

# බාලාවතාර
# බලන සන්නය



"BALAWATARABALANASANNAYA"

# බාලාවතාර බලන සන්නය.

මොල්ලිගොඩ

ප්‍රවචනොදය පිරිවෙනෙහි

ද්විතීයාචාර්‍ය්‍යවූ

**එල්ලෑවල සඞකිමම ස්වාමීන් වහන්සේ විසින්**

ලිපිදෙස් පහකිරීම් වශයෙන්

ශුද්ධකරනලදී.

ඩී. පී. වීරසේකර අප්පුහාමි විසින්

පානදුරේ

සුචරිතොදය යන්ත්‍රාලයෙහි මුද්‍රණය කරවනලදී.

Printed at the Sucharitodaya Press

Panadure.

1899.

# සංඥාපනය.

"**බලනසන්නය**" නමැති මෙම පුරාණබාලාවතාර ප්‍රතීතාඛ්‍යා තොමෝ ශුද්ධමාගධව්‍යාකරණාවබොධකාමී ශිෂ්‍යසමූහයාට බාලාවතාරපදාර්ථපරිචයාතිශයොපකාරීයයි සකලපණ්ඩිතසත්විරපරම්පරාව විසින්ම ගරුකොට සලකනලද්දීය. මේ සන්නයෙහි අර්ථකථනය බොහෝසෙයින් පදාර්ථප්‍රධානකොට කරන ලද්දේය. ගඩලාදෙණිසන්නයෙහි අර්ථකථනය වනාහි බොහෝසෙයින් භාවාර්ථයම ප්‍රධානකොට සලකා කරනලදබැව් පෙණේ. මේ සන්නයෙන් පදාර්ථකථනය පුහුණු නොකළවුන්ට ගඩලාදෙණිසන්නයෙහි භාවාර්ථාවබොධය පහසු නොවේ. එබැවින් මේ "**බලනසන්නය**" බාලාවතාරපදාර්ථපරිචය පිණිස ආධුනිකජනතාවට අතිශයොපකාරී වේ. මෙයකවරකලක වැඩිසිටි කිනම් කෙනෙකු විසින් ලියනලද්දේදැයි කිසිම ලියවිල්ලකින් නොදිටුවෙමු. නුමුත් බාලාවතාරයෙහි මුලපටන් අවසානය දක්වාම පදාර්ථකථනය සිද්ධකොට තිබෙන හෙයින් කාත්‍යායන ව්‍යාකරණයෙහි විචක්ෂණ වූ පුරාණපණ්ඩිතයෙක් විසින් ප්‍රශිෂ්‍යජනතාවට හිතානුකම්පා පිණිස සත්පුරුෂගුණයෙන් මෙහෙයනලද සිත්ඇතුව මේ සන්නය කරනලද්දේයයි හැඟේ. මෙය ශොධනයකරන්නාවූ මා විසින් උඩපහත දෙරටින්ම පොත්කීපයක් ලබාකරගෙන අනෙකවිධලිපිදොෂාකුලතැන් යථාශක්තීන් ශුද්ධකරනලද්දේය. මෙහි එසේ ශුද්ධයෙහි ප්‍රමාදභ්‍රමාදියෙන් ජනිතවූ දොස් විද්‍යමාන වුවහොත් සත්පුරුෂගුණාඞ්ගසඞ්ගත සුධිජනසමූහයා විසින් ලොකශාසනානුග්‍රහමයන් ක්ෂමාව භජනයකොට ශුද්ධකරනුලැබෙත්වා.

1898 දෙසැම්බර් මස 10
**වෙනිද්දක මොල්ලිගොඩදීය.**

E. Sankichcho.

1 සරදකාලනිම්මලින්දුබිම්බසන්නිභානනං
ද්විබලක්ඛණානුබ්‍යඤ්ජනප්පභාවිරාජිතං,
සුරනරොරගාදිපාළිසෙවිතප්පදම්බුජං
අඛිලලොකපූජිතං තථාගතං නමාමහං.

2 සුගතසෙලසම්භවං පරායනණ්ණවන්තිමං
අරියමග්ගිකාඞ්ගධම්මනිජ්ඣපූරිතං සුචිං,
සුගතසාරභාරනීමහානදිං මනොරමං
අභිනමාමි පෙමභාරගාරවාදරො අහං.

3 දසබලොලූරාජසෙට්ඨොලූසංඝසන්නිභං
විහතරාගදොසමොහපාපවෙරිමණ්ඩලං,
තිදිවමොක්ඛසාතදං සුපුඤ්ඤඛෙත්තමුත්තමං
සුගතසූනුසංඝසාගරං නමෙ නිරන්තරං.

4 සත්ථුණොවසා පරහිරගුණො සුකිත්ති
ථෙරුත්තමො 'සි සිරිමා වරධම්මකිත්ති,
සො 'කාසි බාලජනතාය හිතාය පුබ්බෙ
බාලාවතාරමිතිඛ්‍යාතපසත්ථගන්ථං.

5 තස්ස 'ත්ථසංවණ්ණිතපොත්ථකානි
නානාභිධානානි බහූනි 'හෙසුං,
කතානි පුබ්බාචරියුත්තමෙහි
ඤාතබ්බ සංවණ්ණිත පොත්ථකෙසු,

6 අත්ථඤ්ඤුනා කෙන චි දෙව ධීමතා
බාලානමත්ථාවගමූපකාරිකා,
ඔලොකනාබාධා 'නුපදත්ථ දීපිකා
ව්‍යාඛ්‍යා පුරාණත්ථවරෙන දීපිතා.

7 සා සුඛමාගධිකාව්‍යාකරණාවබොධ
හියො 'පකාරජනිකා ලපනාය අත්ථං,
කාලා 'නුකාල ලිපිකාරජ දොසජාල
සඞ්කිණ්ණමාසි සුචිරන්තනමාගතත්තා,

8 බොද්ධෙල්ලවිහයවිහාරනිවාසිකෙන
සද්ධාදිරක්ඛිතමහාථෙරාධිපෙන,
සංවඩ්ඪිතො පිතුපදාධිගතෙන සම්මා
සුඛාසයෙන ගරුනා ගරුනා ගුණෙන—

9 සබ්බඤ්ඤුනො සාසනපඞ්කජාකරෙ
සමුල්ලපඤ්ඤාරුහතුල්‍යකිත්තිනා,
පඤ්ඤාවතා පාවචනොද'ධිම්හයෙ
විජ්ජාලයෙ 'ධිවසතා සිරිමතා—

10 ඉන්දජොති'ව්හයථෙරසාමි
පාදෙන ථෙරව්හයහාසනෙන,
නිරුත්තියා මාගධිකාය සම්මං
සික්ඛාපිතො පාවචනෙ ජිනස්ස—

11 ඉච්චෙවං ථෙරවංසඛජනිහමගිමොළාරථෙරුත්තමෙහි
ලද්ධස්සාසප්පතිට්ඨො ගරුවරගහිතො ඛත්තයංකිච්චනාමො,
සො'හං දොසාපහාරිං දසබලතනුජො සුද්ධිමාකඞ්ඛමානො
ඛීමනො මම පමාදබ්භමම්හි සාරුණාබුද්ධිතා මා භජන්තු.

# බාලාවතාර බලනසන්නය.

**නමො තස්ස භගවතො අරහතො**
**සම්මා සම්බුද්ධස්ස**

---

බුද්ධං තිධාභිවන්දිත්වා බුද්ධම්බුජවිලොචනං
බාලාවතාරං භාසිස්සං, බාලානං බුද්ධිවුද්ධියා

“අක්ඛරාපාදයොඑකචත්තාලීසං” අක්ඛරාපිඅකාරාදයොඑකචත්තාලීසං සුත්තන්තෙ උපකාරා තංයථා අ ආ ඉ ඊ උ ඌ එ ඔ ක ඛ ග ඝ ඞ, ච ඡ ජ ඣ ඤ, ට ඨ ඩ ඪ ණ, ත ථ ද ධ න, ප ඵ බ භ ම, ය ර ල ව ස හ ළ අං—ඉති—

---

බුද්ධං අභිවන්දිත්වා බලාවතාරං භාසිස්සං යනු මෙහි ක්‍රියා කාරක පද සම්බන්ධයි— බුද්ධං, සර්වඥයා, අභිවන්දිත්වා, මනාකොට වැඳ, බාලාවතාරං, බාලාවතාරනම්වූ ප්‍රකරණයක්, භාසිස්සං, කියමි— කෙන විසිට්ඨං බුද්ධං කෙන පකාරෙන වන්දිත්වා කිමත්ථං බාලාවතාරං භාසිස්සසි, යනු මෙහි චොදනාපද සම්බන්ධයි— කෙන විසිට්ඨං බුද්ධං, කුමකින් විශිෂ්ටවූ සර්වඥයා, කෙන පකාරෙන වන්දිත්වා, කවර ප්‍රකාරයකින් වැඳ, කිමත්ථං, කුමක්පිණිස, බාලාවතාරං, බාලාවතාරනම් ප්‍රකරණයක්, භාසිස්සසි, කියයිදයත්?— බුද්ධම්බුජවිලොචනං බුද්ධං තිධා, අභිවන්දිත්වා බාලානං බුද්ධිවුද්ධියා බාලාවතාරං භාසිස්සං—යනු මෙසේ පරිහාරසමග අර්ථපදසම්බන්ධයි— බුද්ධ, ප්‍රබුද්ධවූ, අම්බුජ, නිලොත්පලදලහා සාදෘශ්‍යවූ, විලොචනං, විශිෂ්ටවූ නෙත්‍රද්වයක්ඇති, බුද්ධං, (භූත භවිෂ්‍යත් වර්තමානාඛ්‍ය කාලත්‍රය වර්තීවූ සර්ව ධර්මයන් සර්වාකාරයෙන් පරොපදෙශරහිතව ස්වයම් භූඥානයෙන් දැන සත්‍යාවගමනකළාවූ) සර්වඥයා, තිධා, තුන්පරිච්ඡෙදයකින්, හෙවත් කාය වාග් මනඃ සඞ්ඛ්‍යාතද්වාරත්‍රයෙන්, අභිවන්දිත්වා (භයලොභකුලාචාරවිනා භක්තිප්‍රෙමාතිභාරාවර්ණතො නතමාඞ්ගයෙන්) මනාකොට වැඳ, බාලානං, අවිදිතශබ්දස්වරූප ඇති අව්‍යුත්පන්න බාලජනයන්ගේ, බුද්ධිවුද්ධියා, ඥානාභිවෘද්ධිය පිණිස, බාලාවතාරං, (යථොක්ත බාලජනයන්ගේ ශබ්දශාස්ත්‍රාවතරණයට අත්‍යන්තොපකාරිහෙයින්) බාලාවතාරනම්වූ මේප්‍රකරණය, භාසිස්සං, කියමි, හෙවත්විස්තර මධ්‍යමහැර සංක්ෂෙපයෙන්කියමි·

“අක්ඛරා පාදයො එකචත්තාලීසං,, යනු අක්ෂරසංඥාවිධාන සූත්‍රයි— අක්ඛරා යනු පදය, අපි යනු පදය, ආදයො යනු පදය, එකච

1 'තත්ථොදන්තා සරා අට්ඨ'—"තත්ථ අක්ඛරෙසු ඔකාරන්තා අට්ඨ සරා නාම—හොන්ති වචනෙන— 2 "ලහුමත්තා තයො රස්සා"—තත්ථ සරෙසු ලහුමත්තා අ ඉ උ ඉති තයො රස්සා— 3 "අඤ්ඤෙ දීඝා"—තත්ථ සරෙසු රස්සෙහි අඤ්ඤෙ දීඝා—4 සංයොගපුබ්බා එ ඔ රස්සා ඉව වුච්චන්ති ක්වචි—අනන්තරා බ්‍යඤ්ජනා සංයොගො—
5 එත් සෙසයා බ්‍යඤ්ජනා—

---

චත්තාළීසං යනු පදයි— සුගතාගත, පිටකාගත, උපකාරා, වහල් වූ, අකාරාදයො. අකාරයා ආදිකොටඇති, අක්ඛරා අපි, අක්ෂරයෝද හෙවත් "අකාරාදි අක්ඛරප්පභෙදා" යනා පූර්වාචාර්ය්‍යයන් සන්දර්ශිත ප්‍රභෙදකොට ඇති වර්ණයෝ, එකචත්තාළීසං, එක් සාළිසකි,—කථංයථා—කතමෙ ?—ඔහුතවර්ග අ ආ ඉ ඊ උ ඌ එ ඔ, කඛගඝඞ, චඡජඣඤ, ටඨඩඪණ, තථදධන, පඵබභම, යරලවසහළ අං ඉති, අ ආ ඉ ඊ උ ඌ එ ඔ, ක ඛ ග ඝ ඞ, ච ඡ ජ ඣ ඤ, ට ඨ ඩ ඪ ණ, ත ථ ද ධ න, ප ඵ බ භ ම, යරලවසහළ අං යනා මොහුයි— 1 "තත්ථොදන්තා සරා අට්ඨ" යනු සවරසංඥා විධානසූත්‍රයි— තත්ථ යනු පදය, ඔදන්තා යනු පදය, සරා යනු පදය, අට්ඨ යනු පදයි—තත්ථ අක්ඛරෙසු, ඒ එක්සාළිසක් පමණ අක්ෂරයන් අතුරෙහි, ඔකාරන්තා, ඔකාරයා කෙළවර කොටඇති, අට්ඨ, අටදෙන, සරානාම, සවරයෝනම්වෙත්—තත්ථ ඉති, තත්ථ යනු, වචනෙන, මතුම්තුනු සූත්‍රහා සම්බන්ධකරනුලැබේ— 2 "ලහුමත්තා තයො රස්සා" යනු හ්‍රස්වසංඥාවිධානසූත්‍රයි ලහුමත්තා යනුපදය, තයොයනුපදය, රස්සා යනුපදයි—තත්ථසරෙසු, ඒසවරයන්අටදෙන අතුරෙහි, ලහුමත්තා, ලඝුවූමාත්‍රාඇති; අ ඉ උ ඉති, අ ඉ උ යනා, තයො, තුන්දෙන, රස්සා, හ්‍රස්වාක්ෂරයෝනම්වෙත්— 3 "අඤ්ඤෙ දීඝා" යනු දීර්ඝසංඥාවිධානසූත්‍රයි— අඤ්ඤෙ යනුපදය, දීඝා යනුපදයි— තත්ථසරෙසු ඒ සවරයන් අටදෙනා අතුරෙහි, රස්සෙහි, හ්‍රස්වාක්ෂරයන් තුන්දෙනාකෙරෙන්, අඤ්ඤෙ, සෙසුඅක්ෂරයෝ, දීඝා, දීර්ඝාක්ෂරයෝනම්වෙත්— 4 සංයොගපුබ්බා, සංයොගයාගෙ පෙරෙන්පූර්වයෙහිවූ, එ ඔ, එකාර ඔකාර යනාමොහු දෙදෙනා, රස්සාඉව, හ්‍රස්වාක්ෂරයෝ මෙන්, ක්වචි, කිසියම්තැනෙක්හි' උච්චන්ති, කියනුලැබෙත්— අනන්තරා, අව්‍යවධානවූ, බ්‍යඤ්ජනා, ව්‍යඤ්ජනයෝ, සංයොගො, සංයොගනම්වෙත්;—"එත්ථ සෙය්‍යො ඔට්ඨො සොත්ථං" යනුමෙහි එඔදෙනු මතාන් උදාහරණයි—එත්ථ යනු සංයොගයකට පූර්වවූ එකාරයා ලඝුරූපවූ කාරයාගේ හ්‍රස්වාකාරණය ව උදාහරණය,—සෙය්‍යො යනු සංයොග යකට පූර්වවූ එකාරයාගේ හ්‍රස්වාකාරණය ට උදා හරණයි—ඔට්ඨො යනු සංයොගයකට පූර්ව ඔකාරයාගේ බිඳෝ

1 “සෙසා බ්‍යඤ්ජනා”—සරෙ ඨපෙත්වා සෙසා කාදයො නිග්ගහීතන්තා බ්‍යඤ්ජනා—2 “වග්ගා පඤ්චපඤ්චසො මන්තා” ඉති බ්‍යඤ්ජනානං කාදයො මකාරන්තා පඤ්චපඤ්චසො අක්ඛරවන්තො වග්ගා— 3 වග්ගානං පඨමදුතියා සො චාඝොසා—ලන්තාඤ්ඤෙ ඝොසා — 4 ඝොසාඝොසසඤ්ඤා ච ‘ “පරසමඤ්ඤා පයොගෙති” සංගහීතා—එවං ලිඞ්ග සබ්බනාම පද උපසග්ග නිපාත තද්ධිත ආඛ්‍යාත කම්මප්පවචනියාදි සඤ්ඤා ච— 5.“අං ඉති නිග්ගහීතං”—අංඉති අකාරතො පරං යො බින්දු සුය්‍යතෙ තං නිග්ගහීතං නාම.

6 බින්දු චූලාමණාකාරො, නිග්ගහීතන්ති වුච්චතෙ,
කෙවලස්සාප්පයොගත්තා අකාරො සන්නිධීයතෙ.

7 අ කවග්ගහා කණ්ඨජා—ඉචවග්ගයා තාලුජා—උපවග්ගා ඔට්ඨජා—ටවග්ගරළා මුද්ධජා—තවග්ගලසා දන්තජා—එ කණ්ඨතාලුජො—ඔ කණ්ඨොට්ඨජො—වො දන්තොට්ඨජො.

සන්න

ඤාතවත් හුදෙකලාවිවරණයට උදාහරණය— මෙසේවූනු සංයෝග යානට දුර්වූ සව්‍යඤ්ජනතුරුවූ ඕකාරයාගේ හුදෙකලාවිවරණයට උදාහරණයි——

1 “සෙසා බ්‍යඤ්ජනා” යනු ව්‍යඤ්ජනසංඥාවිධාන සූත්‍රයි—සෙසා යනු පදය, ව්‍යඤ්ජනා යනුපදයි— සරෙඨපෙත්වා, ස්වරයන්අටදෙනා හැර, කාදයො, කකාරයාආදිකොටඇති, නිග්ගහීතන්තා, නිග්ගහීතයා කෙළවරකොටඇති, සෙසා සෙසුඅක්ෂරයෝ, ව්‍යඤ්ජනා, ව්‍යඤ්ජනාක්ෂරයෝනම්වෙත්— 2 “වග්ගා පඤ්ච පඤ්චසො මන්තා” යනු වර්ගසංඥාවිධානසූත්‍රයි—වග්ගා යනුපදය, පඤ්චපඤ්චසො, යනුපදය, මන්තා යනුපදයි - ව්‍යඤ්ජනානං, ව්‍යඤ්ජනාක්ෂරයන් සම්බන්ධව, කාදයො, කකාරයාආදිකොටඇති, මකාරන්තා, මකාරයාකෙළවරකොටඇති, පඤ්චපඤ්චසො, පස්පස්බැගින්, අක්ඛරවන්තො, අක්ෂරවත්වූවාහු, වග්ගා, වර්ගාක්ෂරයෝනම්වෙත්— 8 වග්ගානං, වර්ගාක්ෂරයන්සම්බන්ධවූ, පඨමදුතියා, ප්‍රථමද්විතියාක්ෂරයෝද, සො ච, සකාරයදයනමොහු, අඝොසා, අඝොෂාක්ෂරයෝ නම්වෙත්—ලන්තා, ළකාරයාකෙළවරකොටඇති, අඤ්ඤෙ, සෙසු අක්ෂරයෝ, ඝොසා, ඝොෂාක්ෂරයෝනම්වෙත්— 4 ඝොසාඝොස සඤ්ඤාච, ඝොෂඅඝොෂසංඥාවෝද, “පරසමඤ්ඤා පයොගෙ” ඉති, ‘පරසමඤ්ඤා පයොගෙ’ යන පරිභාෂාසූත්‍රයෙන්, සඞ්ගහීතා, සඞ්ග්‍රහකරනලදහුයි—ලිඞ්ග, ලිඞ්ගසංඥාද, සබ්බනාම, සර්වනාමසංඥාද, පද, පදසංඥාද, උපසග්ග, උපසර්ගසංඥාද, නිපාත, නිපාතසංඥාද;

1 ලොකඅග්ගො ඉච්චස්මිං—
2 "පුබ්බමධොඨිතමස්සරං සරෙන වියොජයෙ"ති පුබ්බබ්‍යඤ්ජනං සරතො පුථක්කාතබ්බං— 3"සරා සරෙ ලොපං"—අනන්තරෙ සරෙපරෙ සරා ලොපං පප්පොන්ති— 4 "නයෙ පරං යුත්තෙ"ති අස්සරො බ්‍යඤ්ජනො පරක්ඛරං නෙතබ්බො—

5 සරෙත්‍යස්මිං ඔපසිලෙසිකො කාසසත්තමී තතො වණ්ණකාලව්‍යවධානෙ කාරියං නහොති—මං අහාසීති—පමාදමනුයුඤ්ජන්ති ත්‍යාදිගාථායං ජනා අප්පමාදන්තිච—එවං සබ්බසන්ධිසු—
6 අනන්තරං පරස්ස සරස්සලොපං වක්ඛති තස්මා නෙහ පුබ්බස්ස ලොපො ඤායති තෙනෙව සත්තමීනිද්දිට්ඨස්ස පරත්ත'පි ගම්‍යතෙ.

---

තද්ධිත, තද්ධිත සංඥද, ආඛ්‍යාත, ආඛ්‍යාත සංඥද, කම්මප්පවචනීයාදිසඤ්ඤව, කර්මප්‍රවචනීයාදිවූසංඥවෝද, එවං, මෙසේමැයි—
5 "අංඉති නිග්ගහීතං" යන නිග්ගහීත සංඥවිධානසූත්‍රයි—අංයනුපදය, ඉතියනුපදය, නිග්ගහීතං, යනුපදයි—අංඉති, අංකියා, අකාරතොපරං, අකාරයාකෙරෙන්පරවූ, යොබින්දු, යම්බින්දුවෙක්තෙම, සූයතෙ, අසනුලැබේද, තං, ඒබින්දුතෙම, නිග්ගහීතන්නාම, නිග්ගහීත නම්වේ—
6 චූලාමණාකාරෝ, සිළුමිණකටබඳුආකාරතිඇති, බින්දු, බින්දුතෙම, නිග්ගහීතංඉති. නිග්ගහීතයයි, වුච්චතෙ, කියනුලැබේ, කෙවලස්ස, හුදකලාබින්දුහුගේ, අප්පයොගතො, උච්චාරණාදි කිසිප්‍රයොගයක් නොකොටනැකිබැවින්, අකාරෝ, අකාරතෙම, සන්නිධීයතෙ, ලංකරනුලැබේ, නොවත් එක්කොට කියනුලැබේ.
7 අ, අවර්ණය, කවග්ග, කවර්ගය, හා, හකාරයයනමොහු, කණ්ඨජා, කණ්ඨජාක්ෂරයෝනම්වෙත් - ඉ, ඉවර්ණය, චවග්ග, චවර්ගය, යා, යකාරය, යනමොහු තාලුජා, තාලුජාක්ෂරයෝනම්වෙත්—
උ උවර්ණය, පවග්ගා, පවර්ගය, යනමොහු, ඔට්ඨජා, ඔෂ්ඨජාක්ෂරයෝ නම්වෙත්— ටවග්ග, ටවර්ගය, රළා, රකාරළකාරයනමොහු, මුද්ධජා, මූර්ධජාක්ෂරයෝනම්වෙත්,— තවග්ග, තවර්ගය, ලසා, ලකාරසකාරයනමොහු දන්තජා, දන්තජාක්ෂරයෝනම්වෙත්—එ, එකාරයතෙම, කණ්ඨතාලුජෝ, කණ්ඨතාලුදෙක්හිඋපදනේය—ඔ, ඔකාරතෙම, කණ්ඨොට්ඨජො, කණ්ඨොෂ්ඨදෙක්හි උපදනේය—වො, වකාරතෙම, දන්තොට්ඨජො, දන්තොෂ්ඨදෙක්හිඋපදනේයි—

සංඥ කාණ්ඩය නිමියා සමාප්තයි

---

1 ලොකඅග්ගො ඉති, ලොකඅග්ගොයන, අස්මිං, මෙහි, සන්ධිවූවිටෙ, සංහිතානාමයයි කියනුලැබේ— 2 "පුබ්බමධොඨිතමස්සරං' සරෙන

1 "සවරනත්‍ථීකාරො"— 2 පනිමෙ පනිමෙ'ති'හ— 3 සරා ලොපං ඉච්චෙව— 4 "වා පරො අසරූපා"—අසමානරූපා සරම්හා පරො සරො වා ලුප්‍යතෙ—පනමෙ පනිමෙ— 5 බන්ධුස්ස ඉව න උපෙති තීධ— 6 "ක්වචාසවණ්ණං ලුත්තෙ"—සරෙලුත්තෙ ක්වචිපරසරස්ස අසවණ්ණො හොතීති ඉ උ ඉච්චෙතෙසං ඨානාසන්නා එ ඔ— බන්ධුස්සෙව නොපෙති — 7 තත්‍රායං යානීධ බහූපකාරං සද්ධීධ තථූපමං තො'තස්මිං— 8 "දීඝං"—සරෙලුත්තෙ පරො සරො ක්වචි ඨානාසන්නං දීඝං යාති—තත්‍රායං යානීධ බහූපකාරං සද්ධීධ තථූපමං— 9 කිංසූධවිත්තං—

10 "පුබ්බොච"—සරෙලුත්තෙ පුබ්බො ච ක්වචි දීඝං යාති— 11 කිංසූධ—තෙ අජ්ජ තෙ අහං'තෙච—12 "යමෙදන්තස්සාදෙසො" සරෙ පරෙ අන්තස්ස එකාරස්ස ක්වචි යො ආදෙසො හොති— ත්‍යජ්ජ—13 "දීඝං"ති බ්‍යඤ්ජනෙ පරෙ ක්වචි දීඝො—

ත්‍යාහං

---

වියොජයෙ,, ඉති, "පුබ්බමධොඨිතමස්සරං සරෙන වියොජයෙ" යන පරිභාෂාසූත්‍රයෙන්, පුබ්බබ්‍යඤ්ජනං, පූර්වව්‍යඤ්ජනයා, සරෙන, ස්වරයාකෙරෙන්, පුථක්කාතබ්බං, වෙන්කටයුත්තේයි.

3 "සරා සරෙ ලොපං" යනු පූර්වස්වරලොපවිධානසූත්‍රයි–සරා යනු පදය, සරෙ යනුපදය, ලොපං යනුපදයි–අනන්තරෙ, අව්‍යවධානවූ, සරෙපරෙ, ස්වරයාපරකල්හි, සරා, පූර්වස්වරයෝ, ලොපං, ලොපට, පප්පොන්ති, පැමිණෙත්— 4 "නයෙ පරං යුත්තෙ" ඉති, නයෙ පරං යුත්තෙ යන පරිභාෂාසූත්‍රයෙන්, අස්සරොබ්‍යඤ්ජනො, ස්වරරහිතවූ ව්‍යඤ්ජනතෙම, පරක්ඛරං, පරාක්ෂරයාකරා, නෙතබ්බො, පැමිණවියයුත්තේයි—ලොකග්ගො, ලොකග්ගො යනුවේ— 5 සරෙඉති, සරෙයනු, අයම්පි, මෙහි, ඔපසිලෙසිකොකාසසත්තමී, ඔපසිලෙසිකාධාරයෙහිසත්තමිය, තතො, එහෙයින්, වණ්ණකාලව්‍යවධානෙ, වර්ණව්‍යවධාන කාලව්‍යවධානයක්ඇතිකල්හි, කාරියංනහොති, සංහිතාකාර්යනොවේ

(යථා, ඊටඋදාහරණමෙසේයි)— "මංඅහාසි" ඉති මංඅහාසි තීයාද— "පමාදමනුයුඤ්ජන්ති" ඉති, පමාදමනුයුඤ්ජන්ති යන, ආදිගාථායං, මේ ආදි ගාථාවෙහි, ජනාඅප්පමාදංඉති ච, ජනාඅප්පමාදංකියාදවේ—සබ්බසන්ධිසු, සියලු සංහිතාකාර්යයෙහිදු, එවං, මෙසේම— 6 අනන්තරං, පූර්වස්වරලොපයටඅනතුරුකොට, පරස්සරස්ස, පරස්වරයාහට, ලොපං, ලොප, වක්ඛති, (ආචාර්යතෙම) මතුකියයි, තස්මා, එහෙයින්, අනෙන, මේකාරණයකාට මෙහා, පුබ්බස්ස,

පූර්වස්වරයාහට, ලොපයා, අලාප, කයයි, කැසේ—තෙනෙව, එහෙසින්ම, සනහාභිනිද්දිඨස්ස, සප්තම්විභක්තීන් දක්වනලද්දනුගේ පරනාපි, පරබවද, ගම්‍යතෙ, දන්නාලැබේ.

1 සරෙ ඉති, සරෙ යනු, අධිකාරො; මතුමත්සූත්‍රහාසම්බන්ධකරනු ලැබේ— 2 පන ඉමෙ පන ඉමෙ ඉති, පන ඉමෙ පන ඉමෙ යන, ඉහ, මෙහි, (සන්ධිවූවචනෙ, සංහිතාකායයිකියනුලැබේ) 3 සරා ඉති, සරා යනුද, ලොපං ඉති, ලොපං යනුද, එව, මතුසූත්‍රයෙහිවැටේ— 4 "වා පරො අසරූපා" යනු, පරස්වරලොප්විධානසූත්‍රයි — වා යනුපදය පරො යනුපදය, අසරූපා යනුපදයි —අසමානරූපා, සමානරූපනො වන්නාවූ, සරම්හා ස්වරයාකෙරෙන්, පරො සරො, පරස්වරතෙම, වා, විකල්පයෙන්, ලුප්‍යතෙ, ලොප්කරනුලැබේ

පනාමෙ පනිමෙ යනුවේ —5 බන්ධුස්ස ඉව න උපෙති ඉති, බන්ධුස්ස ඉව න උපෙති යන, ඉධ, මෙහි, (සන්ධිවූවචනෙ, සංහිතාකායයිකියනුලැබේ) —6 "ක්වචාසවණ්ණංලුත්තෙ" යනු, අසවණ්ණාදෙශවිධානසූත්‍රයි— ක්වචි, යනුපදය, අසවණ්ණං යනුපදය, ලුත්තෙ යනුපදයි, සරෙ ලුත්තෙ, ස්වරයාලොප්කළකල්හි, පරසරස්ස, පරස්වරයාහට, ක්වචි, කිසිතැනෙක්හි, අසවණ්ණො හොතීති, අසවණ්ණාදෙශවේ-යුසි, ඉ උ ඉති, ඉ උ යන, එ තෙසං, මොවුන්ට, ඨානාසන්නා, ස්ථානයෙන්ආසන්නවූ, එ ඔ, එකාරඔකාර යනමොනුආදෙශවෙත්, බන්ධුස්සෙව නොපෙති යනුවේ—

7 තත්‍රඅයං යානි ඉධ බහු උපකාර සඞ්ඝ ඉධ තථාඋපමං ඉති, තත්‍ර අයං යානි ඉධ බහු උපකාරං සඞ්ඝ ඉධ තථා උපමං යන, එත්‍රයෙහිං, මෙහි, (සන්ධිවූවචනෙ, සංහිතාකායයිකියනුලැබේ)— 8 "දීඝං" යනු, පරස්වරදීර්ඝවිධානසූත්‍රයි—දීඝං යනුඑකපදයි— සරෙ ලුත්තෙ; පූර්වස්වරයාලොප්කළකල්හි, පරො සරො, පරස්වරතෙම, ක්වචි, කිසිතැනෙක්හි, ඨානාසන්නං, ස්ථානයෙන් ආසන්නවූ, දීඝංයාති, දීර්ඝ බවට පැමිණේ—තත්‍රායං යානිධ භික්ඛුපකාරා සඞ්ඝ තථූපමං යනුවේ— 9 කිංසු ඉධ ඉති, කිංසු ඉධ යන අත්‍ර, මෙහි,(සන්ධිවූවචනෙ,සංහිතාකායයිකියනුලැබේ)—10 "පුබ්බොවා"—යනු,පූර්වස්වරදීර්ඝවිධානසූත්‍රයි, පුබ්බො යනුපදය, වා යනුපදයි—සරෙලුත්තෙ, පරස්වරයාලොප්කළකල්හි, පුබ්බො, පූර්වස්වරද, ක්වචි, කිසිතැනෙක්හි, දීඝං යාති, දීර්ඝබවටපැමිණේ—කිංසූධ යනුවේ— 11 නො අජ්ජ නො අහං ඉති, නො අජ්ජ නො අහං යන, එත්‍ර, මෙහි,(සන්ධිවූවචනෙ, සංහිතාකායයිකියනුලැබේ)—12 "යමෙදන්තස්සාදෙසො" යනු, යකාරාදෙශවිධානසූත්‍රයි—යං යනපදය, එදන්තස්ස යනුපදය, ආදෙසො යනුපදයි—

1 ක්වචීති කිං නෙතං— 2 සො අයං අජ්ජ [illegible]— 3 "ඡන්දො
ද්දනානානං,—සරෙ පරෙ අන්තනානාරුකාරානං ක්වචි වො ආදෙ
සො හොති—සබ්බස්ස අභාවති—ක්වචීතිකිං? තයස්සු සම්මිතායසො—
4 ඉධ අහං'ති ධ'— 5 "එද ධස්ස ච" සරෙ පරෙ ධස්ස ක්වචි දෙ
හොති—දිස්ස—ඉදහං— 6 ක්වචීති කිං?—ඉධෙව— 7 චකාරො ත
ග්ගහණෙ'පි—ඉද [illegible]— 8 පති අයං වුත්තිඅස්ස'තිහ—
9 "ඉවණ්ණස්ස යං නාම"—සරෙ පරෙ ඉවණ්ණස්ස යො නවා හො
ති— 10 සතයකාරස්ස තිස්ස "සබ්බොවිජ්ජාති"ති ක්වචි චාදෙස

---

සරෙ පරෙ, ඝොෂාඝොෂකල්හි, අනන්තස්ස, පදන්නාවූ, එකාරස්ස, ය
කාරයනට, ක්වචි, කිසිතැනෙකත්හි, යො ආදෙශයොහොති, යකාර
යෙක්ආදෙශවේ—තානයු ය ඝුවේ—13 දීඝං ඉති, දීඝං යනසූත්‍රයෙන්
බ්‍යඤ්ජනෙපරෙ, බ්‍යඤ්ජනයක් පරකල්හි, ක්වචි, කිසිතැනෙක්හි, දීඝො,
දීඝවේ—තානානං යනුවේ— • •

1 ක්වචි ඉති, ක්වචි යනු, කිං, කුමටද, නෙතං, නෙතං, යනතන්හි
ඤ්ඤ කාරාදෙශ නොවනපිණිසයි— 2 සො අස්ස අජ්ජ එති ඉති, සො
අස්ස අජ්ජ එති යන, එඑ, මෙහි, (සන්ධිවුච්චතෙ, සංහිතානාසයිති
යනුලැබේ)— 3 "ඡන්දොද්දනානානං" යනු වකාරාදෙශවිධානසූත්‍රයි—
චං යනුපදය, ඕද්දනානානං යනුපදයි—සරෙ පරෙ, සරයපරකල්හි
අනන්ත, පදන්නවූ, ඔකාරුකාරානං' ඔකාර උකාර යන මොවුන්ට'
ක්වචි, කිසිතැනෙක්හි, වො ආදෙසො හොති, වකාරයෙක්ආදෙශ
වේ—සබ්බස්ස අභාවති, යනුවේ—ක්වචි ඉති, ක්වචි යන, කිං, කුම
ටද?—තයස්සු සම්මිතායසො, තයස්සු සම්මිතායසො යනතන්හි
වකාරාදෙශ නොවනපිණිසයි— 4 ඉධ අහං ඉති, ඉධ අහං යන, ඉ
ධ, මෙහි, (සන්ධි වුච්චතෙ, සංහිතායාසීතියනුලැබේ)— 5 "එද
ධස්ස ච" යන, දකාරාදෙශවිධානසූත්‍රයි—එද යනුපදය, ධස්ස යනු
පදය, ච යනුපදයි—සරෙ පරෙ, සරයපරකල්හි, ධස්ස, ධකාර
යාහට, ක්වචි, කිසිතැනෙක්හි, දෙ, හොති, දකාරයෙක්ආදෙශවේ,
දිස්ස, දීඝකාලයකල්හි, ඉදහං; ඉදහං යනුවේ— 6 ක්වචි ඉයි, ක්වචි
යන, කිං, කුමටද?—ඉධෙව, ඉධෙව යනතන්හි දකාරාදෙශනො
වනපිණිසයි— 7 චකාරෙන, චශබ්දග්‍රහණයෙන්, බ්‍යඤ්ජනෙපි,
බ්‍යඤ්ජනයපරකල්හිද ධකාරයාහට දකාරයෙක්ආදෙශවේ—ඉද ගි
සනිතෙ, ඉද හිතාවෙව යනුවේ— 8 පති අයං වුත්ති අස්ස ඉති, ප
තිඅයං වුත්ති අස්ස යන, ඉන, මෙහි, (සන්ධිවුච්චතෙ, සංහිතා
කායසීතියනුලැබේ)— 9 "ඉවණ්ණස්ස යං නවා" යනු යකාරාදෙශවිධා
නසූත්‍රයි—ඉවණ්ණස්ස යනුපදය, යං යනුපදය, නවා යනුපදයි.

(1"පරවෙභාවො ඨානෙ"ති සරතොපරබ්‍යඤ්ජනස්ස ඨානාසන්නවසා ද්විත්තං—පච්චත්තං වුත්තත්තස්ස—නවා ති කිං? පටගී— 2 එත්ථ "සචෙ ප්‍රිපතිස්ස" තිපතිස්සපි— 3 වණ්ණග්ගහණං සබ්බපරසාදිසඞ්ගහණත්ථං— 4 යථා එවෙතීහ— 5 "එවාදිස්සරි පුබ්බො ච රස්සො— සරතො පරස්ස එවස්සාදිඑකාරො රිත්තං නවා යාති—පුබ්බො ච ඨානාසන්නං රස්සං—යථරිව යථෙව— 6 න ඉමස්ස ති අඩ්ඪිකං ලහු එස්සති අනත අත්ථං ඉතො ආයති තස්මා ඉහ සබ්බි එව ජ අභිඤ්ඤ ප්‍රථ එව පා එවෙහීහ—

---

සරෙ පරෙ; ස්වරයාපරකල්හි; ඉවණ්ණස්ස, ඉවර්ණයහට, නවා; කිසිතැනෙක්හි, යො හොති, යකාරයෙක්ආදෙශවේ—10 කතයකාරස්ස, කරණලද යකාරාදෙශඇති, තිස්ස, තිශබ්දයහට, "සබ්බොචචනති„ ඉති, "සබ්බොචචනති" යන සූත්‍රයෙන්, ක්වචි, කිසි තැනෙක්හි, චාදෙශෙ, චකාරා දෙශ කළ කල්හිද—

1 "පරවෙභාවො ඨානෙ" ඉති, "පරවෙභාවො ඨානෙ" යන පරිභාෂාසූත්‍රයෙන්, සරතො, ස්වරයාකෙරෙන්, පරබ්‍යඤ්ජනස්ස, පරවූ ව්‍යඤ්ජනයහට, ඨානාසන්නවසා, ස්ථානාසන්නවශයෙන්, ද්විත්වං; ද්විත්වවේ—පච්චත්තා වුත්තත්තස්ස යනුවේ—නවා ඉති; නවා යනු, කිං?, කුමටද, පටගී, පටගී යනතන්හි යකාරාදෙශ නොවන්නේ—2 එත්‍ථ, මෙහි, "ක්වචි පටි පතිස්ස" ඉති, "ක්වචි පටි පතිස්ස" යනසූත්‍රයෙන්, පතිස්ස, පතිශබ්දයට, පටි, පටි යනාදෙශවේ 3 වණ්ණග්ගහණං, වර්ණශබ්ද ග්‍රහණය, සබ්බපද, හැම්තන්හිම; රස්සදීඝසංගහණත්ථං, හ්‍රස්ව දීර්ඝ යනමොවුන්ගේ, සංග්‍රහපිණිසයි—4 යථා එව ඉති, යථා එව යන, ඉහ, මෙහි, (සන්ධිවුච්චතෙ, සංහිතාකායයිකියදැලැබේ)— 5 "එවාදිස්ස රි පුබ්බො ච රස්සො" යනු රිකාරාදෙශ විධානසූත්‍රයි—එවාදිස්ස යනුපදය, රි යනුපදය, පුබ්බො යනුපදය, ච යනුපදය, රස්සො යනුපදයි—සරතො, ස්වරයාකෙරෙන්, පරස්ස, පරවූ, එවස්ස, එවශබ්දයාගේ, ආදිඑකාරො, ප්‍රථමඑකාරයතෙම, නවා, කිසිතැනෙක්හි, රිත්තංයාති, රිකාරාදෙශබවටපැමිණේ—පුබ්බොච, පූර්වස්වරද, ඨානාසන්නං, ස්ථානයෙන් ආසන්නවූයේ, රස්සං; හ්‍රස්වවේ—
යථරිව යථෙව යනුවේ—6 න ඉමස්ස ති අඩ්ඪිකං ලහුඑස්සති අනත අත්ථංඉතො ආයති තස්මා ඉහ සබ්බි එව ජ අභිඤ්ඤ ප්‍රථ එව පා එව ඉති, න ඉමස්ස ති අඩ්ඪිකං ලහු එස්සති අනත අත්ථං ඉතො ආයති තස්මා ඉහ සබ්බි එව ජ අභිඤ්ඤ, ප්‍රථ එව පා එව යන, ඉහ, මෙහි, (සන්ධිවුච්චතෙ, සංහිතාකායයිකියදැලැබේ—

1 වා'ති — 2 "යවමදනතරලා චාගමා" — සරෙ පරෙ යාදයො ආගමා වා හොන්ති චකාරෙන ගො ච — 3 නයිමස්ස විචක්ඛිකා ලහු මෙස්සාති අනඤ්ඤං ඉතො ආයති නස්මාතිහ සබ්භිරෙව ඵලතිස්සා, පුථගෙව — 4 "රස්සං" ති බ්‍යඤ්ජනෙ පරෙ ක්වචි රස්සො — 5 පගෙව — 6 වා ති කිං? ඡ අභිඤ්ඤා, පුථ එව පා එව — 7 එත්ථ "සරෙ ක්වචී" ති සරානං පකති හොති සසරූපමෙව න විකාරොතාත්ථො — 8 අභි උග්ගතොනාත්ථ — 9 "අභිභො අභි" ති අභිස්ස අබ්භො — 10 අබ්භුග්ගතො —

## සර සන්ධි.

---

1 වා ඉති, වා යනු, එව, මතු සූත්‍රයෙහි වැටේ — 2 "යවමදනතරලා චාගමා" යනු යාදාගමවිධානසූත්‍රයි — යවමදනතරලා යනුපදය, ච යනුපදය, ආගමා යනුපදයි — සරෙ පරෙ, ස්වරයා පරකල්හි, යාදයො, යාදීහු, වා, විකල්පයෙන්, ආගමා හොන්ති, ආගමවෙත් චකාරෙන, චශබ්දග්‍රහණයෙන්, ගො ච, ගකාරයෙන්දආගමවේ — 3 නයිමස්ස විචක්ඛිකා ලහුමෙස්සති අනඤ්ඤං ඉතො ආයති නස්මාතිහ සබ්භිරෙව ඵලතිස්සා, පුථගෙව යනුවේ — 4 "රස්සං" ඉති, රස්සං" යනුසූත්‍රයෙන්, බ්‍යඤ්ජනෙ පරෙ, බ්‍යඤ්ජනාක්ෂරය පරකල්හි, ක්වචි, කිසිතැනෙක්හි, රස්සො, හ්‍රස්වවේ — 5 පගෙව, පුගෙව යනුවේ — 6 වා ඉති, වා යනු, කිං? කුමටද, ඡ අභිඤ්ඤා, පුථ එව පා එව, ඡ අභිඤ්ඤා, පුථ එව පා එව යනාදීන්හි ලකාර ගකාරාගම නොවන බැවිනයි — 7 එත්ථ, මෙහි, "සරෙ ක්වචි" ඉති, "සරෙක්වචි" යනුසූත්‍රයෙන්, සරානං, ස්වරයන්ට, පකති හොති, ප්‍රකෘතිවත්වේ, සසරූපමෙව, ස්වකීයරූපයමවේ. න විකාරොතාත්ථො, ලොපාගමාදීන්කිසිවිකාරයකට නොපැමිණෙයි යනාදියයි — 8 අභි උග්ගතො ඉති, අභිඋග්ගතො යනු අත්‍ර, මෙහි, (සන්ධිවූවතෙ, සංහිතා කායකියනුලැබේ) — 9 "අභිභො අභි' ඉති, "අභිභො අභි" යනු සූත්‍රයෙන්, අභිස්ස, අභිශබ්දයහට, අබ්භො, අබ්භ යනාදේශවේ — 10 අබ්භුග්ගතො යනුවේ — සරසන්ධි, ස්වරයන් සම්බන්ධවූ සංහිතාකාණ්ඩය නිමාසමාප්තයි —

1 බ්‍යඤ්ජනෙනාධිකාරෝ — 2 ඛ්වීජ්ජම — 3 සො භික්ඛු කාච්චිනු ත්වං ජනෙම තං තීහ — 4 "ලොපඤ්ච තත්‍රාකාරො" — බ්‍යඤ්ජනෙ පරෙ සරානං ඛ්වි ලොපො හොති තත්‍ර ලුත්තෙ ඨානෙ අකාරාගමො චකාරෙන ඔකාරුකාරාපි — 5 සභික්ඛු කාච්චිනොත්වං ජනෙමුතං — 6 ඛ්වියි කිං? සොමුනි — 7 උ ඛොසො ආඛාතන්තීහ 8 වෙභාවෙවා ඨානෙ ඉච්චෙව — 9 "වග්ගෙ ඝොසාඝොසානං තතියපඨමා" — වග්ගෙ ඝොසාඝොසානං චතුත්ථදුතියානං තබ්බග්ගෙ තතියපඨමා යථාසඞ්ඛ්‍යං යුත්තෙ ඨානෙ පිතත්තං යන්ති — 10 උග්ගොසො — 11 රඤ්ඤො — අක්ඛාතං — 12 පර සහස්සං අභිප්ප බො තීහ —

---

1 බ්‍යඤ්ජනෙ ඉති, බ්‍යඤ්ජනෙ යනු, අධිකාරො, මතුමතුසූත්‍රහා සම්බන්ධකරනුලැබේ — 2 ඛ්වි ඉති, ඛ්වීයනු, එව, මතුසූත්‍රයෙහිවැටේ, 3 සො භික්ඛු කාච්චිනු ත්වං ජානෙම තං ඉති, සො භික්ඛු කාච්චිනු ත්වං ජනෙම තං යන, ඉහ, මෙහි, (සන්ධිවූවචනෙ, සංහිතාකායයිකියනු ලැබේ) — 4 "ලොපඤ්ච තත්‍රාකාරො" යනු ලොපාගමවිධානසූත්‍රයි — ලොපං යනුපදය, ච යනුපදය, තත්‍ර යනුපදය, අකාරො යනුපදයි — බ්‍යඤ්ජනෙ පරෙ, බ්‍යඤ්ජනයා පරකල්හි, සරානං, ස්වරයන්ට, ඛ්වි, කිසිතැනෙක්හි, ලොපො හොති, ලොප්වේ, තත්‍ර ලුත්තෙ ඨානෙ, ඔහු ලොප්කළස්ථානයෙහි, අකාරාගමො, අකාරයෙක් ආගමවේ, චකාරෙන, චශබ්දග්‍රහණයෙන්, ඔකාරුකාරාපි, ඔකාරඋකාරයනමොහුද ආගමවෙත් — 5 සභික්ඛු කාච්චිනොත්වං ජනෙමුතං යනුවේ — 6 ඛ්වි ඉති, ඛ්වි යනු, කිං?, කුමටද, සො මුනි, සොමුනි යනතන්හි ලොපාගම නොවනපිණිසයි — 7 උ ඛොසො ආ ඛාතං ඉති, උ ඛොසො ආ ඛාතං යන, ඉහ, මෙහි, (සන්ධිවූවචනෙ, සංහිතාකායයිකියනුලැබේ) — 8 වෙභාවෙවා ඨානෙ ඉති වෙභාවෙවා ඨානෙ යනු, එව, මතුසූත්‍රයෙහි වැටේ — 9 "වග්ගෙ ඝොසාඝොසානං තතියපඨමා" යනු තෘතීයප්‍රථමාක්ෂර විධානසූත්‍රයි — වග්ගෙ යනුපදය, ඝොසාඝොසානං යනුපදය, තතියපඨමා යනුපදයි — වග්ගෙ, වර්ගයෙහිවූ, ඝොසාඝොසානං, ඝොෂඅඝොෂවූ, චතුත්ථදුතියානං, චතුර්ථද්විතීයාක්ෂරයන්ට, තබ්බග්ගෙ, ඒමවර්ගයෙහිවූ, තතියපඨමා, තෘතීයප්‍රථමාක්ෂරයෝ, යථාසඞ්ඛ්‍යං, පිළිවෙළින්, යුත්තෙ ඨානෙ, යුක්තස්ථානයෙහි, පිතත්තං යන්ති, පිත්වයටපැමිණෙත් — 10 උග්ගොසො යනුවේ — 11 රඤ්ඤො, හ්‍රස්වකළකල්හි, අක්ඛාතං, යනුවේ — 12 පර සහස්සං අභිප්ප බො ඉති, පර සහස්සං අභිප්ප බො යන ඉහ, මෙහි, (සන්ධිවූවචනෙ, සංහිතාකායයිකියනු ලැබේ) —

1 "ක්වචි ඔ බ්‍යඤ්ජනෙ"ති ඔකාරාගමො— 2 පරො සහස්සං— 3 ගාගමෙව— 4 අභිදපගොචො— 5 අව නද්ධාත්‍යත්‍ර— 6 "ඔ අවස්සා"ති ක්වචි අවස්ස ඔ— 7 ඔනද්ධා— 8 ක්වචීති කිං? අවසුස්සතු—

බ්‍යඤ්ජනසන්ධි

---

9 නිග්ගහීතග්ගහණාධිකාරො— 10 කිං කතො සං ජාතො සං ඨිතො, තං ධනං තං මිත්තං ඉහ— 11 "වග්ගන්තං වා වග්ගෙ"—වග්ග බ්‍යඤ්ජනෙ පරෙ බින්දුස්ස තබ්බග්ගන්තො වා හොති— 12 කිඞ්කතො සඤ්ජාතො සණ්ඨිතො තන්ධනං තම්මිත්තං— 13 වාති කිං? තං කම්මං—

---

1. "ක්වචි ඔ බ්‍යඤ්ජනෙ"ඉති "ක්වචි ඔ බ්‍යඤ්ජනෙහු"යනසූත්‍රයෙන්, ඔකාරාගමො, ඔකාරයෙක් ආගමවේ— 2 පරොසහස්සං යනුවේ— 3 ගාගමෙව, ගකාරාගමදකලකල්හි— 4 අභිදපගොචො යනුවේ— 5 අව නද්ධා ඉති, අව නද්ධා යන, අත්‍ර, මෙහි, (සන්ධිවූවචනෙ, සංහිතාකාර්‍ය්‍යකියනුලැබෙ)— 6 ඔ අවස්සඉති, "ඔ අවස්ස"යනසූත්‍රයෙන්, ක්වචි, කිසිතැනෙක්හි, අවස්ස, අවශබ්දයහට, ඔ, ඔකාරයක්ආදෙශවේ— 7 ඔනද්ධා යනුවේ— 8 ක්වචි ඉති, ක්වචි යනු කිං, කුමටද, අවසුස්සතු, අවසුස්සතු යනතන්හි ඔකාරාදෙශ නොවනපිණිසයි—

බ්‍යඤ්ජනයන් සම්බන්ධවූ සංහිතාකාණ්ඩය කියාසමාප්තයි—

---

9 නිග්ගහීතං ඉති, නිග්ගහීතං යනු, අධිකාරො, මතුමතුසූත්‍රහා සම්බන්ධකරනුලැබෙ— 10 කිං කතො සං ජාතො සං ඨිතො තං ධනං තං මිත්තං ඉති, කිං කතො සං ජාතො සං ඨිතො තං ධනං තං මිත්තං යන, ඉහ, මෙහි, (සන්ධිවූවචනෙ, සංහිතාකාර්‍ය්‍ය කියනු ලැබෙ)— 11 "වග්ගන්තං වා වග්ගෙ" යනු තත්වර්ගාන්තාදෙශ විධානසූත්‍රයි— වග්ගන්තං යනුපදය, වා යනුපදය, වග්ගෙ යනු පදයි— වග්ගබ්‍යඤ්ජනෙ පරෙ, වර්ගව්‍යඤ්ජනයා පරකල්හි, බින්දුස්ස, නිග්ගහීතයහට, වා, විකල්පයෙන්, තබ්බග්ගන්තො හොති, තත්වර්ගාන්තාදෙශවේ— 12 කිඞ්කතො සඤ්ජාතො සණ්ඨිතො තන්ධනං තම්මිත්තං යනුවේ— 13 වා ඉති, වා යනු, කිං? කුමටද, තං කම්මං යනතන්හි තත්වර්ගාන්තාදෙශනොවන පිණිසයි

1 වාකාරෙනේ'ව ලෙ ළොච— 2 පුල්ලිඞ්ගං— 3 වාත්‍යධිකාරො— 4 එවං අස්ස ඒතං අවොචෙත්‍ය— 5 "මදාසරෙ"— සරෙ පරෙ බිඤ්ඤුනො මදා වා හොන්ති— 6 එවමස්ස ඒතදවොච— 7 වාතිකිං? මං අජිනි— 8 තං එව තං හි තිහ— 9 "එහෙඤ්ඤං"— එකාරෙ හෙච පරෙ බිඤ්ඤුනො ඤෙ වා හොති— 10 විනෙතන— 11 තඤ්ඤෙව තමෙව තඤ්ඤි තංහි— 12 සංයොගොතීහ— 13 "ස යෙ ච"— යකාරෙ පරෙ තෙන සහ බිඤ්ඤුනො ඤෙ වා හොති— 14 විනෙතන— 15 සඤ්ඤොගො සංයොගො— 16 චක්ඛු අනිච්චං අව සිරො තීහ— 17 අංගමො ව්‍යඤ්ජනෙ— 18 "නිග්ගහීතඤ්ච"— සරෙ ව්‍යඤ්ජනෙ වා පරෙ ඛවි බිඤ්ඤුවාගමො හොති— 19 චක්ඛුං අනිච්චං අවං සිරො— 20 විදූනං අග්ගං තාසං අහං තිහ—

---

වාකාරෙන එව, වාශබ්දග්‍රහණයෙන්ම, ලෙ, ලකාරයාපරකල්හි, ළොච, ලකාරයෙක්ද ආදෙශවේ— 2 පුල්ලිඞ්ගං යනුවේ— 3 වා ඉති, වා යනු, අධිකාරො; මතුමතුසූත්‍රහා සම්බන්ධකරනුලැබේ— 4 එවං අස්ස එතං අවොච ඉති, එවං අස්ස එතං අවොච යන, ඉහ, මෙහි, (සන්ධිවුච්චතෙ, සංහිතාකායයි කියනුලැබේ)— 5 "මදාසරෙ" යනු මකාර දකාරාදෙශවිධානසූත්‍රයි— මදා යනුපදය, සරෙ යනුපදයි— සරෙ පරෙ, ස්වරයා පරකල්හි, බිඤ්ඤුනො, නිග්ගහීතය හට, වා, විකල්පයෙන්, මදා හොන්ති, මකාරදකාරාදෙශයෝ වෙත්— 6 එවමස්ස එතදවොච යනුවේ— 7 වා ඉති, වා යනු, කිං, කුමටද? මං අජිනි, මං අජිනි යනතන්හි මකාර දකාරාදෙශනො වනපිණිසයි— 8 තං එව තං හි ඉති, තං එව තං හි යන, ඉහ, මෙහි, (සන්ධිවුච්චතෙ, සංහිතාකායයි කියනුලැබේ)— 9 "එහෙඤ්ඤං" යනු ඤකාරාදෙශවිධානසූත්‍රයි— එහෙ යනුපදය, ඤං යනුපදයි— එකාරෙ හෙච පරෙ, එකාරයාද හකාරයාද පරකල්හි, බිඤ්ඤුනො, නිග්ගහීතයහට, වා, විකල්පයෙන්, ඤෙ හොති, ඤකාරයෙක් ආදෙශවේ— 10 විනෙතන, විග්‍රහකලකල්හි— 11 තඤ්ඤෙව තමෙව තඤ්ඤි තංහි යනුවේ— 12 සංයොගො ඉති, සංයොගො යන, ඉහ, මෙහි, (සන්ධිවුච්චතෙ, සංහිතාකායයි කියනුලැබේ)— 13 "ස යෙ ච" යනු ඤකාරාදෙශ විධානසූත්‍රයි— සහ යනු පදය, යෙ යනුපදය, ච යනුපදයි— යකාරෙ පරෙ, යකාරයා පරකල්හි, තෙන සහ, ඒපරයකාරයාහා සමග, බිඤ්ඤුනො, නිග්ගහීතයහට, වා, විකල්පයෙන්, ඤෙ හොති, ඤකාරයෙක් ආදෙශවේ— 14 විනෙතන, විග්‍රහකලකල්හි,— 15 සඤ්ඤොගො සංයොගො යනුවේ—

1 "ක්වචි ලොපං" තිසරෙ බින්දු ලොපො— 2 විදූනංගං— 3 දීඝෙ— 4 තාසාහං— 5 බුද්ධානං සාසනං සං රාගොතීහ— 6 "බ්‍යඤ්ජනෙ චෙ" ති බින්දුලොපො— 7 බුද්ධාන සාසනං— 8 දීඝෙ— 9 සාරාගො— 10 බීජං ඉවෙතීහ— 11 "පරො වා සරො"— බින්දුතො පරො සරො වා ලුප්පතෙ— 12 බීජංව— 13 එවං අසෙසතීහ— 14 "බ්‍යඤ්ජනො විසඤ්ඤොගො"— බින්දුතො පරෙ සරෙ ලුත්තෙ සංයොගො බ්‍යඤ්ජනො විනට්ඨසංයොගො හොතීති පුබ්බ සලොපො— 15 එවංස—

නිග්ගහීතසන්ධි

---

16 "අනුපදිට්ඨානං වුත්තයොගතො"— ඉධ 'නිද්දිට්ඨා සන්ධයො වුත්තානුසාරෙන ඤෙය්‍යා— 17 යථා— 18 යදි එවං ස්වාධි අධිගා හීග—

---

16 චක්ඛුං අනිච්චං අව සිරො ඉති, චක්ඛු අනිච්චං අව සිරො යන, ඉහ, මෙහි, ( සන්ධි වුච්චතෙ, සංහිතාකායයි කියනුලැබේ )— 17 ආගමො ක්වචි ඉති, ආගමො යනුද ක්වචි යනුද, එව, මතුසූත්‍රයෙහි වැටේ— 18 "නිග්ගහීතඤ්ච" යනු නිග්ගහීතාගම විධානසූත්‍රයි— නිග්ගහීතං යනුපදය, ච යනුපදයි— සරෙ වා, ස්වරයක්හු හෝ, බ්‍යඤ්ජනෙ වා, බ්‍යඤ්ජනයක්හු හෝ, පරෙ, පරකල්හි, ක්වචි, කිසි තැනෙක්හි, බින්දුවාගමො හොති, නිග්ගහීතයෙක් ආගමවේ,— 19 චක්ඛුං අනිච්චං අවං සිරො යනුවේ— 20 විදූනං අග්ගං තාසං අහං ඉති, විදූනං අග්ගං තාසං අහං යන; ඉහ, මෙහි, ( සන්ධි වුච්චතෙ, සංහිතාකායයි කියනුලැබේ )—

1 "ක්වචි ලොපං" ඉති, "ක්වචි ලොපං" යනසූත්‍රයෙන්, සරෙ, ස්වරයා පරකල්හි, බින්දුලොපො, නිග්ගහීතයටලොප්වේ— 2 විදූනමග්ගං යනුවේ— 3 දීඝෙ, දීඝකාලකල්හි,— 4 තාසාහං යනුවේ— 5 බුද්ධානං සාසනං සංරාගො ඉති, බුද්ධානං සාසනං සං රාගො යන, ඉහ, මෙහි, (සන්ධි වුච්චතෙ, සංහිතාකායයි කියනුලැබේ)— 6 "බ්‍යඤ්ජනෙ ච" ඉති, "බ්‍යඤ්ජනෙ ච" යනසූත්‍රයෙන්, බින්දුලොපො, නිග්ගහීතයහට ලොප්වේ— 7 බුද්ධානසාසනං යනුවේ— 8 දීඝෙ, දීඝකාලකල්හි— 9 සාරාගො යනුවේ— 10 බීජං ඉව ඉති, බීජං ඉව යන, ඉහ, මෙහි, (සන්ධි වුච්චතෙ, සංහිතාකායයි කියනුලැබේ)— 11 "පරො වා සරො" යනු පරස්වරලොප්විධාන සූත්‍රයි— පරො යනුපදය, වා යනුපදය, සරො යනුපදයි— බින්දුතො, නිග්ගහීතයාගෙන්, පරො සරො, පරස්වරතෙම, වා, විකල්පයෙන්, ලුප්පතෙ,

1 යථොද්දෙස ඉච්ඡා සුත්තන්ත දයකාරසංයොගස්ස ජො ධයකාර-සංයොගස්ස ජෙඩා— 2 ජිතෙන— 3 යජෙව්වං බොජ්ඣඞ්ගා— 4 අස-දිස සංයොගෙ එකසරූපතා ච— 5 පරිළසනා හීන— 6 යාදෙසෙ රකාරස්ස යො— 7 පයොසනා— 8 වණ්ණානං බහුත්තං විපරීත-තාච— 9 ස රති ඉති එවං සා ඉති බුසා එව බහු ආබාධො අධි අ හවි සුඛං දුක්ඛං ජීවොතීති— 10 මාගමො සකාරෙ අකාරස්ස උව 11 සුමරති— 12 ඉස්සවො— 13 ඉතෙවං—— 14 පරලොපෙ ආකා-රස්ස ඔ— 15 සොතපි— 16 මාගමෙ පුබ්බරස්ස ච එකාරස්ස ඉ— 17 බුසම්ව— 18 වාදෙසෙ හවකාරවිපරියයො— 19 බවහාබාධො— 20 අධිස්ස ඛවි අබො— 21 දීඝෙ— 22 අබාහවි— 23 බිඤ්ඤනො එකාරස්සච එ— 24 සුඛෙ දුක්ඛෙ ජීවෙ— 25 රදනං ලො— 26 පළි බොධො පරිලොහො— 27 සරෙ බ්‍යඤ්ජනෙ වා පරෙ බිඤ්ඤනො ඛවි මෙ— 28 මම් අහාසි බුඩ්මී සරණම් —

---

ලොප්කරනුලැබේ—— 12 බීජංව යනුවේ—— 13 එවං අස්ස ඉති, එවං අස්ස යන, ඉහ, මෙහි, සන්ධි වුච්චතෙ, සංහිතාකායයි කියනු ලැබේ— 14 "බ්‍යඤ්ජනො ච විසඤ්ඤොගො" යනු විසංයොගාදෙශ විධානසූත්‍රයි— බ්‍යඤ්ජනො යනුපදය, ච යනුපදය, විසඤ්ඤොගො යනු පදයි—— බිඤ්ඤතො, නිගගහීතයා කෙරෙන්, පරෙ සරෙ, පරවූස්වරයා, ලුතෙත, ලොප්කලකල්හි, සංයොගොබ්‍යඤ්ජනො, සංයොග ව්‍යඤ්ජන තෙම, විනස්සංයොගො හොතීති, නටුවාවූ සංයොග ඇත්තේනුයි, පුබ්බසලොපො, පූර්වසකාරයහට ලොප් වේ— 15 එවංස යනුවේ—

නිග්ගහීතයන් සම්බන්ධවූසංහිතාකාණ්ඩය කියා සමාප්තයි—

---

6 "අනුපදිස්සානං වුත්තයොගතො" යනු සූත්‍රානිදෙශවිධානසූත්‍රයි— අනුපදිස්සානං යනුපදය, වුත්තයොගතො යනුපදයි— ඉධ, මේ ශාසනායණ්ව්‍යාකරණයෙහි, අනිද්දිස්සා, නොදක්වනලද්දාවූ, සන්ධියො, සංහිතාවෝ, වුත්තානුසාරෙන, කියනලද ක්‍රමානුසාරයෙන්; ඤෙයා, දතයුත්තානුයි— 17 යථා, ඊටඋදාහරණමෙසේයි— 18 යදි එවං බොධි අඩගා ඉති, යදි එවං බොධි අඩගා යන, ඉහ, මෙහි, (සන්ධිවුච්චතෙ, සංහිතාකායයි කියනුලැබේ)—

1 යාදෙසෙ, යකාරාදෙශකළකල්හි, ඉතිනා සූත්‍රෙනාන, මේ සූත්‍රය කාරණකොටගෙන, දයකාරසංයොගස්ස, දයකාරසංයොගයහට, ජ්ජා, ජකාරයෙක්ද, ධයකාරසංයොගස්ස, ධයකාරසංයොගයහට, ඣා, ඣකාරයෙක්ද ආදෙශවේ — 2 විභාග, විභාගකළකල්හි,— 3 යජ්ජෙවං බොජ්ඣඞ්ගා යනුවේ — 4 අසදිස සංයොගෙ, අක්ෂර යන්ගේ විසදෘශවූ සංයොගබවක් ඇතිකල්හි, එකසරූපතාව, සමානරූපබවද වේ — 5 පරි එසනා ඉති, පරි එසනා යනි, ඉත, මෙහි, (සන්ධි වුච්චතෙ, සංහිතාකායඞ් කියනුලැබේ) — 6 යාදෙසෙ, යකාරාදෙශකළකල්හි, රකාරස්ස, රකාරයහට, යො, යකාරයෙක් ආදෙශවේ — 7 පයොසනා යනුවේ — 8 වණ්ණානං, අක්ෂරයන් ගේ, බහුත්තං, බහුලබවද, විපරීතතාව, විපර්‍යාසබවදවේ — 9 ස රති ඉති එවං සා ඉති බූසා එව බහු ආබාධො අයි අහවි සුඛං දුක්ඛං ජීවො ඉති, ස රතිඉතිඑවං සා ඉති බූසා එව බහු ආබාධො අයි අහවි සුඛං දුක්ඛං ජීවො යන, ඉහ, මෙහි, (සන්ධි වුච්චතෙ, සංහිතාකායඞ් කියනුලැබේ) — 10 මාගමො, මකාරාගමද, සකාර සකාරයෙහිවූ, අකාරස්ස, අකාරයහට, උච, උකාරයෙක්ද ආදෙශවේ — 11 සුමරති යනුවේ — 12 ඉස්ස, ඉකාරයහට, වො, වකාර යෙක්ආදෙශවේ — 13 ඉත්‍යෙවං යනුවේ — 14 පරලොපෙ, පරස්වර යා ලොපකළකල්හි, ආකාරස්ස, ආකාරයහට, ඔ ඔකාරයෙක්ආදෙශවේ — 15 සොපි යනුවේ — 16 මාගමෙ, මකාරාගමද, පුබ්බ රස්සච, පූර්වස්වරයහට හ්‍රස්වද කළකල්හි, එකාරස්ස, එකාරය හට, ඉ, ඉකාරයෙක්ආදෙශවේ — 17 බුසම්ව යනුවේ — 18 වාදෙසෙ, වකාරාදෙශකළකල්හි, හවකාරවිපරියයො, හකාරවකාරයන මොවුන්ගේ, විපර්‍යාස බවවේ — 19 බව්හාබාධො යනුවේ — 20 අයිස්ස, අයිශබ්දයහට, ඣචි, කිසිතැනෙක්හි, අබො, අබ යනාදෙශ වේ — 21 දීඝෙ, දීඝකළ කල්හි — 22 අබාහවි යනුවේ — 23 බින්දු නො, නිග්ගහීතයහටද, ඔකාරස්සච, ඔකාරයහටද, එ, එකාර යෙක්ආදෙශවේ — 24 සුඛෙ දුක්ඛෙ ජීවෙ යනුවේ — 25 රදනං, ර කාරදකාර යනමොවුන්ට, ළො, ළකාරයෙක් ආදෙශවේ — 26 පළි බොධො පරිළාහො යනුවේ — 27 සරෙවා; ස්වරයක්හුහෝ, බ්‍යඤ්ජ නෙවා, බ්‍යඤ්ජනයක්හුහෝ, පරෙ, පරකල්හි, බින්දුනො, නිග්ගහී තයහට, ඣචි, කිසිතැනෙක්හි, මො, මකාරයෙක්ආදෙශවේ — 28 මම්අහාසි බුඬ්ඬම්සරණම් යනුවේ—

1 පුබ්බමො පරං න නෙතබ්බො අයුත්තත්තා—2 බින්දුතො පර සරානමඤ්ඤසසරතාපි—3 තං ඉමිනා එවං ඉමං කිං අහං තීහ—4 ඉස්ස අ—5 තදමිනා—6 ඉස්ස උ අකාරස්ස ච එ—7 බින්දුලොපාදෙ—8 එවුමංකොහං—9 වාක්‍යසුඛුච්චාරණත්ථං ඡන්දහානිවජ්ජනත්ථව වණ්ණලොපො 'පි—10 පටිසංඛාය යොනිසො තීහ—11 පුබ්බය ලොපො—12 පටිසඞ්ඛායොනිසො—13 අලාපූතාදෙ අකාරලොපො—14 ලාපූනී සීදන්ති සිලාපල වන්ති—15 වුත්තභෙදස විකාරො 'පි—16 අකරම්හසෙ තෙ ත්‍යාදෙ සකාරෙ ගරුතො එකාරස්ස ඉමිනා ලහුඅකාරො—17 අකරම්හස තෙ කිච්චං—

18 අක්ඛරනියමො ඡන්දං ගරුලහුනියමො භවෙ වුත්ති
දීඝො සංයොගාදිපුබ්බො රස්සො'ව ගරු ලහු තු රස්සො

19 යථා ආ අස්ස අං අ—

20 එවමඤ්ඤ'පි විඤ්ඤෙය්‍යා සංහිතා තන්තියා හිතා.
සංහිතා'ති ච වණ්ණානං සන්නිධබ්‍යවධානතො.

## වොමිස්සකසන්ධි

---

1 පුබ්බං, පූර්වයෙහි, මො, මකාරතෙම, පරං, පරාක්ෂරයාකරා, න නෙතබ්බො, නොපැමිණවියයුත්තේය—අයුත්තත්තා, නුසුදුසු බැවිනි—2 බින්දුතො, නිග්ගහීතයාකෙරෙන්, පරසරානං, පරස්වරයන්ට, අඤ්ඤසසරතාපි, අන්‍යස්වරබවතුදුවේ—3 තං ඉමිනා එවං ඉමං කිං අහං ඉති, තං ඉමිනා එවං ඉමං කිං අහං යන, ඉහ, මෙහි, (සන්ධි වුවවත්, සංහිතායයි කියනුලැබේ)—4 ඉස්ස, ඉකාරයහට, අ, අකාරයෙක්ආදේශවේ—5 තදමිනා යනුවේ—6 ඉස්ස, ඉකාරයහට, උ, උකාරයෙක්ද; අකාරස්සච, අකාරයහට, එ, එකාරයෙක්ද ආදෙශවේ—7 බින්දුලොපාදෙ, නිග්ගහීත් ලොපාදිය කල කල්හි—8 එවුමංකොහං යනුවේ—9 වාක්‍යසුඛුච්චාරණත්ථං, වාක්‍යයන් සුඛොච්චාරණය පිණිසද, ඡන්දහානිවජ්ජනත්ථව, ඡන්දස්හුගේ නොපිරිහීම්පිණිසද, වණ්ණලොපො 'පි, අක්ෂරලොපද්දවේ—10 පටිසඞ්ඛාය යොනිසො ඉති, පටිසඞ්ඛාය යොනිසො යන, ඉහ, මෙහි, (සන්ධි වුවවත, සංහිතායයි කියනුලැබේ)—11 පුබ්බය ලොපො, පූර්වයකාරයහට ලොප්වේ—12 පටිසඞ්ඛා යොනිසො යනුවේ—13 අලාපු ඉති, අලාපු යන, ආදෙ, මේආදිතන්හි, අකාර ලොපො, අකාරයට ලොප්වේ—14 ලාපූනිසීදන්ති සිලා පල වන්ති යනුවේ— 15 වුත්තභෙදය, වෘත්තීනුගේ අභෙදයය පිණිස,

ජිනවචනයුත්තං හී'ති සබ්බත්ථාධිකාරෝ—2 "ලිඞ්ගඤ්ච නිපච්ච
තෙ"— ධාතුප්පච්චයවිභත්තිවජ්ජිතමත්ථයුත්තං සද්දරූපං ලිඞ්ගං
නාම—ජිනවචනයොග්ගං ලිඞ්ගං ඉධ ඨපියති නිපජාදියතිච—3 බුඩ
ඉති ඨිතෙ—4 "තතො ච විභත්තියො"—තස්මා ලිඞ්ගා පරා විභ
ත්තියො හොන්ති චකාරෙන තාසං එකවචනාදිපඨමාදි සඤ්ඤා ච—
5 "සියො අංයො නාහි සනං ස්මාහි සනං ස්මිංසු"ති විභත්තියො—
6 සි යො ඉති පඨමා—අං යො ඉති දුතියා—නා හි ඉති තතියා— ස
නං ඉති චතුත්ථී—ස්මා හි ඉති පඤ්චමී—ස නං ඉති ඡට්ඨී—ස්මිං සු ඉ
ති සත්තමී—7 තාසමනියමප්පසඞ්ග වත්ති ව්‍යවත්ථාවසා—8 "ලිඞ්ගත්ථෙ
පඨමා"—යො සාමඤ්ඤනානාදිවාච්චන්තරමප්පත්තො සසරූපදස්සනො සු
ද්ධො සො ලිඞ්ගත්ථො නාම— තස්සාභිධානමත්තෙ පඨමා විභත්ති
හොති—

---

විකාරෙරා ඕ, අක්ෂරවිකාරදවේ—16 අනරමාසෙ තෙ ඉති, අකරමාස
සෙ තෙ යන, ආදෙ, මේආදිතන්හි, සකාරෙර සකාරයෙහි, ගරු
නො, ගුරුවූ, එකාරස්ස, එකාරයනට, ඉම්නා, මේසූත්‍රයෙන්, ලහු
එකාරෙරා, ලහුවූඅකාරයෙක් ආදෙශවේ—17 අකාරමහසනෙකිවො,
අකාරමහසනෙකිවොයනුවේ—
18 අක්ඛරනියමො, එකාක්ෂරද්ව්‍යක්ෂරාදිවූ අක්ෂරයන්ගේ නියමය,
ඡන්දං හවෙ, ඡන්දස්නම්වන්නේය, ගරුලහුනියමො, හ්‍රස්වදීර්ඝාදිවූ
ගුරුලඝුන්ගේ නියමය, වුත්ති හවෙ, වෘත්තිනම්වන්නේය, දීඝො,
දීර්ඝාක්ෂරද, සංයොගාදිපුබ්බො, සංයොගාදීන්ටපූර්වවූ, රස්සොච,
හ්‍රස්වාක්ෂරද, ගරු(හවෙ), ගුරුනම්වන්නේය, රස්සොතු, කෙවල
හ්‍රස්වාක්ෂරවනාහි, ලහු(හවෙ), ලඝුනම්වන්නේය—19 යථා, ඊටඋ
දහරණමෙසේයි, ආ අස්ස අං අ යනුමෙහි ක්‍රමයෙන්උදහරණයි—
ආ යනු කෙවලදීර්ඝවූගුරුහට උදහරණය, අස්ස යනු සංයොගයක
ටපූර්වවූගුරුහටඋදහරණය—අං යනු නිග්ගහීතයකටපූර්වවූ ගුරුහට
උදහරණය,—අ යනු ලඝුහටඋදහරණයි—20 තන්තියා, පාළියට
හිතා, අනුකූලවූ, අසඤ්ඤිසංහිතා, මෙයින්පිටත්සෙසුසංහිතාදෙව්
ද, එවං, මේයථොක්තක්‍රමයෙන්, විඤ්ඤෙය්‍යා, දතයුතුහු, සංහිතා
ඉයිච, (සංහිතායනේන්හි) සංහිතානාමුදු, වණ්ණානං, අක්ෂරයන්
ගේ, අබ්‍යවධානතො, වර්ණව්‍යවධානකාලව්‍යවධානරහිතබැවින්
සංහිතායි, ලංවීමයි හෙවත් එක්කොටකීමයි—

චොම්සක්කසන්ධි.

---

ව්‍යතිමිශ්‍රකයන්සම්බන්ධවූසංහිතාකාණ්ඩය කියානුපතයි—

ජිනවචනයුත්තං හි ඉති, ජිනවචනයුත්තං හි යනු, සබ්බං, හැම තන්හි, අධිකාරයා, මතුමතු සූත්‍රයා සම්බන්ධ කරනුලැබේ—2 "ලිඞ්ගඤ්ච නිපච්චතෙ"—යනු පරිභාෂාසූත්‍රයි—ලිඞ්ගං යනුපදය, ච යනුපදය, නිපච්චතෙ යනුපදයි—ධාතු, ධාතුය, පච්චය, ප්‍රත්‍යය, විභත්ති. විභක්තිය. යනමොවුන්කෙරෙන්, වජ්ජිතං, වර්ජිතවූ, අත්ථයුත්තං, අර්ථයෙන්යුක්තවූ, සද්දරූපං, ශබ්දරූපය, ලිඞ්ගං නාම, ලිඞ්ගනම්වේ. ජිනවචනයොගතා, සර්වඥවචනයට යොග්‍යවූ, ලිඞ්ගං, ලිඞ්ග, ඉධ, මේකාත්‍යායණව්‍යාකරණයෙහි, ඨපීයති, තබනුලැබෙයි, නිපාදීයති ච. නිපදවනුලැබේ—3 බුධ ඉති, බුධ කියා, සිතෙන, ශබ්දශාස්ත්‍රඥයසිටිකල්හි—4 "තතො ච විභත්තියො"—යනු විභක්තිවිධානසූත්‍රයි-තතො යනුපදය, ච යනුපදය. විභත්තියො යනුපදයි-තස්මා ලිඞ්ගා පරා, ඒලිඞ්ගනුකෙරෙන්පරව, විභත්තියො විභක්ති, විභක්තීහුවෙත්, චකාරෙන, චශබ්දග්‍රහණයෙන්, තාසං, ඒවිභක්තින්ට, එකවචනාදිසඤ්ඤා ච, එකවචනබහුවචනසංඥවෝද, පඨමාදිසඤ්ඤා ච, ප්‍රථමාවිභක්ත්‍යාදිසංඥවෝදවෙත්—5 සියො අංයො නාහි සනං ස්මාහි සනං ස්මිංසු ඉති, සියො අංයො නාහි සනං ස්මාහි සනං ස්මිංසු යනමොහු, විභත්තියො, විභක්තීහු නම්වෙත්—6 සියො ඉති, සිය යෝය යනමොහුදෙදෙන, පඨමා, ප්‍රථමාවිභක්තීහුය—අංයො ඉති, අංය යොය යනමොහුදෙදෙන, දුතියා, ද්විතීයාවිභක්තීහුය—නාහිඉති නාය හිය යනමොහුදෙදෙන, තතියා, තෘතීයාවිභක්තීහුය, සනං ඉති, සය නංය යනමොහුදෙදෙන, චතුත්ථී, චතුර්ථීවිභක්තීහුය;—ස්මාහි ඉති, ස්මාය හිය යනමොහුදෙදෙන, පඤ්චමී, පඤ්චමීවිභක්තීහුය, සනං ඉති, සය නංය යනමොහුදෙදෙන, ඡට්ඨී, ෂෂ්ඨීවිභක්තිහුය,—ස්මිංසු ඉති, ස්මිංය සුය යනමොහුදෙදෙන, සත්තමී, සප්තමීවිභක්තීහුයි—7 තාසං, ඒවිභක්තීන්ගේ, අනියමප්පසඞ්ග, අනියමින්ප්‍රාප්තියක් ඇතිකල්හි, වත්තිච්ඡාවසා, වක්ත්‍රවිවක්ෂාවශයෙන්වේ—8 "ලිඞ්ගත්ථෙ පඨමා" යනු ප්‍රථමාවිභක්තිවිධානසූත්‍රයි—ලිඞ්ගත්ථෙ යනුපදය, පඨමා යනුපදයි—යො, යමෙක්, කම්මකත්තාදි, කර්මකර්තෘ ආදිවූ, අව්‍යතිරිත්තො, අන්‍යඅව්‍යතිරික්තව, අප්පත්තො, නොපැමිණියේද, සසරූපකො, ස්වකීයස්වරූපයෙන්සිටියේද, සුඛො, සුඛද; නොහොත් කාරකාදීන්හාඅමිශ්‍රද, සො, එහෙතම; ලිඞ්ගත්ථොනාම, ලිඞ්ගාර්ථනම්වේ—තස්ස, ඒලිඞ්ගාර්ථයාගේ, අභිධානමත්තෙ, කථනමාත්‍රයක්ඇතිකල්හි, පඨමාවිභත්ති හොති, ප්‍රථමාවිභක්තිවේ—

1 තස්සා'පනියමෙ—2 එකම්හි වත්තබ්බෙ එකවචනං සි—3 ද්වීසු තෙ'නෙකෙසු වචනං— එකස්සපස්ස වචනං එකවචනං— එවං බහුවචනං—අතොනෙවි—4 "සො"—අකාරන්තා පරස්ස සිස්ස ඕ හොති—5 "සරලොපොමාදෙසපච්චයාදිම්හි සරලොපෙ තු පකති" අංආදීසු පරෙසු සරස්ස ලොපො හොති තස්මිං කතෙ තු ක්වචාදිනා අසවණ්ණෙ පතෙන පකති හොති— නයෙ පරං යුත්තෙ—6 එවමුපරි සරලොපාදි—බුද්ධො—7 බහුම්හි වත්තබ්බෙ බහුවචනං යො—8 අතො වාතෙවි— "සබ්බයොනීනමාඑ—අකාරන්තා පරෙසං පඨමාදුතියායොනීනං යථාසඞ්ඛ්‍යං ආඑ වා හොන්ති—බුද්ධා—වා ති කිං?—අග්ගයො:—

1 තස්ස අපි, ඒ විභක්තීන්ගේද, අනියමෙ, අනියම් න් ප්‍රාප්තියක් ඇති කල්හි—2 එකම්හි වත්තබ්බෙ, එකම් අර්ථයක් කියම්නා කල්හි, එක වචනං, එකවචනවූ, සි, සි විභක්තියිවේ—3 අනෙන, මේකාරණයෙන, ද්වීවචන ඉති, කියනුලැබේනුයි, වචනං, වචනනම් වේ: එකස්සපස්ස, එකම් අර්ථයක්හුගේ, වචනං, කීම, එකවචනං, එකවචනනම්වේ-බහුවචනං, බහුවචනංයනුද, එවං, මෙසේමැයි-අතොනෙවි, අතොයනු, එව, මතුසූත්‍රයෙහිවැටේ 4 "සො" යනු ඕකාරාදේශවිධාන සූත්‍රයි—සි යනු පදය, ඔ යනු පදයි—අකාරන්තා, අකාරාන්ත නාමයාකෙරෙන්, පරස්ස, පරවූ, සිස්ස, සිවිභක්තියට, ඔ හොති, ඔකාරයක්ආදේශවේ—5 සරලොපො මාදෙසපච්චයාදිම්හි සරලොපෙ තු පකති" යනු සරලොප්ප්‍රකෘතිවිධාන සූත්‍රයි—සරලොපො යනුපදය, අමාදෙසපච්චයාදිම්හි යනු පදය, සරලොපෙ යනුපදය, තු යනුපදය, පකති යනුපදයි—අංආදීසුපරෙසු, අං ආදිප්‍රත්‍යයන්පරකල්හි, සරස්ස, ස්වරයාහට, ලොපොහොති, ලොප්වේ, තස්මිං කතෙතු, ඔහු ලොප්කළකල්හි වනාහි, ක්වචාදිනා "ක්වචාසවණ්ණං ලුත්තෙ" යන සූත්‍රයෙන්, අසවණ්ණෙ පතෙන, අසවර්ණයට පැමිණිකල්හි, පකතිහොති, ප්‍රකෘතිවත්වේ-යුත්තෙන, යුක්තවූ නයෙහි, පරං, පරාක්ෂරයාකරා, නයෙ, පැමිණවියයුක්තේයි-6 උපරිමත්තෙහිද, සරලොපාදි, ස්වරලොප්ප්‍රකෘතිආදිකාරිය, එවං, මෙසේ මැයි,—බුද්ධො, බුද්ධො යනුවේ—7 බහුම්හි වත්තබ්බෙ, බහුවූ අර්ථයක් කියම්නාකල්හි, බහුවචනං, බහුවචනවූ, යො, යො විභක්තිවේ——8 අතොනෙයි, අතොයනුද, වාඉති, වායනුද, එව, මතුසූත්‍රයෙහිවැටේ——"සබ්බයොනීනමාඑ" යනු ආකාර එකාරාදේශ විධානසූත්‍රයි සබ්බයොනීනං යනුපදය, ආඑ යනුපදයි—

අකාරන්තා, අකාරාන්ත නාමයා කෙරෙන්, පරෙසං

1 ලිඞ්ගත්ථෙ පඨමා තෙව — 2 "ආලපනෙ ච" — අභිමුඛීකරණමාලපනං තදධිකෙ ලිඞ්ගත්ථෙ පඨමා හොති — 3 "ආලපනෙ සි ගසඤ්ඤො" ති සිස්ස ගසඤ්ඤා — ගෙ ඉච්චෙව — 4 "අකාරපිතාද්‍යන්තානමා" — ගෙ පරෙ අකාරො පිතුසත්ථුඅන්තරාජාදීනමන්තො ච ආත්තං යාති — "ආකාරො වා" ති ගෙ පරෙ ආකාරස්ස රස්සො වා — 5 "සෙසතො ලොපං ගසිපි" — සො — සිං — සඤ්ච — "සබ්බතො ගස්ස වා" ත්‍යාදි නිද්දිට්ඨගණ්ඨ අවණ්ණිවණ්ණුවණ්ණාකාරන්තා සෙසා ඉතෙහි පරෙ ගසී ලුප්පන්තෙ — (හෙ) බුද්ධබුද්ධා — යො — බුද්ධා — 6 "කම්මත්ථෙ දුතියා" — යං කරොති තං කම්මං නාම තත්ථ දුතියා හොති — අං — බුද්ධං — යොස්ස එ — බුද්ධෙ —

---

පරවූ, පඨමදුතියායොනීනං, ප්‍රථමවිභක්තියවූ යොශබ්දයනමොවුන්ට, යථාසඞ්ඛ්‍යං පටිපාටියෙන්, වා; විකල්පයෙන්, ආඑහොන්ති, ආකාරඑකාරාදෙශයෝ වෙත් - බුද්ධා, බුද්ධායනුවේ - වාඉති, වායනු, කිං? කුමටය? අග්ගයො, අග්ගයොයනතන්හි ආකාරඑකාරාදෙශනොවන්නාපිණිසයි

1 ලිඞ්ගත්ථෙ ඉති, ලිඞ්ගත්ථෙ යනුද, පඨමා ඉති, පඨමා යනුද, එම් මතුසූත්‍රයෙහි වැටේ — 2 "ආලපනෙ ච" යනු ආලපනවිභක්තිවිධානසූත්‍රයි — ආලපනෙ යනුපදය, ච යනුපදයි — අභිමුඛීකරණං, අනභිමුඛයා අභිමුඛකිරීම, ආලපනං, ආලපනනම්වේ, තදධිකෙ, ඒ ආලපනාර්ථයක් අධිකකොටඇති, ලිඞ්ගත්ථෙ, ලිඞ්ගාර්ථයෙහි, පඨමා හොති, ප්‍රථමාවිභක්තිවේ — 3 ආලපනෙ සි ගසඤ්ඤො" ඉති, "ආලපනෙ සි ගසඤ්ඤො" යනසූත්‍රයෙන්; සිස්ස, සිවිභක්තිහට, ගසඤ්ඤා, ගසංඥවේ — ගෙ ඉති, ගෙ යනු, එව, මතුසූත්‍රයෙහි වැටේ — 4 "අකාරපිතාද්‍යන්තානමා" යනු ආකාරාදෙශවිධානසූත්‍රයි — අකාරපිතාද්‍යන්තානං යනුපදය, ආයනුපදයි — ගෙ පරෙ, ගසංඥයාපරකල්හි, අකාරො, අකාරයනමේද, පිතු, පිතුශබ්දය, සත්ථු, සත්ථුශබ්දය, අන්ත, අන්තශබ්දය, රාජාදීනං, රාජශබ්දයයනාදීන්ගේ, අන්තො ච, අන්තස්වරද, ආත්තං යාති, ආකාරාදෙශබවට පැමිණේ— "ආකාරො වා" ඉති, "ආකාරො වා යනසූත්‍රයෙන්, ගෙ පරෙ, ගසංඥයාපරකල්හි, ආකාරස්ස, ආකාරයහට, වා, විකල්පයෙන්, රස්සො, හ්‍රස්වවේ, 5 "සෙසතො ලොපං ගසිපි" යනු ගසංඥසිවිභක්තිලොපවිධානසූත්‍රයි—සෙසතො යනුපදය, ලොපං යනුපදය, ගසි යනුපදය, අපි යනුපදයි-සො, සො යනසූත්‍රය, සඤ්ච, සඤ්චයනසූත්‍රය, සබ්බතො ගස්සවාඉති, "සබ්බතො ගස්ස වා" යන, ආදිනිද්දිට්ඨෙහි, මේආදිසූත්‍ර යන්දක්වාකලඇදුප්‍රත්කෙරෙන්, අඤ්ඤ, අන්‍යවූ, අවණ්ණිවණ්ණු

1 තතියා චෙව— 2 "කත්තරි ච"—යො කරොති ස කත්තා නාම තස්ස තතියා හොති—නා—3 "අතො නෙන"—අකාරා පරො නා එනං යාති—බුද්ධෙන—හි—4 "සුහිස්වකාරො එ"—සුහිසු පරෙසු අකාරස්ස එ හොති—5 "ස්මාහිස්මිංනං ම්හාභිම්හි වා"—සබ්බස්සෙවස්ස පරෙසං ස්මාහිස්මිංනං යථාසඞ්ඛ්‍යං ම්හාභිම්හි ඉච්චෙතෙ වා හොන්ති—බුද්ධෙහි බුද්ධෙභි—6 "කරණෙ තතියා"—යෙන වා කයිරතෙ තං කරණං නාම තස්ස තතියා හොති—සඞ්ඛං කාකතුසමං—7 "සම්පදානෙ චතුත්ථී"—යස්ස දාතුකාමො රොචතෙ ධාරයතෙ වා තං සම්පදානං නාම තස්ස චතුත්ථී හොති—ස—අතො වා චෙව—8 "ආය චතුත්ථෙකවචනස්ස තු"—අකාරා පරස්ස චතුත්ථෙකවචනස්ස ආයො වා හොති—බුද්ධාය.

---

වණ්ණාකාරාන්තා, අවණ්ණ ඉවණ්ණ උවණ්ණ ඔකාරාන්තයන්නෙමො හු, සෙසා, ශෙෂයෝනම්වෙත්, නෙහි පරෙ, මුවුන්කෙරෙන්පරවූ, ගසි, ගය සිය යනමොහු දෙදෙන. ලොපයෙන, ලොප්කරනු ලැබෙත් (හෙ) බුද්ධබුද්ධා, (හෙ) බුද්ධබුද්ධා යනුවේ—යො. යොවිභක්තිවේ—බුද්ධා, බුද්ධා යනුවේ—6 "කම්මෙත්ථ දුතියා" යනු ද්විතීයාවිභක්තිවිධානසූත්‍රයි—කම්මත්ථෙ යනුපදය, දුතියා යනුපදයි—යං, යමක්, කරොති, කර්තෘතෙමෙ කෙරේද, තං, ඒ. කම්මං නාම, කර්මනම්වේ. තස්ස, ඒ කර්මාඛ්‍යයෙහි, දුතියාහොති, ද්විතීයාවිභක්තිවේ—අං, අංවිභක්තිවේ, බුද්ධං, බුද්ධං යනුවේ—යොනං, යොවිභක්තිහට එ, එකාරයෙක්ආදෙශවේ—බුද්ධෙ, බුද්ධෙ යනුවේ—

1 තතියා ඉති, තතියා යනු, එව, මතුසූත්‍රයෙහිවැටේ—2 "කත්තරි ච" යනු තෘතීයාවිභක්තිවිධානසූත්‍රයි, කත්තරි යනුපදය; ච යනුපදයි යො, කරොති යමෙක්, ක්‍රියාවක්කෙරේද, සො, හෙතෙම, කත්තා නාම, කර්තෘනම්වේ-තස්ස, ඒ කර්තෘඅඛ්‍යයෙහි, තතියා හොති, තෘතීයාවිභක්තිවේ. නා, නා විභක්තිවේ-3 "අතො නෙන" යනු එනාදෙශවිධානසූත්‍රයි—අතො යනුපදය, නා යනුපදය, එන යනුපදයි—අකාරා, අකාරාන්තනාමශබ්දකාරෙන්, පරො, පරවූ, නා, නාවිභක්ති තෙම, එනං යාති, එනයනාදෙශබවටපැමිණේ—බුද්ධෙන, බුද්ධෙන යනුවේ—හි, හිවිභක්තිවේ— 4 "සුහිස්වකාරො එ" යනු එකාරාදෙශවිධානසූත්‍රයි—සුහිසු යනුපදය, අකාරො යනුපදය, එ යනුපදයි—සුහිසු පරෙසු, සුය හිය යනමොවුන්පරකල්හි, අකාරස්ස, අකාරයාහට, එ හොති, එකාරයෙක් ආදෙශවේ—5 "ස්මාහිස්මිංනං ම්හාභි

1 "සාගමො සෙ"ති සෙ සකාරාගමො—බුඩසස—නං-දීඝතෙනවච,
2 "සුනංහිසුච"—සුනංහිසු පරෙසු සරානං දීඝො හොති චසද්දෙ
න කවචි න— බුඩානං— 3 "අපාදානෙ පඤචමී"—යසමා දපෙති භය.
මාදතෙත වා තදපාදානං නාම තසස පඤචමී හොති—තසමා—ශූ
තො ආඑතෙවච— 4 "සමාසමිංනං වා"—අකාරා පරෙසං සමාසමිං
නනං ආඑ වා හොනති—බුඩා බුඩමහා බුඩසමා—බුඩෙහි බුඩෙහි—
5 "සාමිසමිං ඡඨී"—යසස වා පරිගගහො තං සාමි නාම තසසා ඡඨී
හොති—බුඩසස බුඩානං— 6 "ඔකාසෙ සතතමී"—යො ආධාරො තං
ඔකාසං නාම තසස සතතමී හොති—සමිං—බුඩෙ බුඩමහි බුඩ,
සමිං—සු—බුඩෙසු—

---

මහි වා" යනු මිහාහි මහි යනාදෙශවිධායකසූත්‍රයි—සමාහිසමිනනං යනු
පදය, මිහාහිමහි යනුපදය, වා යනුපදයි—සබ්බසද්දෙහි, සියලුශබ්ද
යන්කොරෙන්, පරෙසං, පරවූ, සමාහිසමිනනං, සමා හි හිය සමිංය
යනමොවුන්ට, යථාසඞ්ඛ්‍යං, අනුක්‍රමයෙන්, මිහාහි මහි ඉති, මිහා හිය
මහිය යන්, එතෙ, මොහු. වා, විකල්පයෙන්, හොනති, වෙත්—
බුඩම්හි බුඩෙහි, බුඩෙහිබුඩෙහි යනුවේ— 6 'කරණෙ තතියා" යනු
තෘතීයාවිභක්තිවිධානසූත්‍රයි—කරණෙ යනුපදය, තතියා යනුපද
යි-යෙන, යමක්හුකරණකොටගෙණ, කයිරතෙවා කෘතෘතෙම,කර
නුලබන්නේහෝවේද, තං,ඒ, කරණං නාම, කරණනම්වේ—ත
ත්ථ, ඒකරණාර්ථයෙහි, තතියා හොති, තෘතීයාවිභක්තිවේ—සබ්බා
සියල්ල, කත්තුසමං, කර්තෘකාරකයහා සදෘශයි— 7 "සමපදානෙ චතු
ත්ථී" යනු චතුර්ථීවිභක්තිවිධානසූත්‍රයි-සමපදානෙ යනුපදය, චතුත්ථී
යනුපදයි—යසස, යමක්හට, දාතුකාමො වා, දෙනුකැමැත්තේහෝ
වේද, රොචතෙ වා, රුස්සන්නේහෝවේද, ධාරයතෙවා, දරනුලබන්
නේහෝවේද, තං, ඒ, සමපදානං නාම, සම්ප්‍රදාන නම්වේ, තත්ථ,
එසම්ප්‍රදානාර්ථයෙහි, චතුත්ථී හොති, චතුර්ථීවිභක්තිවේ—ස, සවිභ
ක්තිවේ—අතො ඉති, අතො යනුද, වා ඉති, වායනුද, එව, මතුකු
ත්‍රයෙහිවැවේ— 8 "ආය චතුත්ථෙකවචනසස" ති" යනු ආයයනා
දෙශවිධායකසූත්‍රයි—ආය යනුපදය, චතුත්ථෙකවචනසස යනුපදය,
තු යනුපදයි—අකාරා, අකාරන්තනාමයකෙරෙන්, පරසස, පරවූ,
චතුත්ථෙකවචනසස, චතුර්ථීවිභක්ති එකවචනයහට, වා, විකල්ප
යෙන්, ආය හොති, ආයයනාදෙශවේ—බුඩාය. බුඩාය යනුවේ—

1 බුද්ධො බුද්ධ සුඛං දදාති සරණො බුද්ධං භජෙ සාදරං
කිං බුද්ධෙන මහිද්ධයො'පි මුනයො, බුද්ධෙන ජාතා සුඛී
බුද්ධස්සෙව හිතං දදෙ පදමහං බුද්ධා ලභෙය්‍යා'චිරං
බුද්ධස්මිං න කිං කරෙ භවභයෙ භත්‍යස්තු බුද්ධෙ මම.

2 ඉතො පරං තතියා පඤ්චමීනඤ්ච චතුත්ථිඡට්ඨීනඤ්ච සරූපත්තා පඤ්චමීඡට්ඨියො හීයො උපෙක්ඛිතෙන— 3 අත්තසි—බ්‍රහ්මත්තසඛරාජාදිතො චෙව— 4 "සඛාච"–බ්‍රහ්මාදිතො සිස්ස ආ හොති--අත්තා- 5 "යොනමානො"ති බ්‍රහ්මාදිතො යොනං ආනොත්තං—අත්තා නො—(හෙ)අත්ත අත්තා —යො— අත්තානො—

---

1 "ස්වාගමො සෙ"ඉති, "ස්වාගමො සෙ"යන සූත්‍රයෙන්, සෙ, සවිභත්තිපරකල්හි, සකාරාගමො, සකාරයෙක් ආගමවේ—බුද්ධ, බුද්ධස්ස, බුද්ධස්සයනුවේ-නං, නං විභක්තිවේ-දීඝං ඉති, දීඝං යනු, ඒව, මිතුසූත්‍රයෙහිවැටේ– 2 "සුනංහිසු ච"යනු දීඝවිධානසූත්‍රයි–සුනංහිසු යනු පදය, චයනුපදයි—සුනංහිසු පරෙසු, සුය නංය හිය යන්නමොවුන් පරකල්හි, සරානං; ස්වරයන්ට; දීඝො හොති; දීඝවේ, ච සද්දෙන; චශබ්දග්‍රහණයෙන්; ක්වචි, කිසිතැනෙක්හි; න; දීඝනොවේ—බුද්ධානං; බුද්ධානං යනුවේ— 3 "අපාදානෙ පඤ්චමී"යනු පඤ්චමිවිභක්ති විධානසූත්‍රයි—අපාදානෙ යනුපදය; පඤ්චමී යනුපදයි—යස්මාද යමක්හු කෙරෙන්; අපෙති වා; පහවන්නේහෝවේද; භයං වා ;භය වන්නේහෝවේද; ආදදාති වා; ග්‍රහණයකරන්නේහෝවේද; තං; ඒ; අපාදානං නාම; අපාදාන නාම්වේ; තත්‍ර; ඒඅපාදානාර්ථයෙහි, පඤ්චමී හොති; පඤ්චමී විභක්තිවේ—ස්මා; ස්මා විභක්තිවේ—අතො ඉති; අතො යනුද; ආඑ ඉති; ආඑ යනුද; ඒව; මිතුසූත්‍රයෙහි වැටේ— 4 "ස්මාස්මින්නං වා"යනු 'ආකාරඒකාරාදෙශවිධානසූත්‍රයි—ස්මාස්මින්නං යනුපදය; වා යනුපදයි—අකාරා, අකාරාන්තනාමයාකෙරෙන්; පරෙසං; පරවූ; ස්මාස්මින්නං; ස්මාය ස්මිංය යන මොවුන්ට; වා; විකල්පයෙන්; ආඑ හොන්ති; ආකාරඒකාරාදෙශයෝවෙත්—බුද්ධා බුද්ධම්හා බුද්ධස්මා බුද්ධෙ බුද්ධෙහි යනුවේ— 5 "සාමිස්මිං ඡට්ඨී" යනු ඡට්ඨි විභක්තිවිධානසූත්‍රයි—සාමිස්මිං යනුපදය; ඡට්ඨී යනුපදයි-යස්ස; යමක්හුගේ; පරිග්ගහො වා අයිතියක්හෝවේද, තං; ඒ; සාමිනාම; සාමි නම්වේ—තත්‍ර; ඒ සාමාර්ථයෙහි; ඡට්ඨී හොති; ඡට්ඨී විභක්තිවේ-බුද්ධස්ස බුද්ධානං. බුද්ධස්සබුද්ධානං යනුවේ– 6 "ඔකාසෙසත්තමී"යනු සත්තමී විභක්ති විධානසූත්‍රයි—ඔකාසෙ යනුපදය, සත්තමී යනුපදයි—යො; යමෙක්; ආධාරො, ආධාරද; තං; ඒ; ඔකාසං නාම; ඔකාස නම්වේ; තත්‍ර; ඒඔකාසාර්ථයෙහි; සත්තමී හොති; සත්තමී විභක්තිවේ—

1 "බ්‍රහ්මත්තසඛරාජාදිතො අම්‍ානං" ති බ්‍රහ්මාදිතො අංවචනස්ස ආනා වා හොති—අත්තානං අත්තං අත්තානො—අත්තනා අත්තනා—ඡකෙබා— ජිනවචනානුරොධෙන එනාභාවො— 2 "අත්තා නෙතා හිස්මිමනත්තං" ති හිස්මි අත්තන්තස්ස අතො—අත්තනෙහි අත්තතෙහි—එවං කරණෙ— 3 "සස්සතො" ති තොකාරො—අත්තතො අත්තානං— 4 අම්හතුම්හනතුරාජබ්‍රහ්මත්තසඛසත්‍ථුපිතාදීහි ස්මා නාව—අම්හාදිතො ස්මා නාඉව හොති—අත්තනා— 5 "ත්තො ස්මිංනි" ති ස්මිනො නි—අත්තනි— 6 "අත්තන්තා" ති භාවති දෙද්සෙන සුම්හිව අතො—අත්තනෙසු— 7 රාජා අත්තා'ව—නා—සවිභත්තිස්ස රාජස්සෙවව—

---

ස්මිං; ස්මිං විභක්තිවේ—බුද්ධෙ බුද්ධම්හි බුද්ධස්මිං, බුද්ධෙ බුද්ධම්හි බුද්ධස්මිං යනුවේ. සු; සුවිභක්තිවේ—බුද්ධෙසු බුද්ධෙසු යනුවේ—

1 බුද්ධො, සර්වඥතෙම; බුද්ධ; පින්වත්වූසර්වඥය; බුද්ධං; සර්වඥයා; සරතො; සිහිකරන්නාහට; සුඛං; (ඓහලෞකිකපාරලෞකික)සැපය. දදාති; දෙන්නේය; තතො; එහෙයින්; බුද්ධෙන සර්වඥයාවිසින්; දුක්කරං; දුෂ්කරයක්නම්; කිං කිම? මහිද්ධයො; මහත්වූසෘද්ධිඇති; මුනයො අපි; ශාරිපුත්‍රමහාමෞද්ගල්‍යායනාදිමහාශ්‍රාවකයෝ පවා; බුද්ධෙන; සර්වඥයාකාරණකොටගෙණ; සුඛිතා; සුවපත්වූහ;(හෙවත් නිර්වාණසුඛප්‍රාප්තවූහ) (එහෙයින්)බුද්ධසෙව; සර්වඥයාහටම; මනං, හිත; දදෙ; දෙමි; හෙවත්බුද්ධුන්මසිහිකරමි) (එහෙයින්) අහං; මම; බුද්ධා; සර්වඥයාකෙරෙන්; අච්චුතං; චුතිරහිත්වූ; පදං; නිර්වාණපදය; ලභෙය්‍යං; ලබමි (සිහිකාලමාත්‍රයකින් නිවන්ලැබේදයත්? බුද්ධස්ස. සර්වඥයාගේ; ඉද්ධි; සෘද්ධිතොම; කිං නකරෙ; කුමක්නම්නොකරන්නීද?—(සියල්ලකරන්නීයි) (එහෙයින්) මම; මාගේ; භවනි; භක්තිතොම භවෙභවෙ; ජන්මජන්මයෙහි; බුද්ධෙ; සර්වඥයාකෙරෙහි; අත්‍ථු; වේවා—2 ඉතො පරං, මෙසින්මතොත්හි; තතියාපඤ්චමීනංච; තෘතීයාපඤ්චමීවිභක්තීන්ගේද; චතුත්‍ථිඡට්ඨීනංච; චතුර්ත්‍ථීෂෂ්ඨීවිභක්තීන්ගේද; සරූපතා; සමානස්වරූපබැවින්, පඤ්චමීඡට්ඨීයො; පඤ්චමීෂෂ්ඨිවිභක්තීහු, භීයො; බොහෝසෙයින්; උපෙක්ඛනෙන; උපෙක්ෂාකරනුලැබෙත්— 3 අත්තානි; අත්තශබ්දයාකෙරෙන් පරව සිවිභක්තිවේ—බ්‍රහ්මත්තසඛරාජාදිතො ඉති; බ්‍රහ්මත්තසඛරාජාදිතො යනු; එව; මතුසූත්‍රයෙහිවැටේ- 4 "ස්‍යාච" යනු ආකාරාදෙශවිධානසූත්‍රයි;—සි යනුපදය; අං යනුපදය; ච යනුපදයි—බ්‍රහ්මාදිතො; බ්‍රහ්මශබ්දාදීන්කෙරෙන්පරවූ; සිස්ස; සිවිභක්තිහට; ආ හොති; ආකාරයෙක්ආදේශවේ—අත්තා යනුවේ—5 "යොනමානො" ති

1 “බ්‍රහ්මත්තසඛරාජාදිතො අමානං”ති බ්‍රහ්මාදිතො අංවචනස්ස ආනං වා හොති—අත්තානං අත්තං අභාසෙසි—අත්තෙන අත්තනා —පච්චෙකබ—ජිනවචනානුරොධෙන එනාභාවො—2 “අත්තන්තා හිස්මිමනත්තං”තිහිම හි අත්තන්තස්ස අනො—අත්තනෙහි අත්තනෙභි—එවං කරණෙ—3 “සස්සනො”ති නොකාරො—අත්තනො අත්තානං—4 “අම්හතුම්හනන්තුරාජබ්‍රහ්මත්තසඛසත්ථුපිතාදීහි ස්මා නාව—අම්හාදිතො ස්මා නාඉව හොති—අත්තනා—5 “ත්තො ස්මින්නි”ති ස්මිනො නි—අත්තනි—6 “අත්තත්තං”ති භාවනිද්දෙසෙන සුඛිව අනො—අත්තනෙසු—7 රාජා අත්තා'ව—නා—සබ්බනාමස්ස රාජස්සෙව—

---

“යොනමානො”යනසූත්‍රයෙන්, බ්‍රහ්මාදිතො,—බ්‍රහ්මශබ්දාදීන්කෙරෙන්පරවූ, යොනං, යොවිභක්තීන්ට, ආනො නත්තං, ආනොයනාදෙශවේ—අත්තානො යනුවේ—(හෙ)අත්ත අත්තා යනුවේ—යො, යොවිභක්තිවේ—අත්තානො යනුවේ—

1 “බ්‍රහ්මත්තසඛරාජාදිතො අමානං”ඉති, “බ්‍රහ්මත්ත සඛරාජාදිතො අමානං”යන්සූත්‍රයෙන්, බ්‍රහ්මාදිතො, බ්‍රහ්මශබ්දාදීන්කෙරෙන් පරවූ, අංවචනස්ස, අංවිභක්තිහට, වා, විකල්පයෙන්, ආනං, ආනංයනාදෙශවේ—අත්තානං අත්තං අත්තානො යනුවේ—අත්තන අත්තනා යනුවේ—ඡකොව, එක්පක්ෂයෙක්හි—ජිනවචනානුරොධෙන්, සර්වඥවචනයටඅවිරුද්ධපරිද්දෙන්, එනාභාවො, එනාය නාදේශයාගේනොවීමවේ—2 “අත්තනෙතා හිස්මිමනත්තං”ඉති, “අත්තන්තා හිස්මිමනත්තං” යන්සූත්‍රයෙන්, හිම් ?, හිවිභක්තිපරකල්හි; අත්තන්තස්ස, අත්තශබ්දයාගේඅත්තයහට, අනො; අනොයනාදෙශවේ-අත්තනෙහි අත්තනෙභි යනුවේ-කරණෙ, කරණකාරකයෙහිදු, එවං, මෙසේමැයි-3 “ස ස්ස නො”ඉති, “සස්සනො”යන්සූත්‍රයෙන්; ඉත්ථාකාරො, නොයනාදෙශවේ-අත්තනො අත්තානං යනුවේ—4 “අම්හතුම්හනන්තුරාජබ්‍රහ්මත්තසඛසත්ථුපිතාදීහි ස්මා නා'ව” යනු නාවත්විධානසූත්‍රයි—'අම්හතුම්හනන්තුරාජබ්‍රහ්මත්තසඛසත්ථුපිතාදීහි යනුපදය, ස්මා යනුපදය, නා යනුපදය, ඉව යනුපදයි—අම්හාදිතො, අම්හශබ්දාදීන්කෙරෙන්පරවූ, ස්මා, ස්මාවිභක්තිහට, නා ඉව හොති, නා විභක්තිමෙන්වේ—අත්තනා යනුවේ—5 “ත්තො ස්මින්නි”ඉති, “ත්තො ස්මින්නි”යන්සූත්‍රයෙන්, ස්මිනො, ස්මිංවිභක්තිහට, නි, නියනාදෙශවේ—අත්තනි යනුවේ—6 “අත්තත්තං”ඉති, “අත්තත්තං”යන, භාවනිද්දෙසෙන, භාවනිර්දේශයෙන්, සුඛිව, සුවිභක්තිපරකල්හිද, අනො, අනොයනාදෙශවේ—අත්තනෙසු,

1 "නාම්හි රඤ්ඤා වා" — නාම්හි සවිභත්තිස්ස රාජසද්දස්ස රඤ්ඤා වා හොති — රඤ්ඤා, රාජිනා — 2 "රාජස්ස රාජු සුනංහිසු ච" — සුනංහිසු පරෙසු රාජස්ස රාජු හොති චකාරෙන ක්වචි න — 3 "සුනංහිසු ච"ති දීඝො — රාජූහි රාජූහි, රාජෙහි රාජෙහි — සවිභත්තිස්සෙ ත්‍යාධිකාරො — 4 "රාජස්ස රඤ්ඤොරාජිනො සෙ" ති සෙ රඤ්ඤො, රාජිනො හොන්ති — රඤ්ඤො, රාජිනො — 5 "රඤ්ඤං නම්හි වා"ති නම්හි රඤ්ඤං වා — රඤ්ඤං රාජූනං රාජානං — 6 සමාසස්ස නාතුලත්තතා නාම්හි රඤ්ඤා වා — රඤ්ඤා, රාජසමා — 7 "ස්මිම්හි රඤ්ඤෙරාජිනි"ති ස්මිම්හි රඤ්ඤෙරාජිනි හොන්ති — රඤ්ඤෙ රාජිනි — රාජූසු රාජෙසු — 8 ගුණවන්තුසි — සවිභත්තිස්ස න්තුස්සන්තත්ව — 9 "ආ සිම්හි"ති සිම්හි න්තුස්ස ආ — ගුණවා —

---

යනුවේ—7 රාජා, රාජශබ්දයතෙම, අත්තා ඉව, අත්තශබ්දය මෙන්—නා, නාවිභක්තිවේ—

සවිභත්තිස්ස ඉති, සවිභත්තිස්ස යනුද, රාජස්ස ඉති, රාජස්ස යනුද, එව, මතුසූත්‍රයෙහිවැටේ

1 "නාම්හි රඤ්ඤා වා,, යනු රඤ්ඤා ආදේශවිධානසූත්‍රයි—නාම්හි යනුපදය, රඤ්ඤා යනුපදය, වා යනුපදයි- නාම්හි, නාවිභක්තිපරකල්හි, සවිභත්තිස්ස, විභක්තිසහිතවූ, රාජසද්දස්ස, රාජශබ්දයහට, වා, විකල්පයෙන්, රඤ්ඤා හොති, රඤ්ඤා ආදේශවේ-රඤ්ඤා, රාජිනා යනුවේ—2 "රාජස්ස රාජු සුනංහිසු ච" යනු රාජු ආදේශවිධානසූත්‍රයි- රාජස්ස යනුපදය, රාජු යනුපදය, සුනංහිසු යනුපදය, ච යනුපදයි— සුනංහිසුපරෙසු, සු නං හි යන මොවුන්පරකල්හි, රාජස්ස, රාජ ශබ්දයහට, රාජු හොති, රාජු ආදේශවේ' චකාරෙන, චශබ්දග්‍රහණයෙන්, ක්වචි, කිසිතැනෙක්හි, න, රාජු (ආදේශ)නොවේ—

"සුනංහිසු ච"ඉති, "සුනංහිසු ච"යනුසූත්‍රයෙන්, දීඝො, දීර්ඝය කල්හි, රාජූහි රාජූහි රාජෙහි රාජෙහි යනුවේ—සවිභත්තිස්ස ඉති, සවිභත්තිස්ස යනු, අධිකාරො, මතුමතුසූත්‍රයා සම්බන්ධකරනුලැබේ- 4 "රාජස්ස රඤ්ඤොරාජිනො සෙ"ඉති, "රාජස්ස රඤ්ඤොරාජිනො සෙ"යනුසූත්‍රයෙන්, සෙ, සවිභක්තිපරකල්හි, රඤ්ඤොරාජිනො හොන්ති, රඤ්ඤොරාජිනො ආදේශවෙත්—රඤ්ඤො, රාජිනො යනුවේ—5 "රඤ්ඤං නම්හි වා"ඉති, "රඤ්ඤං නම්හි වා"යනුසූත්‍රයෙන්, නම්හි, නංවිභක්තිපරකල්හි, වා, විකල්පයෙන්, රඤ්ඤං, රඤ්ඤං ආදේශවේ—රඤ්ඤං රාජූනං රාජානං යනුවේ -6 සමාසස්ස, සමාස වි භක්තිතවා, නාතුලත්තතා, නාවිභක්ති ආදේශවූ බැවින්, නාම්හි,

1 යොම්හි පඨමෙ චෙව—2 "න්තුස්ස න්තෝ"—පඨමෙ යොම්හි ස විභත්තිස්ස න්තුස්ස න්තෝකාරෝ හොති—ගුණවන්තෝ—3 සුනංහිසු අත්තං චෙව—4 "න්තුස්ස න්තා යොසු ච"—සුනංහිසු යොසු චකාරෙන අඤ්ඤෙසු'පි පරෙසු න්තුස්ස න්තා අත්තං යාති—"ගුණවන්තා"—සවිභත්තිස්සෙ න්තාධිකාරො—අංඉ චෙව—5 "අවණ්ණං ච ගෙ"—ගෙ පරෙ සවිභත්තිස්ස න්තුස්ස අං අ ආ. හොන්ති—(භො) "ගුණවං ගුණව ගුණවා"—යො—ගුණවන්තො ගුණවන්තා—අත්තං ගුණවන්තං ගුණවන්තෙ—6 "තොතිතා සස්මිංනාසු"ති සවිභත්තිස්ස න්තුස්ස නාම්හි තා ඉස තොතාතෙරා ස්මිම්හි ති ච වා—"ගුණවතා ගුණවන්තෙන ගුණවන්තෙහි ගුණවන්තෙභි—"ගුණවතො" ගුණවන්තස්ස—

---

නාවිභක්තිපරකල්හි, වා, විකල්පයෙන්, රඤ්ඤ. රඤ්ඤ යනාදෙශ වේ—"රඤ්ඤ"රාජසමා යනුවේ—7 "ස්මිම්හි රඤ්ඤරාජිනි" ඉති, ස්මිම්හි රඤ්ඤරාජිනි" යනසූත්‍රයෙන්; ස්මිම්හි, ස්මිංවිභක්තිපරකල්හි, රඤ්ඤරාජිනි හොන්ති, රඤ්ඤ රාජිනි යනාදෙශයෝවෙත්—රඤ්ඤරාජිනි"රාජ්ඤ රාජ්ඤ යනුවේ—8 ගුණවන්තුසි, ගුණවන්තු ශබ්දයෙකෙරෙන්පරවන විභක්තිවේ—සවිභත්තිස්ස ඉති, සවිභත්තිස්ස, යනුද, න්තුස්ස ඉති, න්තුස්ස යනුද, එව, මතුසූත්‍රයෙහිවැටේ—9 "ආසිම්හි" ඉති, 'ආසිම්හි" යනසූත්‍රයෙන්, සිම්හි, සිවිභක්තිපර කල්හි, න්තුස්ස, න්තුශබ්දයට, ආ; ආකාරයෙක්ආදෙශවේ—"ගුණවා' යනුවේ—

1 'යොම්හි ඉති, යොම්හි යනුද, පඨමෙ ඉති, පඨමෙ යනුද, එව, මතු සූත්‍රයෙහි වැටේ—2 "න්තුස්ස න්තෝ"යනු න්තෝ යනාදෙශවිධාන සූත්‍රයි—න්තුස්ස යනුපදය, න්තෝ යනුපදයි—පඨමෙ යොම්හි, ප්‍රථමා යොවිභක්තිපරකල්හි, සවිභත්තිස්ස, විභක්තිසහිතවූ, න්තුස්ස, න්තු ශබ්දයහට, න්තෝකාරෝ හොති, න්තෝ යනාදෙශවේ—"ගුණවන්තෝ"යනුවේ—3 සුනංහිසු ඉති, සුනංහිසු යනුද, අත්තං ඉති, අත්තං යනුද, එව, මතු සූත්‍රයෙහිවැටේ—4 "න්තුස්ස න්තා යොසු ච"යනු අත්තවිධානසූත්‍රයි—න්තුස්ස යනුපදය, න්තා යනුපදය, යොසු යනුපදය, ච යනුපදයි—සුනංහිසු, සුය නංය හිය යනුමේවා වූත්පරකල්හිද, යොසු, යොවිභක්තිපරකල්හිද, චකාරෙන, චශබ්දග්‍රහණයෙන්, අඤ්ඤෙසු'පි පරෙසු, සෙසුවිභක්තීන්පරකල්හිද. න්තුස්ස න්තා, න්තුශබ්දයාගේ අන්තයෙනම, අත්තං යාති, අකාරබවට පැමිණේ,—"ගුණවන්තා"යනුවේ—සවිභත්තිස්ස ඉති; සවිභත්තිස්ස

රයෙක් ආදෙශවේ—3 "ඉමස්සිදන්ත්‍යාදිගතොථෙසු ච" යනු ඉකා
රාදෙශ විධානසූත්‍රයි-ඉමස්ස යනු පදය ඉ යනු පදය ඇත්‍යාදිගතො
ථෙසු යනු පදය චයනු පදයි—අං ආදිසු පරසු, අං ආදි ප්‍රත්‍යයන්
පරකල්හි; ඉමස්ස ඉ හොති, ඉමිශබ්දයහට ඉකාරයෙක් ආදෙශවේ-
ඉතො, යනුවේ—4 "සබ්බස්සෙතස්සාකාරො වා" ඉති, "සබ්බස්සෙත
ස්සාකාරො වා" යන සූත්‍රයෙන්; තොථෙසු, තොථ දෙක යන මොවුන්
පරකල්හි; එතස්ස, එතශබ්දයාහට; වා විකල්පයෙන්; අත්තං,
අත්ව වේ—අතො, එතතො, යනු වේ—එත්ථ, එත්ථස්සයෙහි;
සරලොපාදිනා' සරලොපාදිසූත්‍රයෙන්; අකාරලොපො, අකාර
ලොප්වේ—1 "ත්‍රතොථෙසුච' ඉති "ත්‍රතොථෙසුච" යන සූත්‍රයෙන්;
කිස්ස, කිංශබ්දයහට; කු, කු යනාදෙශ වේ—කුතො, යනු වේ—
2 "ක්වචිතො"ඉති, "ක්වචිතො" යන; සුත්තවිධාකරණෙන, සූත්‍ර
විධාකරණයෙන්, සත්තම්‍යත්ථෙ ච, සප්තම්‍යර්ථයෙහිද; තො හො
ති, තොප්‍රත්‍යය වේ—ආදිස්මිං, යන වාක්‍යයෙහි ආදිතො, යනු
වේ—3 "ත්‍රථ සත්තමියා සබ්බනාමෙහි" ඉති, "ත්‍රථ සත්තමියා ස
බ්බනාමෙහි" යන සූත්‍රයෙන්; සත්තම්‍යත්ථෙ, සප්තම්‍යර්ථයෙහි; ත්‍ර
ථප්පච්චයා හොන්ති; ත්‍ර ථ ප්‍රත්‍යයෝ වෙත්—සබ්බස්මිං, යන වා
ක්‍යයෙහි; සබ්බත්‍ර, සබ්බත්ථ, යනු වේ— ඉතරං, ඉත්ථ වේ—අත්‍ර අත්
එත්ථ, අත්‍ර අත්ථ එත්ථ යනුද; එවං, මෙසේමැයි— 4 "ත්‍රෙ නිච්චං"
ඉති, "ත්‍රෙ නිච්චං" යන සූත්‍රයෙන්; පුබ්බෙ, පූර්වයෙහි; එතස්ස

චකාරේන හිංචනං දාචනංසු ච—කුහිං කුහං කුහිංචනං—1 "ත
ම්හා ච"ති හිංහං—තහිං තහං—"යතො හිං"ති හිං—යහිං—
"ඉමස්මා හධා ච"ති හ ධා—ඉහ ඉධ—"සබ්බතො ධි"ති ධි-සබ්බධි.
2 කාලෙත්‍යධිකාරො—"කිංසබ්බඤ්ඤෙකයකුහි දාදාචනං"ති කිං
ආදිතො දාදාචනං ච—කස්මිං කාලෙ කදා කුදාචනං-"සබ්බස්ස සො
දාම්හි වා"ති සබ්බස්ස සො වා—සදා සබ්බදා—"තම්හා දානි ච"ති
දානිදා ච—තදානි තදා—අදාදිනා ඉමසද්දා සමානාපරෙහි ච යථාස
ඞ්ඛ්‍යං ජ්ජ ජ්ජුපච්චයා ඉමසමානත්තං අජ්ජ ච—

---

ඒතශබ්දයහට; අ, අකාරයෙක් ආදෙශවේ—කුත්‍ර, කුතො, යනු වේ—
5 "සෙසෙසුච"ඉති, "සෙසෙසු ච" යන සූත්‍රයෙන්; කාදෙශය, ක
කාරාදෙශ කිරීම් කල්හි; කහං, යනු වේ—6 "කිස්මා වො ච" ඉති,
"කිස්මා වො ච" යන සූත්‍රයෙන්; වප්පච්චයෙය, වප්‍රත්‍යයවේ—"කි
ස්ස ක වෙ ච"ඉති, කිස්ස කවෙච"යන සූත්‍රයෙන්; කො, කකාර
යෙක් ආදෙශ වේ—කකාර, කකාරයෙහිවූ; අකාරලොපො, අකා
රයාගේලොප් වේ—ක්ව, කුව වේ—7 "හිංහංහිංචනං"ඉති, "හිංහං
හිංචනං"යන සූත්‍රයෙන්; කිම්හා, කිංශබ්දයා කෙරෙන් පරව; හිං
ආදිපච්චයා, හිංආදිප්‍රත්‍යයෝ වෙත්—"කුහිංහාසුච"ඉති, කුහිං
හංසුච" යන සූත්‍රයෙන්; කිස්ස, කිංශබ්දයහට; කු, කුයනාදෙශවේ;

චකාරෙන, චශබ්දග්‍රහණයෙන්, හිංචනං දාචනංසු ච' හිංචනංය
දාචනංය යන මොවුන් පරකල්හිද වේ—කුහිං කුහං කුහිංචනං,
යනුවේ—1 "තම්හා ච"ඉති, "තම්හා ච" යන සූත්‍රයෙන්; හිංහං,
හිංහංප්‍රත්‍යයෝ වෙත්—තහිං තහං, යනු වේ—"යතො හිං"ඉති,
"යතො හිං" යන සූත්‍රයෙන්; හිං, හිංප්‍රත්‍යයවේ—යහිං, යනු වේ—
"ඉමස්මා හධාච"ඉති, "ඉමස්මා හධා ච" යන සූත්‍රයෙන්; හධා, හ
ධාප්‍රත්‍යයෝ වෙත්—ඉහ ඉධ, යනුවේ—"සබ්බතො ධි"ඉති, "සබ්බ
තො ධි" යන සූත්‍රයෙන්, ධි, ධිප්‍රත්‍යය වේ—සබ්බධි, යනු වේ—
2 කාලෙ ඉති, කාලෙ යනු; අධිකාරො, මතුමතු සූත්‍රහා සම්බන්ධ
කරනු ලැබේ—"කිංසබ්බඤ්ඤෙකයකුහි දාදාචනං"ඉති, "කිංසබ්බ
ඤ්ඤෙකයකුහි දාදාචනං" යන සූත්‍රයෙන්; කිංආදිතො, කිංආදිශබ්ද
යන් කෙරෙන්; දා දාචනං ච' දාප්‍රත්‍යයද දාචනංප්‍රත්‍යයද වෙත්—
කස්මිං කාලෙ, යන වාක්‍යයෙහි; කදා කුදාචනං යනු වේ—"සබ්බ
ස්ස සො දාම්හි වා"ඉති, "සබ්බස්ස සො දාම්හි වා" යන සූත්‍රයෙන්,
සබ්බස්ස, සබ්බශබ්දයහට; වා, විකල්පයෙන්; සො, සකාරයෙක් ආ
දෙශ වේ—සදා සබ්බදා, යනු වේ—"තම්හා දානිච"ඉති, "තම්හා

අජ්ජ සජ්ජු අපරජ්ජු—“ඉමස්මා රහිධුනාදානි ච”ති රහාදිපච්චයා—“එත රහිම්හි”ති ඉමස්ස එතො—එතරහි—“අ ධුනාම්හි ච”ති, ඉමස්ස අ—අධුනා ඉදානි—1 ලොපඤ්චෙව—“සබ්බාසමාවුසොපසග්ගනිපාතාදීහි ච”—එතෙහි පරා සබ්බා විභත්ති ලුප්පන්ති—ත්වං ආවුසො තුම්හෙ ආවුසො.

2 උපසග්ගනිපාතා වුච්චන්තෙ—ප පරා නි නී උ දු සං වි අව අනු පරි අධි අභි පති සු ආ අති අපි අප උප—එතෙ වීසතුපසග්ගා. 3 ච න ව වා මා හි ඛි චි ඛු තු නු චෙ රෙ හෙ ජෙ වෙ වො ඛො නො තො යං තං නං කිං; හන්ද කිර එව හීව යාව තාව වත වථ අථ අහ ඉංඝ තග්ඝ ආම නාම නූන පුන පනා ආහ සහ මුසා සක්කා ලබ්භා හෙඨා ආරා දූරා දිවා තථා විනා නානා අද්ධා මුධා මිච්ඡා පච්ඡා ආවි සක්ඛි සච්ඡි සජ්ඣ බහි යදි ඉති කිඤ්ති අප්ප සොත්ථි ඛලු නනු කිමු අස්සු ෂගෙහ සචෙ හවෙසුචෙ

---

දානි ච” යන සූත්‍රයෙන්; දානි, දානිප්‍රත්‍යයද; ද ච, දප්‍රත්‍යයද වෙත්—තදානි තදා, යනු වේ—යදාදිනා, යදාදිසූත්‍රයෙන්; ඉමසද්ද සමානා පරෙහි ච’ ඉමශබ්ද සමානශබ්ද අපරශබ්ද යන මොවුන් කෙරෙන් පරව; යථාසඞ්ඛ්‍යං, පිළිවෙළින්; ජ්ජ ජ්ජුපච්චයා, ජ්ජ ජ්ජුප්‍රත්‍යයෝ වෙත්; ඉමස්සමානානං, ඉමශබ්ද සමානශබ්ද යන මොවුන්ට; අසා ච’ අකාර සකාරාදෙශයෝද වෙත්—

අජ්ජ සජ්ජු අපරජ්ජු, යනු වේ—“ඉමස්මා රහිධුනාදානි ච” ඉති, “ඉමස්මා රහිධුනාදානි ච” යන සූත්‍රයෙන්; රහිආදිපච්චයා, රහිආදිප්‍රත්‍යයෝ වෙත්—“එත රහිම්හි”ඉති, “එත රහිම්හි” යන සූත්‍රයෙන්; ඉමස්ස, ඉමශබ්දයහට; එතො, එතාදෙශ වේ—එතරහි, යනු වේ—“අ ධුනාම්හි ච” ඉති, “අ ධුනාම්හි ච” යන සූත්‍රයෙන්; ඉමස්ස, ඉමශබ්දයහට; අ, අකාරයෙක් ආදෙශ වේ—අධුනා ඉදානි, යනු වේ—1 ලොපං ඉති, ලොපං යනු; එව, මිතු සූත්‍රයෙහි වැටේ—“සබ්බාසමාවුසොපසග්ගනිපාතාදීහි ච” යනු සියලු විභක්ති ලොප්විධාන සූත්‍රයි සබ්බ සං යනු පදය ආවුසොපසග්ගනිපාතාදීහි යනුපදය ච යනු පදයි—එතෙහි පරා, මොවුන් කෙරෙන් පරවූ; සබ්බා විභත්ති, සියලු විභක්තීහු; ලුප්පන්තෙ, ලොප්කරනු ලැබෙත්—ත්වං ආවුසො තුම්හෙ ආවුසො, යනු වේ.

2 උපසග්ගනිපාතා, උපසර්ග නිපාතයෝ; වුච්චන්තෙ, කියනු ලැබෙත්—ප පරා නි නී උ දු සං වි අව අනු පරි අධි අභි පති සු ආ අති අපි අප උප, යන; එතෙ වීසති, මොහු විසිදෙන; උපසග්ගා, උපසර්ගයෝ නම් වෙත්.

සුවෙවා අපරෙ පුරෙ නමො තිරො අධො අථො අහො රහො හි මිච්ඡා හිය්‍යො අඤ්ඤතා පාතො සුදං කිල්ලං එවං ධුවං අලං හලං සයං සායං සමං සාමං කාමං පාරං ඔරං චිරං හුරං අහ සහං උච්චං නීචං සණිං සද්ධිං; අථවා අඤ්ඤතරා ආරකා බාහිරා බහිද්ධා යාවතා තාවතා සමන්තා සාමන්තා ආමන්තා සම්මුඛා වරහි තරහි සම්පති ආයති උපරි යාවදෙ තාවදෙ තිරියං සනිකං සසක්කං; එතරහි එත්තාවතා පරම්මුඛා කිත්තාවතා අඤ්ඤදත්ථු සෙය්‍යථීදං; අප්පෙවනාම; භිය්‍යොසොමත්තාය—ඉච්චාදයො නිපාතා.

1 සදිසා යෙ තිලිඞ්ගෙසු සබ්බාසු ච විභත්තිසු,
වචනෙසු ච සබ්බෙසු තෙ නිපාතා ති කිත්තිතා.

2 යථා-උච්චං රුක්ඛො—ලතා-ඝරං වා—උච්චං රුක්ඛා (පෙ) රුක්ඛං රුක්ඛං රුක්ඛෙන රුක්ඛස්ස රුක්ඛස්මා රුක්ඛෙ වා ඉච්චාදි—උච්චං රුක්ඛො රුක්ඛා වා ඉච්චාදි—එවං ලතා ඝරානි.

---

3 ච නා—පෙ—තං කිං, යන මොහු එකාක්ෂර නිපාතයෝයි—හන්ද කිර—පෙ—සණිං සද්ධිං, යන මොහු ද්‍ව්‍යක්ෂර නිපාතයෝයි—

අථවා අඤ්ඤතරා—පෙ—සනිකං සසක්කං, යනු ත්‍ර්‍යක්ෂර නිපාතයෝයි—එතරහි—පෙ—සෙය්‍යථීදං, යනු චතුරක්ෂර නිපාතයෝයි-

අප්පෙවනාම, යන පඤ්චාක්ෂර නිපාතයි—භිය්‍යොසොමත්තාය, යනු ෂඩක්ෂර නිපාතයි—ඉති ආදයො, යන මේ ආදීහු නිපාතා, නිපාතයෝ නම් වෙත්.

1 යෙ, යම් ශබ්දකෙනෙක්; තිලිඞ්ගෙසු, (ස්ත්‍රී පුන්නපුංසක සඞ්ඛ්‍යාත) ලිඞ්ගත්‍රයෙහිද; සබ්බාසු ච විභත්තීසු, (ප්‍රථමා විභක්ත්‍යාදි) සියලු විභක්තීන්හිද; සබ්බෙසු වචනෙසු ච, (එක වචන බහු වචන සඞ්ඛ්‍යාත) සියලු වචනයෙහි ද; සදිසා, සමානරූප ඇත්තාහුද; තෙ, ඔහු; නිපාතා ඉති, නිපාතයෝයයි; කිත්තිතා, කියන ලද හුයි.

2 යථා, (ඊට උදාහරණ) මෙසේයි—උච්චං රුක්ඛො ලතා ඝරං වා, උච්ච රුක්ඛො ලතා ඝරං කියාහෝ වේ—උච්චං රුක්ඛා (පෙ) රුක්ඛ—පෙ—රුක්ඛෙ වා ඉති, රුක්ඛෙ වා යන; ආදී, මේ ආදිය වේ—3 උච්චං රුක්ඛො රුක්ඛා වා ඉති, උච්චං රුක්ඛො රුක්ඛා වා යන ආදී, මේ ආදිය වේ—ලතා ඝරානි, ලතා ඝරානි යනුද එවං, මෙමසේමැයි.

1 උභයෙසු විභත්‍යත්ථක්‍රියාදෙසසමයදිසාගුණනෙති,
සබ්බාපි යථායොගං විභත්‍යො අඤ්ඤෙහි තු පඨමා.

2 තං යථා—අධි අනොතා සද්දෙහි සත්තමී—සයං සද්දා තතියා ඡට්ඨී ච—නමො සද්දා පඨමා දුතියා ච—පාරං සද්දා සත්තමී—දිවා සද්දා පඨමා, දුතියා සත්තමී ච—හෙට්ඨා සද්දා සත්තමී—උච්චං සද්දා සබ්බාපි—ප සද්දා ච ච සද්දා ච පඨමා—හෙ සද්දා ආලපනෙ පඨමා—තථා අඤ්ඤෙහිපි—3 උපසග්ගා, සඞ්ඛාපි සද්දන්තරෙන සහ පයුජ්ජන්තෙ—නිපාතා, තු—එකම්පි විසුම්පි—යථා—පහාරො පහරති—සා ච ඉසා ච හාසති වා, කරෙස්සති වා, සොභිතාදි.

1 එකොකාලිඞ්ගං විලිඞ්ගං තිලිඞ්ගං චාප්‍යලිඞ්ගිකං,
චතුද්ධෙති නාමං නාමං තම්මතාපරං කිත්තිතං.

## නාමි කං.

1 උභයෙසු, දෙපක්ෂයෙහිවූ (උපසර්ග නිපාතයන් අතුරෙහි); විභත්ති, විභක්තිය; අත්ථ, අර්ථය; ක්‍රියා, ක්‍රියාව; දෙස, ප්‍රදේශය; සමය, කාලය; දිසා, දිශාය; ගුණ නෙති, ගුණය යන මොවුන් අපි කොටඇති උපසර්ග නිපාතයන් කෙරෙන් පරව; සබ්බාපි විභත්ති-යො, සියලු විභක්තීහුද; යථායොගං, යෙදෙනු යෙදෙන පරිද්දෙන්; වෙති; අඤ්ඤෙහි තු, මෙයින් පිටත් උපසර්ග නිපාතයන් කෙරෙන් පරව වනාහි; පඨමා, ප්‍රථමා විභක්ති වේ. 2 තං යථා, ඊට උදාහරණ මෙසේයි—අධි අනොතා සද්දෙහි, අධි අනොතා ශබ්දයන් කෙරෙන් පරම; සත්තමී, සප්තමී විභක්ති වේ—සයං සද්දා, සයං ශබ්දයා කෙරෙන් පරව; තතියා ඡට්ඨී ච, තෘතීයා ෂෂ්ඨී විභක්තිද වේ-නමො සද්දා, නමො ශබ්දයා කෙරෙන් පරව; පඨමා දුතියා ච, ප්‍රථමා ද්විතීයා විභක්තිද වේ—පාරං සද්දා, පාරං ශබ්දයා කෙරෙන් පරව; සත්තමී, සප්තමී විභක්ති වේ—දිවා සද්දා, දිවා ශබ්දයා කෙරෙන් පරව; පඨමා දුතියා සත්තමී ච, ප්‍රථමා ද්විතීයා සප්තමී විභක්තිද වේ—හෙට්ඨා සද්දා, හෙට්ඨා ශබ්දයා කෙරෙන් පරව; සත්තමී, සප්තමී විභක්ති වේ—උච්චං සද්දා, උච්චං ශබ්දයා කෙරෙන් පරව; සබ්බාපි, සියලු විභක්ති වේ -ප සද්දා ච, ප ශබ්දයාකෙරෙන් පරවද; ච සද්දා ච, ච ශබ්දයා කෙරෙන් පරවද; පඨමා, ප්‍රථමා විභක්ති වේ—හෙ සද්ද, හෙ ශබ්දයා, කෙරෙන් පරව, ආලපනෙ, ආලපනාර්ථයෙහි; පඨමා, ප්‍රථමා විභක්ති වේ—අඤ්ඤෙහිපි, සෙසයන් කෙරෙන්ද, තථා, එසේමැයි—3 උපසග්ගා, උපසර්ගයෝ; සඞ්ඛාපි, හැමදෙනාමද; සද්දන්තරෙන සහ, අනික් ශබ්දයක් සමග; පයුජ්ජන්තෙ, ප්‍රයෝග කරනු ලැබෙත්—නිපාතා තු, නිපාතයෝ වනාහි;

1 "නාමානං සමාසො යුත්තත්ථො" ත්‍යධිකාරො—සමාසොති භි
න්නත්ථානං පදානමෙකත්ථතා—යුත්තත්ථොති අඤ්ඤමඤ්ඤසම්බ
න්ධො—විභාසාත්‍යධිකාතබ්බං වාක්‍යත්ථං—මහන්තො ච සො වීරො
චාති වාක්‍යං—2 "විපදෙ තුල්‍යාධිකරණෙ කම්මධාරයො"—
භින්නප්පවත්තිනිමිත්තා, සද්දා එකස්මිං වත්ථුනි පවත්තා තුල්‍යාධික
රණා—විසෙසන විසෙස්සභූතා සමානාධිකරණෙ වෙ පදෙ, යදා
සමස්සන්තෙ භවන්ති තදා සො සමාසො, කම්මධාරයො නාම—ඉධ සමාසසු
ත්තානි සඤ්ඤාධිකාරෙන සමාසවිධායකානි—අගහිතවිසෙසනා බුද්ධි ම
ද්දෙසස්සමිං න උපජ්ජතීති විසෙසනං පුබ්බං හොති—සමාසෙනෙව
තුල්‍යාධිකරණත්තස්ස වුත්තත්තා තප්පකාසනත්ථං පයුත්තා සමාස
තො අතිරිත්තා ච සො ඉච්චෙතෙ වුත්තත්ථානමප්පයොගොති ඤා
යා නප්පයුජ්ජන්තෙ එවමඤ්ඤත්‍ර—3 "තෙසං විභත්තියො ලොපා
ච"—තෙසං යුත්තත්ථානං සමාසානං පුබ්බුත්තරපදානං විභත්ති
ලුප්‍යන්තෙ වකාරෙන බුච්චන—

---

සොප, සමරන්නේ නොහොත් ය; එසුමෙ, මෙන් කොටද කියනු ලැබෙත්
යනා, (ඊට උදාහරණ) මෙසේයි—පහාරෝ පහරති, යනු වේ—සා
ඩු සො ච ලුනාති වා කරොති වා සොපි ඉති, සා ච සො ච හා
සති වා කරොති වා සොපි යනා, ආදී, මේ ආදිය වේ.
නාමං, නාමය තෙම; එකොකලිංගං, එකිඑකී ලිඟු ඇත්තේය; විලි
ඞ්ගං, ලිඞ්ගවයක් ඇත්තේය; තිලිඞ්ගං, ලිඞ්ගත්‍රයක් ඇත්තේය; අපි,
නැවත; අලිඞ්ගිකා ඉති, ලිඟු නැත්තේයයි; චතුධා, සතරපරිද්
දෙකින් වෙයි; අත්ථං, අර්ථයකාරා; නමතීති, නැමේනුයි; නාමං ඉති,
නාමයයි; කිත්තිතං, කියනු ලදී—නාමිකං, නාමය කියා සමාප්තයි.

1, "නාමානං සමාසො, යුත්තත්ථො" ඉති, "නාමානං සමාසො යු
ත්තත්ථො" යනු; අධිකාරෝ, මතුමතු සූත්‍රයා සම්බන්ධ කරනු ලැ
බේ—සමාසො ඉති, සමාස නම්; භින්නත්ථානං, වෙන්වෙන්වූ අර්ථ
ඇතියි; පදානං, පදයන්ගේ; එකත්ථතා, සමානාර්ථව වේ—යුත්ත
ත්ථො ඉති, යුක්තාර්ථ නම්; අඤ්ඤමඤ්ඤසම්බන්ධො, ඔවුනොවුන් හා
සම්බන්ධය යනු අර්ථයි—විභාසා ඉති, විභාසා යනු; අධිකාතබ්බං,
මතුමතු සූත්‍රයා සම්බන්ධ කටයුතුයි; (කුමක් හෙයින්ද යත්) වාක්‍ය
ත්ථං, වාක්‍යය පිණිසයි—මහන්තො ච සො වීරො ච ඉති, මහ
න්තො ච සො වීරො ච යනු; වාක්‍යං, වාක්‍යයෙයි—2 "විපදෙ තු
ල්‍යාධිකරණෙ කම්මධාරයො" යනු කම්මධාරය සමාස සංඥාවිධාන
සූත්‍රයි. විපදෙ යනු පදය තුල්‍යාධිකරණෙ යනු පදය කම්මධාරයො
යනු පදයි—

ත්තො මහන්ත වීර ඉති ච, රූපප්පසඞ්ගෙ. 1 "පකති චස්ස සරන්තස්ස"—විභත්තිසු ලුත්තාසු සණ්ඨන්තස්ස පුබ්බපදන්තස්ස පරලුත්තස්ස ච අස්ස සමාසපදස්ස පකති හොතීති ලුත්තාකාරා පුනානීයන්තෙ—තතො මහන්ත වීර ඉති ඨිතෙ—"මහතං මහා තුල්‍යාධිකරණෙ පදෙ"ති මහන්තස්ස මහා—"තද්ධිතසමාසකිතකා නාමංවාතවෙතුනාදිසු ච"—තද්ධිතාදයො නාමං ඉව දට්ඨබ්බා තතො ප්පභුති පච්චයෙ වජ්ජෙත්වා—තතො විභත්තිවජ්ජය සාදි—මහාවීරො මහාවීරා ඉච්චාදි.

2 කම්මධාරයො මජ්ඣෙ ච තප්පුරිසො ච ලාභිතො,
තයො පරපදෙ ලිඞ්ගං බහුබ්බීහි පදන්තරෙ.

---

භින්නප්පවත්තිනිමිත්තා, වෙන්වෙන්වූ අභිප්‍රවෘත්තිනිමිත්තයකොට ඇති; සද්දා; ශබ්දයෝ; එකස්මිං වත්ථුනි පවත්තා, එක්වස්තුවෙක්හි පැවැත්තාහු; තුල්‍යාධිකරණා, සමානාධිකරණයෝ නම් වෙත්—විසෙසන විසෙස්සභූතා, විශෙෂණ විශෙෂ්‍යවූ, සමානාධිකරණා තුල්‍යාධිකරණවූ වෙ පද, පදයෝ දෙදෙනෙක්; යදා, යම් කාලෙක්හි; සමස්‍යන්තෙ, සමාසකරනු ලැබෙද්ද; තදා, එකල්හි; සො සමාසො, ඒ සමාසය තෙම; කම්මධාරයො නාම, කර්මධාරය සමාස නම් වේ—ඉධ, මේ කාත්‍යායන ව්‍යාකරණයෙහි; සමාසසුත්තානි, සමාස සූත්‍රයෝ; සඤ්ඤාවාරෙන, සංඥමුඛයෙන්; සමාසප්ධායකානි, සමාස විධායකයෝ වෙත්—අගහිතවිසෙසනං, නොගන්නාලද විශෙෂණයා ඇති; බුද්ධි, බුද්ධිතොම; විසෙස්සම්හි, විශෙෂ්‍යයා කෙරෙහි; න උපජ්ජතීති, නූපදිනුයි; විසෙසනං, විශෙෂණය; පුබ්බං හොති, පූර්ව වේ—සමාසෙනෙව, සමාස පදයෙන්ම; තුල්‍යාධිකරණත්තස්ස, සමානාධිකරණබව තමා; වුත්තත්තා, කියන ලද හෙයින්; තප්පකාසනත්ථං, ඒ ප්‍රකාශ කරනු පිණිස; පයුත්තො, ප්‍රයොග කරන ලද; සමාසතො, සමාසයා කෙරෙන්; අතිරිත්තො, ඉතිරිවූ; ච සො ඉති, චය සොය යන; එතෙ, මේ ශබ්දයෝ; වුත්තඨානමප්පයොගො ඉති, වුත්තඨානමප්පයොගො යන; සූත්‍රයා, සූත්‍රයෙන්; නප්පයුජ්ජන්ති, ප්‍රයොග කරනු නොලැබෙත්—අඤ්ඤත්‍ර; සෙසුතැන්හිද; එවං, මෙසේමැයි—3 "එතෙසං විභත්තියො ලොපා ච" යනු සියලු විභක්තිලොපවිධාන සූත්‍රයි, එතෙසං යනු පදය විභත්තියො යනු පදය ලොපා යනු පදය ච යනු පදයි—එතෙසං, ඒ; යුත්තත්ථානං, සම්බන්ධවූ අර්ථඇති; සමාසානං, සමාසකරන ලද; පුබ්බුත්තරපදානං, පූර්වවූද පරවූද පදයන්ගේ; විභත්ති, විභක්තීහු;

රත්තා ච සා පටිචාති රත්තපටී—මහන්තී ච සා සද්ධා චාති මහාසද්ධා—1 එත්ථ "කම්මධාරයසඤ්ඤෙ ච"ති පුබ්බපදෙ පුම්භාවො කතෙ ආප්පච්චයානං නිවුත්ති—2 නීලඤ්ච තං උප්පලඤ්චාති නීලුප්පලං—3 සඤ්ඤිවසඤ්ඤී, සඤ්ඤී ච සා සාමා චාති සඤ්ඤාමා, නාරී—4 මුඛමෙව චන්දො මුඛචන්දො—5 විසෙසන විසෙස්සානං යථෙච්ඡිතතා කචි විසෙසනං පරං හොති—6 ඛත්තියභූතො ඉච්චාදි—7 ඉච්ඡා ච යථා තත්ත්—8 නයඤ්ඤ, සි, තස්ස ලොපො—9 න සුරො අසුරො—10 එ ච කම්මධාරයෙ කතෙ—

---

ලුත්තෙන, ලොප්කරනු ලැබෙත්; චකාරෙන, චශබ්දග්‍රහණයෙන්; කචි, කිසිතැනෙක්හි; න, විභත්ති ලොප්කරනු නොලැබෙත්—තතො ඉක්බිත්තෙන්; මහන්ත වීර ඉති ච, මහන්ත වීර යසිකියෙද; රූපප්පසඞ්ගෙ; රූපයන්ගේ ප්‍රාප්තියක් ඇතිකල්හි. 1 "පකති චස්ස සරන්තස්ස" යනු ස්වරාන්තප්‍රකෘතිවත්විධාන සූත්‍රයි පකති යනු පදය ච යනු පදය අස්ස යනු පදය සරන්තස්ස යනු පදයි—විභත්තීසු ලුත්තාසු, විභක්තීන් ලොප්කරන ලද කල්හි. සරන්තස්ස, ස්වරාන්ත[illegible] පුබ්බභූතස්ස, පූර්වවූද; පරභූතස්ස ච, පරවූද; අස්ස සමාසපදස්ස, මේ සමාසපදයහට; පකති හොතීති, ප්‍රකෘතිවත් වේනුයි; ඉහ, මෙහි; ලුත්තාකාරා, ලොප්කරන ලද අකාරයෝ; පුන, නැවත; ආනීයන්තෙ, ගෙනෙනු ලැබෙත්—තතො, ඒ ප්‍රකෘතිවත් කල ඉක්බිත්තෙන්; මහන්ත වීර ඉති, මහන්ත වීර යියා; යිතෙ, සිටිකල්හි—"මහතං මහා තුල්‍යාධිකරණෙ පදෙ" ඉති, "මහතං මහා තුල්‍යාධිකරණෙ පදෙ" යන සූත්‍රයෙන්; මහන්තස්ස, මහන්තශබ්දයහට; මහා, මහායනාදෙශ වේ —"නදීනසමාසඛිතකා නාමංවෘතවෙත්තුනාදිසු ච"—යනු නම් වත්විධාන සූත්‍රයි නදීනසමාසඛිතකා යනු පදය නාමං යනු පදය ඉව යනු පදය අනන්තෙවත්තුනාදිසු යනු පදය ච යනු පදයි—නදීනාදයො, නදීන සමාස ඛිතකාදීහු; නාමං ඉව, නාමයාමෙන්; අබ්බා, දුක්තයුක්තාන්තය; නවෙප්පභූති, නවෙ ප්‍රත්‍යයා ප්‍රභෘතකොටඇති; පච්චයෙ, ප්‍රත්‍යයන්; වජ්ජෙත්වා, හැරසී—තතො, එහෙයින්, වත්ති විජ්ජාය, චසාපෘවිවාරණ විශයෙන්; සකාදී, සිආදිවිභක්ති වේ—මහාවීරො මහාවීරා ඉති, මහාවීරො මහාවීරා යන ආදී; මේ ආදියවේ.

"උභෙ තප්පුරිසා"ති තප්පුරිසසඤ්ඤා—1 "අත්තං නස්ස තප්පුරි සෙ"ති නස්ස අ—2 න අස්සො අනස්සො—3 එත්ථ "සරෙ අන්" ති නස්ස අන්·

4 "නාමානං සමාසො"ති යුත්තත්ථ විධා කත්තෙ අයුත්තත්ථානම්පි කවචි සමාසො—5 න භුන ගෙයාන අපුනවගයාන, ගාවෙත්තාදි—6 එත්ථ ගෙයානං සම්බන්ධො නසඤෙඤා අඤ්ඤතන්තෙනාපි පුනක් ඛොගවිභාගබලා සමස්සන්තෙ—7 නයෙ, ලෙනා සමාහටා ති ලොකං—8 එත්ථ "සඞ්ඛ්‍යාපුබ්බො දිගු"ති කම්මධාරයස්ස දිගුසඤ්ඤා 9 "දිගුස්සෙකත්තං"ති එකත්තං නපුංසකත්තඤ්ච

10 තප්පුරිසොචෙව—11 "අමාදයො පරපදෙහි"—12 දුතියන්තාදයො පරප

---

2 කම්මධාරයො, කර්මධාරයසමාසයද; දිගු ච, දිගුසමාසයද; තප්පුරිසො ච, තත්පුරුෂසමාසයද යන; තයො, තුන් දෙන; පරපදෙ, උත්තරපදයෙහි; ලිඞ්ගං, ලිඞ්ග; ලාභිනො, ලබන්නාහ; බහුබ්බීහි, බහුව්‍රීහිසමාසයතෙම; පදන්තර, අන්‍යපදයෙක්හි ලිඞ්ග ලබන් නේයි.

රත්තා ච සා පටි ච ඉති, රත්තා ච සා පටි ච යනවාක්‍යයෙහි; රත්තපටි, යනුවේ—මහන්තී ච සා සඞ්ඛා ච ඉයි, මහන්තී ච සා සඞ්ඛා ච යනවාක්‍යයෙහි; මහාසඞ්ඛා, යනුවේ—1 එත්ථ, මෙහි; "කම්මධාරයසඤ්ඤෙ ච" ඉති, "කම්මධාරයසඤ්ඤෙ ච" යනසූත්‍රයෙන්; පුබ්බපදෙ, පූර්වපදය; පුමෙව කත්ත, පුල්ලිඞ්ගමෙන් කළකල්හි; ආ ඊ පච්චයානං, ආ ඊ ප්‍රත්‍යයන්ගේ; නිවුත්ති, වැළැක්මයි-2 නීලඤ්ච තං උප්පලඤ්ච ඉති, නීලඤ්ච තං උප්පලඤ්ච යනවාක්‍යයෙහි; නීලුප්පලං යනුවේ—3 සඞ්ඛිව, ශංඛයක් වැනියි; සඞ්ඛි, සඞ්ඛි යනුවේ—සඞ්ඛි ච සා සාමා ච ඉති, සඞ්ඛි ච සා සාමා ච යනවාක්‍යයෙහි; සඞ්ඛිසාමා, සඞ්ඛිසාමා යනුවේ—(ඛගු කාවරත්ද)—නාරී, ස්ත්‍රීයි—4 මුඛමෙව චන්දො, යනවාක්‍යයෙහි; මුඛචන්දො, යනුවේ—5 විසෙසනවිසෙසනං, විශෙෂණවිශෙෂ්‍යදෙදෙන; යථෙච්ඡන්තා, කැමතිපරිද්දෙන්වනසෙසින්; පුබ්බ, තිබ්බත්තෙනයාහ; විසෙසනං, විශෙෂණය; පරං හොති, පරව වේ—6 ඛත්තියභූතො ඉති, ඛත්තියභූතො යන; ආදි, පම්ආදිනවේ—7 ඉච්ඡා ච, කැමතිවෙද, යථාභාති, පාලිමු පරද්දෙන්—8 නසඤ්ඤ, නශබ්දයාගෙරෙන්ථරවූ; යි, සිවිහනසියේ; නස්ස, ඔහට; ලොපො, ලොප්වේ—9 න සුරො, යනවාක්‍යයෙහි; අසුරො, යනුවේ—10 එත්ථ, මෙහි; කම්මධාරයොකෙත, කම්මධාරයසමාස කලකල්හි—

පදෙහි නාමෙහි යදා සමස්‍යන්තෙ තදා සො සමාසො තප්පුරිසො නාම—1 ගාමං ගතො ගාමගතො—2 යස්ස වාසිඨ ගාමං ගතො තිසෙසා සාවපිං තත්‍රායුත්තත්තාය න සමාසො—3 තථා සඤ්ඤ සද්දයං—4 රඤ්ඤො හතො රාජහතො—5 කිච්චනෙහි ගියෙස අධිකත්ථවචනෙ—තබ්බ අනීය ණ්‍ය රිච්චප්පච්චයා කිච්චා—පුතිනි ඤපමජ්ඣාරොපිතත්තං වචනං අධිකත්ථවචනං—6 සොණලෙයො කුපො ඉච්චාදි—සොණ්ඩිහි යථා ලියතෙ තථා පුණ්ණතා පුති, තෙහි උච්චිඨතතා නිඤ්ඤච—7 දධිනා උපසිත්තං භොජනං දධිභොජනං—8 සමාසපදෙනෙව උද්දසිතත්ත ක්‍රියාය කථනා තපෙපපායුත්තන්තා—9 උපසිත්තසද්දප්පයොගොප්‍රබොච.

---

''උභෙ තප්පුරිසා'' ඉති, ''උභෙ තප්පුරිසා'' යනසූත්‍රයෙන්; තප්පුරිසසඤ්ඤ, සත්පුරුෂසමාස සංඥවේ—1 ''අත්තංනස්සතප්පුරිසෙ'' ඉති, ''අත්තං නස්ස තප්පුරිසෙ'' යනසූත්‍රයෙන්; තස්ස, තකාරය හට; අ, අකාරයෙක්ආදෙශවේ— න අස්සො, යනවාක්‍යයෙහි; අනස්සො, යනුවේ—3 එත්ථ, මෙහි; ''සරෙ අන්'' ඉති, ''සරෙ අන්'' යනසූත්‍රයෙන්; නස්ස, නකාරයහට; අන්, අන්යනාදෙශවේ.

4 ''නාමානං සමාසො'' ඉති, ''නාමානං සමාසො'' යන; සුත්තෙන, සූත්‍රයෙනම; විධා කෙතෙ, දෙකක් කළකල්හි; අයුත්තත්ථානම්පි, අයුක්තාර්ථයන්ටද; ක්වචි, කිසිතැනෙක්හි; සමාසො, සමාසවේ—5 න පුන ගෙය්‍යා, යනවාක්‍යයෙහි; අපුනගෙය්‍යා, යනුවේ—ගාථා, ගාථාවයි; ඉති ආදි, මේආදියවේ—6 එත්ථ, මෙහි; ගෙය්‍යන්ත, ගෙය්‍ය ශබ්දයාහා; සම්බන්ධො, සම්බන්ධවන්නාවූ; නසද්දො; නශබ්දයතෙම; අයුත්තත්ථොපි, අයුක්තාර්ථද්වූ; පුනන්ත, පුනශබ්දයාහා, යොගවිභාගබලා, සූත්‍ර විධාකරණ බලයෙන්; සමස්‍යතෙ, සමාස කරනු ලැබේ—7 තයො ලොකා සමාහටා, යනවාක්‍යයෙහි; තිලොකං, යනුවේ—8 එත්ථ, මෙහි; ''සඞ්ඛ්‍යාපුබ්බො දිගු'' ඉති, ''සඞ්ඛ්‍යාපුබ්බො දිගු'' යනසූත්‍රයෙන්; කම්මධාරයස්ස, කර්මධාරය සමාසයහට; දිගු සඤ්ඤ, දිගුසමාස සංඥවේ—9 ''දිගුස්සෙකත්තං'' ඉති, ''දිගුස්සෙකත්තං'' යනසූත්‍රයෙන්; එකත්තං, එකවචනබවද; නපුංසකත්තං ච, නපුංසකලිඞ්ගබවදවේ.

---

10 තප්පුරිසා ඉති, තප්පුරිසා යනු, එව, මතුසූත්‍රයෙහි වැටේ—11 ''අමාදයො පරපදෙහි'' යනු තත්පුරුෂ සමාසසංඥවිධාන සූත්‍රයි—අමාදයො යනුපදය පරපදෙහි යනුපදයි—12 දුතියන්තාදයො, විභක්ත්‍යන්තාදීහු; පරපදෙහි නාමෙහි, උත්තරපදනාමයන්හා; යදා, යම් කලෙක්හි; සමස්‍යන්තෙ, සමාසකරනු ලැබෙද්ද; තදා, එකල්

1 කරණේ තු—2 අසිනා කලහො අසිකලහො—3 බුද්ධස්ස දෙය්‍යං බුද්ධදෙය්‍යං—4 පරස්සපදං—5 එත්ථ විභත්‍යලොපො—6 එවං අත්තනොපදම්වච්චාදි—7 චොරස්මා භයං චොරභයං—8 එවං බන්ධනමුත්තොවච්චාදි—9 රඤ්ඤො පුත්තො රාජපුත්තො.

10 බ්‍රාහ්මණස්ස කණ්හා දන්තා ඉච්චත්‍ර දන්තාපෙක්ඛා ඡට්ඨී කණ්හෙන සම්බන්ධාභාවා න සමාසො—11 යදා තු කණ්හා ච තෙ දන්තා චෙති කම්මධාරයො තදා ඡට්ඨී කණ්හදන්තාපෙක්ඛාති බ්‍රාහ්මණකණ්හදන්තාති සමාසො හොතෙව—12 රඤ්ඤො මාගධස්ස ධනන්ත්‍යත්‍ර රඤ්ඤොති ඡට්ඨී ධනමපෙක්ඛතෙ න මාගධං, රාජාඑව මාගධසද්දෙන වුච්චතීති භෙදාභාවා සම්බන්ධාභාවොති තුල්‍යාධිකරණෙන මාගධෙන සහ රාජා න සමස්‍යතෙ—

---

හි; සො සමාසො, ඒ සමාසයතෙම; තප්පුරිසො නාම, තත්පුරුෂ සමාසනම්වේ—

1 ගාමං ගතො, යනවාක්‍යයෙහි; ගාමගතො; යනුවේ—2 පස්ස වාසිඨ ගාමං ගන්තා තිස්සො සාවත්ථිං ඉති, පස්ස වාසිඨ ගාමං ගන්තා තිස්සො සාවත්ථිං යන; අත්‍ර, මෙහි; අයුක්තත්වතාය, නුසුදුසු බැවින්; න සමාසො, සමාසනොවේ—3 අසදෘශ, සෙසුතන්හිද; තථා, එසේම; දෙය්‍යං, දෙනයුත්තේසි—4 රඤ්ඤා හතො, යනවාක්‍යයෙහි; රාජහතො, යනුවේ—5 කිච්චෙනෙහි, කිච්චප්‍රත්‍යයාන්ත යන්හා සමග; භිය්‍යො, බොහෝසේ; අධිකාර්ථවචනෙ, අධිකාර්ථවචනයෙහි තෘතීයා සමාසවේ—තබ්බ, තබ්බ ප්‍රත්‍යය; අනීය, අනීය ප්‍රත්‍යය; ණ්‍ය, ණ්‍ය ප්‍රත්‍යය; රිච්චප්පච්චයා, රිච්චප්‍රත්‍යය යනමොහු; කිච්චා, කිච්චප්‍රත්‍යයෝ නම් වෙත්—ද්‍රුතිනිරූපණං, ස්තුති නිරූපිණීස; අධ්‍යාරොපිතත්වං, නගනලද අර්ථඇති; වචනං, වචනය; අධිකත්ථවචනං, අධිකාර්ථ වචන නම්—6 සොණ්ඩෙලෙය්‍යො කූපො ඉති, සොණ්ඩලෙය්‍යො කූපො යන; ආදි, මේ ආදියවේ—සොණ්ණහි, සුණඛයන්විසින්; යථා, යම්සේ; ලෙය්‍යතෙ, ලෙහකරනු ලැබේද; තථා, එසේම; පුණ්ණතා, පිරුණුබැවින්; ද්‍රුති, සතුතිසද, තෙහි, ඔවුන්විසින්; උච්චිඨතා, ඉඳුල් කළබැවින්; නින්දච, නින්දදවේ—

7 දධිනා උපසිත්තං භොජනං, යනවාක්‍යයෙහි; දධිභොජනං, යනුවේ—8 සමාසපදෙනෙව, සමාසපදයෙන්ම; උපසිත්තක්‍රියාය, උපසිත්තක්‍රියාවගේ; කථනා, කීබැවින්; එත්ථ, මෙහි; අයුක්තත්වතා, නුසුදුසුබව; නත්ථි, නැත්තේසි—9 උපසිත්තසද්ද, උපසිත්තශබ්දයාගේ; අප්පයොගො, අප්‍රයොගයතෙම; පුබ්බෙව, පූර්වයෙහි මෙනි

1 වීසො හි සම්බන්ධො—2 රඤ්ඤො අස්සො ච පුරිසො චෙත්ථ ර-ඤ්ඤො අස්සො රඤ්ඤො පුරිසොති ච පවෙච්චකං සම්බන්ධතො සාපෙක්ඛතා අත්ථි න සමාසො—3 අස්සො ච පුරිසො චාති වසෙන ක-තෙ තු රාජස්සපුරිසාති හොතෙව—4 අඤ්ඤනපෙක්ඛතතා—5 ර-ඤ්ඤො ගරුපුත්තො ඉච්චත්‍ර රාජාපෙක්ඛිතොපි ගරුනො පුත්තෙ-න සහ සමාසො—6 ගමකත්තා—7 ගමකත්තම්පි සමාසස්ස නිබන්ධ-නං—8 තත්ථ ගරුනො පුත්තොති විග්ගහො—9 එවමඤ්ඤත්‍ර—10 රූ-පෙසඤ්ඤා රූපසඤ්ඤා—11 කච්ඡි නිදස්සා—12 කූපෙ මණ්ඩුකො විය කූපමණ්ඩුකො—13 එවං නගරකාකො ඉච්චාදි—14 අත්‍රොපමා-ය නිදුගම්‍යතෙ—15 අන්තෙවාසිකොත්‍යාදෞ විභත්‍යලොපො.

---

1 කරණෙ තු, කරණකාරකයෙහි වනාහි—2 අසිනා කලහො, යනවාක්‍යයෙහි; අසිකලහො, යනුවේ—3 බුද්ධස්ස දෙය්‍යං, යනවාක්‍යයෙහි; බුද්ධදෙය්‍යං, යනුවේ—4 පරස්සපදං, යනුවේ—5 එපද, මෙහි; විභත්‍යලොපො, විභක්තිහට ලොප් නොවේ—6 අත්තනොපදං ඉති, අත්තනොපදං යන; ආදි, මේ ආදියෙහි; එවං, මෙසේමැයි—7 චොරස්මා භයං, යනවාක්‍යයෙහි; චොරභයං, යනුවේ—8 බන්ධනමුත්තො ඉති, බන්ධනමුත්තො යන; ආදි, මේ ආදියෙහි; එවං, මෙසේමැයි—9 රඤ්ඤො, පුත්තො; යනවාක්‍යයෙහි; රාජපුත්තො, යනුවේ.

10 බ්‍රාහ්මණස්ස කණ්හා දන්තා ඉති, බ්‍රාහ්මණස්ස කණ්හා දන්තාය යි කියා; අත්‍ර, මෙහි; දන්තාපෙක්ඛා, දන්තශබ්දයා අපෙක්ෂාකළේ, ජනිති, ජනිතිනුයි; කණ්හෙන, කණ්හශබ්දයාගා සමග; සම්බන්ධාභාවා, සම්බන්ධයක්හුගේ නොවීමෙන්; න සමාසො, සමාසනොවේ—11 යදා තු, යම් කාලෙක්හි වනාහි; කණ්හා ච තෙ දන්තා ච ඉති, කණ්හා ච තෙ දන්තා ච යි කියා; කම්මධාරයො, කර්මධාරය සමාස වේද, තදා, එකල්හි; ජනි, ජනිතොම; කණ්හදන්තාපෙක්ඛානි, කණ්හදන්තශබ්දයා අපෙක්ෂාකෝළේනුයි, බ්‍රාහ්මණකණ්හදන්තා ඉති, බ්‍රාහ්මණකණ්හදන්තා යි කියා; සමාසො හොතෙව. සමාස වන්නේමැයි—12 රඤ්ඤො මාගධස්ස ධනං ඉති, රඤ්ඤො මාගධස්ස ධනං යන; අත්‍ර, මෙහි; රඤ්ඤොති, රඤ්ඤො යි කියා; ජනි, ජනිතොම; ධනම්පෙක්ඛතෙ, ධනශබ්දය අපෙක්ෂා කෙරෙයි; න මාගධං, මාගධශබ්දයා අපෙක්ෂා නොකෙරෙයි; රාජා එව, රාජශබ්දයම; මාගධසද්දෙන, මාගධශබ්දයෙන්; ප්‍රිච්ඡන්නො යි, කියනු ලැබේයායි; භෙදනාචා, භෙදයක්හු නැතිහෙයින්; සම්බන්ධාභාවොති, සම්බන්ධයක්හුගේ නොවීමනුයි; තුල්‍යාධිකරණත, සමානාධිකරණ

1 "අඤ්ඤපදත්ථෙසු බහුබ්බීහි"—2 අප්පඨමන්තානමනෙකෙසං පදානං අත්ථෙසු ද්වෙ වා බහූනි වා නාමානි යදා සමස්‍යන්තෙ තදා සො ස මාසො බහුබ්බීහි නාම.

3 ආගතා සමණා යං සො ආගතසමණො, විහාරො—4 ජිතානි ඉන්ද්‍රියානි යෙන සො ජිතින්ද්‍රියො, භගවා—5 ආහිතො අග්ගි යෙන සො ආහිතග්ගි—6 අග්‍යාහිතො වාත්‍යාදෙ යථෙච්ඡං විසෙසනස්ස පරතා—7 කාරණෙ තු—8 ජින්නා රුක්ඛා යෙන සො ජින්නරුක්ඛො, ඵරසු—9 දින්නො සුංකො යස්ස සො දින්නසුංකො, රාජා—10 නිග්ගතා ජනා යස්මා සො නිග්ගතජනො, ගාමො—11 දස බලානි යස්ස සො දසබලො, භගවා—12 නත්ථි සමො යස්ස සො අසමො—13 එත්ථ "අත්ථග්ගහණස්සා"ති යොගවිභාගෙන නස්ස අ-

---

ණුවූ; මාගධෙන සහ, මාගධශබ්දසාහා සමග; රාජ්, රාජශබ්දය තෙම; න සමස්‍යතෙ, සමාසකරනු නොලැබේ—
1 සම්බන්ධො, සම්බන්ධතෙම; විසො හි, දෙදෙනෙක්හුගෙනෙරහි පි හිටියේමැයි—2 රඤ්ඤො අස්සො ච පුරිසො ච ඉති, රඤ්ඤො අස්සො ච පුරිසො ච යන; අත්‍ර, මෙහි; රඤ්ඤො අස්සො රඤ්ඤො පුරිසො ති ච, රඤ්ඤො අස්සො රඤ්ඤො පුරිසො කියාද; සම්බන්ධං, මෙ නැගිනම; සම්බන්ධතො, සම්බන්ධවන හෙයින්; සාපෙක්ඛතා, අපෙ ක්ෂාසහිතබව; අත්ථීති, ඇත්තේනුයි; න සමාසො, සමාස නො වේ—3 අස්සො ච පුරිසො ච ඉති, අස්සො ච පුරිසො ච යි කියා; වශෙෂ කෙතෙ තු, වශෙෂසමාස කලකල්හි වනාහි; රාජස්සපුරිසාති, රාජස්සපුරිසා යී කියා; හොතෙව, වන්නේමැයි—(කුමක් හෙයින් ද යත්?)—4 අපෙක්ඛා, අනිකාක්ෂාවිසින්; න අපෙක්ඛනතො, අපෙක්ෂා නොකලබැවිනි—5 රඤ්ඤො ගරුපුත්තො ඉති, රඤ්ඤො ගරුපුත්තො යන; අත්‍ර, මෙහි; රාජාපෙක්ඛිතොයි, රාජශබ්දය අපෙක්ෂා කලේද; ගරුනො පුත්තෙන සහ, ගුරුනුගේ පුත්‍රශබ්දයාහා සම ග; සමාසො, සමාසවේ—(කුමක් හෙයින්ද යත්?)—6 ගමකත්තා, ගමකබව හෙයිනි—7 ගමකත්තම්පි, ගමකබවද; සමාසස්ස, සමා සයාගේ; නිබන්ධනං, කාරණායි—8 තථා, එහි; ගරුනො පුත්තො ති, ගරුනො පුත්තො යි කියා විග්‍රහෙ, වාක්‍යයයි—9 අඤ්ඤත්‍ර, සෙසුතන්හිද; එවං, මෙසේමැයි—10 රූපෙ සඤ්ඤා, යනවාක්‍යයෙ හි; රූපසඤ්ඤා, යනුවේ—11 කචි, කිසිතනෙක්හි; නිච්චං, නි ත්‍යවක් හැමහන කල්හි සමාසවේ—12 කූපෙ මණ්ඩූකො වි ය, යනවාක්‍යයෙහි; කූපමණ්ඩූකො, යනුවේ—13 නගරකාකො ඉ ති, නගරකාකො යන; ආදී, මේආදියද; එවං, මෙසේමැයි—14 අ

1 පහූතා ජිව්හා යස්ස සො පහූතජිව්හො—2 මහතී පඤ්ඤා ය
ස්ස සො මහාපඤ්ඤො—3 වීසු—4 "ඉත්ථියමභාසිතපුම්ඉත්ථිපුම්බා ච චෙ"
ති පුම්භාවාතිදෙසො පුබ්බුත්තරපදෙසු ආ ඊ ප්‍රත්‍යයාන්තම් භාවො—
5 "ක්වචි සමාසන්තගතානමකාරන්තො"ති අන්තස්ස අත්තං—6 නා
රඟගහණෙන ආ ඉ ච—7 ඉත්ථියම්වණ්ණන්තා නදීතොතහි ච කප්ප
ච්චයොපි—8 යථා—9 විසාලං අක්ඛි යස්සසො විසාලක්ඛො—10 ද
ච්චක්කධම්මො—11 සිලොපො—12 සොභනො ගන්ධො යස්ස සො සු
ගන්ධි—13 බහුකත්තිකො—14 බහුනදිකො—සමුද්දො—15 එක පද
දිනා රස්සො—16 බහුකත්තුකො—17 මත්තා බහවො මාතඞ්ගා ය
ස්මිං තං මත්තබහුමාතඞ්ගං, වනං—18 තුල්‍යාධිකරණෙ.
19 සුවණ්ණස්ස විය වණ්ණො යස්ස සො සුවණ්ණවණ්ණො—20 ච
ජීරං පාණිම්හි යස්ස සො චජීරපාණී—

---

ඤ, ගමුන; උපමාය, උපමාවෙයන්; නිදු, නිඳතොම; ගමනෙත, භ
ගේ—15 අනෙතවාසිකො ඉති, අනෙතවාසිකො යන; ආදෙ, මේ
ආදි තන්හි; විභත්‍යලොපො, විභක්තිහට ලොප්නොවේ.

---

1 "අඤ්ඤපදත්ථෙසු බහුබ්බීහි" යනු බහුව්‍රීහිසමාස සංඥාවිධානසූත්‍ර
සි අඤ්ඤපදත්ථෙසු යනුපදය බහුබ්බීහි යනුපදයි—2 අප්‍රථමානතා
නං, ප්‍රථමාන්ත නොවන්නාවූ, අඤ්ඤසං පදනං, අන්‍යපදයන්
ගේ; අත්ථෙසු, අර්ථයෙහි; වෙ වා නාමානි, ශබ්දයෝ දෙදෙනෙක
හෝ; බහූනි වා නාමානි, බොහෝ ශබ්දයෝහෝ; යදා, යම් කාලෙක
හි; සමස්‍යන්තෙ, සමාස කරනු ලැබෙද්ද, තදා, එකල්හි; සො සමා
සො, ඒසමාසයතෙම, බහුබ්බීහි නාම, බහුව්‍රීහිසමාස නම් වේ.
3 ආගතා සමණා යං සො, යනවාක්‍යයෙහි; ආගතසමණො, යනු
වේ—(ඒ කවරේද?) විහාරො, විහාරයයි—4 ජිතානි ඉන්ද්‍රියානි යෙ
න සො, යනවාක්‍යයෙහි; ජිතින්ද්‍රියො, යනුවේ—(ඒ කවරේද?) භ
ගවා, භාග්‍යවතුන් වහන්සේයි—5 ආහිතො අග්ගි යෙන සො, ය
නවාක්‍යයෙහි; ආහිතග්ගි, යනුවේ—6 අග්‍යාහිතො වා ඉති, අග්‍යා
හිතො වා යනා; ආදෙ, මේ ආදිතන්හි; යථෙච්ඡං, කැමති පරිද්
දෙන්; විසෙසනස්ස, විශෙෂණයාගේ; පරතා, පරබවවේ—7 කර
ණෙ තු, කරණ කාරකයෙහි වනාහි—8 ඡින්නො රුක්ඛො යෙන
සො, යනවාක්‍යයෙහි; ඡින්නරුක්ඛො යනුවේ—(ඒ කවරේද?) ප
රශු, පොරොවයි—9 දින්නො සුඞ්කො යස්ස සො, යනවාක්‍යයෙහි;
දින්නසුඞ්කො යනුවේ—(ඒ කවරේද?) රාජා, රජයි—10 නිග්ගතා
ජනා යස්මා සො, යනවාක්‍යයෙහි; නිග්ගතජනො, යනුවේ—(ඒ කා
වරේද?) ගාමො, ගමයි—11 දසබලානි යස්ස සො, යනවාක්‍යයෙ

1 උරසි ලොමානි යස්ස සො උරසිලොමො—2 එතං විගතාසෙලො සො—3 අභිසම්භූති බහුභාගගහණෙන ඝචි පඨමගතානම්පි—4 සහ මහතුනා යො වත්තෙතසො සහෙතුකො—5 යදාදිනා සඞ්ඝස්ස සො—6 සතත වා අඩ්ඪා යෙ තෙ සතතඩ්ඪ—මාසා—7 එතං සඞ්ඝාපදෙසො වාසද්දස්සත්ථො—8 දක්ඛිණස්සා ච පුබ්බස්සා ච දිසාය යං අනතරාලං සා දක්ඛිණපුබ්බා—දිසා—9 භින්නාධිකරණො—10 අප්පඨමගතානන්තානි කිං? දෙසිතො බුද්ධෙන යො. ධම්මො.

---

හි; දසබලො, යනුවේ—(ඒ කවරේද?) භගවා, සර්වඥයි—12 නාත්ථි සමො යස්ස සො, යනවාක්‍යයෙහි; අසමො, යනුවේ—13 එජ්, මෙහි; "අභාගනනාස්ස"ති, "අභාගනනාස්ස" යන; යොගවිභාගෙන, සූත්‍ර විධාකරණයෙන්; භස්ස, භකාරයහට; අ, අකාරයක් ආදෙශවේ—

1 පහුතා ජිව්හා යස්ස සො, යනවාක්‍යයෙහි; පහුතජිව්හො; යනුවේ—2 මහන්තී පඤ්ඤා යස්ස සො, යනවාක්‍යයෙහි; මහාපඤ්ඤො, යනුවේ—3 වීසු, දෙතන්හි—4 "ඉත්ථියම්භාසිතපුම්ථිපුමාව චෙ" ති, "ඉත්ථියම්භාසිතපුම්ථිපුමාව චෙ" යන සූත්‍රයෙන්; ප්‍රථමාවිභක්ති දෙසා, ප්‍රංවත් කිරීමෙන්; පුබ්බුත්තරපදෙසු, පූර්වොත්තර පදයෙහි; ආ ඊ පච්චයානං, ආ ඊ ප්‍රත්‍යයන්ගේ, අභාවො, වැලැක්මයි—5 "ඝචි සමාසන්තගතානමකාරන්තො" ඉති, "ඝචි සමාසන්තගතානමකාරන්තො" යනසූත්‍රයෙන්; අන්තස්ස, අන්තයහට; අත්තං, අත්වවේ—6 කාරග්ගහණෙන, කාරග්‍රහණයෙන්; ආඉ ච, ආකාර ඉකාර යනමොහුද අන්‍දෙශවෙත්—7 ඉත්ථියං, ස්ත්‍රීලිඞ්ගයෙහි; ඉවණ්ණන්තා, ඉවර්ණාන්තයාකෙරෙන්ද; ඌවණ්ණන්ත ච, ඌවර්ණාන්තයාකෙරෙන්ද; කපච්චයොපි, කප්‍රත්‍යයද වේ—8 යථා, මෙසේයි—9 විසාලං අක්ඛි යස්ස සො, යනවාක්‍යයෙහි; විසාලක්ඛො, යනුවේ—10 පඤ්චනබධම්මො, යනුවේ—11 සිලොපො, සිහට ලොප්වේ—12 සොභනො ගන්ධො යස්ස සො, යනවාක්‍යයෙහි; සුගන්ධි, යනුවේ—13 (බහවො කත්තාරො යස්ස සො යනවාක්‍යයෙහි;) බහුකත්තුකො, යනුවේ—14 (බහවො නදියො, යස්ස සො යනවාක්‍යයෙහි,) බහුනදිකොයනුවේ—(ඒකවරේද?) සමුද්‍රෙ, සමුද්‍රයයි—15 එතං; මෙහි, යදාදිනා, යදාදිසූත්‍රයෙන්; රස්සො, හ්‍රස්වවේ—16 (බහවො කත්තාරො, යස්ස සො යනවාක්‍යයෙහි;) බහුකත්තුකො, යනුවේ—17 මහන්තා බහවො මාතරො යස්මිං තං, යනවාක්‍යයෙහි; මහාබහුමාතරං, යනුවේ—(ඒ කවරේද?) වනං, වනයයි—18 තුල්‍යාධිකරණො, සමානාධිකරණ බහුව්‍රීහි.

1 "නාමානං සමුච්චයො ද්වන්දො"—2 සමුච්චයොති පිණ්ඩීකරණං—
3 එකවිභත්තිකානං නාමානං යො සමුච්චයො සො ද්වන්දො නාම—
4 ඉදං සුත්තං බහුවචනවිසයං—5 චන්දො ච සූරියො ච චන්දසූරි
යා—6 භින්නාභින්නාදික්‍රියාසම්බන්ධසමුච්චයතො අනෙකත්ථාරොපකත්
තා—7 එවං නරනාරියො—8 අක්ඛරපදානි.
9 "තථා ද්වන්දෙ පාණිතූරියයොග්ගසෙනඞ්ගඛුද්දජන්තුකවිවිධවිරුද්
ධවිසභාගත්ථාදීනඤ්ච"—10 විවිධෙනාකාරෙන විරුද්ධා විවිධවිරුද්ධා—
11 සභාගා සදිසා—12 විවිධා ච තෙ සභාගා චෙති විසභාගා—
13 යථා දිගුසමාසෙ තථා ද්වන්දෙ පාණ්‍යඞ්ගාදීනං එකත්තං න
පුංසකත්තඤ්ච හොති—34 චක්ඛුසොතං—15 ගීතවාදිතං—

---

19 සුවණ්ණස්ස විය වණ්ණො යස්ස සො, යනවාක්‍යයෙහි; සුව
ණ්ණවණ්ණො, යනුවේ—20 වජිරං පාණිම්හි යස්ස සො, යනවා
ක්‍යයෙහි; වජිරපාණි, යනුවේ--
1 උරසි ලොමානි යස්ස සො, යනවාක්‍යයෙහි; උරසිලොමො, ය
නුවේ—2 එත්ථ, මෙහි; විභත්‍යලොපො, විභක්තිහට ලොප් නො
වේ—3 අපෙත්‍ථ ඉති, අපෙපසු යන; බහුත්තග්ගහණෙන, බහුවච
නග්‍රහණයෙන්, කව ජි, කිසිතැනෙක්හි; පඨමන්තානම්පි, ප්‍රථමාන්ත
යන්ගේ අර්ථයෙහිද සමාසවේ—4 සහ හෙතුනා යො වත්තතෙ
සො, යනවාක්‍යයෙහි; සහෙතුකො, යනුවේ—5 සදාදීනං, සදාදී
සූත්‍රයෙන්; සහස්ස, සහශබ්දයහට; සො, සකාරයෙක් ආදෙශවේ—
6 සත්ත වා අට්ඨ වා යෙ තෙ යනවාක්‍යයෙහි; සත්තට්ඨ, යනුවේ—
(ඒ කවරේද?) මාසා, මාසයෝයි—7 එත්ථ, මෙහි; අඤ්ඤපදත්ථො,
අන්‍යපදාර්ථනම්; වාසද්දස්සත්ථො, වාශබ්දයාගේ අර්ථයි—8 දක්ඛිණ
ස්සා ච පුබ්බස්සා ච දිසාය යං අන්තරාලං සා, යනවාක්‍යයෙහි; ද
ක්ඛිණපුබ්බා, යනුවේ—(ඔහු කවරක්හුද?) දිසා, දිශායි—9 භින්නා
ධිකරණො, භින්නාධිකරණ බහුව්‍රීහියි—10 අප්පඨමන්තානං ඉති,
අප්පඨමන්තානං යනු; කිං, කුමටද? දෙසිතො බුද්ධෙන යො ධම්මො,
යනතන්හි ප්‍රථමායෙන් නොවන පිණිසයි.

---

1 "නාමානං සමුච්චයො ද්වන්දො" යනු ද්වන්ද්වසමාස සංඥාවිධාන සූ
ත්‍රයි— නාමානං යනුපදය සමුච්චයො යනුපදය ද්වන්දො යනුපද
යි—2 සමුච්චයොති, සමුච්චයනම්; පිණ්ඩීකරණං, රැස්කිරීමයි—
3 එකවිභත්තිකානං, සමාන විභක්තිකවූ; නාමානං' නාමයන්ගේ;
යො සමුච්චයො, යම් රැස්කිරීමෙක් ඇද්ද, සො, හෙතෙම, ද්වන්දො
නාම, ද්වන්ද්ව සමාස නම්වේ—4 ඉදං සුත්තං, මේ සූත්‍රය; බහුවච
නවිසයං, බහුවචන විෂයකොට ඇත්තේයි—5 චන්දො ච සූරියො

1 යුගනඞ්ගලං—හත්ථස්සං—අසිචම්මං—ඩංසමකසං—කාකොලූකං—නාමරූපං—2 නාමං නමනලක්ඛණං රූපං රුප්පනලක්ඛණං—එවමෙතෙ ධම්මා ලක්ඛණතො විවිධා පරමත්ථතො සභාගා ච—3 ආදිසද්දෙනාඤ්ඤත්ථාපි—යථා—තිනනාලිඞ්ගානං—4 ඉත්ථිපුමං—යදදිනා රසො—දසිදසං—පත්තචීවරං—ගඞ්ගාසොණං—5 සඞ්ඛ්‍යාපරිමාණානං—තිකචතුක්කං—

---

ච' යනවාක්‍යයෙහි; චන්දසූරියා, යනුවේ—6 තිඪන්ති ඉති, තිඪන්ති යන; ආදික්‍රියාසම්බන්ධසාමඤ්ඤතො, මේ ආදි ක්‍රියාසම්බන්ධසාමාන්‍යහෙයින්; එකාපි, මෙහිද; එකත්තා, එකාර්ථවෙක්; අත්ථි, ඇති—7 නරනාරියො, නරනාරියො යනුද; එවං, මෙසේමැයි—8 අක්ඛරානි ච පදානි ච, යනවාක්‍යයෙහි; අක්ඛරපදානි, යනුවේ. 9 "තථා චන්ද පාණිතූරියයොග්‍යසෙනඞ්ගඛුද්දජන්තුකවිවිධවිරුද්ධවිසභාගත්ථාදීනඤ්ච" යනු එකත්ත නපුංසකත්තවිධාන සූත්‍රයි තථා යනුපදය චන්ද යනුපදය පාණිතූරියයොග්‍යසෙනඞ්ගඛුද්දජන්තුකවිවිධවිරුද්ධවිසභාගත්ථාදීනං යනුපදය ච යනුපදයි—10 විවිධනාකාරන, අනේකප්‍රකාරයෙන්; විරුද්ධා, විරුද්ධවූවාහු; විවිධවිරුද්ධා, විවිධවිරුද්ධා නම් වෙත්—11 සභාගා, සභාගයෝ නම්; සදිසා, සමානයෝයි—12 විවිධා ච තෙ සභාගා ච, යන වාක්‍යයෙහි; විසභාගා, යනුවේ—13 යථා, යම්සේ; ද්විගුසමාසෙ, ද්විගුසමාසයෙහිද; තථා, එසේම, චන්දෙ, චන්දසමාසයෙහි; පාණ්‍යඞ්ගත්ථාදීනං, පාණ්‍යඞ්ගත්ථාදීන්ගේ; එකත්තං, එකත්වයද; නපුංසකත්තං ච හොති, නපුංසකත්වයද වේ—14 චක්ඛු ච සොතං ච, යනවාක්‍යයෙහි; චක්ඛුසොතං, යනුවේ—15 ගීතං ච වාදිතං ච, යනවාක්‍යයෙහි; ගීතවාදිතං, යනුවේ—

1 යුගංච නඞ්ගලංච, යන වාක්‍යයෙහි; යුගනඞ්ගලං, යනුවේ—හත්ථී ච අස්සා ච, යන වාක්‍යයෙහි; හත්ථස්සං, යනුවේ—අසි ච චම්මං, යන වාක්‍යයෙහි; අසිචම්මං, යනුවේ—ඩංසා ච මකසා ච, යන වාක්‍යයෙහි; ඩංසමකසං, යනුවේ—කාකා ච උලූකා ච, යන වාක්‍යයෙහි; කාකොලූකං, යනුවේ—නාමච රූපච යන වාක්‍යයෙහි; නාමරූපං, යනුවේ—2 නාමං, නාමයතෙම; නමනලක්ඛණං, නැමීම ලක්ෂණකොට ඇත්තේය; රූපං, රූපයතෙම; රුප්පනලක්ඛණං, විකාරප්‍රාප්තිය ලක්ෂණකොට ඇත්තේයි—එවං, මෙසේ; එතෙ ධම්මා, මේ නාමරූප ධර්මයෝ; ලක්ඛණතො, ලක්ෂණ හෙයින් විවිධා, අනෙකප්‍රකාරයහ; පරමත්ථතො, පරමාර්ථ හෙයින්, සභාගාච, සදෘශයෝ වෙත්—3 ආදිසද්දෙන, ආදිශබ්දයෙන්; අඤ්ඤත්ථාපි, සෙසුතන්හිද එකත්ව නපුංසකත්වය වේ—යථා. මෙසේයි —

1 සිප්පට්ඨානං—වෙණරථකාරං—2 ලුද්දකානං—සාකුන්තිකමාගවිකං—3 අප්පාණිජාතීනං—ආරසත්ති—4 එකජ්ඣායනබ්‍රාහ්මණානං—කඨකාලාපං ඉච්චාදි.

5 "විභාසා රුක්ඛ තිණ පසු ධන ධඤ්ඤ ජනපදාදීනඤ්ච"—6 ද්වන්ද්වෙ රුක්ඛාදීනං එකත්තං නපුංසකත්තඤ්ච වා හොති—7 ධවඛදිරං ධවඛදිරා—මුඤ්ජබබ්බජං මුඤ්ජබබ්බජා—අජෙළකං අජෙළකා—හිරඤ්ඤසුවණ්ණං හිරඤ්ඤසුවණ්ණානි—සාලියවං සාලියවා—කාසිකොසලං කාසිකොසලා—8 ආදිසද්දෙන අස්සසුපි ඕ—*

---

තිනනම්‍රිගානා, මෙවන්වූ ඥාණඇති ශබ්දයන්ගේ එකත්ව නපුංසකත්වය වේ—4 ඉත්ථී ච පුමා ච, යන වාක්‍යයෙහි; ඉත්ථිපුමං, යනුවේ—යදාදිනා,' යදාදිසූත්‍රයෙන්; රස්සො, හ්‍රස්ව වේ—දාසී ච දාසො ච, යන වාක්‍යයෙහි; දාසිදාසං, යනු වේ—පත්තො ච චීවරඤ්ච, යන වාක්‍යයෙහි, පත්තචීවරං, යනු වේ—ගාවො ච සොණො ච, යන වාක්‍යයෙහි; ගවාසොණං, යනු වේ—5 සඞ්ඛ්‍යාපරිමාණානං, සඞ්ඛ්‍යාප්‍රමාණවාචී ශබ්දයන්ගේ එකත්ව නපුංසකත්වය වේ—තිකඤ්ච චතුක්කඤ්ච, යන වාක්‍යයෙහි; තිකචතුක්කං, යනු වේ—

1 සිප්පිනං, ශිල්පිවාචී ශබ්දයන්ගේ එකත්ව නපුංසකත්වය වේ—වෙණො ච රථකාරො ච, යන වාක්‍යයෙහි; වෙණරථකාරං, යනු වේ—2 ලුද්දකානං, ලුද්දකවාචී ශබ්දයන්ගේ; එකත්ව නපුංසකත්වය වේ—සාකුන්තිකො ච මාගවිකො ච, යන වාක්‍යයෙහි; සාකුන්තිකමාගවිකං, යනු වේ—3 අප්පාණිජාතීනං, අප්‍රාණිජාතිවාචී ශබ්දයන්ගේ එකත්ව නපුංසකත්වය වේ—ආරා ච සත්ති ච, යන වාක්‍යයෙහි; ආරසත්ති, යනු වේ—4 එකජ්ඣායනබ්‍රාහ්මණානං, සමානපාඨඇති බ්‍රාහ්මණවාචී ශබ්දයන්ගේ එකත්ව නපුංසකත්වය වේ—කඨකාලාපා ඉති, කඨකාලාපං යන, ආදී, මේ ආදියවේ—

5 "විභාසා රුක්ඛ තිණ පසු ධන ධඤ්ඤ ජනපදාදීනඤ්ච" යනු විකල්පකත්ව නපුංසකත්ව විධානසූත්‍රයයි විභාසා යනු පදය රුක්ඛතිණපසුධනධඤ්ඤජනපදාදීනං යනු පදය ච යනු පදයි—6 ද්වන්ද්වෙ, ද්වන්ද්ව සමාස කළ කල්හි; රුක්ඛාදීනං, වෘක්ෂාදීන්ගේ; එකත්තං, එකත්වයද; නපුංසකත්තඤ්ච, නපුංසකත්වයද; වා, විකල්පයෙන්; හොති, වේ—7 ධවො ච ඛදිරො ච, යන වාක්‍යයෙහි; ධවඛදිරං ධවඛදිරා, යනු වේ—මුඤ්ජො ච බබ්බජො ච, යන වාක්‍යයෙහි; මුඤ්ජබබ්බජං මුඤ්ජබබ්බජා, යනු වේ—අජා ච එළකො ච, යන වාක්‍යයෙහි; අජෙළකං අජෙළකා, යනු වේ—හිරඤ්ඤඤ්ච සුවණ්ණඤ්ච, යන

---

* අශ්වයුපි ඕ මුද්‍රිත පොතේ

1 යථා—නිච්චවිරොධීනමද්‍රබ්බානං—කුසලාකුසලං කුසලාකුසලානි—2 සකුණීනං—බකබලාකං බකබලාකා—3 බ්‍යඤ්ජනානං—දධිඝතං දධිඝතානි—4 දිසානං—පුබ්බාපරං පුබ්බාපරා ඉච්චාදි.

---

අධිසද්ද, සමිං තස්ස ලොපො—අධිසද්දෙන තුල්‍යාධිකරණත්තා ඉත්ථිසද්දොපි සමිං—නිච්චසමාසත්තා ආධාරභූතායං ඉත්ථියන්ති පදන්තරෙන විග්ගහො—අධිත්ථියන්ති සීහෙ—6 "උපසග්ගනිපාතපුබ්බකො අබ්‍යයීභාවො"—

---

වාක්‍යයෙහි; හිරඤ්ඤසුවණ්ණං හිරඤ්ඤසුවණ්ණානි, යනුවේ—සාලී ච යවා ච, යන වාක්‍යයෙහි; සාලියවං සාලියවා, යනු වේ—කාසී ච කොසලා ච, යන වාක්‍යයෙහි; කාසිකොසලං කාසිකොසලා, යනු වේ—8 ආදිසද්දෙන, ආදිශබ්දග්‍රහණයෙන්; අඤ්ඤෙසුපි ච, සෙසු අර්ථයෙහිද එකත්ව නපුංසකත්වය වේ—

1 යථා, මෙසේයි—නිච්චවිරොධීනං, නිත්‍යවිරොධීවූ; අද්‍රබ්බානං, ද්‍රව්‍යවාචීනොවන ශබ්දයන්ගේ විකල්පයෙන් එකත්ව නපුංසකත්වය වේ—කුසලච අකුසලච, යන වාක්‍යයෙහි; කුසලාකුසලං කුසලාකුසලානි, යනු වේ—2 සකුණීනං, පක්ෂිවාචී ශබ්දයන්ගේ විකල්පයෙන් එකත්ව නපුංසකත්වය වේ—බකො ච බලාකා ච, යන වාක්‍යයෙහි; බකබලාකං බකබලාකා, යනුවේ—3 බ්‍යඤ්ජනානං, බ්‍යඤ්ජනවාචී ශබ්දයන්ගේ විකල්පයෙන් එකත්ව නපුංසකත්වය වේ—දධිච ඝතච, යන වාක්‍යයෙහි; දධිඝතං දධිඝතානි, යනුවේ—4 දිසානං, දිසාවාචී ශබ්දයන්ගේ විකල්පයෙන් එකත්ව නපුංසකත්වය වේ—පුබ්බාපරං පුබ්බාපරා ඉති, පුබ්බාපරං පුබ්බාපරා යනු; ආදි, මේ ආදිය වේ.

---

අධිසද්ද, අධිශබ්දයා කෙරෙන්; සමිං, සමිංවිභක්ති වේ; තස්ස, ඊහට; ලොපො, ලොප් වේ—අධිසද්දෙන, අධිශබ්දයාහා; තුල්‍යාධිකරණත්තා, සමානාධිකරණ හෙයින්, ඉත්ථිසද්දොපි, ඉත්ථිශබ්දයා කෙරෙන්ද; සමිං, සමිංවිභක්ති වේ—නිච්චසමාසත්තා, නිත්‍යසමාසහෙයින්; ආධාරභූතායං ඉත්ථියං ඉති, ආධාරවූ ස්ත්‍රියකෙරෙහි යයි; පදන්තරෙන, අනික් පදයකින්; විග්ගහො, වාක්‍යය වේ—අධිත්ථියන්ති' අධිත්ථියං කියා; සීහෙ, සිටිකල්හි—6 "උපසග්ගනිපාතපුබ්බකො අබ්‍යයීභාවො" යනු අබ්‍යයීභාවසමාසසංඥාවිධානසූත්‍රයී—උපසග්ගනිපාතපුබ්බකො යනු පදය අබ්‍යයීභාවො යනු පදයි—7 උපසග්ගාදිපුබ්බකො, උපසර්ගාදීන් පූර්වපදප්‍රධානකොට ඇති;

7 උපසග්ගාදිපුබ්බකො සද්දො, විභත්‍යත්ථාදීසු සමාසො හොති අබ්‍යයීභාවසඤ්ඤො ච—1 “සො නපුංසකලිඞ්ගො” ති අබ්‍යයීභාවො නපුංසකලිඞ්ගො—2 “ශද්‍රුදිනා” එකවචනො ච—3 “සරො රස්සො නපුංසකෙ” ති රස්සො—4 “අඤ්ඤස්මා ලොපො ච”—5 අනකාරන්තා අබ්‍යයීභාවා පරා සබ්බාවිභත්ති ලුජ්ජරෙ—අධිත්ථි—6 විභත්තීනමත්ථො ආධාරාදී—ඉධාධිසද්දො ආධාරෙවත්තතෙ—අධිත්ථි ඉච්චෙතං පදං ඉත්ථියමිච්චෙතමත්ථං වදති—සමීපං නගරස්ස උපනගරං—7 “අං විභත්තීනමකාරන්තාබ්‍යයීභාවා” ති විභත්තීනං ක්වචි අං—ක්වචීති කිං? උපනගරෙ—අභාවො මක්ඛිකානං නිම්මක්ඛිකං—

---

සද්දො, ශබ්දය තෙම; විභත්‍යත්ථාදීසු, විභක්ත්‍යර්ථාදියෙහි; සමාසො හොති, සමාස වෙයි; අබ්‍යයීභාවසඤ්ඤො ච, අබ්‍යයීභාවසමාසසංඥද වේ—1 “සො නපුංසකලිඞ්ගො” ඉති, “සො නපුංසකලිඞ්ගො” යන සූත්‍රයෙන්; අබ්‍යයීභාවො, අබ්‍යයීභාවසමාසය තෙම; නපුංසකලිඞ්ගො, නපුංසකලිඞ්ග වේ—2 “ශද්‍රුදිනා” “ශද්‍රුදී” සූත්‍රයෙන්; එකවචනො ච, එකවචනද වේ—3 “සරො රස්සො නපුංසකෙ” ඉති, “සරො රස්සො නපුංසකෙ” යන සූත්‍රයෙන්; රස්සො, හ්‍රස්ව වේ—4 “අඤ්ඤස්මා ලොපො ච” යනු විභක්තිලොප්විධානසූත්‍රයි. අඤ්ඤස්මා යනු පදය ලොපො යනු පදය ච යනු පදයි—5 අනකාරන්තා, අකාරාන්ත නොවන්නාවූ; අබ්‍යයීභාවා පරා, අබ්‍යයීභාවසමාසයාකෙරෙන් පරවූ; සබ්බාවිභත්ති, සියලු විභක්තීහු ලුජ්ජරෙ, ලොප්කරනු ලැබෙත්—අධිත්ථි යනු වේ—6 විභත්තීනං, විභක්තීන්ගේ, අත්ථො, අර්ථය නම්, ආධාරාදී, ආධාරාදියයි—ඉධ, මෙහි, අධිසද්දො, අධිශබ්දය තෙම; ආධාරෙ වත්තතෙ, ආධාරයෙහි වැටේ—අධිත්ථි ඉති, අධිත්ථි යන, එතං පදං, මේ පදය; ඉත්ථියං, ස්ත්‍රිය කෙරෙහිය යන, එතං අත්ථං, මේ අර්ථය; වදති, කියා—නගරස්ස සමීපං, යන වාක්‍යයෙහි; උපනගරං, යනු වේ—7 “අං විභත්තීනමකාරන්තාබ්‍යයීභාවා” ඉති, “අං විභත්තීනමකාරන්තාබ්‍යයීභාවා” යන සූත්‍රයෙන්; විභත්තීනං, විභක්තීන්ට; ක්වචි, කිසිතැනෙක්හි, අං, අං යනාදෙශ වේ—ක්වචි ඉති, ක්වචි යනු; කිං, කුමටද; උපනගරෙ, යන තන්හි නොවන පිණිසයි—අභාවො මක්ඛිකානං, යන වාක්‍යයෙහි; නිම්මක්ඛිකං, යනු වේ—

රස්සා—1 අනුපුබ්බෙන ථෙරානං අනුථෙරං—අනතික්කම්ම සත්තිං යථාසත්ති—යෙ යෙ වුඩ්ඪා යථාවුඩ්ඪං—විච්ඡායං—2 යත්තකො පරිච්ඡෙදො ජීවස්ස යාවජීවං—අවධාරණෙ—3 ආපබ්බතා ඛෙත්තං ආපබ්බතං ඛෙත්තං—මරියාදායං—වජ්ජමානා සීමා මරියාදා—පබ්බතං විනාත්‍යත්ථො—4 ආජලන්තා සීතං ආජලන්තං සීතං—අභිවිධිම්හි—ගය්හමානා සීමා අභිවිධි—ජලෙනාපි සහෙත්‍යත්ථො—5 ආසද්දයොගෙ "ධාතුනාමං" ඉච්චාදිනා අපාදානවිධානෙනෙව වාක්‍යම්පි සිද්ධං—තදාසඤ්ඤත්ථා—6 උත්තමො වීරො පවීරො—ඉච්චාදො පන පුබ්බපදත්ථප්පධානතාභාවා බහුබ්බීහිභාවාභාවා කම්මධාරයො එව—එවං විසෙසා ධම්මා අභිධම්මා—

---

රස්සා, හ්‍රස්ව වේ—1 අනුපුබ්බෙන ථෙරානං, යන වාක්‍යයෙහි; අනුථෙරං, යනු වේ—අනතික්කම්ම සත්තිං, යන වාක්‍යයෙහි; යථාසත්ති, යනු වේ—යෙ යෙ වුඩ්ඪා, යන වාක්‍යයෙහි; යථාවුඩ්ඪං, යනු වේ—විච්ඡායං, මේ වීප්සාවෙහිසි—2 යත්තකො පරිච්ඡෙදො ජීවස්ස, යන වාක්‍යයෙහි, යාවජීවං, යනු වේ—අවධාරණෙ, මේ අවධාරණයෙහිසි—3 ආපබ්බතා ඛෙත්තං, යන වාක්‍යයෙහි; ආපබ්බතං යනු වේ—එත් කවරේද? ඛෙත්තං, ක්ෂෙත්‍රයයි—මරියාදායං, මේ මර්‍ය්‍යාදාවෙහිසි—වජ්ජමානා, හරණ ලබන්නාවූ; සීමා, සීමාතොමෝ; මරියාදා, මර්‍ය්‍යාද නම්—පබ්බතං විනාත්‍ය, පර්‍වතය හැරැ යන; අත්ථො, අර්ථයි—4 ආජලන්තා සීතං, යන වාක්‍යයෙහි; ආජලන්තං, යනු වේ—ගේ කවරේද? සීතං, ශෛත්‍යයයි—අභිවිධිම්හි, මේ අභිවිධියෙහිසි—ගය්හමානා, ගන්නාලබන්නාවූ; සීමා, සීමාතොම; අභිවිධි, අභිවිධි නමු—ජලෙනාපි සහෙත්‍යත්ථො, දියෙකාලවරහා සමගය යන අර්ථයි—5 ආසද්දයොගෙ, ආ යන උපසර්ගයාහා සම්බන්ධයක් ඇතිකල්හි; "ධාතුනාමං"ඉච්චාදිනා, "ධාතුනාමං"ඉ සූත්‍රයෙන්; අපාදානවිධානෙනෙව, අපාදානසංඥාකළ හෙයින්ම; වාක්‍යම්පි සිද්ධං, වාක්‍යයද සිද්ධයි—අසඤ්ඤත්ථා, සෙසු තන්හිද; තදා, එසේමැයි—6 උත්තමො වීරො පවීරො ඉති, —පෙ—ප්‍රවීරො යන; ආදො පන, මේ ආදී තන්හි වනාහි; පුබ්බපදත්ථප්පධානතාභාවා, පූර්‍වපදාර්ථයාගේ ප්‍රධානත්වයක් නැති හෙයින්; අබ්‍යයීභාවාභාවතො, අව්‍යයීභාවසමාසයාගේ නොවීමනුයි; කම්මධාරයො එව, කර්‍මධාරය සමාසම වෙයි—විසෙසා ධම්මා අභිධම්මා, යනුද; එවං, මෙසේමැයි—

කුච්ඡිතං අන්නං කදන්නං—එත්ථ "කදං කුස්සා"ති සරෙ කුස්ස කදාදෙසො—අප්පකං ලවණං කාලවණං—එත්ථ "කාප්පත්ථෙසු චා"ති කුස්ස කා—බහුවචනෙනාඤ්ඤත්‍රාපි ක්වචි—කුච්ඡිතො පුරිසො, කාපුරිසො කුපුරිසො වා—එවමසුරාදී.

1. පුබ්බපරූභයමඤ්ඤපදත්ථප්පධානාබ්‍යයීභාවසමාසො,
කම්මධාරයතප්පුරිසා චෙව ද්වන්දො ච බහුබ්බීහි ච ඤෙය්‍යා.

## සමාසො.

---

කුච්ඡිතං අන්නං, යන වාක්‍යයෙහි; කදන්නං, යනු වේ—එත්ථ, මෙහි; "කදං කුස්සා"ති, "කදං කුස්ස" යන සූත්‍රයෙන්; සරෙ, ස්වරයා පරකල්හි; කුස්ස, කුශබ්දයහට; කදාදෙසො, කද යනාදේශ වේ—අප්පකං ලවණං, යන වාක්‍යයෙහි; කාලවණං, යනු වේ—එත්ථ, මෙහි; "කාප්පත්ථෙසු ච"ඉති, "කාප්පත්ථේසු ච" යන සූත්‍රයෙන්; කුස්ස, කුශබ්දයහට; කා, කායනාදෙශ වේ—බහුවචනෙන, බහුවචනග්‍රහණයෙන්; අඤ්ඤත්‍රාපි, සෙසු අර්ථයෙහිද; ක්වචි, කිසිතැනෙක්හි කායනාදෙශ වේ—කුච්ඡිතො පුරිසො, යන වාක්‍යයෙහි; කාපුරිසො, යනු වේ; කුපුරිසො වා, කුපුරිසො කියාහෝ වේ—අසුරාදී, අසුරශබ්දයා ආදිකොටඇති ශබ්දයෝද; එවං, මෙසේමැයි.

1 අබ්‍යයීභාවසමාසො ච, අව්‍යයීභාව සමාසයද; කම්මධාරයතප්පුරිසා චෙව ච, කර්මධාරය සමාසය තත්පුරුෂ සමාසය යන දෙදෙනාද; ද්වන්දො ච, ද්වන්ද සමාසයද; බහුබ්බීහි ච, බහුව්‍රීහි සමාසයද යන මොහු; පුබ්බ, පූර්වපදාර්ථය; පර, උත්තරපදාර්ථය; උභය, උභයපදාර්ථය; අඤ්ඤපදත්ථප්පධානා, අන්‍යපදාර්ථය යන මොවුන් ප්‍රධාන කොට ඇත්තාහයි; ඤෙය්‍යා, පිළිවෙළින් දතයුත්තාහුයි.

සමාසො, සමාසය කියා නිමවන ලදී.

---

1 "වා ණප්පච්චෙ"—ජණ්ණාතා සද්දා තස්සාපච්චමිච්චස්මිං අත්ථෙ
ණො වා හොති—වාති වාක්‍යත්ථො—ණණෙනවාපච්චස්ස වුත්ත
ත්තා අපච්චසද්දප්පයොගො—"තෙසං විඝතාසා"දෙ, 2තෙසං ගහ
ණෙන විඝතාදිලොපො—තථොත්තරත්‍ර—2 "තෙසං ණො ලො
පං"ති පච්චයානං ණස්ස ලොපො—3 "වුඩ්ඪාදිසරස්ස වා සංයොග
න්තස්ස සණෙ ච"ති ණකාරෙ පරෙ අසංයොගන්තස්සාදිසරස්ස
වුඩ්ඪි—තස්සාපනියමෙ—4 "අයුවණ්ණානඤ්චායො වුඩ්ඪි"—අකාරිව
ණ්ණුවණ්ණානං ආඑඔ වුඩ්ඪියො හොන්ති වසද්දෙන කව් න—

---

1 "වා ණප්පච්චෙ" යනු ණප්‍රත්‍යය විධාන සූත්‍රයි වා යනු පදය
ණො යනු පදය අපච්චෙ යනු පදයි—ජණ්ණාතා සද්දා, ෂෂ්ඨ්‍යන්තශ
බ්දයා කෙරෙන්; තස්ස, ඔහුගේ; අපච්චං ඉති, පුත්‍රය යන; අත්ථෙ
අත්ථෙ, මේ අර්ථයෙහි; ණො, ණප්‍රත්‍යය තෙම; වා, විකල්පයෙන්;
හොති, වේ—වා ඉති, වා යනු; වාක්‍යත්ථං, වාක්‍යය පිණිසයි—ණණ
ෙනව, ණප්‍රත්‍යයා විසින්ම; අපච්චස්ස, අපත්‍යාර්ථයා තම්හා; වු
ත්තත්තා, කියනලද හෙයින්; අපච්චසද්දප්පයොගො, අපච්චශබ්දයා
ගේ ලොප්කිරීම වේ—"තෙසං විඝතාසා"දෙ, "තෙසං විඝතාදීයො
ලොපා ච" යන සූත්‍රයෙහි; තෙසං ගහණෙන, තෙසංග්‍රහණයෙන්;
විඝතාදිලොපො, විඝතාදිනට ලොප් වේ—තථා, එසේම; උත්තර
ත්‍ර, මතුමත්තෙහිදු දතයුත්තේයි.

2 "තෙසං ණො ලොපං"ඉති, "තෙසං ණො ලොපං" යන සූත්‍ර
යෙන්, පච්චයානං, ප්‍රත්‍යයන්ගේ; ණස්ස, ණකාරයහට; ලොපො,
ලොප් වේ—3 "වුඩ්ඪාදිසරස්ස වා සංයොගන්තස්ස සණෙ ච"ඉති,
"වුඩ්ඪාදිසරස්ස වා සංයොගන්තස්ස සණෙ ච" යන සූත්‍රයෙන්; ස
ණකාරෙ පරෙ, ණානුබන්ධප්‍රත්‍යයා පරකල්හි; අසංයොගන්තස්ස,
සංයොගාන්ත නොවන්නාවූ; ආදිසරස්ස, ආදිස්වරයහට; වුඩ්ඪි, වෘ
ද්ධි වේ—තස්සාපි, ඒ වෘද්ධියගේද; අනියමෙ, නියමයක් නැතිකල්
හි—4 "අයුවණ්ණානඤ්චායො වුඩ්ඪි" යනු වෘද්ධිවිධාන සූත්‍රයි අයුවණ්ණා
නං යනු පදය ච යනු පදය ආයො යනු පදය වුඩ්ඪි යනු පදයි—
අකාරිවණ්ණුවණ්ණානං, අකාරය ඉවර්ණය උවර්ණය යන මොවුන්
ට; ආඑඔ, ආය එය ඔය යන මොහු; වුඩ්ඪියො හොන්ති, වෘද්ධි වෙත්;
වසද්දෙන, ව ශබ්දග්‍රහණයෙන්; කව්, කිසිතැනෙක්හි; න, නො
වෙත්—

සරලොපාදි—තද්ධිතන්තා නාමම්ව කතෙ ස්‍යාදි.

1 තද්ධිතාභිධෙය්‍යලිඞ්ගවිභත්තිවචනා සියුං,
සමූහභාවජා භිය්‍යො සකත්ථෙ ණ්‍යා නපුංසකෙ,
තා තු ත්‍ථියං නිපාතා තෙ ධාදිංපච්චයන්තකා.

2 වසිට්ඨස්සාපච්චං පොසො වාසිට්ඨො—ඉත්ථී වාසිට්ඨී—නපුංසකං වාසිට්ඨං—විකප්පවිධානතො තද්ධිතෙන සමාසස්සාච්ඡින්නත්තා බාධායාභාවා වසිට්ඨාපච්චන්තිපි හොති—

3 සාමඤ්ඤෙභිමතෙ සද්දෙ නිද්දිස්සති පුමෙන වා,
නපුංසකෙන වාපීති සද්දසත්ථවිදූ විදුං.

---

සරලොපාදි, ස්වර ලොපප්‍රක්‍රියාදි න්‍යායයී වේ—තද්ධිතන්තා, තද්ධිතාන්ත බැවින්; නාමම්ව කතෙ, නාමවත් කළ කල්හි; ස්‍යාදි, සිආදි විභක්ති වේ.

1 තද්ධිතා, තද්ධිතප්‍රත්‍යයෝ තුමූ; අභිධෙය්‍ය, අර්ථයට බඳුවූ; ලිඞ්ග, ලිඞ්ගය; විභත්ති, විභක්තීන්; වචනා, වචනයන් ඇත්තාහු; සියුං, වන්නාහ; සමූහභාවජා, සමූහාර්ථ භාවාර්ථ දෙක්හිවූ තද්ධිතප්‍රත්‍යයෝද; සකත්ථෙ, ස්වාර්ථයෙහිවූ; ණ්‍යා, ණ්‍යප්‍රත්‍යයද යන මොහු; භිය්‍යො, බොහෝසේ; නපුංසකෙ, නපුංසකලිඞ්ගයෙහි වන්නාහුය; තා තු, තාප්‍රත්‍යය වනාහි; ඉත්ථියං, ස්ත්‍රීලිඞ්ගයෙහි වන්නේය; ධාදී, ධප්‍රත්‍යය ආදිකොටඇති; ංපච්චයන්තකා, ංප්‍රත්‍යය කෙළවර කොටඇති; තෙ, ඒ ප්‍රත්‍යයෝ; නිපාතා, නිපාතයෝ නම් වෙත්— 2 වසිට්ඨස්සාපච්චං පොසො, යන වාක්‍යයෙහි; වාසිට්ඨො, යනු වේ- ඉත්ථී වාසිට්ඨී, වසිට්ඨස්සාපච්චා ඉත්ථී, යන වාක්‍යයෙහි වාසිට්ඨී යනු වේ—* නපුංසකං වාසිට්ඨං, වසිට්ඨස්සාපච්චං නපුංසකං, යන වාක්‍යයෙහි වාසිට්ඨං යනු වේ—† විකප්පවිධානතො, තද්ධිත විකල්පයෙන් කළහෙයින්; තද්ධිතෙන, තද්ධිතප්‍රත්‍යයා විසින්; සමාසස්ස, සමාසයහට; අච්ඡින්නත්තා, අතිශයින්; බාධායාභාවා, බාධාවක්හුගේ නොවීමෙන්; වසිට්ඨාපච්චන්තිපි හොති, වසිට්ඨාපච්චං කියාද වේ—.3 සාමඤ්ඤෙ, සාමාන්‍යයක්; අභිමතෙ, කැමතිවන ලද කල්හි

---

* ඉත්ථි, ස්ත්‍රීලිඞ්ගයෙහි යනු සන්නය.

† නපුංසකං, නපුංසකලිඞ්ගයෙහි යනු සන්නය.

1 වා අපච්චෙතිවාධිකාරෙ—"ණායන ණාන වච්ඡාදිතො"—වච්ඡාදිතො ගොත්තගණතො ණායනො ණානො ච හොති—අපච්චං පුත්තප්පභුති ගොත්තං—කච්චස්සාපච්චං කච්චායනො කච්චානො වා—සංයොගන්තත්තා න වුඩ්ඪි—2 "ණෙය්‍යො කත්තිකාදීහි"ති ණෙය්‍යො—විනතාය අපච්චං වෙනතෙය්‍යො විනතෙය්‍යො වා—න පක්ඛෙ වුඩ්ඪි—3 ණෙය්‍යොති යොගවිභාගෙන තස්ස දීයතෙත්‍යස්මිම්පි ණෙය්‍යො—දක්ඛිණා දීයතෙ යස්ස සො දක්ඛිණෙය්‍යො—

---

සද්දො, ශබ්දය තෙම්; පුමෙහි වා, පුල්ලිඞ්ගයෙන්හෝ; අපි, නැවත; නපුංසකෙහි වා, නපුංසකලිඞ්ගයෙන්හෝ; නිද්දිස්සතීති, දක්වනු ලැබේනුයි; සද්දසත්ථවිදූ, ශබ්දශාස්ත්‍රඥයන්හෝ; විදුං, දනිත්.

1 වා ඉති, වා යනුද; අපච්චෙති, අපච්ච යනුද; අධිකාරෙ, මතුමතු සූත්‍රහා සම්බන්ධකරනු ලැබේ—"ණායන ණානා වච්ඡාදිතො"යනු ණායන ණාන ප්‍රත්‍යයවිධාන සූත්‍රයි ණායන ණානා යනු පදය වච්ඡාදිතො යනු පදයි—වච්ඡාදිතො, වච්ඡ ශබ්දයා ආදි කොට ඇති; ගොත්තගණතො, ගොත්‍රගණවාචී ශබ්දයාකෙරෙන්; ණායනො, ණායන ප්‍රත්‍යයද; ණානො ච, ණාන ප්‍රත්‍යයද; වා, විකල්පයෙන්; හොති, වේ—පුත්තප්පභුති, මුනුබුරා පටන් කොට; අපච්චං, පුත්‍ර තෙම; ගොත්තං, ගොත්‍ර නම් වේ—කච්චස්ස අපච්චං, යන වාක්‍යයෙහි; කච්චායනො, යනු වේ; කච්චානො වා, කච්චානො කියාහෝ වේ—සංයොගන්තත්තා, සංයොගාන්ත බැවින්; න වුඩ්ඪි, වෘද්ධි නොවේ.

2 "ණෙය්‍යො කත්තිකාදීහි"ඉති, "ණෙය්‍යො කත්තිකාදීහි" යන සූත්‍රයෙන්; ණෙය්‍යො, ණෙය්‍ය ප්‍රත්‍යය වේ—විනතාය අපච්චං, යන වාක්‍යයෙහි; වෙනතෙය්‍යො, යනු වේ; විනතෙය්‍යො වා, විනතෙය්‍යො කියාහෝ වේ—පක්ඛෙ, එක් පක්ෂයෙක්හි; න වුඩ්ඪි, වෘද්ධි නොවේ—3 ණෙය්‍යොති, ණෙය්‍යො යන; යොගවිභාගෙන, සූත්‍රවිභාකරණයෙන්; තස්ස දීයතෙත්‍යස්මිම්පි, ඔහට දෙනු ලැබේයයි යන අර්ථයෙහිද; ණෙය්‍යො, ණෙය්‍ය ප්‍රත්‍යය වේ—දක්ඛිණා දීයතෙ යස්ස සො, යන වාක්‍යයෙහි; දක්ඛිණෙය්‍යො, යනු වේ.

1 "අතො ණි වා"—අකාරන්තතො අපච්චෙ ණි වා හොති—පුන වාසද්දෙන ණිකො අකාරන්තා අනකාරන්තා ච බොපි—දක්ඛි—සක්‍යපුත්තිකො—මණ්ඩබ්බො—භාතුබ්බො—විනතං—2 "ණවො පගවාදීහී"ති ණවො—මනුනො අපච්චං මාණවො—3 "ණෙර විධවාදිතො"ති ණෙරො—සාමණෙරො.

---

"යෙන වා සංසට්ඨං තරති චරති වහති ණිකො"ති ණිකො—වාකාරෙන නෙකත්ථෙ නෙකප්පච්චයා ච—ඝතෙන සංසට්ඨො ඝාතිකො—ඔදනො—උළුම්පෙන තරතීති ඔළුම්පිකො උළුම්පිකො වා—න පනෙත්ථ වුද්ධි—සකටෙන චරතීති සාකටිකො—සීසෙන වහතීති සීසිකො—න වුද්ධි--

---

1 "අතො ණි වා" යනු ණි ප්‍රත්‍යයවිධාන සූත්‍රයි අතො යනු පදය ණි යනු පදය වා යනු පදයි—අකාරන්තාතො, අකාරාන්ත නාම්‍යා කෙරෙන්, අපච්චෙ, අපත්‍යාර්ථයෙහි කිව්මනා කල්හි; ණි, ණි ප්‍රත්‍යය තෙම; වා හොති, විකල්පයෙන් වේ—පුන, නැවත; වාසද්දෙන, වා ග්‍රහණයෙන්; ණිකො, ණික ප්‍රත්‍යය වේ; අකාරන්තා, අකාරාන්තයා කෙරෙන්ද; අනකාරන්තා ච, අකාරාන්ත නොවූ ශබ්දයා කෙරෙන්ද; බොපි, බ ප්‍රත්‍යයද වේ—දක්ඛි, යනු වේ—සක්‍යපුත්තිකො. යනු වේ—මණ්ඩබ්බො, භාතුබ්බො, යනු වේ—විනතං, වින්තව වේ—2 "ණවො පගවාදීහි"ඉති, "ණවො පගවාදීහි" යන සූත්‍රයෙන්; ණවො, ණව ප්‍රත්‍යය වේ—මනුනො අපච්චං, යන වාක්‍යයෙහි; මාණවො, යනු වේ—3 "ණෙර විධවාදිතො"ඉති, "ණෙර විධවාදිතො" යන සූත්‍රයෙන්; ණෙරො, ණෙර ප්‍රත්‍යය වේ—සාමණෙරො, යනු වේ.

---

"යෙන වා සංසට්ඨං තරති චරති වහති ණිකො" ඉති, —පෙ—යන සූත්‍රයෙන්; ණිකො, ණික ප්‍රත්‍යය වේ—වාකාරෙන, වා ග්‍රහණයෙන්; අනෙකත්ථෙ, අනෙකාර්ථයෙහි; අනෙකප්පච්චයා ච; අනෙක ප්‍රත්‍යයෝද වෙත්—ඝතෙන සංසට්ඨො, යන් වාක්‍යයෙහි; ඝාතිකො යනු වේ—(ඒ කවරේද? ඔදනො, ආහාරයයි—ඔළුම්පෙන තරතීති, යන වාක්‍යයෙහි; ඔළුම්පිකො, යනු වේ—උළුම්පිකො වා, උළුම්පිකො කියාහෝ වේ—පක්ඛෙ, එක් පක්ෂයෙක්හි; න වුද්ධි, වෘද්ධි නොවේ—සකටෙන චරතීති, යන වාක්‍යයෙහි; සාකටිකො, යනු වේ—

1 ඉත්ථිලිඞ්ගතො එය්‍යකො ණෙය්‍යො ච—චම්පායං ජාතො චම්පෙය්‍යකො—එවං බාරාණසෙය්‍යකො—ණෙය්‍යො—කුසිනාරායං වසතීති කොසිනාරෙය්‍යො—2 ජනපදතො ණිකො ච—මගධෙ වසන්තීති තස්සිස්සරො වා * මාගධකො—

3 තජ්ජාතියා විසිට්ඨෙ ආජානීයො—අස්සජාතියා විසිට්ඨො අස්සාජානීයො—ණඤ—අග්ගජාති ජනිතඤ්ඤං අග්ගඤ්ඤං—ඕතතං.—4 "තමධීතෙ තෙන කතාදි සන්නිධාන නියොග සිප්ප භණ්ඩ ජීවිකත්ථෙසු ච"—තං අධීතෙ ඉච්චාදීස්වත්ථෙසු ආදිසද්දෙන හතාදීසු ච ණිකො වා හොති—අභිධම්මමධීතෙති ආභිධම්මිකො

---

සිසෙසු වසතීති, යන වාක්‍යයෙහි; සිසිකො, යනු වේ—න වුඩ්ඪි, වෘද්ධි නොවේ—1 ඉත්ථිලිඞ්ගතො, ස්ත්‍රීලිඞ්ගවාචී ශබ්දයන් කෙරෙන් පරව; එය්‍යකො, එය්‍යක ප්‍රත්‍යයද; ණෙය්‍යො ච, ණෙය්‍ය ප්‍රත්‍යයද වේ—චම්පායං ජාතො, යන වාක්‍යයෙහි; චම්පෙය්‍යකො. යනු වේ—බාරාණසෙය්‍යකො, යනුද; එවං, මෙසේමැයි—ණෙය්‍යො, ණෙය්‍ය ප්‍රත්‍යය වේ—කුසිනාරායං වසතීති, යන වාක්‍යයෙහි; කොසිනාරෙය්‍යො; යනු වේ—2 ජනපදතො, ජනපදවාචී ශබ්දයන් කෙරෙන් පරව, ණිකො, ණික ප්‍රත්‍යය වේ—මගධෙ වසන්තීති වා, මගධයෙහි වෙසෙන්නුයිනෝ; තස්සිස්සරො වා, ඒ මගධයාගේ ඊශ්වරයෝ; මාගධකො, මාගධක නම්—3 තජ්ජාතියා, ඒ ජාතියෙන්, විසිට්ඨෙ, විශේෂ කරන ලද අර්ථයෙහි; ආජානීයො, ආජානීය ප්‍රත්‍යය වේ—අස්සජාතියා විසිට්ඨො, යන වාක්‍යයෙහි; අස්සාජානීයො, යනු වේ—ණඤ, ඤ ප්‍රත්‍යය වේ—අග්ගජාති, අග්‍රයයි; ජනිතඤ්ඤං, දනහුන්නේත්; අග්ගඤ්ඤං, අග්ගඤ්ඤ නම්—ඕතතං, ඕතව වේ.

4 "තමධීතෙ තෙන කතාදිසන්නිධානනියොගසිප්පභණ්ඩජීවිකත්ථෙසු ච" යනු ණික ප්‍රත්‍යයවිධාන සූත්‍රයි—තං යනු පදය අධීතෙ යනු පදය තෙන යනු පදය කතාදිසන්නිධානනියොගසිප්පභණ්ඩජීවිකත්ථෙසු යනු පදය ච යනු පදයි—තං අධීතෙ ඉති, ඒ හදාරයි යනු; ආදිස්වත්ථෙසු, මේ ආදිඅර්ථයෙහිද; ආදිසද්දෙන, ආදිශබ්දයෙන්; හතාදීසු ච, හතාදිඅර්ථයෙහිද; ණිකො, ණික ප්‍රත්‍යය තෙම; වා හොති, විකල්පයෙන් වේ—අභිධම්මමධීතෙති, යන වාක්‍යයෙහි; ආභිධම්මිකො, යනු වේ;

---

* මගධෙසු වසන්ති එතස්ස ඉස්සරො වා—මුද්‍රිත පොත්.

අභිධම්මිකො වා—න පක්ඛෙ වුඩ්ඪි—වචසා කතං කම්මං වාචසිකං—එවං මානසිකං—එත්ථ "ස සරෙ වාගමො"ති ගානුවත්තිතාදිසද්දෙන සාගමො—1 සරීරෙ සන්නිධානා (වෙදනා) සාරීරිකා—ද්වාරෙ නියුත්තො දොවාරිකො—එත්ථ "මායූනමාගමො ඨානෙ"ති වකාරතො පුබ්බෙ ඔකාරාගමො—2 සිප්පානි ගීතාදිකලා—වීණා අස්ස සිප්පන්ති වෙණිකො—අත්‍ර වීණෙති වීණාවාදනං—ගන්ධො අස්ස භණ්ඩන්ති ගන්ධිකො—මගෙ හන්ත්වා ජීවතීති මාගවිකො—වකාරාගමො—ජාලෙන හනතො ජාලිකො—සුත්තෙන බද්ධො සුත්තිකො—චාපො අස්ස ආයුධොති චාපිකො—

වාතො අස්ස අබාධො අත්ථීති වා වාතිකො—බුද්ධෙ පසන්නො බුද්ධිකො—වත්ථෙන කීතං භණ්ඩං වත්ථිකං—කුම්භො අස්ස පරිමාණං තමරහති එතස්ස රාසි වා කුම්භිකො—අක්ඛෙන දිබ්බතීති අක්ඛිකො—මගධෙ * වසති ජාතොතිවා මාගධිකො ඉච්චාදි.

---

අභිධම්මිකො වා; අභිධම්මිකො කියාහෝ වේ—පක්ඛෙ, එක් පක්ෂයෙක්හි; න වුඩ්ඪි, වෘද්ධි නොවේ—වචසා කතං කම්මං, යන වාක්‍යයෙහි; වාචසිකං, යන්නු වේ—

මානසිකං, මානසිකං යන්නද; එවං, මෙසේමැයි—එත්ථ, මෙහි; "ස සරෙ වාගමො" ඉති, "ස සරෙ වාගමො" යන; ඉත, මෙයින්; අනුවත්තිත, අනුවෘත්තිකරනලද; ආදිසද්දෙන; ආදි ශබ්ද ග්‍රහණයෙන්; සාගමො; සකාරයෙක් ආගම වේ—1 සරීරෙ සන්නිධානා (වෙදනා) යන වාක්‍යයෙහි; සාරීරිකා; යන්නු වේ—ද්වාරෙ නියුත්තො; යන වාක්‍යයෙහි; දොවාරිකො; යන්නු වේ—එත්ථ, මෙහි; "මායූනමාගමො ඨානෙ" ඉති; —පෙ—යන සූත්‍රයෙන්; වකාරතො; වකාරයා කෙරෙන්; පුබ්බෙ; පූර්වයෙහි; ඔකාරාගමො; ඔකාරයෙක් ආගම වේ—2 සිප්පානි, සිල්පනම්; ගීතාදිකලා; ගීතාදිවූ කලාසි—වීණා අස්ස සිප්පන්ති, යන වාක්‍යයෙහි; වෙණිකො; යන්නු වේ—අත්‍ර; මෙහි; වීණා ඉති, වීණාසිබ්යා; වීණාවාදනං, වීණාගායනාකිරීමයි—ගන්ධො අස්ස භණ්ඩං; යන වාක්‍යයෙහි; ගන්ධිකො; යන්නු වේ—මගෙ හන්ත්වා ජීවතීති, යන වාක්‍යයෙහි; මාගවිකො; යන්නු වේ—වකාරාගමො, වකාරයෙක් ආගම වේ—ජාලෙන හනතො, යන වාක්‍යයෙහි; ජාලිකො; යන්නු වේ—සුත්තෙන බද්ධො, යන වාක්‍යයෙහි; සුත්තිකො යන්නු වේ—චාපො අස්ස ආයුධොති, යන වාක්‍යයෙහි; චාපිකො, යන්නු වේ—

---

* මගධෙසු—මුද්‍රිතපොත්.

"ණ රාගා තෙන රත්තං තස්සෙදමඤ්ඤත්ථෙසු ච"—තෙන රත්තං තාදත්ථෙසු ණො වා හොති—කාසාවෙන රත්තං කාසාවං—එවං නීලං පීතමිච්චාදි—න වුද්ධි—මහිසස්ස ඉදං මාහිසං, සින්ධවා—එවං රාජපොරිසං—එත්ථ "ආයුවණ්ණානඤ්චා"දො පුන වුද්ධිගහණෙන උත්තරපදස්ස වුද්ධි—මගධාගතො තත්‍ර ජාතො තස්සිස්සරො.

සො අස්ස නිවාසොති වා මාගධො *—කත්තිකාදීහි යුත්තො කාත්තිකො; මාසො—බුද්ධො අස්ස දෙවතාති බුද්ධො—ව්‍යාකරණං අධීච්ච අධීතෙති වෙය්‍යාකරණො—එත්ථ "මායූනමා"දිනා යකාරතො පුබ්බෙ එ ආගමො—සස්ස විත්තං—සගරෙහි නිබ්බත්තො සාගරො ඉච්චාදි.

---

මාතා අස්ස ආබාධො අත්ථීති වා, යන වාක්‍යයෙහි; මාතිකො, යනු වේ—බුද්ධෙ පසන්නො, යන වාක්‍යයෙහි; බුද්ධිකො, යනු වේ—වණ්ණේන කීතං භණ්ඩං, යන වාක්‍යයෙහි; වණ්ණිකං යනු වේ—කුම්භො අස්ස පරිමාණං තමරහති තෙසං රාසි වා, යන වාක්‍යයෙහි; කුම්භිකො, යනු වේ—අක්ඛෙහි දිබ්බතීති, යන වාක්‍යයෙහි; අක්ඛිකො, යනු වේ—

මගධෙ වසති ජාතොති වා; මාගධිකො ඉති, මගධෙ වසති ජාතොතිවා මාගධිකො යන; ආදි, මේ ආදිය වේ.

"ණ රාගා තෙන රත්තං තස්සෙදමඤ්ඤත්ථෙසු ච" යනු ණ ප්‍රත්‍යයවිධාන සූත්‍රයි ණ යනු පදය රාගා යනු පදය තෙන යනු පදය රත්තං යනු පදය තස්ස යනු පදය ඉදං යනු පදය අඤ්ඤත්ථෙසු යනු පදය ච යනු පදයි—තෙන රත්තං ඉති, එයින් රදන ල යී යනු; ආදත්ථෙසු, මේ ආදිඅර්ථයෙහි; ණො, ණ ප්‍රත්‍යය තෙම; වා හොති, විකල්පයෙන් වේ—කාසාවෙන රත්තං, යන වාක්‍යයෙහි; කාසාව, යනු වේ—නීලං පීතං ඉති, නීලං පීතං යනු; ආදී, මේ ආදියද; එවං, මෙසේමැයි—න වුද්ධි, වෘද්ධි නොවේ—මහිසස්ස ඉදං, යන වාක්‍යයෙහි; මාහිසං යනුවේ—සින්ධවං, අශ්වයී—රාජපොරිසං, යනුද; එවං, මෙසේමැයි—එත්ථ, මෙහි; "ආයුවණ්ණානඤ්චා"දො "ආයුවණ්ණානඤ්චායො වුද්ධි" යන සූත්‍රයෙහි; පුන, නැවත, වුද්ධිගහණෙන, වෘද්ධිග්‍රහණයෙන්, උත්තරපදස්ස, උත්තරපදයාහට; වුද්ධි, වෘද්ධි වේ—

---

* මගධෙහි ආගතො තත්‍ර ජාතො තෙසං ඉස්සරො සො අස්ස නිවාසොති වා මාගධො—මුද්‍රිත පොතේ.

1 "ජනාදීනමිමියා ච"—ජනාදීසු ඉමො ඉයො ච හොති වසද්දෙන කියො ච—පච්ඡා ජනො පච්ඡිමො—මනුස්සජාතියා ජනො මනුස්සජාතියො—අන්තෙ නියුත්තො අන්තිමො අන්තියො—එවං අන්ධකියො—පුත්තා අස්ස අත්ථීති පුත්තිමො පුත්තියො—එවං කප්පියො—2 "තදස්සට්ඨානමීයො චෙ"ති ඊයො චකාරෙන හිතාද්‍යත්ථෙපි—බන්ධනස්ස ඨානං බන්ධනීයං—වඩ්ඪමනස්ස, හිතං වඩ්ඪමනීයං—

---

මගධාගතො තත්‍ර ජනො තස්සිස්සරො සො අස්සනිවාසොති වා, යන වාක්‍යයෙහි; මාගධො යනුවේ—කත්තිකාදීහි යුත්තො, යන වාක්‍යයෙහි; කත්තිකො, යනු වේ—(ඒ කවරේද? මාසො; හිල්මඝයි—බුද්ධො අස්ස දෙවතාති, යන වාක්‍යයෙහි; බුද්ධො, යනු වේ—ව්‍යාකරණං අවෙච්ච අධීතෙති, යනවාක්‍යයෙහි; වෙය්‍යාකරණො, යනු වේ—

එහි, මෙහි; "මායූනම"දිනා, "මායූනමාගමො ඨානෙ" යන සූත්‍රයෙන්; ය්කාරතො පුබ්බ; යකාරයා කෙරෙන් පූර්වයෙහි; එ ආගමො; එකාරයක් ආගම වේ—යස්ස, යකාරයහට; විතානං, විත වේ—සගරෙහි නිබ්බත්තො, යන වාක්‍යයෙහි; සාගරො ඉති, සාගරො යන; ආදී, මේ ආදිය වේ.

"ජනාදීනමිමියා ච" යනු ඉම ඉය ප්‍රත්‍යයවිධාන සූත්‍රයි—ජනාදීනං යනුපදය ඉමියා යනුපදය ච යනුපදයි—ජනාදීසු, ජනාද්‍යර්ථ යෙහි; ඉමො, ඉම ප්‍රත්‍යයද; ඉයො ච, ඉය ප්‍රත්‍යයද; හොති, වේ වසද්දෙන, වශබ්දග්‍රහණයෙන්; කියො ච, කිය ප්‍රත්‍යයද වේ—පච්ඡා ජනො; යන වාක්‍යයෙහි; පච්ඡිමො, යනු වේ—මනුස්සජාතියා ජනො, යන වාක්‍යයෙහි; මනුස්සජාතියො, යනු වේ—අන්තෙ නියුත්තො, යන වාක්‍යයෙහි, අන්තිමො අන්තියො යනු වේ—අන්ධකියො, යනුද; එවං, මෙසේමැයි—පුත්තා අස්ස අත්ථි, යන වාක්‍යයෙහි; පුත්තිමො, පුත්තියො, යනු වේ—කප්පියො, යනුද; එවං; මෙසේමැයි—2 "තදස්සට්ඨානමීයො ච" ඉති, "තදස්සට්ඨානමීයොච" යන සූත්‍රයෙන්; ඊයො, ඊය ප්‍රත්‍යය වේ; චකාරෙන, චශබ්දග්‍රහණයෙන්; හිතාද්‍යත්ථෙපි, හිතාද්‍යර්ථයෙහිද ඊය ප්‍රත්‍යය වේ—බන්ධනස්ස ඨානං, යන වාක්‍යයෙහි; බන්ධනීයං, යනු වේ— වඩ්ඪමනස්ස හිතං, යන වාක්‍යයෙහි; වඩ්ඪමනීයං, යනු වේ—

1 "ආලු තබ්බහුලෙ"ති ආලු—අභිජ්ඣා බහුලා අභිජ්ඣාලු—2 "විසෙසෙ තරතමිස්සිකියිට්ඨා"—අතිසයත්ථෙ තරාදයො හොන්ති—අයමෙතෙසං අතිසයෙන පාපොති පාපතරො පාපතමො, පාපිස්සිකො, පාපියො, පාපිට්ඨො වා—"වුද්ධස්ස ජො ඉයිට්ඨෙසු"ති වුද්ධස්ස ජාදෙසො—සරලොපාදෙ, පකතිගණහණෙන පකතිභාවො ඉස්ස එ—ජෙය්‍යො ජෙට්ඨො—එවං "පසත්ථස්ස සො ච"ති සාදෙසො—සෙය්‍යො සෙට්ඨො. 3 "තදස්සත්ථීති වී ච"ති වී—මෙධා අස්සත්ථීති මෙධාවී.

1 එවං "තපාදිතො සී"ති සී—විතතං—තපස්සී. 2 "දණ්ඩාදිතො ඉක ඊ"ති ඉකො ඊ ච—දණ්ඩිකො, දණ්ඩී.

---

1 "ආලු තබ්බහුලෙ" ඉති, "ආලු තබ්බහුලෙ" යන සූත්‍රයෙන්; ආලු ආලු ප්‍රත්‍යය වේ—අභිජ්ඣා බහුලා, යන වාක්‍යයෙහි; අභිජ්ඣාලු, යනු වේ. 2 "විසෙසෙ තරතමිස්සිකියිට්ඨා" යනු තරාදි ප්‍රත්‍යයවිධාන සූත්‍රයි. විසෙසෙ යනු පදය තරතමිස්සිකියිට්ඨා යනු පදයි—අතිසයත්ථෙ, අතිශයාර්ථයෙහි; තරාදයො හොන්ති, තරාදි ප්‍රත්‍යයෝ වේත්—අයමෙතෙසං අතිසයෙන පාපොති, යන වාක්‍යයෙහි; පාපතරො, පාපතර නමි; පාපතමො, පාපතම නම; පාපිස්සිකො, පාපිස්සික නම; පාපියො, පාපිය නම; පාපිට්ඨො වා, පාපිට්ඨ කියා හෝ වේ—"වුද්ධස්ස ජො ඉයිට්ඨෙසු" ඉති, "වුද්ධස්ස ජො ඉයිට්ඨෙසු" යන සූත්‍රයෙන්; වුද්ධස්ස, වුද්ධ ශබ්දයහට; ජාදෙසො, ජකාරාදෙශ කල් කල්හි—"සරලොපාදෙ", "සරලොපා"දි සූත්‍රයෙහි; පකතිගණහණෙන, ප්‍රකෘතිග්‍රහණයෙන්; පකතිභාවො, ප්‍රකෘතිවත් නොවීමෙන්; ඉස්ස, ඉකාරයහට; එ, එකාරයක් ආදේශවී—ජෙය්‍යො, ජෙට්ඨො, යනු වේ—එවං, මෙසේ; "පසත්ථස්ස සො ච" ඉති, "පසත්ථස්ස සො ච" යන සූත්‍රයෙන්; සාදෙසො, සකාරාදෙශ කල් කල්හි—සෙය්‍යො, සෙට්ඨො, යනු වේ. 3 "තදස්සත්ථීති වී ච" ඉති, "තදස්සත්ථීති වී ච" යන සූත්‍රයෙන්; වී, වී ප්‍රත්‍යය වේ—මෙධා අස්ස අත්ථීති, යන වාක්‍යයෙහි; මෙධාවී යනු වේ. එවං, මෙසේ, "තපාදිතො සී" ඉති, "තපාදිතො සී" යන සූත්‍රයෙන්, සී, සී ප්‍රත්‍යය වේ—විතතං, වීතව වේ—තපස්සී, යනු වේ. "දණ්ඩාදිතො ඉක ඊ" ඉති, "දණ්ඩාදිතො ඉක ඊ" යන සූත්‍රයෙන්; ඉකො, ඉක ප්‍රත්‍යයද; ඊ ච, ඊ ප්‍රත්‍යයද වේ—දණ්ඩිකො, දණ්ඩී, යනුවේ.

3 "ගුණාදිතො වන්තු"ති වන්තු—ගුණවා, පඤ්ඤවා—සදාදිනා රස්සො. 4 "සත්‍යාදීහි මන්තු"ති මන්තු—සතිමා, භානුමා. 5 "ආයුස්සුකාරස් මන්තුම්හි"ති උස්ස අස්—ආයස්මා. 6 "සද්ධාදිතො ණ" ඉති ණො—සද්ධො. 7 "තප්පකතිවචනෙ මයො" ති මයො—සුවණ්ණෙන පකතං සොවණ්ණමයං, සුවණ්ණමයං වා—පක්ඛෙ සදාදිනා වුද්ධි. 8 "එතස්සමො ලොපෙ"—විගතන්තිලොපෙ මනාදීන මනස්ස ඔ හොති—මනොමයං.

..........................................

සඞ්ඛ්‍යාපූරණත්‍යධිකාරො—"ම්හීහි තීයො"ති තීයො—"තියෙ දු තාපිචෙ"ති ම්හීනං දුතා—ම්හන්නං පූරණො දුතියො—එවං තතියො. 2 "චතුචෙ'ඡහි ථ ඨා"ති ථ ඨා—චතුත්ථො, ඡට්ඨො. 3 "තෙ සමඩ්ඪුපපදෙනාඩ්ඪුඩ්ඪස්සදිවඩ්ඪදියඩ්ඪාඩ්ඪතියා"—චතුත්‍ථදුතියතතියානං අඩ්ඪුපපදෙන සහ අඩ්ඪුඩ්ඪදිවඩ්ඪදියඩ්ඪාඩ්ඪතියා හොන්ති—අඩ්ඪෙන චතුත්‍ථො අඩ්ඪුඩ්ඪො—අඩ්ඪෙන දුතියො දිවඩ්ඪො, දියඩ්ඪො වා—අඩ්ඪෙන තතියො අඩ්ඪතියො. 4 "සඞ්ඛ්‍යාපූරණෙ මො"ති මො—පඤ්චමො—ඉත්‍ථියං—පඤ්චන්නං පූරණී පඤ්චමී.

---

3 "ගුණාදිතො වන්තු" ඉති, "ගුණාදිතො වන්තු" යන සූත්‍රයෙන්; වන්තු, වන්තු ප්‍රත්‍යය වේ—ගුණවා, පඤ්ඤවා, යනු වේ—සදාදිනා, සදාදී සූත්‍රයෙන්; රස්සො, හ්‍රස්ව වේ. 4 "සත්‍යාදීහි මන්තු" ඉති, —පෙ—යන සූත්‍රයෙන්; මන්තු, මන්තු ප්‍රත්‍යය වේ—සතිමා, භානුමා, යනු වේ. 5 "ආයුස්සුකාරස් මන්තුම්හි" ඉති,—පෙ—යන සූත්‍රයෙන්; උස්ස, උකාරයහට; අස්, අස් යනාදෙශ වේ—ආයස්මා, යනු වේ. 6 "සද්ධාතො ණ" ඉති,—පෙ—යන සූත්‍රයෙන්; ණො, ණ ප්‍රත්‍යය වේ—සද්ධො යනුවේ. 7 "තප්පකතිවචනෙ මයො"ඉති,—පෙ—යන සූත්‍රයෙන්; මයො, මය ප්‍රත්‍යය වේ—සුවණ්ණෙන පකතං, යනවාක්‍යයෙහි; සොවණ්ණමයං, යනු වේ; සුවණ්ණමයං වා, සුවණ්ණමයං කියාහෝ වේ—පක්ඛෙ, එක් පක්ෂයෙක්හි; සදාදිනා, සදාදී සූත්‍රයෙන් වුද්ධි, වෘද්ධි වේ.

8 "එතස්සමො ලොපෙ"—පෙ—ඔකාරාදෙශවිධාන සූත්‍රයි එතස්සං යනු පදය ඔ යනු පදය ලොපො යනු පදයි—විගතන්තිලොපෙ, විගතන්තිහට ලොප් කළකල්හි; මනාදීනං, මන ශබ්දාදීන්ගේ; අන්තස්ස, අන්තයහට; ඔ හොති, ඔකාරයෙක් ආදෙශවේ—මනොමයං, යනු වේ.

සඞ්ඛ්‍යාපූරණෙ ඉති,—පෙ—යනු; අධිකාරො, මිතීමිතුසූත්‍රය

1 එකො ච දසචාති මජ්ඣෙ කතෙ—"මෙකට්ඨානමාකාරො වා"—ස
ඞ්ඛ්‍යානෙ උත්තරපදෙ ඒ එක අට්ඨ ඉච්චෙතෙසමන්තස්ස ආ හොති-
ඒකාදස—පඤ්චච—එවං බාදස—යෙදිනා ද්විස්ස තෙ ආදෙසෙ—
"එකාදිතො දස ර සඞ්ඛ්‍යානෙ"ති දසසද්දෙ දස්ස රො—තෙරස.
2 "චතූපපදස්ස ලොපො තුත්තරපදාදිචස්ස චු චොපි නවා"ති ච
තුසද්දෙ තුස්ස ලොපො චස්ස චු ච—චුද්දස. 3 "දසෙ සො නිච්ච
ඤ්ච"ති ඡස්ස සො ආදෙසො * —"ල දරානං"ති දසසද්දෙ දස්ස
ලො † —සොළස,අට්ඨාරස. 4 "වීසතිදසෙසු බා ද්විස්ස තු"ති ද්විස්ස
බා—බාවීසති—එකාදසන්නං පූරණො එකාදසමො.

---

සම්බන්ධකරනු ලැබේ—"ද්වීහිති තියො" ඉති,—පෙ—යන සූත්‍රයෙන්;
තියො, තිය ප්‍රත්‍යය වේ—"තියෙ දුතාපි ච" ඉති—පෙ—යන සූත්‍ර
යෙන්; ද්වීතිනං, ද්වි ශබ්දය ති ශබ්දය යන මොවුන්ට; දුතා, දු ත ය
නාදෙශයෝ වෙත්—ද්විතිනං පූරණො, යන වාක්‍යයෙහි; දුතියො,
යනු වේ—තතියො, යනුද; එවං, මෙසේමැයි. 2 "චතුච්ඡෙහි
ථඨා" ඉති,—පෙ—යන සූත්‍රයෙන්; ථ ඨා, ථ ඨ යන ප්‍රත්‍යයෝ
වෙත්—චතුත්ථො, ඡට්ඨො, යනු වේ. 3 "තෙසමඩ්ඪූපපදෙනඩ්ඪුඩ්ඪ
දිවඩ්ඪදියඩ්ඪාඩ්ඪතියා" යනු අඩ්ඪුඩ්ඪාදි ආදෙශවිධාන සූත්‍රයි—තෙ
සං යනු පදය අඩ්ඪූපපදෙන යනු පදය අඩ්ඪුඩ්ඪදිවඩ්ඪදියඩ්ඪාඩ්ඪති
යා යනු පදයි—චතුත්ථදුතියතතියානං, චතුත්ථ දුතිය තතිය ශබ්ද
යන්ට; අඩ්ඪූපපදෙන සහ, අඩ්ඪ යන උපපදයහා සමග; අඩ්ඪුඩ්ඪ
දිවඩ්ඪදියඩ්ඪාඩ්ඪතියා හොන්ති, අඩ්ඪුඩ්ඪ දිවඩ්ඪ දියඩ්ඪ අඩ්ඪතිය ය
නාදෙශයො වෙත්—අඩ්ඪෙන චතුත්ථො, යන වාක්‍යයෙහි; අඩ්ඪු
ඩ්ඪො, යනු වේ—අඩ්ඪෙන දුතියො, යන වාක්‍යයෙහි; දිවඩ්ඪො,
යනුවේ—දියඩ්ඪො වා, දියඩ්ඪො කියා හෝ වේ—අඩ්ඪෙන තතියො
යන වාක්‍යයෙහි; අඩ්ඪතියො, යනු වේ.
4 "සඞ්ඛ්‍යාපූරණෙ මො" ඉති— පෙ—යන සූත්‍රයෙන්; මො, ම
ප්‍රත්‍යය වේ—පඤ්චමො, යනු වේ—ඉත්ථියං, ස්ත්‍රීලිඞ්ගයෙහි—පඤ්චන්නං
පූරණී, යන වාක්‍යයෙහි; පඤ්චමී, යනු වේ—

1 එකො ච දස ච ඉති, එකො ච දස ච යී කියා; මජ්ඣෙ කතෙ
මැද සමාස කළ කල්හි—මෙකට්ඨානමාකාරො වා යනු ආකාරාදෙ
ශවිධාන සූත්‍රයි මෙකට්ඨානං යනු පදය ආකාරො යනු පදය වා යනු
පදයි—සඞ්ඛ්‍යානෙ, සඞ්ඛ්‍යාවාචී ශබ්දයක් කිව්වමිනා කල්හි; උත්තර

---

* ආදෙසෙ මුද්‍රිත පොත්. † මුද්‍රිත පොත්හි ළකාර පාඨයි.

1 "ඒකාදිතො දසස්සී"ති ඉත්ථියං ඊ—ඒකාදසී ඉච්චාදි. 2 "වාදිතො කො නෙකත්ථෙ ච"ති කො—වෙ පරිමාණානි අස්සාති විකං—එවං තිකාදි. 3 "සමූහත්ථෙ කණ්ණා ච"ති කණ් ච ණො ච—මනුස්සානං සමූහො මානුස්සකො, මානුස්සො වා—ණෙ කතෙ—"ඛිලානමියුවා සරෙ වා"තිහ වාකාරෙන ඉස්ස අයාදෙසෙ—වියං, තය—"එවං ගාමජනබන්ධුසහායාදීහි තා"ති තා—ගාමතා; නාගරතා.

.........................

---

පදද, සමාසයෙහි පරපදකල්හි; ඒකාඅඤ්ඤත්, ඒ එක අඤ යන; එතෙසං, මොවුන්ගේ; අන්තස්ස, අන්තයහට, ආ හොයි, ආකාරා; දෙශ වේ—එකාදස, යනු වේ—පම්ච, පච ශබ්දයා මෙනි—චාදස යනුද; එවං, මෙසේමැයි—සඤදිනා, සඤදිසූත්‍රයෙන්; තිස්ස, ති ශබ්ද යහට; තෙ ආදෙසෙ, තෙ යනාදෙශ කළකල්හි; "ඒකාදිතො දසර සංඛ්‍යානෙ" ඉති—පෙ—යන සූත්‍රයෙන්; දසසද්දෙ, දස ශබ්දයෙහි; දස්ස, දකාරයහට; රො, රකාරයෙක්, ආදේශවේ—තෙරස, යනු වේ. 2 "චතුපපදස්ස ලොපො තුත්තරපදාදිචස්ස චු චොපි නවා" ඉති—පෙ—යන සූත්‍රයෙන්; චතුසද්දෙ, චතු ශබ්දයෙහි; තුස්ස, තුකාරයහට; ලොපො, ලොප් වේ; චස්ස, චකාරයහට; චු ච, චු යනාදෙශද වේ—චුද්දස, යනු වේ. 3 "ඡසෙ සො ච" ඉති—පෙ යන සූත්‍රයෙන්; ඡස්ස, ඡකාරයහට, සො ආදෙසො, සකාරයෙක් ආදේශ වේ—"ළ දරානං" ඉති, "ළ දරානං" යන සූත්‍රයෙන්; දස සද්දෙ, දස ශබ්දයෙහි; දස්ස, දකාරයහට, ළො, ළකාරයෙක් ආදේශ වේ—සොළස, යනු වේ—අට්ඨාරස, යනු වේ. 4 "විසතිදසෙසු බා විස්සතු" ඉති—පෙ—යන සූත්‍රයෙන්; විස්ස, වි ශබ්දයහට; බා, බා යනාදෙශ වේ—බාවීසති, යනු වේ—

"ණ්‍යත්තතා භාවෙ තු"—භාවත්ථෙ ණ්‍ය ත්ත තා හොන්ති තුසද්දෙන ත්තනා ච—සඛ්‍යාදිසුපි ණෙය සකත්ථෙ තා ච.

.........................

එකාදසන්නං පූරණො, යන වාක්‍යයෙහි; එකාදසමො, යනු වේ. 1 "එකාදිතො දසස්සී" ඉති—පෙ—යන සූත්‍රයෙන්; ඉත්ථියං, ස්ත්‍රීලිඞ්ගයෙහි; ඊ, ඊ ප්‍රත්‍යය වේ—එක දසී ඉති, එකාදසී යන; ආදී, මේ ආදිය වේ. 2 "වාදිතො කො නෙකත්ථෙ ච" ඉති—පෙ—යන සූත්‍රයෙන්; කො, ක ප්‍රත්‍යය වේ—වෙ පරිමාණානි අස්සාති, යන වාක්‍යයෙහි; විකං, යනු වේ—තිකාදි, තිකං යනාදියද; එවං මෙසේමැයි. 3 "සමූහත්ථෙ කණ්ණා ච" ඉති—පෙ—යන සූත්‍රයෙන්, කණ් ච, කණ් ප්‍රත්‍යයද; ණො ච, ණ ප්‍රත්‍යයද වේ—මනුස්සානං

1 භොන්ත්‍යස්මා සද්දඤ්ඤාණි භාවො සො සද්දවුත්තියා,
නිමිත්තභූතං නාමඤ්ච ජාතිදබ්බං ක්‍රියා ගුණො.

2 යථා—චන්දස්ස භාවො චන්දත්තං—ඉහ නාමවසා චන්දසද්දො, චන්දද්දබ්බෙ වත්තතෙ—නිමිත්තස්සරූපානුගතඤ්ච ඤාණං—එවං මනුස්සත්තන්ති මනුස්සජාතිවසා—යදිනා ඊස්ස රසෙස—දණ්ඩිත්තන්ති දණ්ඩද්දබ්බසම්බන්ධා—පාචකත්තන්ති පචනක්‍රියාසම්බන්ධා.—නීලත්තන්ති නීලගුණවසා—එවං ණ්‍යාදිසු * යථායොගං යොජ්‍යං—ණෙය්‍ය † —

---

සමූහො, යන වාක්‍යයෙහි; මනුස්සෙසො, යනු වේ—මනුස්සො වා, මානුස්සො කියාහෝ වේ—ණෙ කතෙ, ණ ප්‍රත්‍යය කළකල්හි "සබ්ලානම්යුවා සරෙ වා" ඉති—පෙ—යන; ඉන, මෙ සූත්‍රයෙහි; වා කාරන, වා ග්‍රහණයෙන්; ඉස්ස, ඉකාරයහට; අයාදෙසො, අය යනාදෙශ කළකල්හි—මයං, තයං, යනු වේ—එවං, මෙසේ; "ගාමජනබන්ධුසහායාදීහි තා" ඉති—පෙ—යන සූත්‍රයෙන්; තා, තා ප්‍රත්‍යය වේ—ගාමතා, නාගරතා, යනු වේ.

---

"ණ්‍යත්තතා භාවෙ තු" යනු ණ්‍ය ත්ත තා ප්‍රත්‍යයවිධානසූත්‍රයි, ණ්‍යත්තතා යනු පදය භාවෙ යනු පදය තු යනු පදයි—භාවත්ථෙ, භාවාර්ථයෙහි; ණ්‍යත්තතා හොන්ති, ණ්‍ය ය ත්ත ය තා ය යන ප්‍රත්‍යයෝ වෙත්; තුසද්දෙන, තු ශබ්දග්‍රහණයෙන්; ත්තනො ච, ත්තන ප්‍රත්‍යයද වේ—සකාජ්ජාදිසුපි, සකාදීදියෙහිද; ණෙය්‍යා, ණෙය්‍ය ප්‍රත්‍යය යවි; සකාදෙසු, සකාපියෙහි; තා ච, තා ප්‍රත්‍යයද වේ.
අස්මා, මොහුකෙරෙන්; සද්දඤ්ඤාණි, ශබ්ද ඥාන දෙදෙන; හොන්ති, වෙත්නුයි; භාවො, භාව නම; සො, ඒ භාවය තෙමේ සද්දවුත්තියා, ශබ්දප්‍රවෘත්තියට; නිමිත්තභූතං, කාරණවූ; නාමඤ්ච, නාමයද, ජති, ජතිය; දබ්බං, ද්‍රව්‍යය; ක්‍රියා, ක්‍රියාව; ගුණො, ගුණය යන මේයි.

---

* ණ්‍යාදිසුපි—මුද්‍රිත පොත්.
† ණෙය්‍යා—මුද්‍රිත පොත්.

*—1 "අවණ්ණා යෙ ලොපඤ්ච"—යෙ පරෙ අවණ්ණා ලුප්‍යතෙ චකාරෙන ඉකාරොපි—"යවතං ත ල ණ ද කාරානං බ්‍යඤ්ජනානි ච ල ඤ ජ කාරත්තං" ති යකාරයුත්තානං තාදීනං චාදයො, කාරග්ගහණෙන ස ක ප භ මාදීනො පරයකාරස්ස පුබ්බෙන සහ ඤ්ච පුබ්බරූපං—චිත්තං—පණ්ඩිච්චං කොසල්ලං සාමඤ්ඤං සොභග්ගං පොරිස්සං ආනෙපුඤ්ඤං සාරුප්පං ඔසග්ගං ඔපම්මං.

---

යථා, (ඊට උදාහරණ) මෙසේයි—චන්දස්ස, චන්ද ශබ්දයාගේ; භාවො, භාවය තෙම; චන්දත්තං, චන්දත්ත නම්—ඉහ, මෙහි; නාමවසා; නාමය හෙතුකොටගෙන; චන්දසද්දො, චන්ද ශබ්දය තෙම; චන්දද්දබ්බෙ, චන්ද්‍රද්‍රව්‍යයෙහි; වත්තතෙ, වැටේ—නිමිත්තස්සරූපානුගතං, නිමිත්තස්වරූපය අනුවවූ; ඤාණව, ඥානයද. චන්ද්‍රද්‍රව්‍යයෙහි පවති *—එවං, මෙසේ; මනුස්සත්තන්ති, මනුස්සත්තං යනු මනුස්සජාතිවසා, මනුෂ්‍යජාති හෙයිනි ‡ යදාදිනා, යදාදිසූත්‍රයෙන්; ඊස්ස, ඊකාරයහට; රස්සො, හ්‍රස්ව තලකල්හි, දණ්ඩත්තන්ති, දණ්ඩත්තං යනු; දණ්ඩද්දබ්බසම්බන්ධා, දණ්ඩද්‍රව්‍යය සම්බන්ධ හෙයිනි—පාචකත්තන්ති, පාචකත්තං යනු; පචනක්‍රියාසම්බන්ධා, පචනක්‍රියාවශයෙන් සම්බන්ධව පවත්තේයි—නීලත්තන්ති, නීලත්තං යනු; නීලගුණවසා, නීලගුණවශයෙන් පවත්නේයි—එවං, මෙසේ, ණ්‍යාදිසු, ණ්‍ය ප්‍රත්‍යයාදියෙහි; යථායොගං; යෙදෙනයෙදෙනපරිද්දෙන්; ඤෙය්‍යං, දතයුතුයි— ණ්‍යණ්‍ය ප්‍රත්‍යය කාලකල්හි—

---

1 "අවණ්ණා යෙ ලොපඤ්ච යනු අවර්ණ ලොප් විධාන සූත්‍රයි—අවණ්ණා යනුපදය යෙ යනුපදය ලොපං යනුපදය ච යනුපදයි—යෙ පරෙ, යකාරය පරකල්හි; අවණ්ණා, අවර්ණය තෙම; ලුප්‍යතෙ, ලොප්කරනු ලැබෙයි; ච කාරෙන, ච ග්‍රහණයෙන්; ඉකාරොපි, ඉකාරද ලොප් කරනුලැබෙයි—"යවතං ත ල න ද කාරානං බ්‍යඤ්ජනානි ච ල ඤ ජ කාරත්තං" ඉති, —පෙ—යන සූත්‍රයෙන්; යකාර යුත්තානං, යකාරයෙන් යුක්තවූ; තාදීනං, තාදීන්ට; චාදයො, චාදීහු වෙති; කාරග්ගහණෙන, කාරග්‍රහණ

---

* නිමිත්තස්ස, නිමිත්තයහට; රූපඅනු, අනුරූපවශයෙන්; අනුගතව, ගියාවූද; ඤාණං, ඤාණය නම් වේ—සන්න.

† මනුස්සත්තන්ති, මනසගේ උසස්බව හෙතුකොටගෙන හෙවත් අඩිකොටගෙණ ගියාවූ ජාතිය; මනුස්සජාතිවසා, මනුෂ්‍යජාතිවශයෙන් පවත්නේයි—සන්න.

I "ආතතා ච"—ඉ උ ඉච්චේතෙසං * ආ හොති රි කාරාගමො ච ඨානෙ—"සරලොපා"දිනා ඉ ලොපො—ඉසිනො භාවො ආරිසං—එවං මුදුතා අරහතා—නතස්ස යදාදිනා ලොපො—පුථුජ්ජනතානං අකිඤ්චනමෙව ආකිඤ්චඤ්ඤං—කුණ්ඩ නියා අපච්චං කොණ්ඩඤ්ඤො—එත්ථ "වුඩ්ඪාදෙ"ට්ඨාකාරෙන සංයොගන්තස්සාපි වුඩ්ඪි—පාදාය හිතං පජ්ජං †—ධනාය සංවත්තනිකං ධඤ්ඤං—සන්තො සමිභූතං සච්චං—ඉ ලොපො—වීසු න වුඩ්ඪි—දෙවො එව දෙවතා—

---

යෙන්; ස ක ප භ මාදීනො, සංක ප භ මාදීන්කෙරෙන්; පරයකාරස්ස, පරයකාරයහට, පුබ්බන සහ, පූර්ව භාසමග; කවච්, කිසි තැනෙකත්හි; පුබ්බරූපව, පූර්වරූපද වේ—

ඞනතං, ඞතවේ—පණ්ඩිච්චං, පණ්ඩිතස්ස භාවො යන වාක්‍යයෙහි; පණ්ඩිච්චං යනු වේ; කොසල්ලං, කුසලස්ස භාවො යන වාක්‍යයෙහි කොසල්ලං යනු වේ—සාමඤ්ඤං, සමණස්ස භාවො යන වාක්‍යයෙහි සාමඤ්ඤං යනුවේ—සොභග්ගං, සුභගස්ස භාවොයනවාක්‍යයෙහිසොභග්ගංයනුවේ—පොරිසං, පුරිසස්සභාවො යන වාක්‍යයෙහි පොරිසං යනු වේ—නෙපක්කං, නිපකස්ස භාවො යන වාක්‍යයෙහි නෙපක්කං යනු වේ—සාරුප්පං, සරූපස්ස භාවො යන වාක්‍යයෙහි සාරුප්පං යනු වේ—ඔසභං, උසභස්ස භාවො යන වාක්‍යයෙහි ඔසභං යනු වේ—ඔපම්මං,

උපමාය භාවො යන වාක්‍යයෙහි ඔපම්මං යනු වේ ‡—

1 "ආතතා ච"යනු ආ කාරාදේශවධානසූත්‍රයි ආතතං යනු පදය ච යනුපදයි—ඉ උ ඉති, ඉය උය යන; එතෙසං, මොවුන්ට; ආ හොති, ආ කාර වේ; ඨානෙ, යුක්තස්ථානයෙහි; රි කාරාගමො ච, රි කාරාගමද වේ—"සරලොපා"දිනා, "සරලොපා"දි සූත්‍රයෙන් ඉ ලොපො, ඉ කාරයහට ලොප් වේ—ඉසිනො භාවො, යනවාක්‍ය

---

* ඉච්චෙසං—මුද්‍රිත බාලාවතාර—

† මුද්‍රිතබාලාවතාරවල "පදාය හිතං පජ්ජං" කියාද මුද්‍රිතරූපසිද්ධියෙහි "පදානං හිතං පජ්ජං" කියාද තිබෙනත් ලියාපුස්කොළපොත්වල "පාදාය හිතං පජ්ජං"සීද පාදානං හිතං පජ්ජං"සීද තිබේ-එයම "පාදාවිමුද්දකං පාදජම්"යන භගෙටොජ්දීක්ෂිතාවායසීව්වනාත්‍ථසාරයෙනුත්තුඛයයි සැලකියයුතුයි—

‡ පණ්ඩිච්චං, පණ්ඩිච්චං යනුද;—පෙ—මෙහිසංයොගවිසර්රූපසිද්ධි—සන්නය—

1 "ණ විසමාදීහී"ති භාවෙ ණො—වෙසම්මං, උජ්ජුනො භාවො ආජ්ජවං *—එත්ථ උස්සාගමො පරූකාරස්ස යදාදිනා අවො—2 "රමණීයාදිතො කණ්"ඉති කණ්—මානුඤ්ඤකං—3 "විභාගෙ ධාචෙ"ති ධා චකාරෙන සො පච්චයො ච—එකෙන විභාගෙන එකධා—නිපාතනතා සිලොපො—පදවිභාගෙන පදසො—4 "සබ්බනාමෙහි පකාරවචනෙ තු ථා"ති ථා තුකාරෙන ථත්තා ච—සබ්බො පකාරො සබ්බෙන පකාරෙන වා සබ්බථා—එවං අඤ්ඤථත්තා—5 "කිම්මෙහි ථං"ති ථං—කාදෙසෙ—කථං—ඉ ආදෙසෙ—ඉත්ථං—

---

යෙහි; ආජ්ජවං, යනු වේ—එවං මෙසේ; මුදුතා, අරහතා, යනු වේ; තාස්ස, තා ශබ්දයනට; යදාදිනා, යදාදිසූත්‍රයෙන්; ලොපො, ලොප් වේ—පුථුජ්ජනතානං යනු වේ—අකිඤ්චනමෙව, කිසිවක් නැත්තේම; ආකිඤ්චඤ්ඤං, ආකිඤ්චඤ්ඤ නම්—කුණ්ඩනියා අපච්චං, යන වාක්‍යයෙහි; කොණ්ඩඤ්ඤො, යනු වේ—එත්ථ, මෙහි; "වුඩ්ඪාදෙ" 'වුඩ්ඪාදිසරස්ස වා සංයොගන්තස්ස සණෙ ච" යනාසූත්‍රයෙහි; වා කාරෙන, වා ග්‍රහණයෙන්; සංයොගන්තස්සාපි, සංයොගාන්තය 'හටද; වුඩ්ඪි, වෘද්ධි වේ—පාදාය හිතං, යන වාක්‍යයෙහි; පාජ්ජං, යනු වේ—ධනාය සංවත්තනිකං, යන වාක්‍යයෙහි; ධඤ්ඤං, යනු වේ—සතිපතා සමන්නුතා, යන වාක්‍යයෙහි; සච්චං, යනු වේ—ඉ ලොපො, ඉ කාරයහට ලොප් වේ—විසූ; දෙතැන්හි; න වුඩ්ඪි, වෘද්ධි නො වේ—දෙවො එව, දෙවිමය යන අර්ථයෙහි, දෙවතා, යනු වේ—

..................

1 "ණ විසමාදීහි" ඉති—පෙ—යන සූත්‍රයෙන්; භාවෙ, භාව යෙහි; ණො, ණ ප්‍රත්‍යය වේ—වෙසම්මං, යනු වේ—උජ්ජුනො භාවො යන වාක්‍යයෙහි; ආජ්ජවං, යනු වේ—එත්ථ, මෙහි, උස්ස, උකාර යහට, ආගමො, ආගමය කළකල්හි; පරූකාරස්ස, පරඋකාරයහට; යදාදිනා, යදාදිසූත්‍රයෙන්; අවො, අව යනාදෙශ වේ—2 "රමණීයාදිතො කණ්"ඉති—පෙ—යන සූත්‍රයෙන්; කණ්, කණ් ප්‍රත්‍යය වේ—මානුඤ්ඤකං, යනු වේ —3 "විභාගෙ ධා ච" ඉති—පෙ යන සූත්‍රයෙන්; ධා, ධා ප්‍රත්‍යය වේ; චකාරෙන, ච ග්‍රහණයෙන්; සො පච්චයො ච, සො ප්‍රත්‍යයද වේ—එකෙන විභාගෙන, යන වාක්‍යයෙහි; එකධා, යනු වේ—නිපාතනතා, නිපාතබැවින්; සිලොපො, සිහට ලොප් වේ—පදවිභාගෙන, පදවිභාගයෙන් යන අර්ථයෙහි; පදසො, යනුවේ—

---

* රූපසිද්ධියෙහි—හ්‍රස්වනොකොට "අජ්ජවං"යි කියනලදී.

චණ්ණි යොගවිභාගෙන ථං—බහුලං. 1 අමලිනං මලිනං කරොති ත්‍යාදිස්ස—අභූතතබ්භාවෙ ගම්‍යමානෙ කර භූ යොගෙ සති නාමතො යදාදිනා ඊ පච්චයො—මලිනී කරොති, සෙසං—අභූසමනො භූසමනො කරණන්ති භූසම්කරණං, කාඨස්ස—අමලිනො මලිනො භවතීති මලිනී භවති, සෙසතො—ඊ පච්චයන්තාපි නිපාතො—අභූතතබ්භාවෙති කිං? ඝටං කරොති ඝටො භවති—කරභූයොගෙති කිං? අමලිනො මලිනො ජායතෙ.

---

4 "සබ්බනාමෙහි පකාරවචනෙ තු ථා" ඉති—පෙ—යන සූත්‍රයෙන් ථා, ථා ප්‍රත්‍යය වේ, තුකාරෙන, තු ග්‍රහණයෙන්; ථත්තා ච, ථත්තා ප්‍රත්‍යයද වේ—සබ්බො පකාරො සබ්බෙන පකාරෙන වා, යන වාක්‍යයෙහි; සබ්බථා, යනු වේ—අඤ්ඤථත්තා, යනුද; එවං, මෙසේ මැයි—5 "කිම්හි මෙහි ථං" ඉති—පෙ—යන සූත්‍රයෙන්; ථං, ථං ප්‍රත්‍යය වේ—කාදෙසෙ, කකාරාදෙශ කළකල්හි; කථං, යනු වේ—ඉ ආදෙසෙ, ඉකාරාදෙශ කළකල්හි;—ඉත්ථං, යනු වේ—

ථං ඉති, ථං යන; යොගවිභාගෙන, සූත්‍රවිධාකරණයෙන්; ථං, ථං ප්‍රත්‍යය වේ—බහුලං, යනු වේ—1 අමලිනං මලිනං කරොති ඉති, අමලිනං මලිනං කරොති යන; ආද්‍යත්‍ථෙසු, මේ ආදිඅර්ථයෙහි; අභූතතබ්භාවෙ, අභූතතද්භාවයක්; ගම්‍යමානෙ, හැඟෙනකල්හි; කර භූ යොගෙ සති, කර භූ ධාතූන්ගේ සම්බන්ධයක් ඇතිකල්හි; නාමතො, නාමයාකෙරෙන්; යදාදිනා, යදාදිසූත්‍රයෙන්; ඊ පච්චයො, ඊ ප්‍රත්‍යය වේ—මලිනී කරොති, යනු වේ—(ඒ කවරේද?) සෙසං, සුදයි—අභූසමනො භූසමනො කරණන්ති, යන වාක්‍යයෙහි; භූසම්කරණං, යනුවේ—(ඒකවරේද?) කාඨස්ස, කාෂ්ඨයාගේ සි—අමලිනො මලිනො භවති ඉති, අමලිනො මලිනො භවති යන වාක්‍යයෙහි මලිනී භවති යනු වේ—(ඒ කවරේද?) සෙසතො, සුදයි—ඊ පච්චයන්තාපි, ඊ ප්‍රත්‍යයාන්තවූ ශබ්දද; නිපාතො, නිපාතයි *—අභූතතබ්භාවෙ ඉති; අභූතතබ්භාවෙ යනු; කිං, කුමටද; ඝටං කරොති භටො භවති, යන තන්හි නොවන පිණිසයි, කර භූ යොගෙ ඉති, කර භූ යොගෙ යනු; කිං, කුමටද; අමලිනො මලිනො ජායතෙ, යනතන්හි නොවන පිණිසයි.

---

* ඊ පච්චයන්තාපි, ඊ ප්‍රත්‍යයාන්තද්වූ; නිපාතො, නිපාතය කි—යන්න.

1 අවත්ථාවතො 'වත්ථාය 'භූතස්සඤ්ඤාය වුත්තිතො,
තාය වත්ථාය භවනං අභූතතබ්භාවං විදුං.

තබ්භො

පච පාකෙ—පච ඉති ඨිතෙ—“භූවාදයො ධාතවො”—භූ ඉච්චාදයො සද්දා ධාතවො නාම—“ධාතුස්සන්තො ලොපො නෙකසරස්සා”ති ඛවි ධාත්වන්තස්ස ලොපො—“ධාතුලිඞ්ගෙහි පරාප්පච්චයා”ති ධාතුම්හා නෙකප්පච්චයප්පසඞ්ගෙ වත්තිච්ඡාතො.

“වත්තමානා ති අන්ති සි ථ මි ම තෙ අන්තෙ සෙ ව්හෙ එ ම්හෙ”ති තාදීනං වත්තමානාසඤ්ඤා. කාලෙති අධිකාරො ධාතොසම්බන්ධවත්තනතෙ—

---

1 අවත්ථාවතො, අවස්ථාවත්වූ; අඤ්ඤාය අවත්ථාය; අනික් අවස්ථායෙකින්; අභූතස්ස, නොවූ; වුත්තිතො, වැ...හුයේ; තාය අවත්ථාය *, ඒ නොවූ අවස්ථාවෙන් යුක්තව; භවනං, වීම; අභූතතබ්භාවං, අභූතතද්භාවයයි; විදුං, දනිත්.

තබ්භො, තබ්භාවක්‍රියා නිමවනලදී.

පච, පච යනධාතූ පාකෙ, පිසීමෙහිවැවේ—පච ඉති, පචයි කියා; ඨිතෙ, සිටිකල්හි—“භූවාදයො ධාතවො” යනු ධාතුසංඥ විධාන සූත්‍රයි; භූවාදයො යනුපදය ධාතවො යනුපදයි—භූ ඉති, භූයන; ආදයො, මේ ආදිකොටඇති; සද්දා, ශබ්දයෝ; ධාතවො නාම, ධාතූහු නම් වෙත්—“ධාතුස්සන්තො ලොපො නෙකසරස්ස” ඉති—පෙ—යන සූත්‍රයෙන්; ධාත්වන්තස්ස, අනෙකස්වරවූ ධාතූහුගේ අන්තායහට; ඛවි ලොපො, සමහරතැනක ලොප් වේ—“ධාතුලිඞ්ගෙහි පරාප්පච්චයා” ඉති—පෙ—යන සූත්‍රයෙන්; අනෙකප්පච්චයප්පසඞ්ගෙ, † අනෙකප්‍රත්‍යයන් පත්තෙයි; වත්තිච්ඡාතො, වක්තෘහුගේ විවක්ෂාවූ පරිද්දෙන් වේ—

---

* තාය අවත්ථාය, ඒ අවස්ථාවගේ; භවනං, පැමිණීම; අභූත, අභූතයයි; තං ඒ අර්ථය; භාවං, භාවාකාරයයි; විදුං, ශබ්දශාස්ත්‍රඥන්හු විසින් දතයුත්තේයි.

† අනෙකප්පච්චයප්පසඞ්ගෙ, නොයෙක් ප්‍රත්‍යයන්ට සඞ්ගහකොට; වත්තිච්ඡාතො, වත්තේයයි කැමතිවන්නේයි—හෙවත් වක්තෘ විවක්ෂාවශයෙන් වේ—සන්න.

1 කාලො තීතවත්තමානානාගතක්‍රියලක්ඛණො,
පච්චුප්පන්නොනාමතො කාලො ආරද්ධා නිට්ඨිතෙ ක්‍රියෙ.
2 ක්‍රියාසන්තානවිච්ඡෙදෙ කාලො තීතොති ගම්‍යතෙ;
අනාගතො අනාරම්භෙ ක්‍රියාය තු පතීයතෙ.
3 අද්දබ්බභූතං කත්තාදිකාරකග්ගාමසාධියං,
පදත්ථං කත්තුකම්මත්ථං ක්‍රියමිච්ඡන්ති තබ්බිදූ.

“වත්තමානා පච්චුප්පන්නෙ”—පච්චුප්පන්නෙ කාලෙ වත්තමානා* විභත්තිහොති—

---

වත්තමානාතිඅන්තිසිථමිමතෙඅන්තෙ සෙ ව්හෙ ඒ ම්හෙ"ඉච්-චෙ-මෙහ-යනසූත්‍රයෙන්; ත්‍යාදීනං, තිආදීන්ට; වත්තමානාසඤ්ඤා, වත්තිමානාසංඥවේ-කාලෙ ඉති, කාලයෙහි; අට්ඨවිභත්තිවිධානෙ, අෂ්ට විභක්තීන්ගේවිධානයෙහි; සඞ්ඛ්‍යෙ, ගැනිතන්හි; වත්තතෙ, වැටේ.

කාලො, කාලය තෙම; අතීත, අතීතක්‍රියාවය; වත්තමාන; වත්තමානක්‍රියාවය; අනාගතක්‍රියලක්ඛණො, අනාගතක්‍රියාවද ලක්ෂණ කොට ඇත්තේය; ක්‍රියෙ, ක්‍රියාව තමා; ආරද්ධ, පටන්ගන්නාලදින්; අනිට්ඨිතෙ, සමාප්ත නොවූ කල්හි; පච්චුප්පන්නො කාලො, වත්තිමානකාලයයි; මතො, දන්නා ලදි.

2 ක්‍රියාසන්තාන, ක්‍රියාපරම්පරාව; විච්ඡෙදෙ, සමාප්තවූ කල්හි; කාලො, කාලය තෙම; අතීතොති, අතීතයයි; ගම්‍යතෙ, හැඟේ; ක්‍රියාය තු, ක්‍රියාවගේ වනාහි; අනාරම්භෙ, පටන් නොගැන්මෙහි; අනාගතො, අනාගතකාලයයි; පතීයතෙ, දන්නාලැබේ.

අද්දබ්බභූතං, ද්‍රව්‍ය නොවූ; කත්තාදි, කර්තෘආදිවූ; කාරකග්ගාමසාධියං. කාරකසමූහයා විසින් සිද්ධකටයුතුවූ; කත්තුකම්මත්ථං, කර්තෘකර්මදෙදෙනාකෙරෙහි පිහිටියාවූ; පදත්ථං, පදාර්ථය; ක්‍රියං ඉති ක්‍රියාවයයි; තබ්බිදූ, ඒ ක්‍රියාලක්ෂණදන්නානු; ඉච්ඡන්ති, කැමති වෙත්.

4 “වත්තමානා පච්චුප්පන්නෙ” යනු වත්තිමානාවිභක්තිවිධාන සූත්‍රයි වත්තමානා යනුපදය පච්චුප්පන්නෙ යනුපදයි—

---

* මුද්‍රිත බාලාවතාර රූපසිද්ධි කච්චායනාදියෙහි “වත්තමානාවිභත්ති හොති”යි තිබෙතත් ලියාපු පරණපොත්වලතිබෙන “වත්තමානා විභත්ති හොති”යන්නම මැනව් ඒ බව “ඇමැ:තිකාලෙ වත්තමානා විභක්තිර්භවති” යන ශ්‍රීදුර්ගසිංහාචාර්‍ය්‍යකෘත කලාපව්‍යාකරණවෘත්තියෙන් දතයුතුයි.

විභත්ති හොති—තස්සාපනියමෙ—1 "අථ පුබ්බානි විභත්තීනං ඡ පරස්සපදානි"—අඨවිභත්තීනං යානි යානි පුබ්බානි ඡ පදානි තානි තානි පරස්සපදානි නාම. 2 "කත්තරි පරස්සපදං" ති පරස්සපදං—තස්සාපනියමෙ. 3 "ද්වෙ ද්වෙ පඨමමජ්ඣිමුත්තමපුරිසා"—අඨවිභත්තීසු පරස්සපදත්තනොපදානං ද්වෙ ද්වෙ පදානි පඨම මජ්ඣිම උත්තම පුරිසා නාම—යථා—ති අන්ති ඉති පඨමො පුරිසො—සි ථ ඉති මජ්ඣිමො—මි ම ඉති උත්තමො—අත්තනොපදෙසුපි—තෙ අන්තෙ ඉති පඨමො—සෙ ව්හෙ ඉති මජ්ඣිමො—ඒ මෙහ ඉති උත්තමො—තදුපරි.

---

පච්චුප්පන්නෙ කාලෙ, ප්‍රත්‍යුත්පන්න කාලයෙහි; වත්තමානා විභත්ති හොති, වර්තමානා විභක්ති වේ—තස්සාපි, ඒ වර්තමානා විභක්තියගේද; අනියමෙ, අනියමින් ප්‍රාප්තියක් ඇතිකල්හි—1 "අථ පුබ්බානි විභත්තීනං ඡ පරස්සපදානි" යනු පරස්මෛපදවිභක්ති සංඥාවිධාන සූත්‍රයි— අථ යනු පදය පුබ්බානි යනුපදය විභත්තීනං යනුපදය ඡ යනුපදය පරස්සපදානි යනුපදයි—අඨවිභත්තීනං, අෂ්ටවිභක්තීන්ගේ; යානි යානි, යම් යම්; පුබ්බානි ඡ පදානි, පූර්ව ස පදකෙනෙක් ඇද්ද; තානි තානි, ඒ ඒ පදයෝ, පරස්සපදානි නාම, පරස්මෛපදයෝ නම් වෙත්. 2 "කත්තරි පරස්සපදං" ඉති—පෙ—යන සූත්‍රයෙන්; පරස්සපදං, පරස්මෛපදබව වේ—තස්සාපි; ඒ පරස්මෛපදයාගේද; අනියමෙ, අනියමින් ප්‍රාප්තියක් ඇතිකල්හි. 3 "ද්වෙ ද්වෙ පඨමමජ්ඣිමුත්තමපුරිසා" යනු ප්‍රථමපුරුෂාදිසංඥාවිධාන සූත්‍රයි—ද්වෙ යනුපදය ද්වෙ යනුපදය * පඨමමජ්ඣිමුත්තමපුරිසා යනුපදයි—අඨවිභත්තීසු, අෂ්ටවිභක්තීන් අතුරෙහි; පරස්සපදානං, පරස්මෛපදයන්ගේද; අත්තනොපදානං, ආත්මනෙපදයන්ගේද; ද්වෙ ද්වෙ පදානි, පදයෝ දෙදෙනෙක් දෙදෙනෙක්; පඨමමජ්ඣිමුත්තමපුරිසා නාම, ප්‍රථම මධ්‍යම උත්තම පුරුෂ නම් වෙත්. යථා, මෙසේයි.

ති අන්ති ඉති, තිය අන්තිය යන මොහු දෙදෙන; පඨමො පුරිසො, ප්‍රථමපුරුෂ නම් වෙති—සි ථ ඉති, සිය ථය යන මොහු දෙදෙන, මජ්ඣිමො, මධ්‍යමපුරුෂ නම් වෙති—මි ම ඉති, මිය මය යන මොහු දෙදෙන; උත්තමො, උත්තමපුරුෂ නම් වෙති—

අත්තනොපදෙසුපි, ආත්මනෙපදයන් අතුරෙහිදු—තෙ අන්තෙ ඉති, තෙය අන්තෙය යන මොහු දෙදෙන; පඨමො, ප්‍රථම

---

* ද්වෙද්වෙ යනුපදය—යනානය.

1 "නාමම්හි පයුජ්ජමානෙපි තුල්‍යාධිකරණෙ පඨමො"—තුල්‍යාධිකරණභූතෙ නාමම්හි පයුජ්ජමානෙපි අප්පයුජ්ජමානෙපි පඨමො පුරිසො හොති—තස්සාපනියමෙ—එකම්හි වත්තබ්බෙ එකවචනං ති. 2 කත්තරිති විකරණවිධානෙ සබ්බත්ථ වත්තතෙ—"භූවාදිතො අ"—භූ ඉච්චාදිහි ධාතූහි කත්තරි වත්තමානාපඤ්චමීහීයත්තනිසු අප්පච්චයො හොති—එවං යාදිවිකරණ. භූ ඉච්චාදිහි ධාතූහි කත්තරි වත්තමානාපඤ්චමීහීයත්තනිසු අප්පච්චයො හොති—එවං යාදිවිකරණා.

---

පුරුෂ නම් වෙති—ශස වෙන ඉති, ශෙයෂ වේනය යන මොහු දෙදෙන; මජ්ඣිමො, මධ්‍යමපුරුෂ නම් වෙති—එ මෙහ ඉති, එඹ මෙහෙය යන මොහු දෙදෙන, උත්තමො, උත්තමපුරුෂ නම් වෙති, උපරි, මත්තෙහිදු, තථා, එසේමැයි.

1 "නාමම්හි පයුජ්ජමානෙපි තුල්‍යාධිකරණෙ පඨමො" යනු ප්‍රථමපුරුෂවිභක්තිවිධාන සූත්‍රයි—නාමම්හි යනුපදය පයුජ්ජමානෙ යනුපදය අපි යනුපදය තුල්‍යාධිකරණෙ යනුපදය පඨමො යනුපදයි—තුල්‍යාධිකරණභූතෙ, සමානාධිකරණවූ; නාමම්හි, නාමයක් හු; පයුජ්ජමානෙපි, ප්‍රයොගකරණලබනකල්හිද; අප්පයුජ්ජමානෙපි, ප්‍රයොගකරණනොලබනකල්හිද; පඨමො පුරිසො හොති, ප්‍රථමපුරුෂවේ—තස්සාපි, ඒ ප්‍රථමපුරුෂයාගේද; අනියමෙ, අනියමින් ප්‍රාප්තියක් ඇතිකල්හි—එකම්හි වත්තබ්බෙ, එකාර්ථයක් කියවම්නාකල්හි; එකවචනං, එකවචනවූ; ති, ති විභක්ති (එක්තැනෙක) වේ.

2 කත්තරි ඉති, කත්තරි යනු; විකරණවිධානෙ, විකරණප්‍රත්‍යයන් කරන; සබ්බත්ථ, හැමසූත්‍රයෙහි, වත්තතෙ වැටේ—"භූවාදිතො අ" යනු අ ප්‍රත්‍යයවිධාන සූත්‍රයි භූවාදිතො යනු පදය අ යනුපදයි—භූ ඉති, භූ යන; ආදිහි ධාතූහි, මේ ආදිධාතූන්කෙරෙන් පරව; කත්තරි, කර්තෘකාරකයෙහි; වත්තමානාපඤ්චමීහීයත්තනීසු, වර්තමානාය පඤ්චමීය හීයත්තනීය යන මොවුන් පරකල්හි; අ පච්චයො හොති. අ ප්‍රත්‍යය වේ--යාදිවිකරණා, යකාරාදිවිකරණයෝ; එවං, මෙසේමැයි.

1 පුබ්බාපරභාගඝාතා භින්නා ධාතුවිභත්තියො,
නිස්සාය පච්චයා හොන්ති යෙ තෙ විකරණා සියුං

සො ඔදනං පචති—බහූහි වත්තබ්බෙ බහුවචනං අන්ති—සර ලොපාදි—තෙ පචන්ති. 2 පයුජ්ජමානෙපි තුල්‍යාධිකරණෙතිවාධිකාරො—"තුම්හෙ මජ්ඣිමො"—තුල්‍යාධිකරණෙ තුම්හෙ පයුජ්ජමානෙපි අප්පයුජ්ජමානෙපි මජ්ඣිමො පුරිසො හොති—ත්වං පචසි තුම්හෙ පචථ. "අම්හෙ උත්තමො"—තුල්‍යාධිකරණෙ අම්හෙ පයුජ්ජමානෙපි අප්පයුජ්ජමානෙපි උත්තමො පුරිසො හොති—

---

1 පුබ්බාපරභාගඝාතා, පූර්වාපරභාගදෙක්හි සිටීමෙන්; භින්නා, වෙන්වෙන්වූ; ධාතුවිභත්තියො, ධාතුවිභක්තීන්; නිස්සාය, නිසා; යෙ පච්චයා, යම් ප්‍රත්‍යයකෙනෙක්; හොන්ති, වෙද්ද; තෙ, ඔහු; විකරණා සියුං, විකරණප්‍රත්‍යයෝ නම් වෙත්.

සො, ඒ තෙම; ඔදනං, ආහාරය; පචති, පිසේ—බහූහි, බහුවීයක්; වත්තබ්බෙ, කියයුතුකල්හි; බහුවචනං, බහුවචනවූ, අන්ති, අන්ති විභක්ති වේ—සරලොපාදි, ස්වරලොප ප්‍රකෘතිආදිකාර්‍ය වේ—තෙ, ඔහු; පචන්ති, පිසෙත්, 2 පයුජ්ජමානෙපි, පයුජ්ජමානෙපි යනුද; තුල්‍යාධිකරණෙතිව, තුල්‍යාධිකරණෙ, යනුද; අධිකාරො, සම්බන්ධකරතුලැබේ—"තුම්හෙ මජ්ඣිමො"යනු මධ්‍යමපුරුෂවිභක්තිවිධාන සූත්‍රයි තුම්හෙ යනුපදය මජ්ඣිමො යනුපදයි—තුල්‍යාධිකරණෙ, සමානාධිකරණවූ; තුම්හෙ, තුම්හශබ්දයා; පයුජ්ජමානෙපි, ප්‍රයොගකරණලබන කල්හිද; අප්පයුජ්ජමානෙපි, ප්‍රයොග නොකරණලබනකල්හිද; මජ්ඣිමො පුරිසො හොති, මධ්‍යමපුරුෂවිභක්ති වේ—ත්වං, තෝ; පචසි, පිසෙහි; *තුම්හෙ තෙපි; පචථ, පිසව්.

"අම්හෙ උත්තමො" යනු උත්තමපුරුෂවිභක්තිවිධාන සූත්‍රයි—අම්හෙ යනුපදය උත්තමො යනුපදයි—

තුල්‍යාධිකරණෙ, සමානාධිකරණවූ; අම්හෙ, අම්හශබ්දයා; පයුජ්ජමානෙපි, ප්‍රයොගකරණලබනකල්හිද; අප්පයුජ්ජමානෙපි, අප්‍රයොගකරණලබනකල්හිද; උත්තමො පුරිසො හොති, උත්තමපුරුෂවිභක්ති වේ—

---

* පිසෙනනී—සහන

1 "අකාරො දීඝං හිමිමෙසු"—හ්‍යාදිස්වකාරස්ස දීඝො හොති— අහං පචාමි, මයං පචාම. 2 "පරාන්‍යත්තනොපදානි"—අඩ්ඪත්තිකානං යානි යානි පරානි ඡ පදානි තානි තානි අත්තනොපදානි නාම—"කත්තරි ච"ති අත්තනොපදානි—සෙසං. පුබ්බාව—සො පචතෙ තෙ පචන්තෙ ත්වං පචසෙ තුම්හෙ පචව්හෙ අහං පචෙ මයං පචාමහෙ

3 "අත්තනොපදානි භාවෙ ච කම්මනි"—භාවෙ කම්මනි ච අත්තනොපදානි හොන්ති—

1 "භාවකම්මෙසු යො" ති යො— 2 "තස්ස චවග්ගයකාරවකාරත්තං සධාත්වන්තස්ස"—තස්ස යප්පච්චයස්ස ධාත්වන්තෙන සහ යථාසම්භවං චවග්ග යවා හොන්ති—ඉධ ධාත්වන්තස්ස චවග්ගාදිත්තා කාදිසෙ කතෙ චිත්තාං. "අත්තනොපදානි පරස්සපදත්තං" — අත්තනොපදානි කමි පරස්සපදත්තං යන්ති—තෙන තයා මයා වා සො දෙනො පච්චති, පච්චතෙ වා—තෙ පච්චන්තෙ පච්චසෙ පච්චෙව්හ පච්චෙ පච්චාමහෙ. 4 භාවෙ—භූ භූ සත්තායං *—ඉධ භාවො කාරකාපෙක්ඛාය සුඤ්ඤොධාත්වත්ථො—තස්සෙකත්තා එකවචනමෙව—තඤ්ච පඨම පුරිසෙ එව හොති—තෙන තයා මයා වා භූයතෙ—තස්ස තව මම වා සම්පත්ති භවනන්ත්‍යත්ථො.

---

1 "අකාරො දීඝං හි මි මෙසු" යනු දීඝවිධානසූත්‍රයි—අකාරො යනු පදය දීඝං යනුපදය හි මි මෙසු යනුපදයි—හ්‍යාදිසු, හි ආදීන් පර කල්හි; අකාරස්ස, අකාරයනට; දීඝො හොති, දිඝී වේ—අහං, මම; පචාමි, පිසමි; මයං, අපි; පචාම; පිසමු.
2 "පරාන්‍යත්තනොපදානි" යනු ආත්මනෙපදසංඥාවිධානසූත්‍රයි—පරානි යනුපදය අත්තනොපදානි යනුපදයි—අඩ්ඪත්තිකානං, අඩ එකකයින්ගේ; යානි යානි, යම් යම්; පරානි, පරවූ; ඡ පදානි, ස පදකෙනෙක් ඇද්ද; තානි තානි, ඒ ඒ පදයෝ; අත්තනො පදානි නාම, ආත්මනෙපද නම් වෙත්—"කත්තරි ච"ඉති "කත්තරි ච" යනසූත්‍රයෙන්; අත්තනොපදානි, ආත්මනෙපදයෝ වෙත්—සෙසං, සෙස්ස; පුබ්බෙව, පළමුමෙනි—සො, තෙතෙම; පචතෙ, පිසේ; තෙ, ඔහු; පචන්තෙ, පිසෙත්; ත්වං, තෝ, පචසෙ, පිසෙහි; තුම්හෙ, තෙපි, පචව්හෙ, පිසව්; අහං, මම; පචෙ, පිසෙමි; මයං, අපි; පචාමහෙ, පියමු.
3 "අත්තනොපදානි භාවෙ ච කම්මනි" යනු ආත්මනෙපද භාන්තිවිධාන සූත්‍රයි—අත්තනොපදානි යනුපදය භාවෙ යනුපදය ච යනුපදය කම්මනි යනුපදයි—භාවෙ ච, භාවයෙහිද; කම්මනි ච, කර්මයෙහිද; අත්තනොපදානි හොන්ති, ආත්මනෙපදයෝ වෙත්—
1 "භාවකම්මෙසු යො" ඉති—පෙ—යන සූත්‍රයෙන්; යො, ය ප්‍රත්‍ය

---

* භූසත්තායං; මුද්‍රිතපොත්.

1 ආඛ්‍යාතප්පච්චයා සබ්බෙ භවෙය්‍යුං සාධනත්තයෙ,
කත්තා කම්මඤ්ච භාවො ච සාධනානීධ වුච්චරෙ.

2 සකම්මකම්හා ධාතුම්හා කත්තුකම්මෙසු හොන්ති තෙ,
න භාවෙ කම්මරහිතම්හා කත්තුභාවෙසු නා පරෙ.

3 කම්මාවචනිච්ඡායං න විරුජ්ඣති සකම්මකා,
භාවෙපි තං යථා ගෙහෙ දෙවදත්තෙන පච්චතෙ.

---

රණය වේ—2 "තස්ස චවග්ගයකාරවකාරත්තංසධාත්වන්තස්ස" යනු චවර්ග ය කාර ව කාරාදෙශවිධාන සූත්‍රයි—තස්සයනුපදය, චවග්ග යකාරවකාරත්තං යනුපදය සධාත්වන්තස්ස යනුපදයි—තස්ස යප්පච්චයස්ස, ඒ ය ප්‍රත්‍යයහට; ධාත්වන්තෙන සහ, ධාත්වන්තයහා සමඟ; යථාසම්භවං, ලැබෙන ලැබෙන පරිද්දෙන්;

චවග්ගයබා හොන්ති, චවර්ග ය කාර ව කාර යන මොහු ආදෙශ වෙත්—ඉධ, මෙහි; ධාත්වන්තස්ස, ධාත්වන්තයා තමා; චවග්ගාදීනං, චවර්ගාදීහුසයින්; තාදිසෙ කාලෙ, එබඳු කලැකල්හි; විනා, විනා වේ.

3 "අත්තනොපදානි පරස්සපදත්තං" යනු පරස්මෛපදවිධාන සූත්‍රයි—අත්තනොපදානියනුපදය පරස්සපදත්තංයනුපදයි—අත්තනොපදානි, ආත්මනෙපදයෝ; කචි. කිසිතැනෙක්හි; පරස්සපදත්තං යන්ති. පරස්මෛපදබවට යෙත්—තෙන, ඔහුවිසින්හෝ; තයා වා, තා විසින්හෝ; මයා වා, මා විසින්හෝ; සො ඔදනො, ඒ ඔදනයතෙම; පච්චති. † පිසනු ලැබේ—පච්චතෙ වා, පච්චතෙ, සියාහෝ වේ—තෙ, ඔහු; පච්චන්තෙ, පිසනුලැබෙත්; පච්චසෙ, තෝ පිසනුලැබෙහි; පච්චවෙහෙ, තෙපි පිසනුලබව්; පච්චෙ, මම පිසනුලබමි; පච්චාමහෙ, අපි පිසනුලබමු. 4 භාවෙ, භාවයෙහි (වේ)—භූ හූ, භූ හූ යන ධාතු; සත්තායං, වීමෙහි වැටෙත්—ඉධ, මෙහි; භාවො, භාව නම්. කාරකාවිසෙසො,

කාරකයෙන් අමිශ්‍රවූ; සුද්ධො, ශුද්ධවූ; ධාත්වත්ථො, ධාත්වර්ථයි—තස්ස, ඒ භාවයා තමා; එකත්තා, එකවලහෙයින්; එකවචනමෙව, එකවචනමැයි—තම්, හෙද; පඨමපුරිසෙ එව හොති, ප්‍රථම පුරුෂයෙහිම වේ—තෙන, ඔහු විසින්හෝ; තයා, තා විසින් හෝ; මයා වා. මා විසින්හෝ; භූයතෙ, වීමයි—තස්ස, ඔහුගේහෝ; තව, තාගේහෝ; මම වා, මාගේහෝ; සම්පති, දැන්; භවනං ඉති, වීමය යනු; අනුභූ, අවීයි.

1 සබ්බෙ. සියලු; ආඛ්‍යාතප්පච්චයා, ආඛ්‍යාතප්‍රත්‍යයෝ; සාධනත්තයෙ, සාරකත්‍රයෙහි; භවෙය්‍යුං, වන්නාහ; ඉධ, මේ ශාස්ත්‍රය ව්‍යාකරණයෙහි; කත්තා, කර්තෘකාරකද; කම්මඤ්ච. කර්මකාරකද; භාවො ච. භාවකාරකද; සාධනානි, සාධන (කාරකය) යයි; වුච්චරෙ, කියනුලැබෙත්.

---

† පච්චති, පිසයයිද; යනාදිය සත්තා·

1 සන්තම්පි වත්ථුමිච්ඡාං න ඨාපනසඤ්ඤකම්පි සා භවෙ
තං යථානුදරා කඤ්ඤා, සමුද්දො කුණ්ඩිකාති ච.

2 උපසග්ගවසා කොචි අකම්මොපි සකම්මකො,
යථාභිභූයතෙ රාජා තාපසෙන මහිද්ධිනා.

3 කාතන්ත්‍රාචින්ති ධාතූහි යස්මිං කම්මං ගවෙස්සතෙ,
සකම්මකොති සො ඤෙයො තබ්බිරුද්ධො අකම්මකො.

4 තථාහි—සො පචතීති වුත්තෙ පාකක්‍රියාය සම්බජ්ඣියමානං කිං ත
ණ්හි ඔදනාදිකං කම්මං ගවෙස්සතෙ—සො භවතීති වුත්තෙ තු භ
වනක්‍රියාය සම්බජ්ඣියමානං කිං තන්ති න කිඤ්චි * කම්මං ගවෙස්ස
තෙ—තාදිසසද්දසත්තිස්ස භාවාභාවා—තථාඤ්ඤත්‍ර.

---

2 තෙ, ඒ ආඛ්‍යාතප්‍රත්‍යයෝ; සකම්මකම්හා ධාතුම්හා, සකර්මක ධාතුන් කෙරෙන් පරව; කත්තුකම්මෙසු හොන්ති, කර්තෘකාරක කර්මකාරක දෙක්හි වෙති; භාවෙ, භාවකාරකයෙහි; න; නො වෙත්; කම්මරහිතම්හා, අකර්මකධාතූන් කෙරෙන් පරව; කත්තුභා වෙසු' කර්තෘකාරක භාවකාරක දෙක්හි වෙති; අපරෙ, මෙසින් අ න්‍යවූ කර්මකාරකයෙහි; න, නොවෙත්.

3 කම්ම, විද්‍යමානවූ කර්මයක්; අවචති විඡාය, නොකීමෙහිලා ඉච්ඡාවක් ඇතිකල්හි; සකම්මකා, සකර්මකධාතූන් කෙරෙන්; භා වෙපි, භාවයෙහිද, න විරුජ්ඣති, විරුඬ නොවේ, තං යථා, ඊට උ දාහරණ මෙසේයි: දෙවදත්තෙන, දෙව්දත්තු විසින්; ගෙහෙ, ගෙ හි; පච්චතෙ, පිසීමයි.

කචි, කිසිතැනෙක්හි; සන්තම්පි, විද්‍යමානවූද වස්තුව; වත්ථුංකියන් නට; ඉච්ඡා, ඉච්ඡා නොම; න, නොවන්නීය, ඨාපි, කිසිතැනෙක් හි; අසන්තම්පි, අවිද්‍යමානවූද වස්තුව; (වත්ථු, කියන්නට;) සා, ඒ ඉච්ඡා නොම; භවෙ, වන්නීය; තං යථා, ඊට උදාහරණ මේ සේයි; කඤ්ඤා, පුත් නොමෝ; අනුදරා, බඩ නැත්තීය; සමුද්දො, ස මුද්‍රයතෙම; කුණ්ඩිකාතිච, කොණ්ඩියකැයි කියාද වේ. 2 උපසග්ගවසා, උපසර්ගයන්ගේ වශයෙන්; කොචි, කිසි; අකම්මකොපි, අකර්මකධා තුද; සකම්මකො, සකර්මක වේ; යථා, මෙසේයි; මහිද්ධිනා, මහත් වූ සෘඬිඇති; තාපසෙන, තපස්වීනු විසින්; රාජා, රාජය තෙම; අභිභූයතෙ, මැඩපවත්වනුලැබේ. 3 යස්මිං ධාතුම්හි, යම් ධාතු වෙක්; කාතුචාචින්ති, කර්තෘවාච්‍යකල්හි; කම්මං, කර්මය, තෙම;

---

* කිඤ්චිපි, මුද්‍රිතපොත්.

"පඤ්චමී තු අන්තු හි ථ මි ම තං අන්තං ස්සු ව්හො එ ආමසෙ" ති තුවාදීනං පඤ්චමීසඤ්ඤා,—2 "ආණත්‍යාසිට්ඨෙනුත්තකාලෙ පඤ්චමී"— ආණත්‍යත්‍ථෙ ච ආසිට්ඨෙ ච ගම්‍යමානෙ පච්චුප්පන්නෙ කාලෙ † හෙදමනාමසිත්‍වා වා පඤ්චමී හොති.

3 නියොගං ජඤ්ඤ ආණත්තිං ආසිට්ඨං ඉට්ඨපත්‍ථනං,
අනුත්තකාලො සාමීපෙ වුත්තෙනා කාලොව ඉච්ඡිතො,
අවුත්තො වා ගහෙතබ්බො පච්චුප්පන්නාදිභෙදතො.

---

ගවෙසනෙ, සොයනුලැබේද; සො, ඒ ධාතුව; සකම්මකොති, සකර්මියයි; ඤෙය්‍යො, දතයුත්තේය; තබ්බිරුද්ධො, ඒට විරුද්ධවූයේ; අකම්මකො, අකර්මකධාතුයයි; (ඤෙය්‍යො, දතයුත්තේයි.)

4 තථා හි; ඒ එසේමැයි—සො, හෙතෙම; පචතීති වුත්තෙ, පිසෙයි යි කල්හි; පාකක්‍රියාය, පචනක්‍රියාව විසින්, සම්බන්ධියමානං, සම්බන්ධකරනු ලබන්නේ; කිං තන්ති, කිමෙක්ද හේයයි; ඔදනාදිකං, ඔදනාදිවූ; කම්මං, කර්මය; ගවෙසනෙ, සොයනු ලැබේ. සො, හෙතෙම; භවතීති, වන්නේයයි; වුත්තෙ තු, කීයනු ලද කල්හි වනාහි; භවනක්‍රියාය, භවනක්‍රියාව විසින්; සම්බන්ධියමානං, සම්බන්ධකරණු ලබන්නේ; කිං තන්ති, කිමෙක්ද හේයයි; කිඤ්චි කිසි, කම්මං, කර්මයක්; න ගවෙසනෙ, නොසොයනු ලැබේ—(කර්ම හෙයින්ද යත්) තාදිස, එබඳුවූ; සඤ්ඤත්ති සභාවාභාවා, ශබ්ද කර්මභාවයක් නැතිහෙයිනි—අඤ්ඤත්‍ර, සෙසුතැන්හිදු; තථා, එසේමැයි.

"පඤ්චමී තු අන්තු හි ථ මි ම තං අන්තං ස්සු ව්හො එ ආමසෙ" ඉති—තුප—ආමසෙ යන සූත්‍රයෙන්; තුවාදීනං, තු ආදීන්ට; පඤ්චමී සඤ්ඤා, පඤ්චමීවිභක්තිසංඥ වේ—2 "ආණත්‍යාසිට්ඨෙනුත්තකාලෙ පඤ්චමී" යනු පඤ්චමීවිභක්තිවිධාන සූත්‍රයි—ආණත්‍යාසිට්ඨෙ යනු පදය අනුත්තකාලෙ යනු පදය පඤ්චමී යනු පදයි—ආණත්‍යත්‍ථෙ ච, නියොගාර්ථයෙහිද; ආසිට්ඨෙ ච, ආශිංසනාර්ථයෙහිද; ගම්‍යමානෙ, හැඟෙනකල්හි; පච්චුප්පන්නෙ කාලෙ, වර්තමානකාලයෙහි වේවයි; හෙදමනාමසිත්‍වා වා, කාලවිශෙෂයක් නොගෙන වේවයි; පඤ්චමී හොති, පඤ්චමීවිභක්ති වේ:

3 නියොගං, නියොග කිරීම, ආණත්තිං, ආණත්තියය; ජඤ්ඤ, දන්නේය; ඉට්ඨපත්‍ථනං, කැමතිදෙයක් ප්‍රාර්ථනා කිරීම; ආසිට්ඨං

---

† කාලභෙදමනාමසිත්‍වා, මුද්‍රිතපොත්.

අප්පච්චයෙ *—පචතු පචන්තු—"හි ලොපං වා"ති හිස්ස ලොපො වා—පච පචාහි—පක්ඛෙ දීඝො—පචථ පචාමි පචාම—අත්තනොපදෙ—පචතං පචන්තං පචස්සු පචව්හො පචෙ පචාමසෙ—කම්මනි—පච්චතං ඉච්චාදි—කත්තුසමං යොච විසෙසො—භාවෙ—භූයතං—ඉතොපරං කම්මභාවෙසු නයානුසාරෙන ඤෙය්‍යා †
"සත්තමී එය්‍ය එය්‍යුං එය්‍යාසි එය්‍යාථ එය්‍යාමි එය්‍යාම එථ එරං එථො එය්‍යව්හො එය්‍යං එය්‍යාමෙහ"ති එය්‍යාදීනං සත්තමීසඤ්ඤා.
2 "අනුමතිපරිකප්පත්ථෙසු සත්තමී"—අනුමත්‍යත්ථෙ පරිකප්පත්ථෙ ච අනාගතකාලෙ සත්තමී හොති.

3 යං කිඤ්චි කත්තුමිච්ඡන්තමඤ්ඤො යදනුමඤ්ඤති,
සා නුමති පරිකප්පො කත්තබ්බා නිච්ඡයො මතො.

---

(ජඤ්ඤා) අසිංසනයසිද්ධත්‍යුත්තෝය; අනාගතකාලෙ, අනාගතකාල නම්; සාමීපෙ, ආසන්නයෙහි; වුත්තො කාලො, කියනලද කාලය තෙම; ඉධ, මෙ තැන්හි; ඉච්ඡිතො, කැමතිවනලද; වා, නො හොත්; පච්චුප්පන්නාදිභෙදතො, වර්තමානාදිභෙදයන්; අවුත්තො, නොකියනලදකාලය, ගහෙතබ්බො, ගතයුතුයි. අප්පච්චයෙ, අප්‍රත්‍යය කලකල්හි—පචතු පචන්තු, යනු වේ—පචතු, පිසේවා; පචන්තු, පිසත්වා—"හි ලොපං වා"ඉති—පෙ—සූත්‍රයෙන්;
හිස්ස, හි විභක්තිහට. ලොපො, ලොප් තෙම. වා, විකල්පයෙන් වේ—පච පචාහි, යනුවේ—පක්ඛෙ, එක් පක්ෂයෙක්හි; දීඝො, දීර්ඝ වේ—පචථ පචාමි පචාම, යනු වේ—අත්තනොපදෙ, ආත්මනෙපද යෙහි—පචතං පචන්තං පචස්සු පචව්හො පචෙ පචාමසෙ, යනු වේ—කම්මනි, කර්මයෙහි, පච්චතං ඉති, පිසනු ලැබේවා යනු; ආදි, මේ ආදිරූපවේ—කත්තුසමං, කර්තෘහා සමානය; යොච, යකාරය කිරීමම; විසෙසො. වෙනසි—භාවෙ, භාවයෙහි; භූයතං, වීමවේවා—ඉතොපරං, මෙයින් මත්තෙහි; කම්මභාවෙසු, කර්ම භාව දෙක්හි; නයානුසාරෙන' කියන ලද ක්‍රමයෙන්; ඤෙය්‍යා, දතයුත්තාහුයි.
"සත්තමී එය්‍ය එය්‍යුං එය්‍යාසි එය්‍යාථ එය්‍යාමි එය්‍යාම එථ එරං එථො එය්‍යව්හො එය්‍යං එය්‍යාමෙහ" ඉති—පෙ—යන සූත්‍රයෙන්; එය්‍යාදීනං, එය්‍යාදීන්ට, සත්තමීසඤ්ඤා, සප්තමීවිභක්තිසංඥා වේ. 2 "අනුමතිපරිකප්පත්ථෙසු සත්තමී" යනු සප්තමීවිභක්තිවිධාන සූත්‍රයි—අනුමතිපරිකප්පත්ථෙසු යනු පදය සත්තමී යනු පදයි—අනුමත්‍යත්ථෙ ච අනුමත්‍යර්ථයක්ද. පරිකප්පත්ථෙ ච, පරිකල්පාර්ථයක්ද,

---

* අප්පච්චයො, මුද්‍රිතපොත්. † ඤෙය්‍යං, මුද්‍රිතපොත්.

1 යදාදිනා එය්‍යස්ස එ ආදෙසො වා—පචෙ පචෙය්‍ය පචෙය්‍යුං පචෙය්‍යාසි පචෙය්‍යාථ පචෙය්‍යාමි පචෙය්‍යාම—අත්තනොපදෙ— පචෙථ පචෙරං පචෙථො පචෙය්‍යාව්හො පචෙය්‍යං පචෙය්‍යාම්හෙ— පඤ්චමී සත්තමීනායං පුබ්බාචරියසඤ්ඤා.

---

“පරොක්ඛා අ උ එ ත්ථ අ ම්හ ත්ථ රෙ ත්ථො ව්හො ඉ ම්හෙ”ති අ ඉ ත්‍යාදීනං පරොක්ඛාසඤ්ඤා—3 “අපච්චක්ඛෙ පරොක්ඛාතීතෙ”— අක්ඛමින්ද්‍රියං, තන්නිස්සිතං පච්චක්ඛං, න පච්චක්ඛං අපච්චක්ඛං, තස්මිං අපච්චක්ඛෙ අතීතෙ කාලෙ පරොක්ඛා හොති. 4 “ක්වචාදිවණ්ණානමෙකස්සරානං ද්වෙභාවො” ති සස්සරස්සාදිස්ස ද්විත්තං— පපච පපචු පපචෙ—“ඉකාරාගමො අසබ්බධාතුකම්හි”—බ්‍යඤ්ජනාදො අසබ්බධාතුකම්හි ඉ ආගමො—

---

හැඟෙන ගල්හි; අනුඤ්ඤාතකාලෙ, අනුඥාතකාලයෙහි; සත්තමී හොති, සප්තමීවිභක්ති වේ.

3 යං කිඤ්චි, යම් කිසිවක්; කත්තුං, කරන්නට; ඉච්ඡන්තං, කැමැත්තහුට; අඤ්ඤස්ස, අන්කෙනෙක්; යදා, යම් කලෙක්හි; අනුමඤ්ඤති, අනුදනිය යන යමෙක් ඇද්ද; සො, ඕ තොම; අනුමති, අනුමති නමු; කත්තබ්බ, * කටයුත්තෙහි; අනිච්ඡයො, නිශ්චය නොකිරීම; පරිකප්පො, පරිකල්පයයි, මතො, දන්නා ලදී.

1 යදාදිනා, යදාදිසූත්‍රයෙන්; එය්‍යස්ස, එය්‍ය විභක්තිහට; එ ආදෙසො, එ යනාදෙශය; වා විකල්පයෙන් වේ—පචෙ පචෙය්‍ය පචෙය්‍යුං පචෙය්‍යාසි පචෙය්‍යාථ පචෙය්‍යාමි පචෙය්‍යාම, යනු වේ අත්තනොපදෙ, ආත්මනෙපදයෙහි—පචෙථ පචෙරං පචෙථො පචෙය්‍යාව්හො පචෙය්‍යං පචෙය්‍යාම්හෙ, යනු වේ—පඤ්චමීසත්තමී ඉති. පඤ්චමී සත්තමී යන, අයං, මේ තොම; පුබ්බාචරියසඤ්ඤා, පූර්වාචාර්‍ය්‍යවරයන්ගේ සංඥයි.

---

“පරොක්ඛා අ උ එ ත්ථ අ ම්හ ත්ථ රෙ ත්ථො ව්හො ඉ ම්හෙ” ඉති—පෙ—ම්හෙ යන සූත්‍රයෙන්; අ ඉති, අ යන; ආදීනං, මේ ආදීන්ට; පරොක්ඛා සඤ්ඤා, පරොක්ෂා භක්තිසංඥා වේ—3 “අපච්චක්ඛෙ පරොක්ඛාතීතෙ” යනු පරොක්ෂාවිභක්තිවිධාන සූත්‍රයි—අපච්චක්ඛෙ යනු පදය පරොක්ඛා යනු පදය අතීතෙ යනු පදයි—අක්ඛං අක්ෂ නම්; ඉන්ද්‍රියං, ඉන්ද්‍රියය; තං නිස්සිතං, ඒ ඇසිරූ කළේ;

---

* කත්තබ්බ සිද සන්ධිය වෙන්කරති.

හීයත්තනී සත්තමී පඤ්චමී * වත්තමානා සබ්බධාතුකං තදඤ්ඤා අසබ්බධාතුකං—පපචිත්ථ පපච පපචිම්හ—අත්තනොපදෙ—පපචිත්ථ පපචිරෙ පපචිත්ථො පපචිව්හො පපචිං පපචිම්හෙ—

"හීයත්තනී ආ ඌ ඔ ත්ථ අ ම්හා ත්ථ ත්ථුං සෙ ව්හං ඉං ම්හසෙ"ති ආ ආදීනං හීයත්තනීසඤ්ඤා. 2 අපච්චක්ඛෙ අතීතෙත්වෙව—"හීයොප්පභූති පච්චක්ඛෙ හීයත්තනී"—හීයොප්පභූති පච්චක්ඛෙ වා අපච්චක්ඛෙ වා අතීතෙ කාලෙ හීයත්තනී හොති—"අකාරාගමො හීයත්තනජ්ජතනිකාලාතිපත්තීසු"ති ධාතුතො පුබ්බෙ ක්වචි අකාරාගමො—අපචා අපචූ අපචො අපචත්ථ අපච අපචම්හා—අත්තනොපදෙ—අපචත්ථ අපචත්ථුං අපචසෙ අපචව්හං අපචිං අපචාම්හසෙ.

---

පච්චක්ඛං, පච්චක්ඛ නම; න පච්චක්ඛං, ප්‍රත්‍යක්‍ෂ නොවන්නේ; අපච්චක්ඛං, අප්‍රත්‍යක්‍ෂ නම්; අපච්චක්ඛෙ, ප්‍රත්‍යක්‍ෂ නොවූ; තස්මිං අතීතෙකාලෙ, ඒ ඉකුත් කල්හි; පරොක්ඛා හොති, පරොක්ඛාවිභක්ති වේ. 4 "ක්වචාදිවණ්ණානමෙකස්සරානං ද්වෙභාවො"ති—පෙ—ද්වෙභාවො යන සූත්‍රයෙන්; සස්සරස්ස, ස්වරසහිතවූ; ආදිස්ස ආදිවර්ණයහට; ද්විත්තං, ද්විත්ව වේ—පපච පපචු පපචෙ යනු වේ—"ඉකාරාගමො අසබ්බධාතුකම්හි" යනු ඉකාරාගමවිධාන සූත්‍රයි—

ඉකාරාගමො යනු පදය අසබ්බධාතුකම්හි යනු පදයි—බ්‍යඤ්ජනාදෙ, බ්‍යඤ්ජනයක්හු ආදිකොටඇති; අසබ්බධාතුකම්හි, අසර්වධාතුක විභක්තිපරකල්හි; ඉ ආගමො, ඉකාරයෙක් ආගම වේ—හීයත්තනී, හීයත්තනීවිභක්තිය; සත්තමී, සප්තමිවිභක්තිය; පඤ්චමී, පඤ්චමිවිභක්තිය; වත්තමානා, වර්තමානාවිභක්තිය; යන මොහු; සබ්බධාතුකං, සර්වධාතුක නම් වෙති; තදඤ්ඤා, ඔවුන්කෙරෙන් අන්‍ය වූවාහු; අසබ්බධාතුකං, අසර්වධාතුක නම් වෙත්—පපචිත්ථ පපච පපචිම්හ, යනු වේ—අත්තනොපදෙ, ආත්මනෙපදයෙහි—පපචිත්ථ පපචිරෙ පපචිත්ථො පපචිව්හො පපචිං පපචිම්හෙ, යනු වේ.

---

"හීයත්තනී ආ ඌ ඔ ත්ථ අ ම්හා ත්ථ ත්ථුං සෙ ව්හං ඉං ම්හසෙ"ඉති—පෙ—ම්හසෙ යන සූත්‍රයෙන්; ආ ආදීනං, ආ ආදීන්ට; හීයත්තනීසඤ්ඤා, හීයත්තනීවිභක්තිසංඥා වේ. 2 අපච්චක්ඛෙ ඉති, අපච්චක්ඛෙ යනුද; අතීතෙ ඉති, අතීතෙයනුද; එව, මතුසූත්‍රයෙහි වැටේ—"හීයොප්පභූති පච්චක්ඛෙ හීයත්තනී" යනු හීයත්තනීවිභක්තිවිධාන සූත්‍රයි—හීයොප්පභූති යනු පදය පච්චක්ඛෙ යනු පදය හීයත්තනී

---

* පඤ්චමී සත්තමී, මුද්‍රිතඃ

අජ්ජතනී ඊ උං ඔ ත්ථ ඉං ම්හා ආ ඌ සෙ විහං අ ම්හෙ" ති ඊ ආදීනං අජ්ජතනීසඤ්ඤා. 2 අතීතෙනෙව—"සමීපෙ ජ්ජතනී"—අජ්ජප්පභුති සමීපෙ අතීතෙ කාලෙ අජ්ජතනී හොති—අපචී—සඤ්ඤාදිනා රස්ස—අපචි—අකාරාගමාභාවෙ—පචි—3 "සබ්බතො උං ඉංසු" සබ්බධාතුහි උං විභත්තිස්ස ඉංසවාදෙසො වා හොති—අපචිංසු අපචුං අපචො—ඉකාරාගමො—අපචිත්ථ අපචිං අපචිම්හා—අත්තනොපදෙ—අපචා අපචූ අපචිසෙ අපචිවිහං අපච අපචිම්හෙ.

3 පවත්තමොහිතරත්තියා යාමො අඩ්ඩම්බුස්ස වා,
කාලො සියානජ්ජතනො වෙය්‍යාකරණදස්සනං.

---

යනු පදයි—හීයොප්පභුති, ඊයේපටන්කොට; පච්චක්ඛෙ වා, ප්‍රත්‍යක්‍ෂවූහෝ; අපච්චක්ඛෙ වා, ප්‍රත්‍යක්‍ෂ නොවූහෝ; අතීතෙ කාලෙ, ඉකුත් කාලයෙහි; හීයත්තනී හොති, හීයත්තනීවිභක්ති වේ—"අකාරාගමො හීයත්තනජ්ජතනීකාලාතිපත්තිසු" ඉති—පෙ—පත්තිසු යනසූත්‍රයෙන්; ධාතුතො, ධාතූනුකෙරෙන්; පුබ්බෙ, පූර්වයෙහි; ක්වචි, කිසිතැනෙක්හි; අකාරාගමො, අකාරයෙක් ආගමවේ—අපචා අපචූ අපචො අපචත්ථ අපච අපචම්හා; යනු වේ—අත්තනොපදෙ, ආත්මනෛපදයෙහි—අපචත්ථ අපචත්ථුං අපචසෙ අපචවිහං අපිචිං අපචාම්හසෙ, යනු වේ.

---

"අජ්ජතනී ඊ උං ඔ ත්ථ ඉං ම්හා ආ ඌ සෙ විහං අ ම්හෙ" ඉති පෙ—ම්හෙ යන සූත්‍රයෙන්; ඊ ආදීනං, ඊ ආදීන්ට; අජ්ජතනිසඤ්ඤා, අජ්ජතනීවිභක්තිසංඥ වේ. 2 අතීතෙ ඉති, අතීතෙ යනු; එව, මතුසූත්‍රයෙහි වැටේ—"සමීපෙජ්ජතනී" යනු අජ්ජතනීවිභක්තිවිධාන සූත්‍රයි සමීපෙ යනු පදය අජ්ජතනී යනු පදයි—අජ්ජප්පභුති, අද පටන්කොට; සමීපෙ, ආසන්නවූ; අතීතෙ කාලෙ, ඉකුත් කාලයෙහි; අජ්ජතනී හොති, අජ්ජතනීවිභක්ති වේ—අපචී, යනුවේ—සඤ්ඤාදිනා, සඤ්ඤාදිසූත්‍රයෙන්; රස්ස, හ්‍රස්වකළකල්හි; අපචි, යනුවේ—අකාරමාභාවෙ, අකාරාගම නොවූ තැන්හි—පචි, යනුවේ—3 "සබ්බතො උං ඉංසු" යනු ඉංසු යනාදෙශවිධාන සූත්‍රයි—සබ්බතො යනු පදය උං යනු පදය ඉංසු යනු පදයි—සබ්බධාතුහි, සියලුධාතූන් කෙරෙන් පරවූ; උං විභත්තිස්ස, උං විභක්තිහට; ඉංසවාදෙසො හොති, ඉංසු යනාදෙශවේ—අපචිංසු අපචුං අපචො, යනුවේ—ඉකාරාගමො, ඉකාරයෙක් ආගමවේ—අපචිත්ථ අපචිං අපචිම්හා, යනුවේ—අත්තනොපදෙ, ආත්මනෛපදයෙහි—අපචා අපචූ අපචිසෙ අපචිවිහං අපච අපචිම්හෙ යනු වේ.

"භවිස්සති ස්සන්ති ස්සසි ස්සථ ස්සාමි ස්සාම ස්සතෙ ස්සන්තෙ ස්සසෙ ස්සව්හෙ ස්සං ස්සාමෙහෙ"ති ස්සත්‍යාදීනං භවිස්සන්තිසඤ්ඤා. 2 "අනාගතෙ භවිස්සන්ති"—අනාගතෙ කාලෙ ගම්‍යමානෙ භවිස්සන්තිවිභත්ති හොති—ඉකාරාගමො—පචිස්සති පචිස්සන්ති පචිස්සසි පචිස්සථ පචිස්සාමි පචිස්සාම—අත්තනොපදෙ—පචිස්සතෙ පචිස්සන්තෙ පචිස්සසෙ පචිස්සව්හෙ පචිස්සං පචිස්සාමෙහෙ.

..................................

"කාලාතිපත්ති ස්සා ස්සංසු ස්සෙ ස්සථ ස්සං ස්සම්හා ස්සථ ස්සිංසු ස්සසෙ ස්සව්හෙ ස්සං ස්සාම්හසෙ"ති ස්සාදීනං කාලාතිපත්තිසඤ්ඤා.

---

4 අතීතරත්තියා, ඉකුත් රාත්‍රියගේ; පච්ඡිමො යාමො වා, පච්ඡිමයාමයගෙ හෝ; අමුස්ස, මේ යාමයාගේ; අඩ්ඪං වා, භාගයක්හෝ; අජ්ජතනො කාලො සියා, අජ්ජතනීකල් නම් වන්නේයයි යනු; වෙය්‍යාකරණදස්සනං, වෛයාකරණයන්ගේ දැක්වීමයි.

---

"භවිස්සති ස්සන්ති ස්සසි ස්සථ ස්සාමි ස්සාම ස්සතෙ ස්සන්තෙ ස්සසෙ ස්සව්හෙ ස්සං ස්සාමෙහෙ" ඉති—පෙ—ස්සාමෙහෙ යන සූත්‍රයෙන්; ස්සත්‍යාදීනං, ස්සති ආදීන්ට; භවිස්සන්තිසඤ්ඤා, භවිස්සන්තිවිභක්තිසංඥා වේ. 2 "අනාගතෙ භවිස්සන්ති" යනු භවිෂ්‍යත්විභක්තිවිධාන සූත්‍රයි අනාගතෙ යනු පදය භවිස්සන්ති යනු පදයි—අනාගතෙ කාලෙ, අනාගතකාලයක්; ගම්‍යමානෙ, හැඟෙන කල්හි; භවිස්සන්තිවිභත්ති හොති, භවිෂ්‍යත්විභක්ති වේ—ඉකාරාගමො, ඉකාරයෙක් ආගම වේ—පචිස්සති පචිස්සන්ති පචිස්සසි පචිස්සථ පචිස්සාමි පචිස්සාම, යනු වේ—අත්තනොපදෙ, ආත්මනෙපදයෙහි—පචිස්සතෙ පචිස්සන්තෙ පචිස්සසෙ පචිස්සව්හෙ පචිස්සං පචිස්සාමෙහෙ, යනු වේ.

~~~~~~

"කාලාතිපත්ති ස්සා ස්සංසු ස්සෙ ස්සථ ස්සං ස්සම්හා ස්සථ ස්සිංසු ස්සසෙ ස්සව්හෙ ස්සං ස්සාම්හසෙ" ඉති—පෙ—ස්සාම්හසෙ යන සූත්‍රයෙන්; ස්සාදීනං, ස්සා ආදීන්ට; කාලාතිපත්තිසඤ්ඤා, කාලාතිපත්තිවිභක්තිසංඥා වේ. "ක්‍රියාතිපන්නෙ තීතෙ කාලාතිපත්ති" යනු කාලාතිපත්තිවිභක්තිවිධාන සූත්‍රයි—ක්‍රියාතිපන්නෙ යනු පදය අතීතෙ යනු පදය කාලාතිපත්ති යනු පදයි—ක්‍රියාතිපන්නමත්තෙ, ක්‍රියාවගේ අභාවමාත්‍රයක් හැඟෙන කල්හි; අතීතෙ කාලෙ, ඉකුත් කාලයෙහි, කාලාතිපත්ති හොති, කාලාතිපත්තිවිභක්ති වේ.
~~~~~~

“ක්‍රියාතිපන්නෙ තීතෙ කාලාතිපත්ති”—ක්‍රියාතිපන්නම්හි අතීතෙ කාලෙ කාලාතිපත්ති හොති.

1 විරුද්ධසන්නිධානා වා හෙතුවෛකල්ලතො පි වා,
ක්‍රියාය භවනං යන්තං ක්‍රියාතිපන්නමිච්ඡිතං.

2 අකාරිකාරාගමො—සචෙ තබ්බිරුද්ධං න භවෙය්‍ය තදුපකරණං වා ලභෙථ ඔදනං අපචිස්සා—අපචිස්සංසු අපචිස්සෙ අපචිස්සථ අපචිස්සං අපචිස්සාම්හා—අත්තනොපදෙ—අපචිස්සථ අපචිස්සිංසු අපචිස්සසෙ අපචිස්සව්හෙ අපචිස්සං අපචිස්සාම්හසෙ.

---

පචන්තං පයොජයතීත්‍යපෙ—“ධාතූහි ණෙ ණය ණාපෙ ණාපයා කාරිතානි හෙත්වත්ථෙ”—හෙත්වත්ථෙ ගම්‍යමානෙ ධාතූහි ණෙ ආදයො හොන්ති

---

1 විරුද්ධසන්නිධානා වා, විරුද්ධප්‍රත්‍යයක්ගේ ලඟාවීමෙන් හෝ; හෙතුවෛකල්ලතො පි වා, කාරණවෛකල්‍යයකින් හෝ; ක්‍රියාය, ක්‍රියාවගේ; අභවනං, නොවීම්ය යනු; යං, යමෙක්ද; තං, ඒ; ක්‍රියාතිපන්නං, ක්‍රියාතිපන්න නමැයි; ඉච්ඡිතං, කැමතිවනලදී.

2 අකාරිකාරගමෝ, අකාර ඉකාරාගම වේ—සචෙ, ඉදින්; තබ්බිරුද්ධං, ඒට විරුද්ධවස්තුයෙක්; න භවෙය්‍ය, නොවීනම්; තදුපකරණං වා, ඒට උපකරණයක් හෝ; ලභෙථ, ලද්දේවීනම්; අපචිස්සා, පිසුයේයි—අපචිස්සංසු අපචිස්සෙ අපචිස්සථ අපචිස්සං අපචිස්සම්හා, යනු වේ—අත්තනොපදෙ, ආත්මනෝපදයෙහි—අපචිස්සථ අපචිස්සිංසු අපචිස්සසෙ අපචිස්සව්හෙ අපචිස්සං අපචිස්සාම්හසෙ, යනු වේ.

---

පචන්තං පිසන්නහු; පයොජයතීත්‍යපෙ, මෙහෙයයි යන අර්ථයෙහි—“ධාතූහි ණෙ ණය ණාපෙ ණාපයා කාරිතානි හෙත්වත්ථෙ” යනු කාරිතප්‍රත්‍යය විධාන සූත්‍රයි ධාතූහි යනුපදය ණෙ ණය ණාපෙ ණාපයා යනු පදය කාරිතානි යනු පදය හෙත්වත්ථෙ යනු පදයි—හෙත්වත්ථෙ, හෙත්වර්ථයක්; ගම්‍යමානෙ, හැඟෙනකල්හි; ධාතූහි, ධාතූන්කෙරෙන්; ණෙ ආදයො හොන්ති, ණෙ ආදිප්‍රත්‍යයෝ වෙත්; තෙසං, ඔවුන්ට; කාරිතසඤ්ඤාච, කාරිතසංඥාද වේ—“කාරිතානං ණො ලොපං” ඉති—පෙ—යන සූත්‍රයෙන්; ණ ලොපො, ණ කාරයහට ලොප් වේ—“අසංයොගන්තස්ස වුද්ධි කාරිතෙ” ඉති—පෙ—යන සූත්‍රයෙන්; වුද්ධි, වෘද්ධි වේ.

තෙසං කාරිතසඤ්ඤා ච—"කාරිතානං ණො ලොපං"ති ණ ලෝපො—"අසංයොගන්තස්ස වුඩ්ඩි කාරිතෙ"ති වුඩ්ඩි.1 "ධාතුප්පච්චයෙහි විභත්තියො හොන්තී"ති* ත්‍යාදයො—පාචෙති—පරලොපෙ පාචෙන්තිත්‍යාදි—අඤ්ඤවිභත්තීසු ඤෙය්‍යං.

2. අකම්මකාපි හෙත්වත්ථප්පච්චයන්තා සකම්මකා,
තං යථා භික්ඛු භාවෙති මග්ගං රාගාදිදූසකං.

භූවාදි.

රුධි ආවරණෙ—අ ඉච්චෙව—"රුධාදිතො නිග්ගහීතපුබ්බඤ්ච"—රුධාදිහි කත්තරි අප්පච්චයො හොති ධාත්වන්තා පුබ්බෙ බිඳුවාගමො ච—රුන්ධති රුන්ධන්තිත්‍යාදි—අඤ්ඤවිභත්තීසු හෙත්වත්ථෙ පි† ඤෙය්‍යං—තදුපරි,

රුධාදි.

---

1 "ධාතුප්පච්චයෙහි විභත්තියො" යනු විභත්තිවිධාන සූත්‍රයි—ධාතුප්පච්චයෙහි යනු පදය විභත්තියො යනු පදයි—ධාත්වත්ථෙ, ධාත්වර්ථයෙහි; නිද්දිට්ඨෙහි, දක්වනලද; ඛාදි, ඛ ප්‍රත්‍යය ආදිකොට ඇති; කාරිතනෙහි; කාරිතප්‍රත්‍යයන් අන්තකොටඇති, පච්චයෙහි, ප්‍රත්‍යයන්කෙරෙන්; විභත්තියො හොන්තීති; විභක්තීහු වෙත්නුයි ත්‍යාදයො, ති ආදීහු වෙත්—පාචෙති, යනු වේ—පරලොපෙ, පරස්වරයහට ලොප්කළකල්හි—පාචෙන්ති ඉති, පාචෙන්ති යන; ආදි, මේ ආදිරූප වේ—අඤ්ඤවිභත්තීසු, අන්‍යවිභක්තියෙහි; ඤෙය්‍යං, දතයුතුයි.

2 හෙත්වත්ථප්පච්චයන්තා, හෙත්වර්ථයෙහි කළ ප්‍රත්‍යයන් අන්තකොටඇති; අකම්මකාපි, අකර්මකධාතූහුද; සකම්මකා, සකර්මසහිත වෙති; තං යථා, ඒ මෙසේයි; භික්ඛු, මහණ තෙම; රාගාදිදූසකං, රාගාදීන් දූෂ්‍යකරන්නාවූ; මග්ගං, ආර්‍ය්‍යමාර්ගය; භාවෙති, වඩා.

භූවාදි 2 භූවාදිගණයයි.

---

රුධි, රුධියනධාතු; ආවරණෙ, වැලක්මෙහි වැටේ—අ ඉති,

---

* හොන්ති ත්‍යාදයො, මුද්‍රිතපොත්.

† හොත්වත්ථෙ ච, මුද්‍රිතපොත්.

දිවු කීළාදිම්හි—"දිවාදිතො යො"ති කත්තරි යො; ද්වි ත්‍යස්සත්‍යා-
දිපුබ්බරූපත්තඤ්ච—"යථා කත්තරි ච"—යථා භාවකම්මෙසු යප්ප-
ච්චයස්සාදෙසො හොති තථා කත්තරිපීති යකාරස්ස පුබ්බරූපත්-
තං—ත්‍වත්ත—"දො ධස්ස ච"ත්‍යත්‍ර චකාරෙන බත්තං—දිබ්බති
දිබ්බන්තීත්‍යාදි.

## දිවාදි.

සු සවණෙ—"ස්වාදිතො ණුණා උණා ච"ති කත්තරි ණුවාද-
යො "අක්ඛක්ඛුසු ච"තීහ චකාරෙන ණුස්ස වුද්ධි—සුණොති—උ-
ලොපො—සුණන්තීත්‍යාදි.

## ස්වාදි.

---

අ යනු; එච, මතුසූත්‍රයෙහි වැටේ—"රුධාදිතො නිග්ගහීතපුබ්බඤ්ච" යනු අ විකරණප්‍රත්‍යයහා නිග්ගහීතාගමවිධාන සූත්‍රයි රුධාදිතො යනු පදය නිග්ගහීතපුබ්බං යනු පදය ච යනු පදයි.—රුධාදිතෝ, රුධාදී ධාතූන්කෙරෙන්; කත්තරි, කර්තෘකාරකයෙහි; අ පච්චයො හොති, අ ප්‍රත්‍යය වේ—ධාත්වන්තා, ධාත්වන්තයාකෙරෙන්; පුබ්බ, ආදියෙහි; බින්දුවාගමො ච, නිග්ගහීතයෙක්ද ආගම වේ.

## රුධාදී.

රුන්ධති රුන්ධන්ති ඉති—පෙ—යන; ආදි, මේ ආදි රූප වේ—අඤ්ඤවිභත්තීසු, අන්‍යවිභක්තියෙහිද; හෙට්ඨෙපි, හෙට්ඨීයෙහිදු; ඤෙය්‍යං, දතයුතුයි—උපරි, මත්තෙහිදු; තථා, එසේමැයි.

## රුධාදි, රුධාදිගණයයි.

දිවු, දිවු යන ධාතු; කීළාදිම්හි, ක්‍රීඩාදිවූ අර්ථයෙහි වැටේ—"දිවාදිතො යො"ඉති—පෙ—යන සූත්‍රයෙන්; කත්තරි, කර්තෘකාරකයෙහි; යො, ය විකරණය වේ. 2 ත්‍යස්සත්‍යාදි, ත්‍යස්ස චවග්ගයකාරවකාරත්තං සධාත්වන්තස්ස යනුද; පුබ්බරූපං ඉති, පුබ්බරූපං යනුද; එච, මතුසූත්‍රයෙහි වැටේ—"යථා කත්තරි ච" යනු පූර්වරූපවිධාන සූත්‍රයි යථා යනු පදය කත්තරි යනු පදය ච යනු පදයි—යථා, යම්සේ; භාවකම්මෙසු, භාවකර්මදෙක්හි; යප්පච්චයස්ස, ය ප්‍රත්‍යය හට; ආදෙසො හොති, ආදෙශ වේද; තථා, එසේම; කත්තරිපීති, කර්තෘකාරකයෙහිද වේනුයි; යකාරස්ස, යකාරයහට; පුබ්බරූපො

කී දබ්බවිනිමයෙ—“කීයාදිතො නා”ති කත්තරි නා—යදාදිනා ඊස්ස රස්සො—කිණාති කිණන්තීත්‍යාදි.

කියාදි.

ගහ උපාදානෙ—“ගහාදිතො ප්ප ණ්හා”ති කත්තරි ප්ප ණ්හා ච “ගහස්ස ඝෙ ප්පෙ”ති ඝෙ ආදෙසො *—ඝෙප්පති—“හලොපො ණ්හාම්හී”ති ධාත්වන්තස්ස හස්ස ලොපො—ගණ්හාති ගණ්හන්තීත්‍යාදි.

ගහාදි.

---

පූර්වරූපවූ; ව්‍ය, වකාරයෙක් ආදෙශ වේ—දිව්‍යන්ත, නිත්‍යකාලකල්හි—“ද්ද ධස්ස ච”ඉති, “ද්ද ධස්ස ච”යන; අත්‍ර, මේ සූත්‍රයෙහි; චකාරෙන, චශබ්දග්‍රහණයෙන්; බ්බයං, බකාරවයක් වේ—දිබ්බති දිබ්බන්ති ඉති—පෙ—යන; ආදි, මේ ආදිය වේ.

දිවාදි, දිවාදිගණයයි.

සු, සු යන ධාතු; සවණෙ, ඇසීමෙහි වැටේ—

“ස්වාදිතො ණු ණා උණා ච” ඉති—පෙ—යන සූත්‍රයෙන්; කත්තරි, කර්තෘකාරකයෙහි; ණුවාදයො, ණු ආදිප්‍රත්‍යයෝ වෙත්—“අ ඤ්ඤ ඤුසු ච”ඉති, “අ ඤ්ඤ ඤුසු ච”යන; ඉහ, මේ සූත්‍රයෙහි; චකාරෙන, චශබ්දග්‍රහණයෙන්; ණුස්ස, ණුකාරයහට; වුඩ්ඩි, වෘද්ධි වේ—සුණොති, යනු වේ—උලොපො, උකාරයහට ලොප් වේ—සුණන්ති ඉති, සුණන්ති යන; ආදි, මේ ආදිරූප වේ.

ස්වාදි, ස්වාදිගණයයි.

කී, කී යනධාතු; දබ්බවිනිමයෙ, ද්‍රව්‍යයන්ගේ ගැනුමෙහි වැ වේ—“කියාදිතො නා” ඉති—පෙ—යන සූත්‍රයෙන්; කත්තරි, කර්තෘකාරකයෙහි; නා, නා විකරණය වේ—යදාදිනා, යදාදිසූත්‍රයෙන්; ඊස්ස, ඊකාරයහට; රස්ස, හ්‍රස්වකාලකල්හි—කිණාති කිණන්ති ඉති—පෙ—යන; ආදි, මේ ආදිරූප වේ.

කියාදි, කියාදිගණයයි.

ගහ, ගහ යනධාතු; උපාදානෙ, ගැන්මෙහි වැවේ—“ගහාදිතො ප්ප ණ්හා” ඉති—පෙ—යන සූත්‍රයෙන්, කත්තරි, කර්තෘකාරකයෙහි; ප්ප ණ්හ ච, ප්ප ණ්හා ප්‍රත්‍යයෝ වෙත්—“ගහස්ස ඝෙප්පෙ”

---

* ආදෙසො, මුද්‍රිතපොත්.

කර කරණෙ—"තනාදිතො ඔ සිරා"—තනු ඉච්චෙවමාදිහි ධාතූහි කත්තරි ඔ සිරා හොන්ති—කරොති—යදාදිනා ධාතුරස්ස ලොපො—කයිරති—"උත්තමොකාරො"ති ඔස්ස උත්තං වා—"කරස්ස කාරොචෙ"ති ධාත්වකාරස්ස උත්තං වා—රලොපො—උස්ස වො—විකෙත—බවයං—කුබ්බන්ති කරොන්ති වා—අත්තනොපදෙ—කුරුතෙ කුබ්බතෙ ඉච්චාදි. කම්මෙ යො—"ඉවණ්ණාගමො වා"ති ඉ ඊ ආගමා වා—යස්ස විකෙත—කරියතෙ කරීයතෙ—පක්ඛෙ රලොපො—කය්‍යතෙ—වාක්‍යව—"කරස්ස කාසත්තමජ්ජතනිම්හි"—

---

ඉති—පෙ—යන සූත්‍රයෙන්; ඝෙ ආදෙසො, ඝෙ යනාදෙශය වේ—ඝෙප්පති, යනු වේ—"හලොපො ණ්හාම්හි" ඉති—පෙ—යන සූත්‍රයෙන්; ධාත්වන්තස්ස, ධාත්වන්තයට; හස්ස, හකාරයනට; ලොපො, ලොප් වේ—ගණ්හාති ගණ්හන්ති ඉති,පෙ—යන; ආදි, මේ ආදිරූප වේ.

ගහාදි, ගහාදිගණයයි.

කර කර යනධාතු; කරණෙ, කිරීමෙහි වැටේ—"තනාදිතො ඔ සිරා" යනු ඔ සිර ප්‍රත්‍යයවිධාන සූත්‍රයි. තනාදිතො යනු පදය ඔ සිරා යනු පදයි—තනු ඉති, තනු යන; එවමාදිහි ධාතූහි, මේ ආදි ධාතූන්කෙරෙන් පරව; කත්තරි, කර්තෘකාරකයෙහි; ඔ සිරා හොන්ති, ඔ සිර ප්‍රත්‍යයයෝ වෙත්—කරොති, යනු වේ—යදාදිනා, යදාදිසූත්‍රයෙන්; ධාතුරස්ස, ධාතුනුගේ රේඵයාට; ලොපො, ලොප් වේ—කයිරති, යනු වේ—"උත්තමොකාරො" ඉති—පෙ—යන සූත්‍රයෙන්; ඔස්ස, ඔකාරයහට; උත්තං, උකාරබව; වා, විකල්පයෙන් වේ—"කරස්සකාරො ච" ඉති—පෙ—යන සූත්‍රයෙන්; ධාත්වකාරස්ස, ධාතුනුගේ අකාරයහට; උත්තං, උකාරයෙක්; වා, විකල්පයෙන් වේ—රලොපො, රේඵයහට ලොප් වේ—උස්ස, උකාරයහට; වො, වකාරයෙක් ආදෙශ වේ—විකෙත, විකල්පකල්හි; බවයං, බකාරවයෙක් වේ—කුබ්බන්ති, යනු වේ, කරොන්ති වා, කරොන්ති යි කියාහෝ වේ—අත්තනොපදෙ, ආත්මනෙපදයෙහි—කුරුතෙ කුබ්බතෙ ඉති—පෙ—යන; ආදි, මේ ආදිරූපවේ.

කම්මෙ, කර්මයෙහි; යො, ය විකරණය වේ—"ඉවණ්ණාගමො වා" ඉති—පෙ—යන සූත්‍රයෙන්; ඉ ඊ ආගමා, ඉකාර ඊකාරාගමයෝ; වා, විකල්පයෙන් වෙත්—යස්ස, යකාරයහට; විකෙත, විකල්පකල්හි—කරියතෙ කරීයතෙ, යනු වේ—පක්ඛෙ, එක්

අජ්ජතනිම්හි පරෙ කරස්ස කාසාදෙසො වා හොති—යදාදිනා ඊස්ස රස්ස—අකාසි අකරි අකාසුං අකරුං ඉච්චාදි—1 ලොපො භවිස්සන්තිම්හි ස්සස්සෙව—"කරස්ස සප්පච්චයස්ස කාහෙ"ති කරස්ස කාහෙ ස්සස්ස ලොපො ච *—කාහති කරිස්සතීත්‍යාදි.

**තනාදිං**

චුර ථෙය්‍යෙ—කාරිතානීතෙව—"චුරාදිතො ණෙ ණයා"—චුරාදිත ණෙ ණයා විකරණා හොන්ති තෙසං කාරිතසඤ්ඤා ච—ණලොපො වුද්ධි—චොරෙතීත්‍යාදි.

**චුරාදි.**

හොන්තුමිච්ඡිතාපෙත—භූජ පාලනබ්‍යවහරණෙසු—බ ජ සා වාතෙව—

---

පක්ෂයෙක්හි; රලොපො, රකාරයහට ලොප් වේ—කය්‍යතෙ, යනු වේ—වා ඉති, වා යනු; එව, මතුසූත්‍රයෙහි වැවේ—"කරස්ස කාසත්තමජ්ජතනිම්හි" යනු කාස යනාදෙශවිධානසූත්‍රයි කරස්ස යනු පදය කාසත්තං යනු පදය අජ්ජතනිම්හි යනු පදයි—

අජ්ජතනිම්හි පරෙ, අජ්ජතනීවිභක්තිපරකල්හි; කරස්ස, කර යනධාතුහට; කාසාදෙසො, කාස යනාදෙශය: වා හොති, විකල්පයෙන් වේ—යදාදිනා, යදාදිසූත්‍රයෙන්; ඊස්ස, ඊකාරයහට; රස්ස, හ්‍රස්වකලකල්හි—අකාසි අකරි අකාසුං අකරුං ඉති—පෙ—අකරුං යනු; ආදි, මේ ආදිරූප වේ—1 ලොපො භවිස්සන්තිම්හි ස්සස්ස ඉති, ලොපො යනුද භවිස්සන්තිම්හියනුද ස්සස්සයනුද. එව, මතුසූත්‍රයෙහිවැවේ—"කරස්ස සප්පච්චයස්ස කාහෙ" ඉති—පෙ—යනසූත්‍රයෙන්; කරස්ස, කර යනධාතුහට; කාහෙ; කාහ යනාදෙශද; ස්සස්ස, ස්සයහට; ලොපො ච, ලොප්ද වේ— කාහති කරිස්සති ඉති—පෙ—යන; ආදි, මේ ආදිරූප වේ.

**තනාදි, තනාදිගණයයි.**

චර, චුර යනධාතු; ථෙය්‍යෙ, සොරාගැනීමෙහිවැවේ—කාරිතානි ඉති, කාරිතානි යනු; එව, මතුසූත්‍රයෙහි වැවේ—"චුරාදිතො ණෙ ණයා" යනු ණෙ ණය විකරණප්‍රත්‍යයවිධාන සූත්‍රයි—චුරාදිතො යනු පදය ණෙ ණයා යනු පදයි—චුරාදිහි, චුරාදිධාතූන්කෙරෙන් පරව; ණෙ ණයා විකරණා හොන්ති, ණෙ ණය

---

* ලොපො ච වා, මුද්‍රිතපොත්,

"භුජ ඝස හර සුපාදීහි තුමිච්ඡත්ථෙසු ච" — භුජාදීහි තුමන්තසහිතෙහිච්ඡත්ථෙසු * ඛ ඡ සා වා හොන්ති. "ඛච්ඡාදීනමිණ්ණාන" මාදිනා † සස්සරස්ස ආදිස්ස ද්විත්තං — "පුබ්බොබ්භාසො" ති ද්විත්ත පුබ්බස්ස අබ්භාසසඤ්ඤා — "දුතියචතුත්ථානං පඨමතතියා" ති අබ්භාසස්ස චතුත්ථස්ස භස්ස තතියො බො — "කො ඛෙ ච" ති ධාත්වන්තස්ස කො — බුභුක්ඛසද්දතො "ධාතුප්පච්චයෙහි විභත්තියො" ති වුත්තත්තා ත්‍යාදි. බුභුක්ඛති බුභුක්ඛන්තීත්‍යාදි.

එවං ඝස අදනෙ — ජෙ ඝච්ඡත්‍යාදි — "කවග්ගස්ස චවග්ගො" ති අබ්භාසස්ස ඝස්ස ඣො —

---

යනප්කාරණප්‍රත්‍යයෝ වෙත්; තෙසං, ඔවුන්ට; කාරිතසඤ්ඤා ච කාරිතසංඥද වේ — ණලොපො වුද්ධි, ණකාරයහට ලොප් ය වෘද්ධි වේ — චොරෙති ඉති — පෙ — යන; ආදි, මේ ආදිරූප වේ

## චුරාදි, චුරාදිගණයයි.

---

භොත්තුං, අනුභවකරන්නට, ඉච්ඡතීති, කැමතිය යන; අර්ථ, අර්ථයෙහි — භුජ, භුජ යනධාතු; පාලන, රක්ෂාකිරීමනා; අභ්‍යවහරණෙසු, අනුභවකිරීමෙහි වැටේ —

අභ්‍යවහරණෙසු, අනුභවකිරීමෙහි වැටේ — ඛ ඡ සා වා ඉති, ඛඡසා යනුද වා යනුද; එව, මතුසූත්‍රයෙහි වැටේ — "භුජඝසහරසුපාදීහි තුමිච්ඡත්ථෙසු ච" යනු ඛඡස ප්‍රත්‍යයවිධාන සූත්‍රයි — භුජඝසහරසුපාදීහි යනු පදය තුමිච්ඡත්ථෙසු යනු පදය ච යනු පදයි — භුජාදීනි, භුජාදිධාතූන්කෙරෙන්; තුමන්තසහිතෙසු, තුං ප්‍රත්‍යයාන්තයාහා යුක්තවූ; ඉච්ඡත්ථෙසු, ඉච්ඡාර්ථයෙහි; ඛඡසා, ඛය ඡය ස ය යනප්‍රත්‍යයෝ; වා හොන්ති, විකල්පයෙන් වෙත්.

"ඛච්ඡාදීනමිණ්ණාන" මාදිනා "ඛච්ඡාදීනමිණ්ණානමෙකස්සරානං වෙභාසවා" යන සූත්‍රයෙන්; ආදිවණ්ණස්ස. ආදිවර්ණයහට; ද්විත්තං, ද්විත්ව වේ — "පුබ්බොබ්භාසො" ඉති — පෙ — යන සූත්‍රයෙන්; ද්විත්ත, ද්විත්වකළකල්හි; පුබ්බස්ස, පූර්වයහට; අබ්භාසසඤ්ඤා, අභ්‍යාසසංඥ වේ — "දුතියචතුත්ථානං පඨමතතියා" ඉති — පෙ — යන සූත්‍රයෙන්. අබ්භාසස්ස, අභ්‍යාසසංඥකරණලද; චතුත්ථස්ස, සතරවෙනිවූ; භස්ස, භකාරයහට, තතියො, තුන්වෙනිවූ; බො, බකාරයෙක් වේ — "කො ඛෙ ච" ඉති — පෙ — යන සූත්‍රයෙන්; ධාත්වන්තස්ස,

---

* තුමන්තසහිතෙසු ඉච්ඡත්ථෙසු, මුද්‍රිතපොත්.

† මුද්‍රිතපොත්හි මේ සූත්‍රය සම්පූර්ණයෙන් තිබේ.

"දුතියාදීනං" ඛස්ස තතියො ජො—"අන්තස්සිවණ්ණාකාරො වා"ති අබ්භාසන්තස්ස ඉ—"බ්‍යඤ්ජනන්තස්ස චො ඡප්පච්චයෙසු ච"ති ධාත්වන්තස්ස චො—ජිඝච්ඡති. හර හරණෙ,—"හරස්ස ගි සෙ"ති ගිං—ගස්ස ජො—ජිගිංසති—තුමිච්ඡත්ථෙසූති කිං? භුඤ්ජනමිච්ඡති—අඤ්ඤවිභත්තිසු හෙත්වත්ථෙ ච ඤෙය්‍යං—තදුපරි.

පබ්බතමිව අත්තානමාචරති කරොතීත්‍යත්ථෙ—"ආය නාමතො කත්තුපමානාදාචාරෙ"— උපමීයතෙ අනෙනෙත්‍යුපමානං—කත්තුස්ස උපමානම්හා දුතියන්තා නාමම්හා ආචාරත්ථෙ ආයො හොති—තෙසං ගහණෙන විභත්තිලොපො—සරලොපාදි—පබ්බතායසද්දා පුබ්බෙව ත්‍යාදී.

---

ධාත්වන්තායහට; කො, කකාරයෙක් ආදෙශ වේ—බුභුක්ඛසද්දතො, බුභුක්ඛ ශබ්දයාකෙරෙන්; "ධාතුප්පච්චයෙහි විභත්තියො" ඉති, "ධාතුප්පච්චයෙහි විභත්තියො"යි කියා; වුත්තත්තා, කියනලදහෙයින්; ත්‍යාදි, ති ආදිවිභක්ති වේ—බුභුක්ඛති බුභුක්ඛන්ති ඉති—පෙ—යනු; ආදි, මේ ආදිරූප වේ; ඝස අදනෙ, ඝස අදනෙ යනු; එවං, මෙසේමැයි—ඡෙ, ඡ ප්‍රත්‍යයකළකල්හි; චිත්තාදි, චිත්තාදිය වේ—"කවග්ගස්ස චවග්ගො" ඉති—පෙ—යන සූත්‍රයෙන්; අබ්භාසස්ස, අබ්භාසසංඥවූ; ඝස්ස, ඝකාරයානට, ඛො, ඛකාරයෙක් ආදෙශ වේ—

දුතියාදීනං, "දුතියචතුත්ථානං පඨමතතියා" යන සූත්‍රයෙන්; ඛස්ස, ඛකාරයහට; තතියො, තුන්වනවූ; ජෙ, ජකාරයෙක් වේ. "අන්තස්සිවණ්ණාකාරො වා" ඉති—පෙ—යන සූත්‍රයෙන්; අබ්භාසන්තස්ස, අබ්භාසයාගේ අන්තයහට; ඉ, ඉකාරයෙක් ආදෙශ වේ—"බ්‍යඤ්ජනන්තස්ස චො ඡප්පච්චයෙසු ච" ඉති—පෙ—යන සූත්‍රයෙන්; ධාත්වන්තස්ස, ධාත්වන්තායහට, චො, චකාරයෙක් ආදෙශ වේ—ජිඝච්ඡති, යනු වේ. හර, හර යනධාතු; හරණෙ, පැහැරගැන්මෙහි වැටේ—"හරස්ස ගිං සෙ" ඉති—පෙ—යන සූත්‍රයෙන්; ගී, ගිං යනාදෙශ වේ—ගස්ස, ගකාරයහට; ජෙ, ජකාරයෙක් ආදෙශ වේ—ජිගිංසති, යනු වේ—තුමිච්ඡත්ථෙසු ඉති, තුමිච්ඡත්ථෙසු යනු; කිං, කුමටද; භුඤ්ජනමිච්ඡති, යන තන්හි නොවන්නීසයි—අඤ්ඤවිභත්තිසු, අන්‍යවිභක්තියෙහිද; හෙත්වත්ථෙ ච, හෙත්වර්ථයෙහිද; ඤෙය්‍යං, දතයුතුයි—උපරි, මත්තෙහිද; තථා, එසේමැයි.

පබ්බතමිව, පර්වතයක්මෙන්; අත්තානං, තමා; ආචරති, ආචරනී යසිස්සයි; කරොති ඉති, කොරෙයි යන, අනුව; අර්ථයෙහි—

න්නුපරි—පබ්බතායති යොගී. 1 පුත්තමිව ආචරතීත්‍යත්‍ර—"ඊයූපමානා ච"—උපමානම්හා දුතියන්තා නාමම්හා ආචාරත්‍ථෙ ඊයො හොති—පුත්තීයති සිස්සං ගරු. 2 අත්තනො පත්තමිච්ඡතීත්‍යත්‍ර—"නාමම්හාත්තිච්ඡත්‍ථෙ"—නාමම්හා දුතියන්තා අත්තනො ඉච්ඡත්‍ථෙ ඊයො හොති—පත්තීයති භික්ඛු. 3 කාරිතානීතෙව ච—"ධාතුරූපෙ නාමස්මා ණයො ච"—ධාතුරූපෙ ධාත්වත්‍ථෙ, සො ච විසුද්ධො හොතීත්‍යාදි—ධාතුරූපෙ සති ස්‍යාද්‍යන්තා නාමතො ණයො හොති කාරිතසඤ්ඤො ච—විසුද්ධා හොතීති විසුද්ධය,ති රත්ති—

---

'ආය නාමතො කත්තුපමානාදාචාරෙ" යනු ආය ප්‍රත්‍යයවිධාන සූත්‍රයි—ආය යනු පදය නාමතො යනු පදය කත්තුපමානා යනු පදය ආචාරෙ යනු පදයි—අනෙන, මේ කරණකොටගෙන; උපමීයතෙති, උපමාකරනු ලැබේනුයි, උපමානං, උපමාන නම් වේ—කත්තුස්ස, කර්තෘහට; උපමානම්හා, උපමානවාචීවූ; දුතියන්තා නාමම්හා, ද්විතීයාන්ත නාමයාකෙරෙන්; ආචාරත්‍ථෙ, ආචාරාර්ථයෙහි; ආයො හොති, ආය ප්‍රත්‍යය වේ—තෙසං ගහණෙන, තෙසං ග්‍රහණයෙන්; විභත්තිලොපො, විභක්තිහට ලොප් වේ—සරලොපාදී, ස්වරලොප ප්‍රකෘතිආදි කාර්‍ය්‍යය වේ—පබ්බතායසද්ද, පබ්බතාය ශබ්දයාකෙරෙන්; පුබ්බෙ'ව, පෙරමෙන්; ත්‍යාදි, ති ආදිවිභක්ති වේ.

උපරි, මත්ථෙහිද්‍ද, තථා, එසේමැයි—යොගී, ධ්‍යානලාභී තෙම; පබ්බතායති, පර්වතයක් මෙන් කෙරේ.

1 පුත්තමිව, පුත්‍රයාමෙන්, ආචරතීත්‍යත්‍ර, කෙරෙයි යන අර්ථයෙහි—"ඊයූපමානා ච" යනු ඊය ප්‍රත්‍යයවිධාන සූත්‍රයි ඊය යනු පදය උපමානා යනු පදය ච යනු පදයි—උපමානම්හා, උපමානවාචීවූ; දුතියන්තා නාමම්හා, ද්විතීයාන්ත නාමයාකෙරෙන්; ආචාරත්‍ථෙ, ආචාරාර්ථයෙහි; ඊයො හොති, ඊය ප්‍රත්‍යය වේ—ගරු, ගුරු තෙම; සිස්සං, ශිෂ්‍යයා; පුත්තීයති, පුත්‍රයෙකුමෙන් කෙරේ. 2 අත්තනො, තමහට; පත්තං, පාත්‍රයක්; ඉච්ඡතීති, කැමැත්තේය යන; අත්‍ථෙ, අර්ථයෙහි—"නාමම්හාත්තිච්ඡත්‍ථෙ" යනු ඊය ප්‍රත්‍යයවිධාන සූත්‍රයි නාමම්හා යනු පදය අත්තිච්ඡත්‍ථෙ යනු පදයි—දුතියන්තා නාමම්හා, ද්විතීයාන්ත නාමයාකෙරෙන්; අත්තනො, තමහට; ඉච්ඡත්‍ථෙ, කැමතිය යන අර්ථයෙහි; ඊයො හොති, ඊයප්‍රත්‍යය වෙ—භික්ඛු, මහණතෙම; පත්තීයති, පාත්‍රයක් කැමති වේ.

3 කාරිතානි ඉති, කාරිතානි යනු; එව, මතුසූත්‍රයෙහි වැටේ—"ධාතුරූපෙ නාමස්මා ණයො ච" යනු ණය ප්‍රත්‍යයවිධාන

දළ්හං කරොතීති දළ්හයති විනයං මුනි—හත්ථිනා අතික්කමතීති අතිහත්ථයතිච්චාදි. අතිපුබ්බො.

යං තිකාලං තිපුරිසං ක්‍රියාවාචී තිකාරකං,
අත්ලිඞ්ගං ද්විවචනං තදක්ඛාතන්ති වුච්චති.

ආඛ්‍යාතං.

..........................

“ණාදයො තෙකාලිකා”—ණාදිවූ තිය්‍යපුඅන්තප්පච්චයා කාලත්තයෙ දට්ඨබ්බා. 2 “අඤ්ඤෙසු කිත්”—කිත්වචනඤ්ඤෙසු ණාදයො ශුප්පඥත යා ච කිත්සඤ්ඤා හොන්ති 3 “කාරිතකිත්”—

---

ත්‍රිසිධාතුරූපෙ යනු පදය නාමස්මා යනු පදය ණාදයො යනු පද ය ච යනු පදයි—ධාතුරූපො, ධාතුරූප නම්; ධාත්වත්ථො, ධාත්වර්ථය; සො ච, එහිද; විසුද්ධො හොතීති, විසුද්ධොහොතියනා; ආදි, මේ ආදියෙව්—ධාතුරූපෙසති, ධාතුරූපයක් ඇතිකල්හි; ස්‍යාද්‍යන්තා; සි ආදිවිභක්තීන් අන්තකොටඇති; නාමතො, ශබ්දයන් කෙරෙන්; ණාදයො හොති, ණය ප්‍රත්‍යය වේ; කාරිතසඤ්ඤා ච, කාරිතසංඥද වේ—විසුද්ධො හොතීති, විසුද්ධවෙයි යන අර්ථයෙහි; විසුද්ධයති යනු වේ—

(ඔහු කවරක්ද?) රත්ති, රාත්‍රියයි—දළ්හං කරොතීති, දැඩි කෙරෙයි යන අර්ථයෙහි; දළ්හයති, දළ්හයති යනු වේ—(ඒ කවරේද?)මුනි, භික්ෂු තෙම; විනයං, විනය; දළ්හයති, දැඩ්කෙරේ—හත්ථිනා අතික්කමතීති, හස්තිනා අතික්කමති යන වාක්‍යයෙහි; අතිහත්ථයති ඉති, අතිහත්ථයති යන; ආදී, මේ ආදිරූප වේ; අතිපුබ්බො, අතිපූර්වයි.

යං, යම් පදයෙක් තෙම; තිකාලං, (භූතභවිෂ්‍යත්වර්තමාන සඞ්ඛ්‍යාත) කාලත්‍රයක් ඇත්තේද; තිපුරිසං, (ප්‍රථම මධ්‍යමොත්තම සඞ්ඛ්‍යාත) පුරුෂත්‍රයක් ඇත්තේද; ක්‍රියාවාචි, (ගමන පචනාදිවූ) ක්‍රියාවාචකද; තිකාරකං, (කර්තෘ කර්ම භාව සඞ්ඛ්‍යාතවූ) කාරකත්‍රයක් ඇත්තේද; අත්ලිඞ්ගං, (ස්ත්‍රී පුනපුංසක සඞ්ඛ්‍යාතවූ) ලිඞ්ගත්‍රයක්නැත්තේද; ද්විවචනං, (එකවචන බහුවචන සඞ්ඛ්‍යාතවූ) වචනවයක්ඇත්තේද; තං, ඒ; ආඛ්‍යාතන්ති, ආඛ්‍යාතයයි; වුච්චති, කියනු ලැබෙයි.

ආඛ්‍යාතං, ආඛ්‍යාතය කියා නිමවනලදී.

---

කිත්සඤ්ඤා, කත්තරි දට්ඨබ්බා—යථාතනාති ක්වචි කම්මාදීසුපි.
පුඤ්ඤං අකාසි කරොති කරිස්සති වාත්‍යත්ථෙ—"ධාතුයා කම්මාදි 1 ම්හි ණො"—කම්මෙ ආදෙ, සති ධාතුතො ණො හොති—"කාරිතං විය ණානුබන්ධො"ති කාරිතෙව කතෙ ණලොපො වුද්ධි—තෙසං ගහණෙන විභත්තිලොපො.

1 කිතකා'භිධෙය්‍යලිඞ්ගා ඉයුවණ්ණා වරා'ජෙ,
අප්පච්චයා ණො දුජ්ජො ඉපපච්චයො පුමෙ සියුං.

2 යුවා'කත්තරි භාවස්මිං ක්ත්වා තොච නපුංසකෙ,
තවාදිකබත්තුමන්තා තු අලිඞ්ගා වා'ජතනතෙසා.

නාමම්ව කතෙ ස්‍යාදි—පුඤ්ඤකාරො, දුමො.—ඊම්හි—පුඤ්ඤකාරී, ඉත්ථී—පුඤ්ඤකාරං, කුලං.

---

"ණ්‍යාදයො තෙකාලිකා" යනු පරිභාෂා සූත්‍රයි—* ණ්‍යාදයො යනු පදය තෙකාලිකා යනුපදයි—ණ්‍යාදී, ණ ප්‍රත්‍යයාදිකොටඇති; ද්විතියයුඅනපපච්චයා, දෙවෙනි යු ප්‍රත්‍යයා අනකොටඇති, ප්‍රත්‍යයෝ; කාලත්තයෙ, තුන් කල්හි; දට්ඨබ්බා, දක්කයුත්තාහුයි. 2 "අඤ්ඤෙ කිත්" යනු කිත්සංඥාවිධාන සූත්‍රයි—අඤ්ඤෙ යනු පදය කිත් යනු පදයි—කිච්චෙච්චහි, කිච්චප්‍රත්‍යයන්කෙරෙන්; අඤ්ඤෙ, අන්‍යවූ; ණ්‍යාදයො, ණ ප්‍රත්‍යයාදිහුද; යුප්පභූතයො ච, යු ප්‍රත්‍යයආදිකොටඇත්තාහුද; කිත්සඤ්ඤා, හොන්ති, කිත්සංඥ ඇත්තාහු වෙත්. 3 "කත්තරි කිත්" යනු කිත්ප්‍රත්‍යය නියම සූත්‍රයි—† කත්තරි යනු පදය කිත් යනු පදයි—

කිත්සඤ්ඤා, කිත්සංඥ ඇත්තාහු; කත්තරි, කර්තෘකාරකයෙහි; දට්ඨබ්බා, දක්කයුත්තාහුය - යථාතනාති, පාලිවූ පරිද්දෙන්; ක්වචි, කිසිතැනෙක්හි; කම්මාදීසුපි, කර්මකාරකාදියෙහිද දක්කයුත්තාහුයි

1 පුඤ්ඤං අකාසි කරොති කරිස්සති වා ඉති—පෙ—වා යන; අත්ථෙ, අර්ථයෙහි—"ධාතුයා කම්මාදිම්හි ණො" යනු ණ ප්‍රත්‍යයවිධාන සූත්‍රයි—ධාතුයා යනු පදය කම්මාදිම්හි යනු පදය ණො යනු පදයි—කම්මෙ, කර්මවාචිශබ්දයක්; ආදෙ, සති, පළමුව සිටිකල්හි; ධාතුතො, ධාතුහු කෙරෙන්; ණො හොති, ණ ප්‍රත්‍යය වේ—"කාරිතං විය ණානුබන්ධො"ඉති—පෙ—යන සූත්‍රයෙන්; කාරිතෙව කතෙ; කාරිතප්‍රත්‍යයාමෙන් කළකල්හි; ණලොපො වුද්ධි, ණ කාර

---

* ණ්‍යාදිප්‍රත්‍යයවිධාන සූත්‍රයි, සන්න. † කිත්සංඥාවිධාන සූත්‍රයි, සන්න.

1 ධාතුයාත්‍යධිකාරො—කම්මාදිම්හි අ ඉච්චෙව "සබ්බතො ණ්වු ත්වාවී වා"—ත්‍යෙම ආදෙ අනාදෙ වා සබ්බධාතුහි අකාරො ණ්වු තු ආවී ච වා හොන්ති—ඊහිතං—තං කරොතීති තක්කාරො.
2 සඤ්ඤායං විභත්‍යලොපො—දීපඞ්කරො වධාදි. 3 නී පාපුණනෙ—විප්පබ්බා—උපසග්ගා ධාතුතො පුබ්බභාගා එව දට්ඨබ්බා.
4 අසංයොගන්තස්ස වුද්ධි ත්‍යෙව—"අඤ්ඤෙසු ච"ති අසංයොගන්තස්ස ධාතුස්සිවණ්ණුවණ්ණානං වුද්ධි—"එ අයා" ති සරෙ එස්ස අයො—නිනෙතී සික්ඛයතීති විනයො—ධාතුනං නෙකත්ථත්තා එව නීත්‍යස්මිං ධාතුම්හි සන්තමෙව සික්ඛත්තං විසදෙන ජොතෙති. තථාහි.

---

යහට ලොප්හා වෘද්ධි වේ—ඉතසං ගහණෙන, නෙසං ශබ්දග්‍රහණයෙන්; විභත්‍යලොපො, විභක්තිහට ලොප් වේ.

2 කිතකා, කිතකප්‍රත්‍යයෝ තුමූ; අභිධෙය්‍ය, අභිධෙයටබඳුවූ; ලිඞ්ගා, ලිඞ්ග ඇත්තාහ; ඉයුවණ්ණා වරාදිතෝ, ඉවර්ණ උවර්ණාන්ත ධාතුන්කෙරෙහිද වරාදිධාතූන්කෙරෙන්දවූ; අප්පච්චයො, අකාරප්‍රත්‍යයද; දුතියො ණො, දෙවන ණ ප්‍රත්‍යයද; ඉප්පච්චයො, ඉ ප්‍රත්‍යයද යන මොහු; පුමෙ සියුං, පුල්ලිඞ්ගයෙහි වන්නාහ. 3 අකත්තරි, කතෘකාරකයෙන් පිටත්තන්හිවූ; යු ච, යු ප්‍රත්‍යයද; භාවස්මිං, භාවයෙහිවූ; කිච්චා, කිච්චප්‍රත්‍යයෝද; තො ච, ත ප්‍රත්‍යයද; නපුංසකෙ, නපුංසකලිඞ්ගයෙහි වන්නාහ; තවාදී, තවෙ ප්‍රත්‍යයආදිකොටඇති; ක්ඛත්තුමන්තා තු, ක්ඛත්තුං ප්‍රත්‍යයකෙළවරකොටඇති ප්‍රත්‍යයෝවනාහි; අලිඞ්ගා, ලිඞ්ග නැත්තාහ; අවිභත්තයො ච, විභක්තිද නැත්තාහුයි.

නාමම්ව කත්ත, නම්වත් කළකල්හි; ස්‍යාදී, සි ආදිවිභක්තිවේ—පුරන්දකාරො, යනු වේ—(ඒ කවරේද?) පුමා, පුරුෂයි.—ඊම්හි, ඊ ප්‍රත්‍යයකළකල්හි—පුරන්දකාරී, යනු වේ—(ඔහු කවරෙක්ද?) ඉත්ථී ස්ත්‍රීයි.—

පුරන්දකාරං, යනු වේ—(ඒ කවරේද?) කුලං, කුලයයි. 1 ධාතුයා ඉති, ධාතුයා යනු; අධිකාරො, සම්බන්ධකරනු ලැබේ—කම්මාදිම්හි ඉති, කර්මාමහි යනුද; අ ඉති, අ දියනුද; එව, මේ සූත්‍රයෙහි වැටේ—"සබ්බතො, ණ්වු ත්වාවී වා" යන ණ්වු ආදිප්‍රත්‍යයවිධාන සූත්‍රයි සබ්බතො යනු පදය ණ්වු ත්වාවී යනු පදය වා යනු පදයි—කමෙම. කර්මවාචීශබ්දයක්; ආදෙ වා, පූර්ව සිටිකල්හි වේවයි; අනාදෙ වා ආදිව නොසිටිකල්හි වේවයි; සබ්බධාතුහි, සියලු ධාතුන්කෙරෙන්; අකාරො, අ ප්‍රත්‍යයද; ණ්වු තු ආවී ච, ණ්වු තු ආවීප්‍රත්‍යයෝද;

1 සන්තමේව හි නීලාදිවණ්ණං දීපාදයො විය,
ධාතුස්මිං සන්තමෙවත්ථං උපසග්ගා පකාසකා.

කථං ගුණ්ඨතු—"ඔ අවසරෙ"ති ඔස්ස අවො—සන්ධො—වර වරණෙ—සංවරො.

3 වර සරා දර චරා 'හමු යමු සන ගනා,
නද මද රණ ගහා ජපාදයො වරාදයො.

4 ණම්හිතෙව—"ආකාරන්තනාමායො"—ණානුබන්ධපරෙ ආකාරන්තධාතුනාමන්තස්ස ආයො හොති—අඪිතිධම්මා අනුබන්ධා—"අන්තස්ස යු ණවුනං"ති යු ණවූනං අනකා—දා දානෙ—අන්තාදෙසතො—"ගෙත ආඛ්‍යාතො කාරිතෙ" ති ඔ එතං ආව ආයා—නායකො—සාවකො—"කරස්ස ච තත්තං තුස්මිං" ති තුම්හි ධාත්වන්තස්ස තො—කත්තා—සත්ථාචි—දීසපෙක්ඛණෙ—යදාදිනාඉස්ස අත්තං—සයදස්සාවි—දණ්ඩිව—.

---

වා ගහානති, විකල්පයෙන් වෙත්—විහතං, විභාවය වේ—තං කරොතීති, යන වාක්‍යයෙහි; තක්කරො, යනු වේ.

2 සඤ්ඤායං, සංඥාවිෂයෙහි; විභත්තිලොපො, විභක්තිහට ලොප් නොවේ—දීපඞ්කරො ඉති—පෙ—යන; ආදී, මෙ ආදිරූප වේ. 3 නී, නී යනධාතු; පාපුණනෙ, පැමිණීමෙහි වැටේ—විපුබ්බා, වි පූර්විකී—උපසග්ගා, උපසර්ගයෝ; ධාතුතො, ධාතූන්ගෙ තෙරෙන්; පුබ්බභාගා එව, පූර්වභාගස්ථවූවාහුම; දස්සිතා, දක්නයුත්තාහුයි. 4 අසංයොගන්තස්ස ඉති, අසංයොගන්තස්ස යනුද; වුද්ධි ඉති, වුද්ධි යනුද; එව, මතුසූත්‍රයෙහි වැටේ—"අසංඛ්‍යෙසු ච"ඉති, "අසංඛ්‍යෙසු ච" යන සූත්‍රයෙන්; අසංයොගන්තස්ස ධාතුස්ස, සංයොගාන්ත නොවූ ධාතුහුගෙ; ඉවණ්ණුවණ්ණානං, ඉවර්ණ උවර්ණයන්ට; වුද්ධි, වෘද්ධි වේ—"එ අය"ඉති, "එ අය" යන සූත්‍රයෙන්; එස්ස, එකාරයහට; අයො, අය යනාදෙශ වේ—විනෙති සික්ඛායති, යන වාක්‍යයෙහි; විනයො. යනු වේ—ධාතූනං, ධාතූන් තමන්; අනෙකත්ථතා එව, අනෙකාර්ථහෙයින්ම; නි ඉති. නි යන; අස්මිං ධාතුම්හි, මේ ධාතුයෙහි; සන්තමෙව, විද්‍යමානමවූ; සික්ඛත්ථං, සික්ෂාර්ථය; විසද්ධො, වි ශබ්දය තෙම; ජොතෙති, ප්‍රකාශ කෙරේ. තථාහි, එසේමැයි.

1 සන්තමෙව හි, පෙරම ඇතිවූ; නීලාදි, නීලපීතාදිවූ; වණ්ණං, පැහැය; දීපාදයො විය; ප්‍රදීපාදීන්මෙන්, ධාතුස්මිං, ධාතුයෙහි; සන්තමෙව, ඇතිමවූ; අත්ථං, අර්ථය; උපසග්ගා, උපසර්ගයෝ; පකාසකා, ප්‍රකාශ කෙරෙත්.

1 රුජ භඞ්ගෙ—"විස රුජ පදාදීහි ණ" ඉති ණො—"ක ග ච ජානං" ති ණානුබන්ධෙ පරෙ ධාත්වන්තානං ච ජානං ක ගා—රොගො. 2 "භාවෙ ච" ති භාවෙ ණො—පචනං පාකො—ඉහ ච කම්මාවචනිච්ඡායං භාවෙපි ණප්පච්චයො—කිතකාභිහිතො භාවො දබ්බමිවොති කත්වා බහුවචනඤ්ච හොති—පාකා. 3 ගමු සප්ප ගතිම්හි—"ක්වි ච" ති ක්වි—"ධාත්වන්තස්ස ලොපො ක්විම්හි" ති ක්විම්හි ධාත්වන්තස්ස ලොපො වා—"ක්වි ලොපො ච" ති ක්විස්ස ලොපො—සබ්බගො—අභිගු.

---

අක්ෂිතු, සෙසුතැන්හිදු; තථාඑසේමැයි—"ඔ අව සරෙ" ඉති, "ඔ අව සරෙ" යන සූත්‍රයෙන්; ඔස්ස, ඔකාරයහට; අවො, අව යනාදෙශ වේ—භවො, යනු වේ—වර. වර යනධාතු, වරණෙ, වැළැක්මෙහි වැටේ—සංවරො, යනු වේ.

3 වර සරා, වර වරණෙය සර ගතියංය යන දෙදෙනද; දර චරා, දර අනාදරෙය චර ගතිභක්ඛණෙසුය යන දෙදෙනද; ගමු. යමු, ගමු සප්ප ගතිම්හිය යමු උපරමෙය යන දෙදෙනද; සනු හනා, සන සද්දෙය හන හිංසාගතීසුය යන දෙදෙනද; නද මද, නද අව්‍යත්තසද්දෙය මද උම්මාදෙය යන දෙදෙනද; රණ ගහා, රණ සද්දෙය ගහ උපාදානෙය යන දෙදෙනද; ජප, ජප ව්‍යත්තවචනෙ යන ධාතුවද යන; ආදයො, මේ ආදිධාතූහු; වරාදයො, වරාදි ධාතූහු නම් වෙත්.

4 ණම්හි ඉති, ණම්හි යනු; එව, මිතුසූත්‍රයෙහි වැටේ—"ආකාරන්තානමායො" යනු ආය යනාදෙශවිධාන සූත්‍රයි—ආකාරන්තානං යනු පදය ආයො යනු පදයි—ණානුබන්ධෙ පරෙ, ණානුබන්ධ ප්‍රත්‍යයා පරකල්හි; ආකාරන්තධාතූනං, ආකාරාන්තධාතූන්ගේ; අන්තස්ස, අන්තයහට; ආයො හොති, ආය යනාදෙශ වේ—අඝිබ මො, නොඩිවිනා සුළුවූවානු; අනුබන්ධා, අනුබන්ධ නම් වෙත්—"අනකා යු ණ්වූනං" ඉති—පෙ—යන සූත්‍රයෙන්; යු ණ්වූනං, යු ප්‍රත්‍යය ණ්වුප්‍රත්‍යය යන මොවුන්ට; අනකා, අන අක යනාදෙශයෝ වෙත්—දා, දා යනධාතු; දානෙ, දීමෙහි වැටේ—අන්නදායකො, යනු වේ—"එත ආවායා කාරිතෙ" ඉති, "එත ආවායා කාරිතෙ" යන සූත්‍රයෙන්; ඔ එතා, ඔකාර එකාරයන්ට; ආව ආයා, ආව ආය යනාදෙශයෝ වෙත්—නායකො, සාවකො, යනු වේ—"කරස්ස ච තත්තං තුස්මිං" ඉති—පෙ—යන සූත්‍රයෙන්; තුම්හි, තු ප්‍රත්‍යයා පරකල්හි; ධාත්වන්තස්ස, ධාතුහුගේ අන්තයහට; තො, තකාරයෙක් ආදෙශ වේ—

චර ගතිම්හි—"තක්කසිලාදීසු ණිත්‍යාමි ච"—ධාතූහි තක්කසිලාද්‍යෙසු ණ්‍යාදයො හොන්ති—බ්‍රහ්මං සීලන්ති චරති තං ධම්මා තස්මිං සාධු වා බ්‍රහ්මචාරීත්‍යාදි—සීලං සභාවො—ධම්මො ආචාරො—සාධු කුසලො. 1 ඝුස සද්දෙ—"සද්ද කුධ චල මණ්ඩත්ථ රුචාදීහි යු" ති යු—ඝොසති සීලනාති ඝොසනො—එව. වඩ්ස වඩ්සනෙ—වඩ්සනො 2 "පාරාදිගම්මිනා රූ"—පාරාදීහි පරස්මා ගමිධාතුතො තක්කසිලාදීසු රූ හොති—"රම්හි රන්තො රාදි නො"—රානුබන්ධෙ පරෙ සබ්බො ධාත්වන්තො තෙන රෙන සහ නො හොති ලුප්‍යති ත්‍යත්ථො—පාරගූ.

---

කාතනා, යනු වේ—සත්‍යාව, සඤ්ඤශබ්දයාමෙනි—දිස, දිස යනධාතු පෙක්ඛණෙ, බැලිමෙහි වැවේ—යදාදීනා, යදාදි සූත්‍රයෙන්; ඉස්ස, ඉකාරයහට; අත්තං, අකාරබව වේ—භයදස්සාවි, යනු වේ—දඩි ඉව, දඩි ශබ්දයා මෙනි.

1 රුජ, රුජ යනධාතු; භඞ්ග, බිඳීමෙහි වැවේ—"විස රුජ පදාදිතො "ඉති—පෙ—යන සූත්‍රයෙන්, ණො, ණ ප්‍රත්‍යය වේ—"කා ගා ච ජානං"ඉති,"කා ගා ච ජානං" යන සූත්‍රයෙන්; ණානුබන්ධෙ පරෙ, ණානුබන්ධප්‍රත්‍යයා පරකල්හි; ධාත්වන්තානං ධාත්වන්තාවූ; ච ජානං, චකාර ජකාර යන මොවුන්ට; කා ගා, කකාර ගකාර යන මොහු ආදෙශ වෙත්—රොගො, යනු වේ.

2 "භාවෙව"ඉති,"භාවෙව ච"යනසූත්‍රයෙන්; භාවෙ, භාවයෙහි; ණො, ණ ප්‍රත්‍යය වේ—පචනං, යනවාක්‍යයෙහි; පාකො, යනු වේ—ඉත ච, මෙහිදු; කම්මාවචනිච්ඡායං, කම්ම නොකියවිකල්හි; භාවෙපි, භාවයෙහිද; ණ පච්චයො, ණ ප්‍රත්‍යය වේ—කිතකාභිහිතො භාවො, කිතකප්‍රත්‍යයන් විසින් කියනලද භාවය තෙම, දබ්බමිවෙති, ද්‍රව්‍යය මෙනැයි යන; සඤ්ඤා, න්‍යායහෙයින්; බහුවචනවු හොයි, බහුවචනද වේ—පාකා, යනු වේ. 3 ගමු, ගමු යන ධාතුද; සප්ප, සප්ප යනධාතුද; ගතිම්හි, යාමෙහි වැවේ—" ක්වි ච" ඉති, "ක්වි ච" යන සූත්‍රයෙන්; ක්වි, ක්වි ප්‍රත්‍යය වේ—"ධාත්වන්තස්ස ලොපො ක්විම්හි" ඉති—පෙ—යනසූත්‍රයෙන්; ක්විම්හි, ක්විප්‍රත්‍යයා පරකල්හි; ධාත්වන්තස්ස, ධාත්වන්තයහට; ලොපො, ලොපය තෙම; වා, විකල්පයෙන් වේ—"ක්වි ලොපො ච" ඉති, "ක්විලොපො ච" යන සූත්‍රයෙන්; ක්විස්ස, ක්වප්‍රත්‍යයහට; ලොපො, ලොපවේ—සඞ්ගතො, යනු වේ—අඞ්ගු, යන වේ.

චර, චර යන ධාතු, ගතිම්හි, යාමෙහි වැවේ—"තක්කසිලාදීසු ණිත්‍යාමි ච"—යනු ණ්‍යාදිප්‍රත්‍යයවිධායක සූත්‍රයි—

සික්ඛ යාචනෙ—"සික්ඛාදීහි තා චෙ"ති රූ—යදාදීනං කචි රස්සො—සික්ඛු—එවං ඤා අවබොධනෙ—විඤ්ඤූතාදී.

"භාවකම්මෙසු තබ්බානීයා"ති තබ්බා අනීයො ච—"ඉකාරාගමො අසබ්බධාතුකම්හි"ති ඉ ආගමො—තබ්බාදෙ චකාරෙන කිච්චානං නාමං ච—භවිතබ්බං භවනීයං. 2 අන්තස්ස කරස්ස ච ත පච්චයෙ—"තුංතූනතබ්බෙසු වා"—තුමාදීසු කරන්තස්ස ලොපො වා හොති—කරියතීති කාතබ්බො කරණීයො—එත්ථ "රහාදිතො ණො"ති නස්ස ණො—"සාස දිසතො තස්ස රිට්ඨො ච"ති ච කාරෙන තස්ස රට්ඨො—දට්ඨබ්බං, 3 "ණ්‍යො ච"ති භාවකම්මෙසු ණ්‍යො වයන්දන ත්‍යප්පච්චයො*ච—

තස්සීලාදීසු යනු පදය ණීත්වාවී යනු පදය ච යනු පදයි—ධාතූහි, ධාතූන්කෙරෙන්; තස්සීලාදීසු, තස්සීලාදිවිෂයෙහි; ණ්‍යාදයො හොන්ති, ණ්‍යාදීහු වෙත්—බ්‍රහ්මං සීලෙන චරති තං ධම්මං තස්මිං සාධු වා, යන වාක්‍යයෙහි; බ්‍රහ්මචාරී, යනු වේ; ඉති ආදි, යන මේ ආදිරූප වේ—සීලං, සිල නම්; සභාවො, සවභාවිය—ධම්මො, ධර්ම නම්; ආචාරො, ආචාරය—සාධු සාධුනම්; කුසලො, නිපුණවූයේයි.

1 භූස, භූස යන ධාතු; සද්දෙ, ශබ්දකිරීමෙහි වැටේ—"සද්ද කුධ චල මණ්ඩත්‍යරුචාදීහි යු" ඉති—පෙ—යන සූත්‍රයෙන්, යු, යු ප්‍රත්‍යය වේ—ඝොසති සීලෙනාති, යන වාක්‍යයෙහි; ඝොසනො, යනු වේ—එවං, මෙසේ; වඩ්ඪ, වඩ්ඪ යන ධාතු; වඩ්ඪනෙ, වැඩීමෙහි වැටේ—වඩ්ඪනො, යනු වේ. 2 "පාරාදිගමිම්හා රූ" යනු රූ ප්‍රත්‍යය විධාන සූත්‍රයි—පාරාදිගමිම්හා යනු පදය රූ යනු පදයි—පාරාදීසි, පාරාදින්කෙරෙන්, පරස්මා, පරවූ; ගමිධාතුතො, ගමු ධාතුන් කෙරෙන්; තස්සීලාදීසු, තච්ඡීලාදීයෙහි; රූ හොති, රූ ප්‍රත්‍යය වේ—"රම්හි රන්තො රාදි නො" යනු රකාරාදිලොපවිධාන සූත්‍රයි—රම්හි යනු පදය රන්තො යනු පදය රාදි යනු පදය නො යනු පදයි—රානුබන්ධෙ පරෙ, රානුබන්ධප්‍රත්‍යයා පරකල්හි; සබ්බො ධාත්වන්තො, සියලු ධාත්වන්තය තෙම; තෙන රෙන සහ, ඒරෙඵ සහායවූ; නො හොති, නොවෙයි; ලුප්‍යතීත්‍යර්ථයි, ලොප්කර තු ලැබෙයි යනාර්ථයි—පාරගූ, යනු වේ.

සික්ඛ, සික්ඛ යන ධාතු, යාචනෙ, ඉල්ලීමෙහි වැටේ—"සික්ඛාදීතො ච" ඉති—පෙ—යන සූත්‍රයෙන්; රූ, රූ ප්‍රත්‍යය වේ—යදාදීනං, යදාදිසූත්‍රයෙන්; කචි, කිසිතැනෙක්හි; රස්සො, හ්‍රස්ව වේ—සික්ඛු, යනු වේ—එවං, මෙසේ; ඤා, ඤා යන ධාතු; අවබොධනෙ අවබොධකිරීමෙහි වැටේ—

* ණෙය්‍යපච්චයො. සමහර මුද්‍රිතපොත්.

ඉ ආගමො—කාරණීයං කාතබ්බං වා කාරියං—ඤාතබ්බං. 1 "වද මද ගම යුජ ගරහාකාරාදීහි ජ්ජ ම්ම ග්ග ය්‍යෙය්‍යා ගාරො වා"—වදාදීහි ආකාරන්තෙහි ච පරස්ස ණ්‍යස්ස ජ්ජාදෙසො ධාත්වන්තෙන සහ හොති ගරහස්ස * ගාරො වා—වද වචනෙ—වජ්ජං—ගරහ නින්දායං—ගාරය්හං—පා පානෙ—පෙය්‍යං. 2 "කරම්හා රිච්චො"ති රිච්චො—රාදිලොපො—කිච්චං.
නාඤ්ඤදීහි ය"ති භාවකම්මෙසු ය—ගහණීයං, ඤාණං—චීයු තස්ස 'ණො. 4 "කත්තුකරණප්පදෙසෙසු ච"ති යු—චකාරෙන සම්පදානාපාදානෙසුපි—

---

1 "වදමදගමයුජගරහාකාරාදීහි ජ්ජම්මග්ගෙය්‍යා ගාරො වා"යනු ජ්ජාදිආදෙශවිධාන සූත්‍රයි—වදමදගමයුජගරහාකාරාදීහි යනු පදය ජ්ජම්මග්ගෙය්‍යා යනු පදය ගාරො යනු පදය වා යනු පදයි—
වදාදීහි, වදාදීන්කෙරෙන්ද; ආකාරන්තෙහි ච, ආකාරාන්තධාතූන් ඡඤ්ඤා ඉති, ඡඤ්ඤා යන; ආදී, මේ ආදිය වේ.

---

"භාවකම්මෙසු තබ්බානීයා"ඉති—පෙ-යනසූත්‍රයෙන්; තබ්බො, තබ්බ ප්‍රත්‍යයද; අනීයො ච, අනීය ප්‍රත්‍යයදවී—"ඉකාරාගමො අසබ්බධාතුකම්හි"ඉති—පෙ—යන සූත්‍රයෙන්; ඉආගමො, ඉකාරයෙක් ආගමවේ—තවීතාදෙදෙ, තවීතාදිසූත්‍රයෙහි; චකාරෙන, ච ග්‍රහණයෙන්; කිච්චන්තා, කිච්චප්‍රත්‍යයාන්තයෝ තුම්: නාමිංව, නාමිකවිනි-භත්තිනං, යන වාක්‍යයෙහි; භවිතබ්බං, භවිනීයං, යනුවේ. 2 අනාස්ස (ඉති), අනාස්ස යනුද; කරස්ස (ඉති), කරස්සයනුද; ච(ඉති), ච යනුද එව, මතුසූත්‍රයෙහිවැටේ-"තුංතුනතබ්බෙසු වා"යනු තකාරාදෙශවිධානසූත්‍රයි—තුංතුනතබ්බෙසු යනු පදය වා යනුපදයි—තුම්-ආදිය, තුම් ආදිප්‍රත්‍යයන් පරකල්හි; කරන්තස්ස, කරයන ධාතුවන් අන්තයටව; තො, තකාරයෙක්; වා හොති, විකල්පයෙන් වේ—කාරියතීති, යන වාක්‍යයෙහි; කත්තබ්බා, කරණීයො, යනු වේ—එතා, තමී; "රහාදිතො ණො ණ"ඉති—පෙ—යන සූත්‍රයෙන්; තස්ස. තකාරයහට, ණො, ණකාරයක් ආදෙශ වේ—"ගාස දිස තො තස්ස රවො ච"ඉති—පෙ—යන; ඉහ, මේ සූත්‍රයෙහි; චකාරෙන, ච ශබ්දග්‍රහණයෙන්; තස්ස, තකාරයහට; රවො, රව යනාදෙශ වේ—දණ්ඩං, යනු වේ. 3 "ණ්‍යො ච"ඉයි, "ණ්‍යො ච" යන සූත්‍රයෙන්; භාවකම්මෙසු, භාව කර්ම දෙක්හි; ණ්‍යො, ණ්‍ය ප්‍රත්‍යය වේ; චසද්දෙන, චශබ්දග්‍රහණයෙන්; තය්‍යප්පච්චයො ච, තය්‍ය ප්‍රත්‍යයද වේ—ඉ ආගමො, ඉකාරයෙක් ආගම වේ—කාරණීයං කාතබ්බං වා, යන වාක්‍යයෙහි; කාරියං, යනු වේ—ඤාතබ්බං යනු වේ—

---

* ගරහස්ස ච යි මුද්‍රිතපොත්.

පදෙසොකාසාධාරො—රජං හරතීති රජොහරණං—තොයං—"එතොසමොලොපො"ති ඔ—යෙන පහරන්ති තං පහරණං—ආස උපවෙසනෙ—යස්මිං ආසන්ති තං ආසනං—යස්ස සම්මා පදීයතෙ තං සම්පදානං—යස්මා අපෙදති අපෙති තං අපාදානං. 1 "සඤ්ඤායං ද ධාතො ඉ"ඉති ඉ—ද දානෙ—ආපුබ්බො—ආදියතීති ආදි—ධා ධාරණෙ—උදකං දධාතීති උදධි—යදාදිනා කලොපො. 2 "ඉච්ඡියමතියචෙ වා"ති ඉච්ඡියා අකාරො ති යු ච වා—ජර වයොහානිම්හි—ජීරතීති ජරා—පුන ආ—මන ඤාණෙ—"ගම ඛන හන රමාදීනමන්තො"ති තෙ තිම්හි ච ධාත්වන්තස්ස ලොපො—මති—චිති චින්තායං—චෙතයතීති චෙතනා.

---

කොරන්ද; පරස්ස, පරවූ; ණ්‍යස්ස, ණ්‍ය ප්‍රත්‍යයහට; ජ්ජාදයො, ජ්ජාදීහු; ධාත්වන්තෙන සහ, ධාත්වන්තයහා සමග; හොන්ති, වෙත්; ගරහස්ස, ගරහ යන ධාතුහට; ගාරො ගාරයනාදෙශය වෙතම; වා, විකල්පයෙන් වේ—වද, වද යන ධාතු; වචනෙ කීමෙහි වැටේ—වජ්ජං, යනු වේ—ගරහා, ගරහ යන ධාතු; නින්දායං, නින්දවෙහි වැටේ—ගාරය්හං, යනු වේ—පා, පා යන ධාතු; පානෙ, පිමෙහි වැටේ—පෙය්‍යං, යනු වේ. 2 "කරම්හා රිච්චො"ඉති—පෙ—යන සූත්‍රයෙන්; රිච්චො, රිච්ච ප්‍රත්‍යය වේ—රාදිලොපො, රාදිහට ලොප් වේ—කිච්චං, යනු වේ.

"නන්දාදීහි යු"ඉති—පෙ—යනසූත්‍රයෙන්; භාවකම්මෙසු, භාව කර්ම දෙක්හි; යු, යු ප්‍රත්‍යය වේ—ගහණං, ඤාණං, යනු වේ—වීසු දෙතැන්හි; නස්ස, නකාරයහට, ණො, ණකාරයෙක් ආදෙශ වේ.

"කත්තුකරණපදෙසෙසු ච"ඉති—පෙ—යන සූත්‍රයෙන්; යු, යු ප්‍රත්‍යය වේ—චකාරෙන, චශබ්දග්‍රහණයෙන්; සම්පදානාපාදානෙසුපි, සම්ප්‍රදාන අපාදාන දෙක්හිදු යු ප්‍රත්‍යය වේ—පදෙසො ඉති; පදෙසො යනු; ආධාරො, ආධාරයයි—රජං හරතීති, යන වාක්‍යයෙහි; රජොහරණං, යනු වේ—(ඒ කවරේද?)තොයං, ජලයයි—"එතොසමොලොපො ච"ඉති—පෙ—යන සූත්‍රයෙන්; ඔ ඔකාරයෙක් ආදෙශ වේ—යෙන පහරන්ති තං, යන වාක්‍යයෙහි; පහරණං යනු වේ—

"1 ඊසදුස්සුහි ඛ"—ඊසාදීහි පරෙහි ධාතූහි ඛො හොති—යදාදිනා, ඛලොපො—ඊසං කාරියතීති ඊසක්කරං—එවං දුක්කරං සුකරං.

"සමාදීහි ථ මා" ති ථ මා—සමු උපසමෙ—යදාදිනා උස්ස අ නධාතුස්සන්තලොපො—සමෙතීති සමථො—භී භයෙ—යස්මා භායන්ති සො භීමො. 2 ඉමම්ව තං පයුජිතබ්බෙ ඉමස්සුප්පද දුස්සෙපෙක්ඛණෙ ඉච්චස්මා කම්මනි ධාතුන්තස්ස ලොපෙ සම්පත්තෙ—"ඉ ය ත ම කි එ සානමන්තස්සරො දීඝං ක්වචි දුසස්ස ගුණං දො රං සක්ඛී ච"—අන්තානං ඉම අමහ කිං එත සමාන ඉච්චෙතෙසං ඉ ම කි එ සා ඉච්චාදෙසා හොන්ති—

---

ආස, ආස යන ධාතු; උපවෙසනෙ, හිඳීමෙහි වැටේ—යස්මිං, ආසන්ති තං, යන වාක්‍යයෙහි; ආසනං, යනු වේ—යස්ස සම්බාපද්දන්තෙ තං, යන වාක්‍යයෙහි; සම්පදනං, යනු වේ—යස්මා අපදදන්ති අපෙන්ති තං, යන වාක්‍යයෙහි, අපාදනං, යනු වේ. 1 "සඤ්ඤායං දධාතො ඉ" ඉති—පෙ—යන සූත්‍රයෙන්; ඉ, ඉ ප්‍රත්‍යය වේ—දා, දා යන ධාතු; දානෙ, දීමෙහි වැටේ—ආපුබ්බො, ආපුබ්බයි—ආදියන්ති, යන් වාක්‍යයෙහි; ආදි, යනු වේ—ධා, ධා යන ධාතු; ධාරණෙ දැරීමෙහි වැටේ—උදකං දධාතීති, යන වාක්‍යයෙහි; උදධි, යනු වේ—යදාදිනා, යදාදිසූත්‍රයෙන්; කලොපො, කකාරයහට ලොප් වේ. 2 "ඉත්ථියමණිත්තියවො වා" ඉති—පෙ—යන සූත්‍රයෙන්; ඉත්ථියං, ස්ත්‍රීලිඟයෙහි; අකාරො, අකාරය; ති, ති ප්‍රත්‍යය; යු ච, යු ප්‍රත්‍යය යන මොහු; වා, විකල්පයෙන් වෙත්—ජර, ජර යන ධාතු; වයොහානිමහි, වයස්පිරිහීමෙහි වැටේ—ජීරතීති, යන වාක්‍යයෙහි; ජරා, යනු වේ—පුන, නැවත; ආ, ආ ප්‍රත්‍යය වේ—මන, මන යන ධාතු; ඤාණෙ, දැනීමෙහි වැටේ—"ගමඛනහනරමාදිනමන්තො" ඉති—පෙ යන සූත්‍රයෙන්; තෙ, ත ප්‍රත්‍යයා පරකල්හිද; තිම්හි ච, ති ප්‍රත්‍යයා පරකල්හිද; ධාත්වන්තස්ස, ධාත්වන්තයහට; ලොපො. ලොප් වේ—මති, යනු වේ—චිත්, චිති යන ධාතු, චින්තායං, සිතීමෙහි වැටේ—චෙතයතීති, සිතාතුයි; චෙතනා, චෙතනා නම්.

"ඊස දුස්සුහි ඛ" යනු ඛ ප්‍රත්‍යයවිධාන සූත්‍රයි—ඊස යනු පදය දුස්සුහි යනු පදය ඛ යනු පදයි—ඊසාදීහි පරෙහි, ඊසාදීන්කෙරෙන් පරවූ, ධාතූහි, ධාතූන්කෙරෙන්; ඛො හොති, ඛ ප්‍රත්‍යය වේ—යදාදිනා, යදාදිසූත්‍රයෙන්; ඛලොපො, ඛ ප්‍රත්‍යයහට ලොප් වේ—

තෙසමන්තස්ස සරස්ස ක්වචි දීඝො* දුසස්සුකාරස්ස ගුණො ඉකාරො දස්ස රො ධාත්වන්තස්ස සො කො ඊ ච—ඊදිසො—එවං යාදි සො තාදිසො මාදිසො කීදිසො එදිසො සාදිසො—දීඝාභාවෙ—සදිසො—එවං රාදෙසෙ—ඊරිසො ඉච්චාදි—කඛාදෙසෙ—ඊදික්ඛො ඉච්චාදි—ඊකාරාදෙසෙ කතෙ න රාදෙසො සස්ස තු දීඝො නිච්චං—ඊදී ච්චාදි. ඉහ එබනා වුඩ්ඪි ගහිතත්තා ගුණොති ඉකාරාදි.
භූ—“අතීතෙ ත තවන්තු තාවී”ති අතීතෙ තො තවන්තු තාවී ච—රස්සො—අභාවීති භූතො භූතවා භූතාවී

ඊසං ත්‍රීයතීති, යන වාක්‍යයෙහි; ඊසක්කාරං, යනු වේ—දුක්කාරං, සුකරං, යනුද; එවං, මෙසේමැයි. 1 “සමාදීහි ථ මා”ඉති—පෙ—යන සූත්‍රයෙන්; ථ මා, ථ ප්‍රත්‍යයද ම ප්‍රත්‍යයද යන මොහු වෙත්—සමු, සමු යන ධාතු; උපසමෙ, සංසිද්මෙහි වැටේ—යදාදීනං, යදාදිසූත්‍රයෙන්; උස්ස, උකාරයහට; අ, අකාරයෙක් ආදෙශ වේ—න ධාත්වන්තලොපො; ධාත්වන්තයහට ලොප් නොවේ—සමෙතීති, යන වාක්‍යයෙහි; සමථො, යනු වේ—හි, හි යන ධාතු; භයෙ, භයෙහි වැටේ—යස්මා භායන්ති සො, යන වාක්‍යයෙහි; හිමො, යනු වේ. 2 ඉමම්ව නං පස්සති ඉති, ඉමම්ව නං පස්සති යන; අනෙ, අව්‍යයෙහි; ඉමස්සුප්පදෙ, ඉම ශබ්දයා උපපදකොටඇති; දිස පෙක්ඛණෙ ඉති—පෙ—යන; අස්මා, ම්මාත්‍රකාරෙන්; කම්මෙහි කව් ප්‍රත්‍යයා පරකල්හි; ධාත්වන්තස්ස, ධාත්වන්තයහට; ලොපො සමපෙතත, ලොප් පැමිණිකල්හි—“ඉයතමකිඑසානමන්තස්සරො දීඝං ක්වචි දුසස්ස ගුණං දො රං සක්ඛී ච”යනු ඉමාදිආදෙශ විධාන සූත්‍රයි—ඉයතමකිඑසානං යනු පදය අන්තස්සරො යනු පදය දීඝං යනු පදය ක්වචි යනු පදය දුසස්ස යනු පදය ගුණං යනු පදය දො යනු පදය රං යනු පදය ස යනු පදය ක්ඛ යනු පදය ඊ යනු පදය ච යනු පදයි—ඒයතානං, ය ශබ්ද ත ශබ්දයන් නැන්තාවූ; ඉම ය ත අමුහ කිං එත සමාන ඉති—පෙ—සමානය යන; එතෙසං මොවුන්ට; ඉ ම කි එ ස ඉති, ඉය මය කිය එය සය යන; ආදෙසා හොන්ති, ආදේශයෝ වෙති; තෙසං. ඔවුන්ගේ; අන්තස්ස සරස්ස අන්තස්වරයහට; ක්වචි, කියතැනෙක්හි; දීඝො, දීඝ වෙයි; දුසස්ස, දුස යන ධාතුහුගේ; දකාරස්ස, දකාරයහට; ගුණො, ගුණවූ; ඉකාරො, ඉකාරයෙක්ද වේ; දස්ස, දකාරයහට; රො, රකාරයෙක් වෙයි;

* තෙසමන්තස්සරො දීඝං ක්වචි, මුද්‍රිතපොතේ.

තස්සෙව—“භුජාදීනමන්තො නො’ච් ච”—තාදෙ පරෙ භුජ ද්‍යන්තො ලුප්‍යතෙ පරස්ස තකාරස්ස ච්තත්තඤ්ච—අභුඤ්ජි භු ත්තො භුත්තවා භුත්තාවී. ජන ජනනෙ—“ජනාදීනමා තිම්හි ච”—එත තිම්හි ච ජනාද්‍යන්තස්ස ආ හොති—ජාතො. රුහ ජ නනෙ—“හාන්තස්ස හො හස්ස ලො වා අදහනහානං”—දහනහ වජ්ජිතෙහි හකාරන්තෙහි පරස්ස තස්ස හො හොති ධාත්වන්තස්ස හස්ස ලො ච—ආරුළ්හො. “භාවකම්මෙසු ත”ඉති නපුංසකෙ— ගෙ සද්දෙ—“සබ්බත්ථ ගෙ ගී”ති ගෙස්ස ගී—ගායනං ගීතං—“රකා රො ච”ති තෙ තිම්හි ච ධාත්වන්තස්ස ලොපො—අකරිති කතං— දුපුබ්බො—“දෙ, ධස්ස ච”තිග ච්කාරෙන තස්ස ටො—දුක්කටං.

---

ධාත්වන්තස්ස, ධාත්වන්තයහට; සො, සකාරයෙහද; ඡො, ඡකද; ඊ ච, ඊකාරයෙක්ද ආදෙශ වේ—ඊදිසො, යනු වේ—යාදි සො තාදිසො මාදිසො කිදිසො එදිසො සාදිසො, යාදිසො—එප සාදිසො යනුද; එවං, මෙසේමැයි—දිඝාභාවෙ, දීඝ නොවූ තන්හි; සදිසො, සදිසො යනු වේ—රාදෙසෙ, රකාරාදෙශ කළ කල්හි; ඊ, රිසො ඉති, ඊරිසො යන; ආදි, මේ ආදියද; එවං, මෙසේමැයි— ඛාදෙසෙ, ඛ යනාදෙශ කළ කල්හි; ඊදික්ඛො ඉති, ඊදික්ඛො යන; ආදි, මේ ආදිය වේ—ඊකාරාදෙශෙ කතෙ, ඊකාරාදෙශ කළ කල්හි; රාදෙසො, රකාරාදෙශ තෙමේ; න, නොවේ—සස්ස තු, සකාරයහට වනාහි; දිසො, දිසි තෙම; නිච්චං, නිත්‍යයෙන් වේ— ඊදි ඉති, ඊදි යන; ආදි, මේ ආදිරූප වේ. ඉහ, මෙහි; එඔනං, එකා ර ඔකාර යන මොවුන්ට; වුඩ්ඪි, වෘද්ධියයි; ගහිතත්තා, ගත් බැවින්; ගුණො ති, ගුණයයි; ඉකාරාදී, ඉකාරාදිය කියනු ලැබේ.

---

භූ, භූ යන ධාතු වේ—“අතීතෙ ත තවන්තු තාවී”ඉති—පෙ—යන සූත්‍රයෙන්; අතීතෙ, අතීත කාලයෙහි; තො, ත ප්‍රත්‍යයද; තව න්තු, තවන්තු ප්‍රත්‍යයද; තාවී ච, තාවී ප්‍රත්‍යයද වේ—රස්සො, හ්‍ර ස්ව වේ—අභාවිත්, යන වාක්‍යයෙහි; භූතො භූතවා භූතාවී, යනු වේ. තස්ස ඉති, තස්ස යනු; එව, මේසූත්‍රයෙහි වැවේ—“භුජාදී නමන්තො නො ච් ච”යනු ලොප්හා විධානධාන සූත්‍රයි—භුජාදීනං යනු පදය අන්තො යනු පදය නො යනු පදය ච් යනු පදය ච යනු පදයි—තාදෙ, පරෙ, තාදීන් පරකල්හි, භුජාද්‍යන්තො, භුජාදිධාතූන් ගේ අන්තය තෙම; ලුප්‍යතෙ, ලොප්කරනු ලැබේ; පරස්ස, පරවන් නයහට; ච්තත්ත, ච්ත්වද වේ—අභුජ්ජි, යන වාක්‍යයෙහි; භු ත්තො භුත්තවා භුත්තාවී, යනු වේ.

ත්වස්සත්වං—"ධඪභහෙහි ධඪා ච"—ධහෙහි තස්ස ධො හොති ඪහෙහි තස්ස ඪො ච—"හචතුත්ථානමන්තානං දො ධෙ"—ධෙ පරෙ ධාත්වන්තානං හකාරවග්ගචතුත්ථානං දො හොති—"ඩො ඪකාරෙ"—ඪෙ පරෙ හචතුත්ථානං ඩො හොති—බධ බන්ධනෙ—බද්ධො—ලභ ලාභෙ—ලද්ධං—වඪ වඪ්ඪනෙ—වුඩ්ඪො—එත්ථ යදාදිනා උ—දහ භස්මීකරණෙ—දඩ්ඪං. දුස අප්පීතිම්හි—"සාදිසන්තපුච්ඡභඤ්ජහංසාදීහි ට්ඨො"ති ආදිබ්‍යඤ්ජනෙන සහ තස්ස ට්ඨො—දුට්ඨො.

---

ජන, ජන යන ධාතු; ජනනෙ, ඉපදවීමෙහි වැටේ—"ජනාදීනමා තිම්හි ච"යනු ආකාරාදෙශවිධාන සූත්‍රයි—ජනාදීනං යනු පදය ආ යනු පදය තිම්හි යනු පදය ච යනු පදයි—තෙ, ත ප්‍රත්‍යය පරකල්හිද; තිම්හි ච, ති ප්‍රත්‍යය පරකල්හිද; ජනාද්‍යන්තස්ස, ජන ශබ්දාදීන්ගේ අන්තයහට; ආ හොති, ආකාරාදෙශ වේ—ජාතො, යනු වේ

රුහ, රුහ යන ධාතු; ජනනෙ, ඉපදවීමෙහි වැටේ—"හකාරන්තෙහි හො හස්ස ළො වා අදහනහානං"යනු හකාර ළකාරාදෙශවිධාන සූත්‍රයි—හකාරන්තෙහි යනු පදය හො යනු පදය හස්ස යනු පදය ළො යනු පදය වා යනු පදය අදහනහානං යනු පදයි—දහනහවජ්ජිතෙහි, දහ නහ යන ධාතූන් තොරකොට ඇත්තාවූ; හකාරන්තෙහි, හකාරාන්තධාතූන් කෙරෙන්; පරස්ස, පරවූ; තස්ස, තකාරයහට; හො, හකාරයෙක් ආදෙශ වෙයි; ධාත්වන්තස්ස, ධාත්වන්තවූ; හස්ස, හකාරයහට; ළො ච, ළකාරයෙක්ද ආදෙශ වේ. ආරූළ්හො, යනු වේ.

"භාවකම්මෙසු ත"ඉති—පෙ—යන සූත්‍රයෙන්; තපච්චයො, ත ප්‍රත්‍යය වේ—ගෙ, ගෙ යන ධාතු; සද්දෙ, ශබ්දකිරීමෙහි වැටේ—"සබ්බත්ථ ගෙ ගී"ඉති—පෙ—යන සූත්‍රයෙන්; ගෙස්ස, ගෙ යන ධාතුහට; ගී, ගී යනාදෙශ වේ—ගායනං, යන වාක්‍යයෙහි; ගීතං, යනු වේ—"රකාරො චෙ"ති."රකාරො ච"යන සූත්‍රයෙන්; තෙ, ත ප්‍රත්‍යය පරකල්හිද; තිම්හි ච, ති ප්‍රත්‍යය පරකල්හිද; ධාත්වන්තස්ස, ධාත්වන්තයහට; ලොපො, ලොප් වේ—අකරි ති, යන වාක්‍යයෙහි, කතං, යනු වේ—දුප්පුබ්බා, දු පූර්වයි—"දො ධස්ස චෙ"ති,"දො ධස්ස ච"යන; ඉහ, මේ සූත්‍රයෙන්; චකාරෙන, චග්‍රහණයෙන්; තස්ස, තකාරයහට; ටො, ටකාරයෙක් ආදෙශ වේ—දුක්කටං, යනු වේ.

ඡිද විදාරණෙ—"ඡිදාදිතො ඉන්නන්නා වා"ති තස්ස ඉන්නාදෙසො ධාත්වන්තලොපො ච—ඡින්නො. ත ඉච්චෙව—"බුධගමාදිත්ථෙ කත්තරි"—සබ්බකාලෙ බුධගමාදීහි තදත්ථෙ ගම්‍යමානෙ කත්තරි තො හොති—බුධ බොධනෙ—අබුජ්ඣි බුජ්ඣති බුජ්ඣිස්සතීති වා බුද්ධො—තර තරණෙ—"තරාදීහි ඉණ්ණො" ති තස්ස ඉණ්ණො ධාත්වන්තලොපො ච—තිණ්ණො.

---

"වත්තමානෙ මානන්ත"—පච්චුප්පන්නෙ ධාතුතො කත්තුකම්මභාවෙසු මානො හොති කත්තරි අන්තො ච—

---

තස්ස ඉති, තස්ස යනු; එව, මතුසූත්‍රයෙහි වැටේ—"ධඪභෙහි ධඪා ච"යනු ධකාර ඪකාරාදෙශවිධාන සූත්‍රයි—ධඪභෙහි යනු පදය ධඪා යනු පදය ච යනු පදයි—ධභෙහි, ධකාර භකාර යන මොවුන් කෙරෙන් පරවූ; තස්ස, තකාරයහට; ධො හොති, ධකාරයෙක් ආදෙශ වෙයි; ඪහෙහි, ඪකාර හකාර යන මොවුන් කෙරෙන් පරවූ; තස්ස, තකාරයහට; ඪො ච, ඪකාරයෙක්ද ආදෙශ වේ—"හචතුත්ථානමන්තානං දො ධෙ" යනු දකාරාදෙශවිධාන සූත්‍රයි—හචතුත්ථානං යනු පදය අන්තානං යනු පදය දො යනු පදය ධෙ යනු පදයි—ධෙ පරෙ, ධකාරයා පරකල්හි; ධාත්වන්තානං, ධාත්වන්තවූ; හකාරවග්ගචතුත්ථානං, හකාරය වර්ගචතුර්ථාක්ෂරය යන මොවුන්ට; දො හොති, දකාරයෙක් ආදෙශ වේ—"ඩො ඪකාරෙ" යනු ඩකාරාදෙශවිධානසූත්‍රයි—ඩො යනු පදය ඪකාරෙ යනු පදයි—ඪෙ පරෙ, ඪකාරයා පරකල්හි; හචතුත්ථානං, හකාරය චතුර්ථාක්ෂරය යන මොවුන්ට; ඩො හොති, ඩකාරයෙක් ආදෙශ වේ—බධ, බධ යන ධාතු; බන්ධනෙ, බැඳීමෙහි වැටේ—බද්ධො, යනු වේ—ලභ, ලභ යන ධාතු; ලාභෙ, ලැබීමෙහි වැටේ—ලද්ධං, යනු වේ—වඪ, වඪ යන ධාතු; වඪ්ඪනෙ, වැඩීමෙහි වැටේ—වුඩ්ඪො, යනු වේ—එත්ථ, මෙහි; යදාදිනා, යදාදිසූත්‍රයෙන්; උ, උකාරයෙක් ආදෙශ වේ—දහ, දහ යන ධාතු; භස්මීකරණෙ, භළුකිරීමෙහි වැටේ—දඩ්ඪං, යනු වේ. දුස, දුස යන ධාතු; අප්පීතිම්හි, අප්‍රීතියෙහි වැටේ—"සාදිසන්තපුච්ඡභඤ්ජහංසාදීහි ට්ඨො"ඉති—පෙ—යන සූත්‍රයෙන්; ආදිබ්‍යඤ්ජනෙන සහ, ආදිබ්‍යඤ්ජනයාහා සමග; තස්ස, තකාරයහට; ට්ඨො, ට්ඨ යනාදෙශ වේ—දුට්ඨො, යනු වේ—

සහ ඛමායං—සහමානො—"හවිපරියයො ලො* වා"ති සෙ හවිපරියයො—තෙන සය්හමානො—භුඤ්ජමානං—ගච්ඡං—"ගමිස්සන්තො ච්ඡො වා සබ්බාසු"ති මස්ස ච්ඡො. භවිස්සති කම්මනිච්චෙව—"ස්සස්ස ස්සං†න්තුමානානා"—සෙසොති අපරිසමත්තො—භවිස්සතිකාලෙ කම්මනාඤ්ඤපපදෙ ලෙසසෙසං ස්සං ආදයො හොන්ති—කම්මං කරිස්සතීති කම්මං කරිස්සං කරොන්තො කුරුමානො කරානො වා වජති—පුබ්බරූපෙ සිලොපො. "අකාරාදීහි කාරං"—අකාරාවීහි සද්දෙහි සකාරෙ කාරො හොති—අ එව අකාරො—එවං කකාරො රකාරො ඉච්චාදි—ධාතූතො සකාරෙ නදීතා ඉ ච ති ච පච්චයා කාතබ්බා—ගමු ඉච්චයං ධාතු එව ගමි—එවං කරොති—තනාදිතො ඔ.

ඡිද, ඡිද යන ධාතු; විදාරණෙ, පැළීමෙහි වැටේ—"ඡිදාදිතො ඉන්තඉතනන්තා වා"ඉති—පෙ—යන සූත්‍රයෙන්; තස්ස තකාරයහට; ඉන්නාදයො, ඉනනාදීහු වෙති; ධාතුඅන්තලොපො ච, ධාත්වන්තයහට ලොප්ද වේ—ඡින්නො, යනු වේ. ත ඉති, ත යනු; එව, මිතුසූත්‍රයෙහි වැටේ—"බුධගමාදිත්ථෙ කත්තරි"යනු ත ප්‍රත්‍යයවිධාන සූත්‍රයි—බුධගමාදිත්ථෙ යනු පදය කත්තරි යනු පදයි—සබ්බකාලෙ, හැම කල්හි; බුධගමාදිහි, බුධ ගමාදි ධාතූන් කෙරෙන් පරවූ; තදත්ථෙ, තදර්ථයෙහි; ගම්‍යමානෙ, හැඟෙන ලැබෙන කල්හි; කත්තරි, කර්තෘකාරකයෙහි; තො හොති, ත ප්‍රත්‍යය වේ—බුධ, බුධ යන ධාතු; බොධනෙ, අවබොධකිරීමෙහි වැටේ—අබුජ්ඣි බුජ්ඣති බුජ්ඣිස්සතීති වා, යන වාක්‍යයෙහි; බුද්ධො, යනු වේ—තර, තර යන ධාතු; තරණෙ එතරවීමෙහි වැටේ—"තරාදීහි ඉණ්ණො"ඉති, "තරාදීහි ඉණ්ණො"යන සූත්‍රයෙන්; තස්ස, ත ප්‍රත්‍යයහට; ඉණ්ණො, ඉණ්ණ යනාදෙශද; ධාත්වන්තලොපො ච, ධාත්වන්තයහට ලොප්ද වේ—තිණ්ණො, යනු වේ.

"වත්තමානෙ මානන්තා"යනු මාන න්ත ප්‍රත්‍යයවිධාන සූත්‍රයි-වත්තමානෙ යනු පදය මානන්තා යනු පදයි—පවත්නාවූ, වර්තමානකාලයෙහි; ධාතුතො, ධාතූන් කෙරෙන්; කත්තුකම්මභාවෙසු, කර්තෘ කර්ම භාවයෙහි; මානො හොති, මාන ප්‍රත්‍යය වේ; කත්තරි, කර්තෘකාරකයෙහි; අන්තො ච, අන්ත ප්‍රත්‍යයද වේ—සහ, සහ යන ධාතු; ඛමායං, ඉවසීමෙහි වැටේ—සය්හමානො, සහමානො, යනු වේ—"හවිපරියයො ලො වා"ඉති—පෙ—යන සූත්‍රයෙන්; යෙ, යකාරයා පරකල්හි; හවිපරියයො, හකාරයාගේ විපර්‍යාසබව වේ—

* ලො, මුද්‍රිත පොත්.

† ස්සන්තු, මුද්‍රිත පොත්.

“ඉච්ඡත්ථෙසු සමානකත්තුකෙසු තවෙ තුං වා”—එකකත්තුකෙසු ඉච්ඡත්ථෙසු ගම්‍යමානෙසු ධාතූහි කත්තරි තවෙ තුං වා හොන්ති— “තවෙ වා තුනාදීසු කා”තිකරස්ස කා—කාතවෙ ඉච්ඡති කාතුං වා- යො කරොති සො එව ඉච්ඡතීත්‍යෙක කත්තුකතා * —සාසාදද ච කාරෙන තුං පච්චයස්ස රට්ඨුම්ාදෙසෙ—දට්ඨුං—“අරහසක්කාදිසු ච”ති අරහාද්‍යර්ථෙසු තුං—නිඥ ගරහාසං—නිඥිතුමරහති— “පුබ්බකාලෙක කත්තුකානං තුන ත්වාන ත්වා වා”—සමානකත්තුකානං ධාතූනං මජ්ඣෙ පුබ්බක්‍රියාවාචීහි ධාතූහි තුන ත්වාන ත්වා වා හොන්ති—

---

තෙන, ඔහු විසින්, සයහමානො, සමාකරනු ලබන්නේයි- හුයම්ානං, යනු වේ—ගච්ඡං, යනු වේ—“ගම්ස්සනොවා ච්ඡො වා සබ්බාසු”ඉති—පෙ—යන සූත්‍රයෙන්; මස්ස, මකාරයහට; ච්ඡා, ච්ඡ යනාදෙශ වේ. භවිස්සති ඉති, භවිස්සති යනුද; කම්මනි ඉති, කම්මනි යනුද; එව, මතුසූත්‍රයෙහි වැවේ—“සෙසෙ ස්සං න්තු මානානා”යනු ස්සං යනාදිප්‍රත්‍යයවිධාන සූත්‍රයි—සෙසෙ යනු පදය. ස්සං න්තු මානානායනුපදයි—සෙසෙසාති,ශෙෂනම්; අපරිසමත්තො, සමාප්ත නුවූයේයි—භවිස්සතිකාලෙ, භවිෂ්‍යත්කාලයෙහි; කම්ම නූපපදෙ, කම්යන්හු උපපදකොට ඇත්තාවූ; සෙසන්ත, ශෙෂා එයෙහි; ස්සං ආදයො හොන්ති, ස්සං යනාදීහු වෙත්—කම්මං කරිස්සතිති, යන වාක්‍යයෙහි; කුම්මං කරිස්සං කරොන්තො කුරුමානො කරාන්නො වා වජති, යනු වේ—පුබ්බරූපෙ, පූර්වරූපයෙහි; යි ලොපො, යිහට ලොප් වේ, “අක්ඛරෙහි කාරං”යනු කාර ප්‍රත්‍යයවිධාන සූත්‍රයි අක්ඛරෙහි යනු පදය කාරං යනු පදයි—අක්ඛරවාචීහි සද්දෙහි, අක්ෂරවාචිශබ්දයන් කෙරෙන් පරව, සකත්ථෙ, ස්වාර්ථයෙහි; කාරො හොති, කාර ප්‍රත්‍යය වේ—අ එව, යන වාක්‍යයෙහි අකාරො, යනු වේ—ක්කාරො රකාරො ඉති—පෙ- රකාරො යන; ආදි, මේ ආදියද; එවං, මෙසේමැයි—ධාතුතො, ධාතූහු කෙරෙන්; සකත්ථෙ,ස්වාර්ථයෙහි; යදාදිනා,.යදාදිසූත්‍රයෙන්, ඉ ච යි ච පච්චයා, ඉ ප්‍රත්‍යය යි ප්‍රත්‍යය යන මොහු; කාතබ්බා, කටයුත්තාහුයි—ගම් ඉච්ඡයං ධාතු එව, යන වාක්‍යයෙහි; ගම්, යනු වේ—කරොති,යනුද; එවං, මෙසේමැයි—තනාදිතො, තනාදීන් කෙරෙන් පරව; ඕ, ඔ විකරණය වේ.

---

* එකකත්තුකතා, මුද්‍රිතපාඨ.

කාතූන ගච්ඡති කත්වාන කත්වා වා—සිත්වා පීත්වා වජ්ජීත්වාදෙ ප රාපෙක්ඛාය පුබ්බතානං. ඨා ගතිනිවුත්තිම්හි—"ඨාපානමිඊ ච"ති ඨා ස්ස ඉ පාස්ස ඊ ච—වාකාරෙන භින්නකත්තුකෙසුපි වදන්ති—යථා—සීහං දිස්වා භයං උප්පජ්ජතීත්‍යාදි—එත්ථ "දිසා ස්වානස්වාන්තලො පො ච"ති තූනාදීනං ස්වා ධාත්වන්තලොපො ච. සද විසරණා දීසු—"දධාන්තතො යො ක්වචී"ති තූනාදිසු යාගමො—යවතමාදි තා සයකාරස්ස දස්ස ජෝ—ඕනතා—ඉ ආගමො—සජ්ජිත්වා—"යථා කතනාදී ච"ති සයකාරස්ස ධස්ස ඣො—බුජ්ඣිත්වා. "සබ්බෙහි තූනාදීනං යො"ති යාදෙසො වා—කාරිය කත්තුනෙවවාදි. දිස උච්චාරණෙ—"පුබ්බරූපඤ්ච"ති යෙ පරෙ පුබ්බ රූපං—උද්දිස්ස

---

"ඉච්ඡත්ථෙසු සමානකත්තුකෙසු තවෙ තුං වා" යනු තවෙ තුං ප්‍රත්‍යය විධාන සූත්‍රයි ඉච්ඡත්ථෙසු යනු පදය සමානකත්තුකෙසු යනු පදය තවෙ තුං යනු පදය වා යනු පදයි—එකකත්තුකෙසු, එකකර්තෘකවූ; ඉච්ඡත්ථෙසු, ඉච්ඡාර්ථයක්; ගම්‍යමානෙසු, හැඟෙන කල්හි ධාතුහි, ධාතූන් කෙරෙන් පරව; කත්තරි, කර්තෘකාරකයෙහි; තවෙ තුං, තවෙ ප්‍රත්‍යය තුං ප්‍රත්‍යය යන මොහු; වා හොන්ති, විකල්පයෙන් වෙත්;—"තවෙතූනාදිසු කා" ඉති—පෙ—යන සූත්‍රයෙන්; කරස්ස, කර යන ධාතුහට; කා, කා යනාදෙශ වේ—කාතවෙ ඉච්ඡති, යනු වේ—කාතුං වා, කාතුං කියාහෝ වේ—යො, යමෙක්; කරොති, කෙරේද; සො එව, හෙම; ඉච්ඡතීති, කැමතිවේනුයි; එකකත්තුකත්ත, සමානකර්තෘකත්වය වේ—සාසාදෙ, "සාසදිසතො තස්ස රිට්ඨො ච" යන සූත්‍රයෙහි; චකාරෙන, චශබ්දග්‍රහණයෙන්; තුං පච්චයස්ස, තුං ප්‍රත්‍යයහට; රට්ඨුමාදෙසෙ, රට්ඨුං යනාදෙශ කළ කල්හි—දට්ඨුං, යනු වේ—"අරහසක්කාදිසු ච" ඉති—පෙ—යන සූත්‍රයෙන්; අරහාද්‍යර්ථෙසු, අරහාදිඅර්ථයෙහි; තුං, තුං ප්‍රත්‍යය වේ—නින්ද, නින්ද යන ධාතු, ගරහායං, නින්දායෙහි වැටේ—නින්දිතුං; නින්දාකරන්නට; අරහති, සුදුසුයි.

"පුබ්බකාලෙකකත්තුකානං තූන ත්වාන ත්වා වා" යනු තූනාදිප්‍රත්‍යයවිධාන සූත්‍රයි පුබ්බකාලෙ යනු පදය එකකත්තුකානං යනු පදය තූනත්වානත්වා යනු පදය වා යනු පදයි—සමානකත්තුකානං, සමානකර්තෘකවූ; ධාතූනං මජ්ඣෙ, ධාතූන්ගේ මධ්‍යයෙහි; පුබ්බකිරියාවාචීහි ධාතූහි, පූර්වක්‍රියාවාචී ධාතූන් කෙරෙන්; තූන ත්වාන ත්වා, තූන ත්වාන ත්වා ප්‍රත්‍යයෝ; වා හොන්ති, විකල්පයෙන් වෙත්—කාතූන ගච්ඡති, යනු වේ—කත්වාන කත්වා වා, කත්වාන කත්වා යි

කියාමො( වේ—සීහා පිට්ඨා වජති ඉති, සිංහයා පිටුපා වජතියන; ආදි, මේ ආදි තන්හි; පරාපෙක්ඛාය, පරක්‍රියාව අපෙක්ෂාකිරීමෙන්; පුබ්බත්තං, පූර්වබව වේ—ඨා, ඨා යන ධාතු; ගතිනිවුත්තිම්හි, ගමන නිවෘත්තියෙහි වැටේ—

"ඨාපානමිඊ ච"ඉති—පෙ—යන සූත්‍රයෙන්; ඨාස්ස, ඨා යන ධාතුහුගේ අන්තයහට; ඉ, ඉකාරයෙක්ද; පාස්ස, පා යන ධාතුහුගේ අන්තයහට; ඊ ච, ඊකාරයෙක්ද ආදෙශ වේ—වාකාරෙන, වා ශබ්දග්‍රහණයෙන්; හිත්වාකත්වාකෙසුපි, හිත්වාකත්වාදීන්හිද; එ දනති, කියත්—යථා, මෙසේයි—සීහං දිස්වා භයං උප්පජ්ජති ඉති—පෙ—උප්පජ්ජති යන; ආදි, මේ ආදිය වේ—එත්ථ, මෙහි; "දිසාස්වාන ස්වාන්තලොපො ච"ඉති—පෙ—යන සූත්‍රයෙන්; තූනාදීනං, තූනාදීන්ට; ස්වා, ස්වා යනාදෙශද; ධාත්වන්තලොපො ච, ධාත්වන්තයහට ලොප්ද වේ.

සද, සද යන ධාතු; විසරණාදිම්හි, විස්තීර්ණාදියෙහි වැටේ—"දධාන්තතො යො ක්වචි"ඉති—පෙ—යන සූත්‍රයෙන්; තූනාදිසු, තූනාදීන් පරකල්හි; යාගමො, යකාරයෙක් ආගම වේ—යවතමාදිනා, යවතමාදිසූත්‍රයෙන්; සයකාරස්ස, යකාර සහිතවූ; දස්ස, දකාරයහට; ජො, ජකාරයෙක් ආදෙශ වේ—ඛීත්තං, ඕහාවය වේ—ඉ ආගමො, ඉකාරයෙක් ආගම වේ—සජ්ජිත්වා, යනු වේ—"යථා කත්තරි ච"ඉති—පෙ—යන සූත්‍රයෙන්; සයකාරස්ස, යකාර සහිතවූ; ධස්ස, ධකාරයහට; ඣො, ඣකාරයෙක් ආදෙශ වේ—බුජ්ඣිත්වා, යනු වේ. "සබ්බෙහි තූනාදීනං යො"ඉති—පෙ—යන සූත්‍රයෙන්; යාදෙසො, යකාරාදෙශය; වා, විකල්පයෙන් වේ—කාරිය කත්තූන ඉති—පෙ—යන; ආදි, මේ ආදිරූප වේ. දිස, දිස යන ධාතු; උච්චාරණෙ, කීමෙහි වැටේ--"පුබ්බරූපච"ඉති--පෙ--යන සූත්‍රයෙන්; යෙ පරෙ, යකාරයා පරකල්හි; පුබ්බරූපං, පූර්වරූප වේ--උද්දිස්ස, යනු වේ.

දලහනති, දලහං යන, දුතියතෙතාපපද, විතියාන්තයා උප පදකොටඇති, ගහ ඉති, ගහ යන, අස්මා, මොනු කෙරෙන්, යද දිනා, යදදිසූත්‍රයෙන්; ණං, පච්චයො, ණං ප්‍රත්‍යය වේ—තස්මා, එ හෙයින්; ගහස්ස, ගහ යන ධාතුහුගේ, අනුප්පයොගො ච, අනුප්‍ර යොගයද; කාතබ්බො, කටයුතුයි--විභත්ති ලොපො, විභක්තිහට ලොප් වේ—දල්හගාහං ගණ්හාති, යනු වේ—දලහං, දෘඪකොට, ගණ්හාතිත්‍යෙර්ථ, ගනීය යන අර්ථයි—

දළ්හන්ති දුතියෙනොපපදෙ ගහදුච්චසමා සද්දිනා ණං පච්චයො ත
ස්මා ගහස්සාතුපපයොගෙ ච සඤ්ඤාකො—විභත්තිලොපො—දළ්හ
ගාහං ගණ්හාති, දළ්හං ගණ්හාතීත්‍යත්‍ථො—එවමඤ්ඤම්පි යොජෙ
තබ්බං. 1 "එකාදිතො සඞ්ඛ්‍යස්ස කඛත්තුං"—සඞ්ඛ්‍යන්ති වාරං—එකාදිහි
සඞ්ඛ්‍යාසද්දස්ස අත්‍ථෙ කඛත්තුං පච්චයො හොති—එකස්මිං වාරෙ එ
කක්ඛත්තුං—එවං ද්වික්ඛත්තුං තික්ඛත්තුමිච්චාදි—විභත්‍යලොපෙ තු
තිණ්ණක්ඛත්තුමිච්චාදි.

ලිඛිතං බාලප්පබොධත්‍ථං වුත්තං යෙභුය්‍යවුත්තියා,
විසෙසො තත්‍ථ සබ්බත්‍ථ ඤෙය්‍යො විඤ්ඤූහි පාළිතො.

කිතකො වුත්තො.

---

එවං, මෙසේ; අඤ්ඤම්පි, සෙස්සද; ඤෙය්‍යං, දතයුත්තේයි·
1 "එකාදිතො සඞ්ඛ්‍යස්සක්ඛත්තුං"යනු කඛත්තුං ප්‍රත්‍යයවිධාන සූත්‍ර
යි; එකාදිතො යනු පදය සඞ්ඛ්‍යස්ස යනු පදය කඛත්තුං යනු පදයි—
සඞ්ඛ්‍යන්ති, සඞ්ඛ්‍යා නම්: වාරං, වරෙක යන අර්ථයි—එකාදිහි, එකාදීන්
කෙරෙන් පරව; සඞ්ඛ්‍යාසද්දස්ස අත්‍ථෙ, සඞ්ඛ්‍යා ශබ්දයාගේ අර්ථයෙහි;
කඛත්තුං පච්චයො හොති, ක්ඛත්තුං ප්‍රත්‍යය වේ—එකස්මිං වාරෙ,
යන වාක්‍යයෙහි; එකක්ඛත්තුං, යනු වේ—ද්වික්ඛත්තුං තික්ඛත්තුං
ඉති—පෙ—තික්ඛත්තුං යන; ආදි, මේ ආදියද; එවං, මෙසේමැයි—
විභත්‍යලොපෙ තු, විභක්තිහට ලොප් නොකළකල්හි වනාහි; ති
ණ්ණක්ඛත්තුං ඉති—පෙ—යන; ආදි, මේ ආදිය වේ;
බාලප්පබොධත්‍ථං, (අව්‍යුත්පන්න) බාලජනයන්ගේ අවබොධය
පිණිස; ලිඛිතං, ලියූ මෙතම, යෙභුය්‍යවුත්තියා, බහුලවෘත්තීයෙන්;
වුත්තං, කියන ලද; තත්‍ථ සබ්බත්‍ථ, ඒ හැමතන්හිම; විසෙසො,
වෙනස; විඤ්ඤූහි, නුවණැත්තන් විසින්; පාළිතො; පාළියෙන්
ඤෙය්‍යො, දතයුත්තේයි.

**කිතකො, කිතකය තෙම; වුත්තො, කියන ලදි·**

---

1 ඡකාරකානි සාමී ච වුත්තානුත්තනාමභෙදතො,
ද්විධාථ වුච්චරෙ භෙදෙ, විභත්තීනං ච වුච්චතෙ.

2 සමාසතද්ධිතාඛ්‍යාතකිතකා යත්ථ ජායරෙ,
සො අත්ථො කථිතො තෙහි අවුත්තො තදපරො භවෙ.

3 වුත්තෙත කම්මාදිසාමිස්මිං ලිඞ්ගත්ථෙ පඨමා සියා,
අවුත්තෙත තු භවන්ත්‍යඤ්ඤා දුතියාදී යථාරහං.

4 කරොති කිරියං නිප්ඵාදෙතීති කාරකං—කිරියානිප්ඵත්තිනිමිත්තන්ත්‍යත්ථො. කාරකසද්දො මුඛ්‍යතො කත්තාරං අමුඛ්‍යතො කම්මාදිච වදති—තථාහි—සබ්බො සද්දවොහාරො මුඛ්‍යාමුඛ්‍යවසෙන ද්විධා වත්තතෙ—යථා—ගඞ්ගායං නහානං ගඞ්ගායං සස්සානි ච—ගඞ්ගාසද්දෙන පුබ්බෙ ජලප්පවාහො වුච්චතෙ පච්ඡිමෙන තු තංසමීපො.

.................................

---

1 ඡකාරකානි, (කම්මාදී) ෂට්කාරකයෝද; සාමී ච, සම්බන්ධයද යන මොහු; වුත්තානුත්තනාමභෙදතො, උක්තානුක්තනාම භෙදයෙහෙයින්; ද්විධා, දෙපරිද්දෙකින්; වුච්චරෙ, කියනු ලැබෙති; අථ, ඉක්බින්තෙන්; විභත්තීනංච, විභක්තීන්ගේද; භෙදෙ, භෙදය; වුච්චතෙ, කියනු ලැබේ. 2 සමාසතද්ධිතාඛ්‍යාතකිතකා, සමාසය තද්ධිතය ආඛ්‍යාතය කිතකය යන මොහු; යත්ථ, යම් අර්ථයෙක්හි; ජායරෙ, උපදිද්ද; සො අත්ථො, ඒ අර්ථය තෙම; තෙහි, ඒ සමාසාදීන් විසින්; කථිතො, උක්තනම්; තදපරො, එයින් අන්‍යවූයේ, අවුත්තො භවෙ, අනුක්ත නම් වේ 3 කම්මාදි, කර්මාදියද; සාමිස්මිං, සම්බන්ධයද යන මොවුන්; වුත්තෙත, උක්තකල්හි; ලිඞ්ගත්ථෙ, ලිඞ්ගාර්ථයෙහි; පඨමා සියා, ප්‍රථමාවිභක්ති වන්නීය; අවුත්තෙත තු, අනුක්තකල්හි වනාහි; අඤ්ඤා, මෙයින් අන්‍යවූ; දුතියාදී, ද්විතීයාදිවිභක්තීහු; යථාරහං, සුදුසු පරිද්දෙන්; භවන්ති, වෙත්.

4 කරොති, යයිසේයි; කිරියං නිප්ඵාදෙතීති, ක්‍රියාව නිපදවානුයි; කාරකං, කාරක නම්—කිරියානිප්ඵත්තිනිමිත්තන්ති, ක්‍රියාවගේ සිඬයට කාරණය යන; අත්ථො, අර්ථයි. කාරකසද්දො, කාරකශබ්දය තෙම; මුඛ්‍යතො, මුඛ්‍යහෙයින්; කත්තාරං, කර්තෘහුද; අමුඛ්‍යතො, අමුඛ්‍යහෙයින්; කම්මාදිච, කර්මාදියද; වදති, කියා—තථාහි, එසේමැයි—සබ්බො සද්දවොහාරො, සකල ශබ්දව්‍යවහාරය තෙම; මුඛ්‍යාමුඛ්‍යවසෙන, ප්‍රධානාප්‍රධානහෙයින්; ද්විධා, දෙපරිද්දෙකින්; වත්තතෙ, පවතී—යථා, මෙසේයි—ගඞ්ගායං, ගඟ; නහානං,

1 තත්‍ථ වුත්තකම්මං තාව—ආගතසමණො විහාරො—ඝාතිකො ආහාරො—සුදින්න ඔදනො පච්චතෙ—බුද්ධෙන දෙසිතො ධම්මො—එත්‍ථ සමාසතද්ධිතාඛ්‍යාතකිතකානං කම්මනි විහිතත්තා තෙහි කම්මං වුත්තන්ති වුච්චතෙ-යථා-ඔදනම්පචතීත්‍යාදෞ ඔදනසඞ්ඛාතං කම්මං දුතියාය වුත්තන්ති පුනත්තත්තා වත්තබ්බස්සාපරිසෙසස්සාභාවා න දුතියා, තථාත්‍රාපි සමාසාදීහි එව විහාරාදීනං කම්මානං කථිතත්තා න පුන තප්පකාසිකා දුතියා සියා. 2 විභත්තිං විනා වාප්පං නිද්දිසිතුමසක්කුණෙය්‍යත්තා අවසිට්ඨලිඞ්ගත්‍ථමත්තාපෙක්ඛාය මෙත්‍ථ විහාරාදීනො තබ්බිසෙසනෙහි තත්‍ථලීනාධිකරණෙහි ආගතසමණාදීහි ච පඨමා හොතෙව—

---

නැහැමය; ගඞ්ගායං, ගඟ; ඝොසො නාම ච, ගොයමැයි කියාද වෙයි— ගඞ්ගාසද්දෙන, ගඞ්ගා ශබ්දයෙන්; පුබ්බ, පළමුවෙන්; ජලප්පවාහො, දියවතුර; වුච්චතෙ, කියනුලැබේ; පච්ඡාමෙහත්‍ථ, පසුවකීතන්හි වූ කලී, තං සමීපො, ඒ ගඞ්ගාව සමීපය කියනුලැබේ.

---

තත්‍ථ, ඔවුන් අතුරෙහි; වුත්තකම්මං, උක්තකර්මය; තාව, පළමු කොට වුච්චතෙ, කියනුලැබේ—ආගත, ආවාවූ; සමණො, ශ්‍රමණයන් ඇති; විහාරො, විහාරය—ඝාතිකො, ඝෘතයෙන් මිශ්‍රකරණලද; ආහාරො, ආහාරය—සුදින්න, අරක්කැමියා විසින්; ඔදනො, ආහාරය; පච්චතෙ, පිසනුලැබෙයි—බුද්ධෙන, බුදුන් විසින්; දෙසිතො, දෙසනලද; ධම්මො. ධර්මයයි—එත්‍ථ, මෙහි; සමාසතද්ධිතාඛ්‍යාතකිතකානං, සමාසය තද්ධිතය ආඛ්‍යාතය කිතකය යන මොවුන්; කම්මනි, කර්මයවාච්‍යකල්හි; විහිතත්තා, කරණලද හෙයින්, තෙහි, ඔවුන් විසින්; කම්මං, කර්මය; වුත්තන්ති, උක්තයයි; වුච්චතෙ, කියනුලැබේ—යථා, යම්සේ; ඔදනං, ආහාරය; පචති, පිසයි යන; ආදෞ, මේ ආදිතන්හි; ඔදනසංඛාතං, ඔදනයයි කියනලද; කම්මං, කර්මය; දුතියාය, විතියාවිභක්තිවිසින්; වුත්තන්ති, කියනලදනුයි; පුන, නැවත; අත්තනා, තමාවිසින්; වත්තබ්බස්ස, කියයුතු; අපරිසෙසස්ස, අවශේෂයක්හුගේ; අභාවා, නැතිහෙයින්; න දුතියා, විතියා නොවේද; තථා, එසේම; අත්‍රාපි, මෙහිද; සමාසාදීහිඑව, සමාසාදීන් විසින්ම; විහාරාදීනං කම්මානං, විහාරාහාරෞදනධර්මාඛ්‍යකර්මයන්; කථිතත්තා, කියනලද හෙයින්; පුන, නැවත; තප්පකාසිකා, ඒ කර්මප්‍රකාශකරන්නාවූ; දුතියා, විතියාවිභක්තිතොම; න සියා, නොවන්නීයි.

2 විභත්තිං විනා ච, විභක්ති හැරද; අප්පං, අර්ථය; නිද්දිසිතුං, දක්වන්නට; අසක්කුණෙය්‍යත්තා, නොපිළිවන් හෙයින්; අවසිට්ඨ

කථං ඔදනම්පචතීත්‍යාදො, දුතියායපි කම්මෙ භූතෙන පුන ලිඞ්ගත්ථ මත්තාපෙක්ඛාය පඨමා න හොතීති චෙ?—කම්මමත්තෙන තාය පා කාවා වුත්තත්ත සන්තොපි ලිඞ්ගත්ථස්ස තිරොහිතත්තා. 1 ඔදනො පච්චතෙත්‍යත්‍ර එකත්තෙ තු තෙවිභත්තියා වුත්තෙපි තාය තං අසුතස්සෙවෙතස්සානියමෙත්වා සාමඤ්ඤෙනවුත්තත්තා ඔදනාදො වි සෙසෙ ඨිතං එකත්තං නිස්සාය එකවචනං හොතෙව—නනු— ආඛ්‍යාතා සාමඤ්ඤමත්ථං වදන්ති ස්‍යාදයො තු විසෙසං—යජ්ජෙවං වි සෙසගතං කම්මං නිස්සාය දුතියාපි කිං න හොතීති චෙ?—තස්ස තථාපිකම්මං සද්දසත්ති[illegible] අකථිතත්තා එවමෙතෙතයි—

---

අවශිෂ්ටවූ; ලිඞ්ගත්ථමත්තාපෙක්ඛායපන, ලිඞ්ගාර්ථමාත්‍රාපෙක්ෂාවක් ඇතිකල්හි වනාහි; විහාරාදිතො ච, විහාරාදිශබ්දයන් කෙරෙන් ද; නපුංසකතෙහි. ඔවුන්ට විශෙෂණවූ; තත්තුල්‍යාධිකරණෙහි, ඔවුන්ට තුල්‍යාධිකරණවූ; ආගතසමණාදීහි ච, ආගතසමණාදීන්. කෙරෙන්ද; පඨමා හොති, ප්‍රථමාවිභක්ති වේ—

ඔදනං පචතීති, ඔදනං පචති යන; ආදො, මේ ආදීන්හි; දුතියාපි, ද්විතීයාවිභක්ති විසින්ද; කම්මෙ, කර්මය; වුත්තෙ, කියනලදකල්හි; පුන, නැවත; ලිඞ්ගත්ථමත්ත, ලිඞ්ගාර්ථමාත්‍රයක්; අපෙක්ඛාය, අපෙක්ෂාකොට; පඨමා, ප්‍රථමා තොමෝ; කථං, කෙසේ; න හොතීති චෙ, නොවේදයත්?—කම්මමත්තෙන, කර්ම්මාත්‍රය; තාය ඒ විභක්තිවිශකාති විසින්; පාකාටා, ප්‍රකාශකොට වුත්තෙ සති, කියනලදකල්හි; සන්තොපි, විද්‍යමානවූද; ලිඞ්ගත්ථස්ස ලිඞ්ගාර්ථයා තමා; තිරොහිතත්තා, මුවාවූහෙයින් නොවේ. 1 ඔදනො පච්චතෙ ඉති, ඔදනො පච්චතෙ යන, අත්‍ර, මෙහි; එකත්තෙ තු, එකත්ව සංඛ්‍යාව වනාහි; තෙවිභත්තියා, තෙවිභක්ති විසින් වුත්තෙපි, කියනලදකල්හිද, තාය, ඒ විභක්තිය විසින්; තං, ඒ එකත්වසංඛ්‍යාව; අසුතස්සෙව, අසාවල්නුයත්වයයි; අනියමෙත්වා, නියම නොකොට; සාමඤ්ඤෙන, සාමාන්‍යයෙන්; වුත්තත්තා, කියනලදහුයි; ඔදනාදො, ඔදනාදීනනවී ඇති; විසෙසෙ, විශෙෂාර්ථයන්; ඨිතං, සිටියාවූ; එකත්තං එකත්වසංඛ්‍යාව, ආශ්‍රයකොට; එකවචනං, එකවචනය; හොතෙව, වේමැයි—නනු, ඒ එසේමැයි—ආඛ්‍යාතා, ආඛ්‍යාතප්‍රත්‍යයෝ; සාමඤ්ඤං, සාමාන්‍යවූ; අත්ථං, අර්ථය, වදන්ති, කියයි; ස්‍යාදයො තු, සිආදිනු වනාහි; විසෙසං, විශෙෂාර්ථය කියත්; යජ්ජෙවං, ඉදින් එසේ වූවහොත්; විසෙසගතං; විශෙෂගතවූ; කම්මං නිස්සාය, කර්මය නිසා; දුතියාපි, ද්විතීයාද; කිං න හොතීති චෙ, කුමැයි නොවේදයත්?—

කථමාගතසමණං විහාරං පස්සසි වෙ?—විහාරස්ස ආගමනකම්මභූතාවත්ථා සමාසෙන වුත්තා—දස්සනකම්මභූතමවත්ථං තු ජොතයිතුං දුතියා සියා. එවං කත්තාදිසු සාමිනි ච යථායොගං වුත්තත්තවිභත්තිවචනානි නෙතබ්බානි.

1 අප්පධානං දුහාදීනං නයාදීනං තු පධානකං,
කම්මං කම්මෙස්වනෙකෙසු වුත්තකම්මන්ති වුච්චති.

2 දුහ යාච රුධි පුච්ඡ භික්ඛ සාසු වචාදයො,
නි වහ හරාදයො ච උභයෙ තෙ විකම්මකා.

---

නාගතනම්පි, ඒ විශෙෂ්‍යයෙහි ඇත්තාද වූ; කම්මං, කර්මයතෙමේ; සද්දසත්තිසභාවතො, ශබ්දශක්තිස්වභාව හෙයින්; තෙවිභත්තියා එව, තෙවිභක්තිය විසින්ම; ගම්‍යතෙති, හඟවනු ලැබෙයි කියායි—ආගත, ආවාවූ ශ්‍රමණයන් ඇති; විහාරං, විහාරය; පස්සසි, බලව යනු; කථංවෙ, කෙසේවේදයත්?—විහාරස්ස, විහාරයාගේ; ආගමනකම්මභූතා, ආගමනක්‍රියාවට කර්මවූ, අවත්ථා, පූර්වඅවස්ථා තොමෝ; සමාසෙන, සමාසයා විසින්; වුත්තා, කියනලද—දස්සනකම්මභූතං, දකිනක්‍රියාවට කර්මවූ; අවත්ථං තු, උත්තරාවස්ථාව වනාහි; ජොතයිතුං, ප්‍රකාශකරන්නට; දුතියා සියා, ද්විතීයාවිභක්ති වන්නීයි.

එවං, මෙසේ; කත්තාදිසු, කර්තෘකාරකාදියෙහිද; සාමිනි ච, සාමිවිෂයෙහිද; යථායොගං, යෙදෙන යෙදෙන පරිද්දෙන්; වුත්තත්තවිභත්තිවචනානි, උක්තවූ විභක්ති වචන යන මොහු; නෙතබ්බානි, දතයුත්තාහුයි.

1 අනෙකෙසු කම්මෙසු, නොයෙක් කර්මයන් අතුරෙහි, දුහාදීනං, දුහාදිධාතූන් සම්බන්ධිවූ; අප්පධානකං කම්මං, අප්‍රධානවූ කර්මයද; නයාදීනං තු, නී ආදිධාතූන් සම්බන්ධිවූ; පධානකං කම්මං, ප්‍රධානවූ කර්මයද; වුත්තකම්මං ඉති, උක්තකර්මයයි; වුච්චතෙ, කියනු ලැබේ. 2 දුහ, දුහ පපූරණෙ යන ධාතුය; යාච, යාච යාචනෙ යන ධාතුය; රුධි, රුධි ආවරණෙ යන ධාතුය; පුච්ඡ, පුච්ඡ පුච්ඡනෙ යන ධාතුය; භික්ඛ, භික්ඛ යාචනෙ යන ධාතුය; සාසු, සාසු අනුසිට්ඨිම්හි යන ධාතුය; වචාදයො, වච වියත්තියං වාචායං යනාදී ධාතූහුද; නි, නී පාපුණනෙ යන ධාතුය; වහ, වහ පාපුණනෙ යන ධාතුය; හරාදයො ච, හර හරණෙ යනාදී ධාතූහුද යන; එතෙ උභයෙ, මේ දෙපක්ෂයෙහි ධාතූහු; විකම්මකා, විකර්මකධාතූහු නම් වෙත්.

තං යථා—ගොපාලෙන ගො ඛීරං දුය්හතෙ දුද්ධො වා—ඉහ ගොරූපං එකං කම්මං ඛීරලක්ඛණඤ්චෙකං කම්මං එතෙසු පයොජනත්තෙ නාභිමතං ඛීරං පධානං තන්නිමිත්තභූතා ගො අප්පධානා—තස්මා ගොහෙත්ථ වුත්තත්තා පඨමා—ඛීරන්ත්විහානුත්තත්තා කම්මනි දුතියා—එවං යාචාදීසු. දාසෙන භාරො ගාමං නීයතෙ නීතො වා—අත්‍ර නීයමානො භාරො පධානො තන්නිමිත්තං ගාමො අප්පධානං—තථා වහාදීසු.

ගතිබොධාහාරසද්දත්ථාකම්මකභාජනං,
කත්තා අකාරිතෙ යො සො තං වුත්තකම්මං හි කාරිතෙ.

යථා—අකාරිතෙ—දාසො ගාමං ගච්ඡති—කාරිතෙ තු සාමිනා දාසො ගාමං ගච්ඡාපියතෙ ගච්ඡාපිතො වා ඉච්චාදි. අකම්මකානං යථා—හත්ථි සයති—කාරිතෙ තු හත්ථාරොහෙන හත්ථි සයාපියතෙ සයාපිතො වා ඉච්චාදි.

---

තං යථා, ඒ මෙසේයි—ගොපාලෙන, ගොපල්ලාවිසින්; ගො, දෙන් තොමෝ; ඛීරං, ක්ෂීරය; දුය්හතෙ, දොනාලැබෙයි; දුද්ධො වා, දොනාලද්දයි කියාහෝ වේ—ඉහ, මෙහි; ගොරූපං, ගොස්වරූපවූ, එකං කම්මං, එක් කර්මයෙක; ඛීර ලක්ඛණඤ්ච, ක්ෂීරස්වරූපවූද; එකං කම්මං, එක් කර්මයෙක; එතෙසු, මේ කර්මයන් දෙදෙනා අතුරෙහි; පයොජනත්තෙන, ප්‍රයොජනහැවින්; අභිමතං, ඉෂ්ටවූ; ඛීරං, ක්ෂීරය; පධානං, ප්‍රධානය; තන්නිමිත්තභූතා, ඒ ක්ෂීරයට නිමිත්තවූ; ගො, දෙන් තොමෝ; අප්පධානා, අප්‍රධානය; තස්මා, එහෙයින්; ගොහි, ගො යන; එත්ථ, මෙහි; වුත්තත්තා, උක්තහෙයින්; පඨමා, ප්‍රථමාවෙයි; ඛීරන්ති, ඛීරං පන; ඉහ, මෙහි; අනුත්තත්තා, අනුක්තහෙයින්; කම්මනි දුතියා, කර්මයෙහි ද්විතීයාවිභක්ති වෙයි— එවං, මෙසේ; යාචාදීසු, යාචාදීන් විෂයෙහි දතයුතුයි—අඤ්ඤත්‍ර, සෙසුතැන්හිද; එවං, මෙසේමැයි.

දාසෙන, දාසයා විසින්; භාරො, භාරය තෙම; ගාමං, ගමට; නීයතෙ, පමුණුවනුලැබෙයි; නීතො වා, පමුණුවනලද්දයිහෝ වේ. අත්‍ර, මෙහි; නීයමානො, පමුණුවනුලබන්නාවූ; භාරො, භාරය තෙම; පධානො, ප්‍රධානය; තන්නිමිත්තං, ඊට නිමිත්තවූ; ගාමො, ග්‍රාමය තෙම; අප්පධානං, අප්‍රධානයි—තථා, එමෙස්ම; වහාදීසු, වහාදීන් කෙරෙහි දතයුතුයි.

1 යස්සප්පධානාප්පධානක්‍රියාසම්බන්ධතො සියා,
වුත්තානුත්තත්තතො තස්ස පඨමං හොති නාපරං.

2 යථා—බ්‍රාහ්මණෙන ඔදනො පචිත්වා භුඤ්ජිතො භුත්තො වා—අත්‍ර යදිපි එකමෙවොදනාඛ්‍යං කම්මං තෙනප්පච්චයෙහි වුත්තං—නුත්තප්පච්චයෙන තථාවුත්තම්පි සියා—තථාපි පධානතායාභිමතභොජනක්‍රියාභිසම්බන්ධවාරෙන වුත්තත්තා 'පධානප්පධානානං පධානෙන එව කාරියප්පසිද්ධි'ති කත්වා පඨමා එව *—භොජනක්‍රියාය විසෙසනතායප්පධානභූතපචනක්‍රියාය † සම්බන්ධවසෙනානුත්තත්තෙපි න දුතියා.

---

ගතී, ගමනය; බොධ, අවබොධය; අහාර, ආහාරය; සද්ද, ශබ්දය යන මොවුන්; අත්ථ, අර්ථකොටඇති ධාතූන්ගේද; හර, හර හරණෙ යන ධාතුය; කර, කර කරණෙ යන ධාතුය යනමොවුන්ගේද; අකම්මකානං, අකර්මකධාතූන්ගේද ප්‍රයොගයක් ඇති කල්හි; අකාරිතෙ, අකාරිතවිෂයෙහි; යො කත්තා, යමෙක් කර්තෘ ද; තං, ඒ තෙමේ; කාරිතෙ, කාරිතවිෂයෙහි; වුත්තකම්මං හි; උක්ත කර්මවේ.

2 යථා, මෙසේයි—අකාරිතෙ, කාරිතප්‍රත්‍යය නොකළකල්හි—දෙසො, දැස තෙමේ, ගාමං, ගමට; ගච්ඡති ය, යෙයි කියා වේ—කාරිතෙ තු, කාරිතප්‍රත්‍යය කළකල්හි වනාහි; සාමිනා, ස්වාමියා විසින් දෙසො, දැස තෙමේ; ගාමං, ගමට; ගච්ඡාපියතෙ, යවනුලැබෙයි; ගච්ඡාපිතො වා ඉති, යවනලද්දීහෝ යනු; ආදි, මේ ආදිය වේ.

අකම්මකානං, අකර්මකයන්ගේ ප්‍රයොගයෙහි; යථා. උදාහරණ මෙසේයි—හසති, හසී තෙමේ; සයති, සයනය කෙරේ—කාරිතෙ තු, කාරිතප්‍රත්‍යය කළකල්හි වනාහි; හත්ථාරොහෙන, ඇතරුවා විසින් හසී, හසනී තෙමේ; සයාපියතෙ, හොවනුලැබෙයි; සයාපිතො වා ඉති, හොවනලද්දීහෝ යනු; ආදි, මේ ආදිය වේ.

1 පධානාප්පධානක්‍රියාසම්බන්ධතො, ප්‍රධානාප්‍රධානක්‍රියාවන්ගේ සම්බන්ධහෙයින්; යස්ස, යම් කර්මයක්හුගේ; වුත්තානුත්තත්තතා, උක්තබවය අනුක්තබවය යන මොහු; සියා, වේද; තස්ස, ඒ කර්මය කියවමනාකල්හි; පඨමා හොති, ප්‍රථමා විභක්ති වෙයි; අපරං, අන්‍යවූ ද්විතීයාවිභක්ති නොවේ.

2 යථා, මෙසේයි—බ්‍රාහ්මණෙන, බ්‍රාහ්මණයා විසින්; ඔදනො,

---

* පඨමා හොතෙව, මුද්‍රිතපොත්. † පචනක්‍රියා, මුද්‍රිතපොත්.

භික්ඛිත්වා ඛිණිත්වා අසජ්ජුත්වා වා භොජනක්‍රියං කත්තුං සක්කාති තිභික්ඛා
දීනං සාමඤ්ඤභූතං භොජනක්‍රියං භික්ඛාදික්‍රියා*යතො ව්‍යවච්ඡින්දතී
ති පාකක්‍රියා භොජනක්‍රියාය විසෙසනං—තථා පචිත්වා දනංගහණ
මඤ්ඤං වා කත්තුම්පි සක්කාති දනාදීනං සාධාරණස්ස පචනස්ස
භොජනක්‍රියාය දනාදිතො විසෙසියමානත්තා පචනම්පි විසෙසනං?.
සච්චං—තථාපි පචනමප්පධානං—ත්වාපච්චයෙන වුච්චමානත්තා—ත්වා
පච්චයාභිධීයමානා හි ක්‍රියා කම්පධුත්තරක්‍රියමපෙක්ඛතීත්‍යප
ධානා.

---

ආහරය; පචිත්වා, පීස; භුඤ්ජති, අනුභවකරනුලැබෙයි; භුඤ්ජතා
වා, කනලද්දයි හෝ වේ—අත්‍ර, මෙහි; යදිපි, ඉදිනුත්; එකමෙව. එ
කම; ඔදනාඛ්‍යං, ඔදන නම් වූ; කම්මං, කර්මය තෙම; නෙතප්පච්ච
යෙහි, තෙ ත ප්‍රත්‍යයන් විසින්, වුත්තං; උක්තය; ත්වාපච්චයෙන
තු, ත්වා ප්‍රත්‍යයා විසින් වනාහී; අවුත්තමපි සියා, අනුක්තද වන්නේ
ය; තථාපි, එතකුදුවුවත්; පධානතාය, ප්‍රධානබැවින්; අභිමත,
කැමතිවනලද්දවූ; භොජනක්‍රියාභිසම්බන්ධමාරෙන, භොජනක්‍රියා
වන්ගේ සම්බන්ධපාසෙන්; වුත්තත්තා, උක්තහෙයින්; පධානප්පධා
නානං, ප්‍රධානාප්‍රධානයන්අතුරෙහි; පධානෙ එව; ප්‍රධානයා කෙරෙ
හිම; කාරියසම්පත්ති, කාර්‍ය්‍යයාගේ ප්‍රතිපත්ති† යනු; ඤායා, යුක්තියෙ
යන්; පඨමා එව, ප්‍රථමාම වේ—භොජනක්‍රියාය, භොජනක්‍රියාවට; වි
සෙසනතාය, විශෙෂණබැවින්; අප්පධානභූත, ප්‍රධානනූවූ; පචන
ක්‍රියාය, පාකක්‍රියාවගේ; සම්බන්ධමුඛෙන, සම්බන්ධමාරයෙන්; අවු
ත්තත්තෙපි, අනුක්තකල්හිද; න දුතියා, විභක්තිනොවේ. භික්ඛිත්වා,
සිඟාද, ඛිණිත්වා, මිලදී ගෙනද; අසජ්ජුත්වා වා, අනික් පරිද්දෙකින්
හෝ; භොජනක්‍රියා, භොජනක්‍රියාව: කත්තුං, කරන්නට: සක්කා
ති, පිළිවනැයි; භික්ඛාදීනං, භික්ෂාදිවූ ක්‍රියාවන්ට; සමඤ්ඤභූතං,
සාධාරණවූ; භොජනක්‍රියං, භොජනක්‍රියාව; පාකක්‍රියා පචනක්‍රියා
තොමෝ, භික්ඛාදික්‍රියාතො, භික්ෂණය ක්‍රිණනය යනාදික්‍රියාවන්
කෙරෙන්; ව්‍යවච්ඡින්දති, පිරිසිඳේනුයි; පාකක්‍රියා, පචනක්‍රියා
තොම; භොජනක්‍රියාය, භොජනක්‍රියාවට; විසෙසනං, විශෙෂණයි

පචිත්වා, පිස; දනං වා, දීමහෝ; ගහණං වා, ගැන්මහෝ; අ
ඤ්ඤං වා, අනිකක්හෝ; කත්තුම්පි, කරන්නටද සක්කාති, පිලිවන්
නුයි; දනාදීනං, දනාදීන්ට; සාධාරණස්ස, සාමාන්‍යවූ; පචනස්ස
පචනක්‍රියාව නම්; භොජනක්‍රියාය, භොජනක්‍රියාව විසින්; දනාදි
තො, දනග්‍රහණාදික්‍රියාවෙන්; විසෙසියමානත්තා, වෙනස්කරණ
ලබනහෙයින්; පචනම්, පචනක්‍රියාවද; විසෙසනං නනු. විශෙෂණ

---

* ක්‍රියතො, මුද්‍රිතපොත් —† ද්‍රාපතීය, පොත්.

1 යාව පදචයං කිඤ්චි සම්බන්ධමුපලබ්භතෙ,
විසෙසනවිසෙස්සත්තං ගම්‍යතෙ තාව නාමතො.
2 යස්මා හි යබ්භෙදබුද්ධි හොති තං තබ්බිසෙසනං,
තච ජාතිගුණක්‍රියා දබ්බනාමාන්‍යනෙකධා.
3 යථා ගො ධවලො ගන්තා විසාණී දෙවදත්තකො,
ජාත්‍යාදිපි විසෙස්සන්තො නිස්සයෙහි සකෙහි තු.
4 තං යථා ජාති ගාවස්ස ධවලො ගමනං තථා,
විසාණං නාමම්පිච්චෙවං ජාත්‍යාදීනං විසෙස්සතා.
5 අඤ්ඤං විසෙසයන්තීති පරියායො විසෙසනං,
තං යථා ගොති කථිතෙ වාචාත්‍යෙසො විසෙස්සතෙ.

---

චන්නේ නොවේද?—සච්චං, සැබැව්; තථාපි, එතකුදුවුවත්; පච නං, පචනක්‍රියාව; අප්පධානං, ප්‍රධාන නොවෙ—(කවරහෙයිනයත්) ත්‍යාඛ්‍යාතත, ත්‍යා ප්‍රත්‍යයාන්තයා විසින්; උච්චමානත්තා, කියන ලබනහෙයිනි—ත්‍යාතෙතත, ත්‍යා ප්‍රත්‍යයාන්තයා විසින්; අභිධීයමා නා, කියනලබන්නාවූ; ක්‍රියා හි, ක්‍රියාව වනාහි; කම්පි, කිසි; උපාත රක්‍රියං, මතු වන ක්‍රි යාවක්; අපෙක්ඛතීති, අපෙක්ෂාකෙරේනුයි; අප්පධානා, ප්‍රධානනොවේ.

.....................................

1 යාව කිඤ්චි පදචයං, යම් කිසි පදචයෙක්; සම්බන්ධං, අන්‍යොන්‍ය සම්බන්ධය; උපලබ්භතෙ, පැමිණේද; තාව, එතැන්හි; විසෙස නවිසෙස්සත්තං, විශෙෂණ විශෙෂ්‍යත්වය; නාමතො, වචනාදී ශබ්ද පරිද්ඡෙදන්; ගම්‍යතෙ, දන්නාලැබේ. 2 යස්මා හි, යම් හෙයකින්; යබ්භෙදබුද්ධි හොති, යමක්හුගේ භෙදයෙහි බුද්ධියෙක් වේද; තං, ඒ තබ්බිසෙසනං, ඊට විශෙෂණය; තච, ඒ විශෙෂණයද; ජාති, ජාති ය, ගුණ, ගුණය; ක්‍රියා, ක්‍රියාවය; දබ්බං, ද්‍රව්‍යය; නාමං ඉති, නා මයයි, අනෙකධා, නොයෙක් පරිද්ඡෙදන් වෙ. 3 යථා, ඊට උදාහර ණ මෙසේයි; ගො, ගොන් තෙමේ; ධවලො, සුදුය; ගන්තා, යෙයි; විසාණී, අං ඇත්තේය; දෙවදත්තකො, දෙව්දත් නම්; ජාත්‍යාදිපි, ජාත්‍යාදිහුද; සකෙහි නිස්සයෙහි තු, ස්වකීයවූ නිශ්‍රයෙන් වනාහි; විසෙස්සන්තො, වෙසෙසනුලැබෙත්. 4 තං යථා, ඊට උදාහරණ මෙසේයි; ගාවස්ස, ගොපදහිමියාගේ; ජාති ජාතිය; ධවලො, ඔහු ගේ ධවලත්වය; ගමනං, ඔහුගේ යාමය; තථා, එසේම; විසාණං, ඔහුගේ අඟය; නාමං ඉති, නාමයයි; එවං, මෙසේ; ජාත්‍යාදීනං, ජාතිආදීන්ට; විසෙස්සතා, විශෙෂ්‍යත්වය වේ.

5 අඤ්ඤං, අනිය; විසෙසයන්තීති, වෙසෙසානුයි; පරියායො, පරි යායශබ්දය තෙම, විසෙසනං, විශෙෂණ වේ; තං යථා, ඊට උදාහර ණ මෙසේයි; ගොති, ගො යි කියා; කථිතෙ, කීකල්හි, වාචා ඉති වාචා යන; අඤ්ඤො, අනිය; විසෙස්සතෙ, වෙසෙසනුලැබේ.

ගොසද්දො පසුභූමිවාචාදයත්‍ථවාචී—තස්මා ගොති වුත්තෙ කො වාත්‍ථොති නාප්පතීයතෙ—පුන පරියායභූතවාචාසද්දප්පයොගෙ තු වචනසඞ්ඛාතො අත්‍ථො විඤ්ඤායති—තත්‍ථ සකලඛණ්ඩමුණ්ඩාදිබ්‍යත්තනුයායී ගොත්තාදිසාමඤ්ඤං ජාති—දබ්බනිස්සිතො නීලාදිකො ගුණො—ක්‍රියා වුත්තලක්ඛණා—ජාත්‍යාදීනමාධාරො දබ්බං—පවත්තිනිවුත්තිසඞ්ඛාතවොහාරත්‍ථං කරීයමානො සඞ්කෙතො නාමං නාම—අභිධානභෙදො සද්දො පරියායො.

විසෙස්සාදිසමානා ත්‍ව' ලිඞ්ගසඞ්ඛ්‍යාවිභත්තිකා,
තුල්‍යාධිකරණෙ භිය්‍යො කත්තබ්බා තා විසෙසනෙ.

තුල්‍යාධිකරණෙති කිං?—රඤ්ඤො ධනං—භිය්‍යොති කිං?—ගුණා පමාණං—කථං චිත්තානි වීසති ජායන්තීති චෙ?—වීසතිසද්දො අත්‍ථනො නියතිත්‍ථිලිඞ්ගෙකවචනත්තා චිත්තසද්දස්ස විභත්තිවචනං ගණ්හාති—ආඛ්‍යාතිකානං අලිඞ්ගත්තා ලිඞ්ගං ගහිතුං නාරහන්තී'විසෙස්සස්ස වචනමත්තමපෙක්ඛන්ති තස්මා ජායන්තීති බහුවචනම්පි චිත්තාපෙක්ඛමෙව—කිං වීසතිමපෙක්ඛිත්වා එකවචනම්පි න භොතීති චෙ?—වීසතියා චිත්තවිසෙසනභූතත්තාඅප්පධානත්තා—නයො යමඤ්ඤත්‍රාපි ඤෙය්‍යො.

---

ගොසද්දො, ගො ශබ්දය තෙම; පසු, ගෙරිය; භූමි, භූමිය; වාචාදි, වචනය; යනාදිවූ; අත්‍ථවාචී, අර්ථවාචකය; තස්මා, එහෙයින්; ගොති, ගොයි; වුත්තෙ, කීකල්හි; කො වාත්‍ථොති, කවර අර්ථයෙක් දෝහෝයි; නාප්පතීයතෙ, නොහැඟෙයි; (එහෙයින්) පුන, නැවත; පරියායභූත, පර්‍ය්‍යායවූ; වාචාසද්දප්පයොගෙ තු, වාචා ශබ්දයාගේ; ප්‍රයෝගයක් ඇතිකල්හි වනාහි; වචනසංඛාතො, වචනාඛ්‍යවූ; අත්‍ථො, අර්ථය තෙම; විඤ්ඤායති, හැඟේ—තත්‍ථ, එහි; සකල, සියලු; ඛණ්ඩමුණ්ඩාදි, ඛණ්ඩය මුණ්ඩය යනාදිවූ; බ්‍යත්ති, විශෙෂය; අනුයායී, අනුවයන්නාවූ; ගොත්තාදි, ගොත්ව යනාදිවූ; සාමඤ්ඤං; සාමාන්‍යය; ජාති, ජාති නම—දබ්බනිස්සිතො, ද්‍රව්‍යය ඇසුරුකලාවූ; නීලාදිකො, නීලාදිය; ගුණො, ගුණ නම—ක්‍රියා, ක්‍රියා තොමෝ; වුත්තලක්ඛණා කියනලද ලක්ෂණඇත්තීයි— ජාත්‍යාදීනං, ජාත්‍යාදීන්ට; ආධාරො, ආධාරවූයේ; දබ්බං, ද්‍රව්‍ය නම්—පවත්තිනිවුත්තිසංඛාත, ප්‍රවෘත්ති නිවෘත්තියයි කියනලද; වොහාරත්‍ථං, ව්‍යවහාරය පිණිස; කරියමානො, කරනලබන; සංකෙතො, සලකුණ; නාමං නාම, නාම නම්—අභිධානභෙදො, නොයෙක්වූ අර්ථ ඇති; සද්දො, ශබ්දයතෙමේ; පරියායො, පර්‍ය්‍යාය නම්.

(2) අනුත්තකම්මං යථා—අත්‍ර සමාස තද්ධිතානං සකං සකං වත්ථු මෙවොදහරණං කතත්තා—එවමනුත්තකත්තරි—සූදො ඕදනං පචති—බුද්ධො ධම්මං දෙසිතවා—එත්ථ සමාසතද්ධිතාඛ්‍යාතකිත කාකාරම්භස්මිං න කත්තාති තෙහි කම්මමනුත්තන්ති වුච්චති—තතො නාම්හෙව දුතියා—එවං කත්තාදිස්වනුත්තත්තං ඤෙය්‍යං. අනෙකකම්මකානං යථා—ගොපාලො ගාවිං ඛීරං දොහති, දුද්ධවා වානාදි—දුම්මා භාරං ගාමං නයති, නීතවාවානාදි—ගාවිං ගාමනත්‍රුහයත් "යං කරොති තං කම්මං" තිහානුවත්තිතවාකාරෙන කම්මසඤ්ඤා. සාමි දසං ගාමං ගමයති, දසෙසන වා—දසගොත්ථ "ගතිබුද්ධිභුජපඨහරකරසයාදීනං කාරිතෙ වා"ති කාරිතෙ සති වා දුතියා පයොබ කතනාරි තතියා—ගාමන්නාත්‍ර තු පුබ්බව වාකාරෙන කම්මසඤ්ඤා—එවං ගරු සිස්සං ධම්මං බොධයති, සිස්සෙන වාතාදි—අකම්මකානං යථා—භසාමරාභො භන්ති සායති, භණිතාවාවාදි.

.........................................

විසෙසස්ස, විශෙෂණයා කෙරෙහි; දිස්සමානා, දක්නාලබන්නාවූ; යා ලිඞ්ගසංඛ්‍යාවිභත්තියො, යම් ලිඞ්ග සඞ්ඛ්‍යා විභක්ති කෙනෙක් ඇද්ද; තා, ඔහු; තුල්‍යාධිකරණෙ, සමානාධිකරණවූ; විසෙසනෙ, විශෙෂණයා කෙරෙහි; යෙභුය්‍යෙන, බොහෝසේ; කාතබ්බා, කාමැත්තානුයි.

තුල්‍යාධිකරණෙති, තුල්‍යාධිකරණෙ යනු; කිං කුමටද?—රූපසද්දං ධන, යත තන්හි නොවන පිණිසයි—තියොසාති, තියොයනු; කිං, කුමටද?—ගුණා පමාණං, යත තන්හි නොවන පිණිසයි—වීසති චිත්තානි, වීසති චිත්තයෝ; ජායන්තීති, උපදිති යනු; කථංනාම එව, කෙසේදයත්!—වීසතිසද්දො, වීසති ශබ්දය තෙමේ; අත්තනො, තමා; නියතිපිලිඞ්ගකවචනත්තා, නියතවූ ලිඞ්ගයා එකවචන ඇතිහෙයින්; චිත්තසද්දස්ස, චිත්ත ශබ්දයාගේ; විභත්තිමත්තං, විභක්තිමාත්‍රයක්; ගණ්හාති, ගණී; ආඛ්‍යාතිකනතු. ආඛ්‍යාතපදය වනාහි; අලිඞ්ගත්තා, ලිඞ්ග නැතිහෙයින්; ලිඞ්ගං, ලිඞ්ග; ගහිතුං, ගන්නට; නාරහතීයි, නොපොහොසත්තුයි; විසෙසස්ස, විශෙෂ්‍යයාගේ; වචනමත්තං, වචනමාත්‍රයක්; අපෙක්ඛතෙ, අපෙක්ෂා කෙරේද; තස්මා, එහෙයින්; ජායන්තීති, ජායන්ති කියා; බහුවචනම්පි, බහුවචනයද; චිත්තාපෙක්ඛමෙව, චිත්ත ශබ්දය අපෙක්ෂාකොට ඇත්තේමැයි—වීසතිමපෙක්ඛිත්වා, වීසති ශබ්දය

(3) වුත්තකත්තා යථා—ජිතින්ද්‍රියො මුනි—ආභිධම්මිකො භික්ඛු—සූදො ඔදනං පචති—පුඤ්ඤකාරො පුමා.

වුත්තකත්තාති සො ඤෙය්‍යො යො මුඛ්‍යො නෙකකත්තුසු,
උස්සාහවන්තො මුඛ්‍යො සො යො කත්තාරං පයොජයෙ.

යථා—සූදපෙරකො සූදෙන ඔදනං පාචෙති—සූදපෙරකොත්‍යත්‍ර "ණ්‍යාකාරිති සඤ්ඤා"ය් හෙතුකත්තුසඤ්ඤා—වුත්තත්තා පඨමා ච—සූදෙනෙත්‍යත්‍ර තු "යො කරොති සකත්තා"ති කත්තුසඤ්ඤා—අනුත්තත්තා තතියා ච—එවමුත්තරත්‍ර.

---

අපෙක්ෂා කොට; එකවචනම්පි, එකවචනද; කිං න හොතීති චෙ කුමැයිනොවේදැයත්?—විසයියා, විසයි ශබ්දයා තම්; චිත්තාදිසෙ සනාගුතනාය. චිත්ත ශබ්දයට විශෙෂණහෙයින්; අප්පධානත්තා, අප්‍රධානබැවිනි—අයං නයො, මේ නය තෙම; අනුසන්‍යායි, සෙනු නැත්හිද; ඤෙය්‍යො, දතයුතුයි.

---

(2) අනුත්තකම්මං, අනුක්තකර්මය; යථා මෙසේයි—අත්‍ර, මේ අනුක්තකර්මයෙහි; සමාසතද්ධිතානං, සමාස තද්ධිත දෙදෙනාට; සකං සකං වාක්‍යමෙව, තමතමා පිළිබඳවූ වාක්‍යයම; උදාහරණං කාතබ්බං, උදාහරණ කටයුතුයි—එවං, මෙසේ; අනුත්තකම්මාදි, අනුක්තකර්මයෙහිද වේ—සූදො, අරක්කැමි තෙම; ඔදනං, බත; පචති, පිසේ—බුද්ධො සර්වඥ තෙම; ධම්මං, ධර්මය, දෙසිතවා, දෙසී—එත්ථ, මෙහි; සමාසතද්ධිතාබ්‍යාත කිතකා, සමාසය තද්ධිතය ආඛ්‍යාතය කිතකය යන මොහු. කම්මස්මිං, කර්මයෙහි; න කථාති, නොකරතලද්දාහුයි; එතෙහි, ඔවුන් විසින්; කම්මං, කර්මය; අනුත්තත්තා, අනුක්තායහි; වුච්චතෙ, කියනුලැබේ—තස්මා, එහෙයින්; කම්මෙ, කර්මයෙහි; දුතියා, විභක්තිය වේ—එවං, මෙසේ; කාතාදිසු, කාතාදියෙහි, අනුත්තත්තං, අනුක්තාර්ථය; ඤෙය්‍යං, දතයුතුයි. අනෙකකම්මකානං, නොයෙක් කර්මයන්ට; යථා, උදාහරණ මෙසේයි—ගොපාලො, ගොපලු; ගාවිං, දෙන්; ඛීරං, කිරය; දොහති, දොවෙයි; දුබ්බා මා ඉයි, දෙවියනෝ යන; ආදි, මේ ආදිය වේ—දාසො, දාස තෙමේ; භාරං, භාරය; ගාමං, ගමට; නයති, පමුණුවයි; නීතවා වා ඉයි, පැමිණවියනෝ යනා; ආදි, මේ ආදිය වේ—ගාවිං ගාමිං ඉයි, ගාවි ගාමං යනා; උභයත්‍ර, දෙතැන්හි; "සං කාරෙති තං කම්මං"ඉති—පෙ—යනා;

පයොජකොපි සො අඤ්ඤං, යදා පන පයොජයෙ,
වුත්තකත්තා තදා එසො නසමාපජ්ජස්සාභිගතො.

යථා—අම්බෙවා සූදපෙජෙන සූදෙන ඔදනං පාචෙති, පාචයති ත්‍යාදි වා—එත්‍ථ දුතියහෙතුවචනිච්ඡායං කාරිතන්තස්මාපි පුන ණෙ ණයාදි හොන්ති*—පුබ්බස්ස කාරිතස්ස යදද්දිනා ලොපො කාතබ්බො—සූදපෙජෙන සූදෙනාත්‍ර අනුත්තත්තා කත්තරි තතියා.

කාරියමානං යං කම්මං සයමෙවප්පසිජ්ඣති,
සුකරං සෙහි ගුණෙහි කම්මකත්තාති තං විදූ.

---

ඉහ, මේ සූත්‍රයෙහි; අනුවත්තිත, අනුවෘත්ත කරනලද; වා, කාරෙන වා ශබ්දග්‍රහණයෙන්, කම්මසඤ්ඤ, කර්මසංඥ වේ—සාමි, ස්වාමි තෙම; දාසං, දාසයා; ගාමං, ගමට; ගමයති, යවා; දාසෙන වා දාසයාලවා යයිවහෝ වේ—දාසනාති, දාසං යන; එත්, මෙහි; "ගතිබුද්ධිභුජපඨහරකරසයාදිනං කාරිතෙ වා"ඉති—පෙ—යන සූත්‍රයෙන්; කාරිතෙ සති, කාරිතප්‍රත්‍යයක් ඇතිකල්හි; වා, විකල්පයෙන්; දුතියා, විතීයාවිභක්ති වේ; පයොගෙ, ප්‍රයෝගයෙහි; ක්‍රියාකාරි, කර්තෘකාරකයෙහි; තතියා, තෘතීයා වේ—ගාමා ඉති, ගාමං යන; අත්‍ර තු, මෙහි වනාහි; පුබ්බෙව, පෙරපරිද්දෙන්ම; වාකාරෙන, වා ශබ්දග්‍රහණයෙන්; කම්මසඤ්ඤ, කර්මසංඥ වේ—එවං, මෙසේ; ගරු, ආචාර්ය තෙම, සිස්සං, ශිෂ්‍යයා; ධම්මං, ධර්මය; බොධයති, දන්වයි; සිස්සෙන වා ඉති, ශිෂ්‍යයාලවාහෝ යන; ආදි, මේ ආදිය වේ—අකම්මකානං, අකර්මකධාතූන්ට; යථා, මෙසේයි—හත්‍ථාරොහො, ඇතරු තෙම; හත්‍ථිං, ඇතු; සායති, ශයවයි; හත්‍ථිනා වා ඉති, හස්තිනාවා යන; ආදි, මේ ආදිය වේ.

---

((3) වුත්තකත්තා, උක්තකර්තෘ තෙමේ, යථා, මෙසේයි—ජිතින්ද්‍රියො, දිනනලද ඉඳුරන්ඇති; මුනි, භික්ෂුයි—ආසිධම්මිකො, අභිධර්මය දන්නාවූ; භික්ඛු, භික්ෂුයි— සූදෙ, අරක්කැමි තෙම; ඔදනං, බත; පචති, පිසෙයි—පුඤ්ඤකාරෝ, පින්කරන්නාවූ; පුමා, පුරුෂයි.

අනෙකකත්තුසු, නොයෙක් කර්තෘන් ඇති ධාතූන්විෂයෙහි; යො, යමෙක්; මුඛ්‍යො, ප්‍රධානද; සො, එ තෙම; වුත්තකත්තාති, උක්තකර්තෘයි; සෙසො, අනුක්තතෙය; උපසාභවිතො, උතසා

---

*ණෙ හොති, මුද්දිතපොත්.

කුසූලො සයමෙව භිජ්ජතෙ—කුසූලො. බලූ අත්‍තෙසු ලෙඩ්ඩුසක්ඛරාදිසු පීළෙන්තෙසු පරප්පයොගං විනා ඡිදුමුපගච්ඡන්තො අත්තනා එව භිජ්ජතෙ නාම, තතො කම්මභූතො ච කත්තුභූතො ච සො එව—කම්මකත්තා කම්මමිවෙති වත්තබ්බං කම්මාපදෙසතො ච කම්මකත්තරිපි කම්මනි විය අත්තනොපදයවිකරණා සිද්ධන්ති—ඉදම් සද්දවිදා සම්මතං.

---

(4) අවුත්තකත්තා යථා—සූදෙන ඔදනො පච්චතෙ—පුවුත්තා ද්වික්කු සානං—අනෙකකත්තුකානං යථා—සූදජෙකෙන සූදෙන ඔදනො පාචාපියතෙ—අමච්චෙන සූදජෙකෙන සූදෙන ඔදනො පාචාපියතෙ—තීසු නයියා.

---

භවන් හෙයින්, සො, යමෙක්; කාරකො, කර්තෘ; පයොජයෙ, ක්‍රියායෙහි මෙහෙයාද; සො, හෙතෙම; මුඛ්‍යො, ප්‍රධාන නම් වේ.

යථා, මෙසේයි—සූදජෙකො ඉති, සූදජෙකො යන; අත්‍ර, මෙහි; "යො කාරෙති සහෙතු"ඉති, "යො කාරෙති සහෙතු"යි; හෙතුකත්තුසඤ්ඤො, හෙතුකර්තෘසංඥ වේ—වුත්තකත්තා, උක්තවෙහෙයින්; පඨමා ච, ප්‍රථමාද වේ—

සූදෙන ඉති, සූදෙන යන; අත්‍ර තු, මෙහි වනාහි; "යො කාරෙති සකත්තා" ඉති, "යො කාරෙති සකත්තා"යි; කත්තුසඤ්ඤො, කර්තෘසංඥ වේයි—අවුත්තකත්තා, අනුක්තහෙයින්; තතියා ච, "කත්තරි ච"යි තෘතියාද වේ—උත්තරත්‍ර, මත්තෙහිද; එවං, මෙසේමැයි. යදා පන, යම් කාලෙක්හි වනාහි; සො අඤ්ඤො, යම් අනිකෙක්; පයොජකම්පි, හෙතුකර්තෘද; පයොජයෙ, ක්‍රියායෙහි මෙහෙයාද; තදා, එකල්හි; එසො. මේ හෙතුකර්තෘ මෙහෙයන තැනැත්තේත්; වුත්තකත්තා, උක්තකර්තෘනම්; (කවර හෙයින යත්) තස්මාපි, ඒ හෙතුකර්තෘහටද එබඳු, උක්තානුවර්තනයෙන්, උත්සාහදෑ හිඟයෙයිනි.

යථා, මෙසේයි—අමච්චො, ඇමති තෙම; සූදජෙකෙන. සූදජෙකයාලවා; සූදෙන, අරක්කැමියාලවා; ඔදනං, ආහාරය; පාචෙති, පිසවා; පාචයන් ඉති, පාචයති යන; ආදි වා, මේ ආදියෙහෝ වේ—එත්‍ථ, මෙහි; දුතියහෙතුවචනිච්ඡාතො, දෙවෙනි හෙතුවක් කියපිහෙයින්; කාරිතගනයමාපි, කාරිතාගනයා කෙරෙතුදු; පුන, නැවත; ණෙ ණයාදි හොනානි, ණෙ ණයාදිහු වෙත්—පුබ්බස්ස කාරිතස්ස, පූර්වවූ කාරිතයහට; යදාදිනා, යදාදිසූත්‍රයෙන්; ලොපො කාතබ්බො, ලොප්කටයුත්තේයි—සූදජෙකෙන සූදෙන ඉති;

යස්සප්පධානාප්පධානක්‍රියාසම්බන්ධතො ඊදිසං,
අනුත්තත්තා තතො තතියා හොති තා පරා.

යථා—බ්‍රාහ්මණෙන භුත්වා සුප්පතෙ—එත්ථ සුප සයනෙ ඉච්චස්සාකම්මකත්තා භාවෙව තෙප්පච්චයො හොති, භාවො ච සාධනරූපත්තා කත්තාරම්පෙක්ඛතෙ, කත්තා ච තෙනාභිහිතත්තා න වුත්තො. ත්වාප්පච්චයෙන පන වුත්තො නාම තස්ස කත්තරි කතත්තා. තථාපි පධානභූතක්‍රියාසම්බන්ධාපායෙන අවුත්තත්තා තතියා, න අප්පධානභොජනක්‍රියා* සම්බන්ධමත්තෙන වුත්තත්තෙනාපි පඨමා.

---

සූදජෙසෙන සූපදන යන; උභයත්‍ර, දෙතැන්හි; අවුත්තත්තා, අනුක්තහෙයින්; කත්තරි, කර්තෘකාරකයෙහි; තතියා, තෘතීයා වේ—

කරියමානං, කරනලබන්නාවූ; යං කම්මං, යම් කර්මයක්; සයමෙව, තෙමේම; පසිජ්ඣති සිද්ධ වේද; සෙහි ගුණෙහි, ස්වකීය ගුණයෙන්; සුකරං, මොනවට කටයුත්තේද; තං, ඒ; කම්මකත්තාසි, කර්මකර්තෘයයි. විදූ, වෛයාකරණයෝ දනිත්.

යථා, මෙසේයි—කුසූලො, කොටුව; සයමෙව, තෙමේම; භිජ්ජතෙ, බිඳුනුලැබේ—

කුසූලො බලු, කොටුව† වනාහි; අත්තනෙව, තමා කෙරෙහි පිහිටියාවූ; ලෙඩ්ඩුසක්ඛරාදිසු, කැටසැබලිහිනතුරු ආදීන්; ජිණ්ණෙසු, දිරාගියකල්හි; පරප්පයොගං විනා, අනුන්ගේ ප්‍රයොගයක් නැතිවම; භෙදං, බිඳීමට; උපගච්ඡන්තො, පැමිණෙන්නේ; අත්තනා එව, තමා විසින්ම; භිජ්ජතෙ නාම, බිඳිනලබන්නේ නම්; තතො, එසේහෙයින්; කම්මභූතො ච, කර්මවූයේද; කත්තුභූතො ච, කර්තෘවූයේද; සො එව, එම කොටුවමැයි—කම්මකත්තා, කර්මකර්තෘ නම්; කම්මමිවෙති, කර්මය මෙනැයි; වත්තබ්බං, කියයුතුයි; (ක්‍රමටය යන්). කම්මාතිදෙසතො ච, කර්මයාවැනිකොට කීමෙන්ද; කම්මකත්තරිපි, කර්මකර්තෘයෙහිද; කම්මනි විය, කර්මයෙහි මෙන්; අත්තනොපදයවිකරණා, ආත්මනෙපදය යවිකරණය යන දෙදෙන; සිජ්ඣන්ති, සිඬවෙත්; ඉදඤ්ච, මේ කර්මයවැනිබවද, යදාදිනා, යදාදිසූත්‍රයෙන්; සඞ්ගහිතං, ඇතුලත් කරනලදී.

(4) අවුත්තකත්තා, අනුක්තකර්තෘ තෙමේ; යථා, මෙසේයි—සූදෙන, අරක්කැමියා විසින්, ඔදනො, ආහාරය; පච්චතෙ, පිසනුලැබේ—පුරිසෙන, පුරුෂයා විසින්; පුඤ්ඤං, කුසලය තෙමෙ; කතං, කරනලදී—අනෙකකත්තුකානං, අනෙකකර්තෘන්ට; යථා, උදාහරණ මෙසේයි—සූදජෙසෙන, සූදජෙසයා විසින්; සූදෙන; සූදයාලවා; ඔදනො, ආහාරය; පාචාපියතෙ, පිසවනුලැබේ—අමච්චෙන, අමාත්‍යයා විසින්; සූදජෙසෙන, සූදජෙසයාලවා; සූදෙන, අරක්කැමියාලවා; ඔදනො, ආහාරය; පාචාපියතෙ, පිසවනුලැබේ—තීසු, තුන්තැන්හි; තතියා, තෘතීයා වේ.

---

* භොජනක්‍රියාහි, මුද්‍රිතපොත්.

† සුණ්ණකොටුහි, පොත්.

වුත්තසම්පදානං යථා—දින්නසුඞ්කො රාජා—දක්ඛිණෙය්‍යො භික්ඛු—සම්පදාතා බද්ධො—වුත්තාපාදානං යථා—නිග්ගතජනො ගාමො—භීමො රක්ඛසො—වුත්තොකාසො යථා—මිත්තමාතඞ්ගං වනං—රුක්ඛවා දෙසො—ආසනං පීඨං—වුත්තසාමී යථා—දසබලො ගග වා—වෙණිකො ගන්ධබ්බො.

1 සමාසො භොති සබ්බත්ථ කිත්තෙසො සාමිවජ්ජිතෙ,
තබ්බිතො ලබ්භතෙ භියෙ‍යා කරණා වධිවජ්ජිතෙ.

2 ආඛ්‍යාතං කත්තුකම්මෙසු කරණාදීනං වභාසිත,
සං සං වාක්‍යමුදාහාරෙ ඉති නාත්‍යනුද්දහට.

වුත්තානුත්තානං දිසාමත්තමිදං, නයෙනානෙන වක්ඛමානම්පි නෙතබ්බං.

---

5 වත්තකරණං යථා—ඡින්නරුක්ඛො ඵරසු—පහරණං ආයුධං—

---

පධානප්පධානක්‍රියාසම්බන්ධතො, ප්‍රධානාප්‍රධාන ක්‍රියාසම්බන්ධහෙයින්; යස්ස, යම් කර්තෘවක්හුගේ; අනුත්තවුත්තතා, අනුක්තබවය උක්තබවය යන දෙදෙනු; සියුං, වෙද්ද; තස්ස, ඒ කර්තෘව කිවමනා කල්හි; තතියා හොති, තෘතීයාවිභක්ති වෙයි; අපර න, අනිකවු ප්‍රථමා විභක්ති නො වේ.

යථා, මෙසේසි—බ්‍රාහ්මණෙන, බ්‍රාහ්මණයා විසින්; භුත්වා, අනුභවකොට; සුප්‍යතෙ, නිදිඉසි—එත්ථ, මෙහි; සුප සයනෙ ඉති, සුප සයනෙ යන; අස්ස, මේ ධාතුහු නමා; අකම්මකත්තා, අකර්මක හෙයින්; භාවෙ, භාවයෙහි; තෙ විභත්ති හොති, තෙ විභක්ති වෙයි; භාවො ච, භාවයද; සාධ්‍යරූපත්තා, සාධ්‍යමානස්වරූපහෙයින්; කත්තාරං, කර්තෘහු; අපෙක්ඛතෙ. අපෙක්ෂා කෙරෙයි; කත්තා ච, කර්තෘද; තෙවිභත්තියා, තෙවිභක්තිය විසින්; න වුත්තො, නොකියනලදද; භාවප්පච්චයෙන පන, භාව ප්‍රත්‍යය විසින් වනාහි; වුත්තො නාම, උක්ත නම් වේ; (කවර හෙයින්ද යත්) ත්‍යාස්ස, භාව ප්‍රත්‍යය නමා; කත්තරි, කර්තෘකාරකයෙහි; කතත්තා, කළහෙයින; තථාපි, එතකුදුවුවත්; පධාන, ප්‍රධානවූ; සුපිනක්‍රියා, ස්වප්නක්‍රියාවහා; සම්බන්ධාපායෙන; සම්බන්ධචාරයෙන්; අවුත්තත්තා, අනුක්තහෙයින් තතියා, තෘතීයා වේ; අප්පධානභොජනක්‍රියා, ප්‍රධාන නොවන්නා වූ භොජනක්‍රියාවහා; සම්බන්ධමාත්‍රෙන, සම්බන්ධොපායෙන්, වුත්තතෙනාපි, උක්තබවක් ඇද්ද; න තු පඨමා, ප්‍රථමා නොවේ.

අථ විභත්තිභෙදෙ වුච්චන්තෙ. වාක්‍යච—"යං කරොති තං කම්මං" කත්තා යං ඉච්ඡිතමනිච්ඡිතමිච්ඡිතානිච්ඡිතං වා කරොති ක්‍රියාසම්බන්ධයති තච වාකාරෙනාකථිතච කම්මං නාම හොති. "කම්මෙසු දුතියා". තත්ථ ඉච්ඡිතං තාව—බුද්ධං වන්දති—ඔදනං භුඤ්ජති—එතර පතනයන් තාගතං භොජනමෙහෙදෙපචාරා යථා, ගාමො ආගච්ඡන්ති—අනිච්ඡිතං—කණ්ටකං මද්දති—විසං ගිලති. ඉච්ඡිතානිච්ඡිතං *—ගාමං ගච්ඡං රුක්ඛමූලමුපගච්ඡති—

---

(5) වුත්තකරණං, උක්තකරණය; යථා, මෙසේසි—ජිතනා; කපනලද; රුක්ඛො, වෘක්ෂය ඇත්තේ; පරසු,පොරොවසි—පහරණං, පහරණ නම්; ආයුධං, ආයුධයසි—වුත්තසම්පදානං, උක්තසම්ප්‍රදානය; යථා, මෙසේසි—දින්නා, දෙනලද; සුඛො; සුඛකාම්; ඇත්තේ; රාජා, රජසි—දක්ඛිණෙය්‍යො, දක්ඛිණෙය්‍ය නම්; භික්ඛු; භික්ෂුසි—සම්පදානං, සම්ප්‍රදාන නමි; බුද්ධො, සර්වඥසි—

වුත්තාපාදානං, උක්තාපාදානය; යථා, මෙසේසි—නිග්ගතා, නික්මුනාවු; ජනො, ජනයන් ඇත්තේ; ගාමො, ගමසි—භීතො, භයඩකරවූයේ; රක්ඛසො, රාක්ෂසයසි—වුත්තාධාරො, උක්තාධාරය; යථා, මෙසේසි—මත්තා, මත්වූ; මාතඞ්ගං, ඇතුන් ඇති; වනං, වනයසි—රුක්ඛා, වෘක්ෂයන් ඇති, දෙසො, ස්ථානයසි—ආසනං, ආසන නමි; පිතා, පුටුවසි—වුත්තසාමි, උක්තසාමි තෙමේ; යථා, මෙසේසි—දසබලො, බලදසයක් ඇත්තේ; භගවා, සර්වඥසි—වෙණිකො, වීණාවාදනය සිල්පකොට ඇත්තේ; ගන්ධබ්බ , ගන්ධර්වසි.

1 සමාසො, සමාසය තෙමේ; සබ්බත්ථ, සියළු අවි කාරකයෙහි; හොති, වෙයි; කිතකො, කිතකප්‍රත්‍යය තෙමේ; සාමිවජ්ජිතෙ, සම්බන්ධරහිතවූ ෂට්කාරකයෙහි වෙයි; තද්ධිතො, තද්ධිතප්‍රත්‍යය තෙමේ; කරණාවධිවජ්ජිතෙ, කරණකාරකය අපාදානකාරකය යන දෙදෙන වර්ජිතකොට ඇති කර්ම කර්තෘ සම්ප්‍රදානාධාර ස්වාමියෙහි; භියො, බොහෝසේ; ලබ්භතෙ, ලැබෙන්නේයි.

2 ආඛ්‍යාතං, ආඛ්‍යාතය තෙමේ; කත්තුකම්මෙසු, කර්තෘකාරක කර්මකාරක දෙක්හි වෙයි; කරණාදිනන්තු, කරණ සම්ප්‍රදාන ආධාර සාමි යන මොවුන්ගේ වනාහි; අභාසිතෙ, අනුක්තවිෂයෙහි; සං සං වාක්‍යං, ස්වකීය ස්වකීයවූ වාක්‍යයම, උදාහරෙ, උදාහරණවෙයි; ඉති,

---

* ඉච්ඡිතානිච්ඡිතං යථා, මුද්‍රිතපොතෙ.

අත්‍ර ගාමගමනමිච්ඡිතං රුක්ඛමූලොපසප්පනං පාසඞ්ගිකමිච්ඡිතාන්‍යනි ච්ඡිතං නාම. අකථිතං—භගවා භික්ඛූ එතදවොච—එත් භික්ඛූ න්‍යකථිතං, තම කෙනාකථිතං? ඡකාරකසඤ්ඤාහි; තස්මා කෙ නාපි සුත්තෙන කාරකසඤ්ඤා න විහිතාති වාකාරෙන භික්ඛූනං කම්මසඤ්ඤා—එවං බීරණෙ කටං කරොතීත්‍යාදි. අකථිතවකම්මං විකම්මකධාතුයොගෙ දට්ඨබ්බං.

නිබ්බත්තිවිකතිප්පත්තිභෙදා කම්මං තිධා යථා,
කටං කරොති ඣාපෙති කට්ඨං රූපං විපස්සති.

---

එහෙයින්; තානි, ඒ අනුක්තකාරක සම්ප්‍රදානාධාර සාමි යන භෙ දූ; අනුද්ධටා නොදක්වනලද්දාහුයි.

ඉදං, මේ; වුත්තානුත්තානං, උක්තානුක්තයන්ගේ; දිසාමත්තං, උපායමාත්‍රයෙක; අනෙන නයෙන; මෙකී යුක්තීන්; වක්ඛමානමපි, මතු කියන ලබන පදයද; නෙතබ්බං, දතයුත්තේයි.

........................................

* අථ, ඉක්බිත්තෙන්; විභත්තිභෙදො; විභක්තීන්ගේ විශෙෂය; වුච්චතෙ, කියනුලැබේ. වා ඉති, වා යනු; එව, මතු සූත්‍රයෙහි වැ වේ—''යං කරොති තං කම්මං'' යනු කර්මසංඥාවිධානසූත්‍රයි—යං ය නු පදය කරොති යනුපදය තං යනු පදය කම්මං යනු පදයි—කත්තා, කර්තෘ තෙමේ; ඉච්ඡිතං, අභිමතවූහෝ: අනිච්ඡිතං' අනභි මතනූවූයෙහෝ; ඉච්ඡිතානිච්ඡිතං වා' අභිමතානභිමතවූහෝ; යං' ය මක්; කරොති'යයිසේසි; ක්‍රියාය, ක්‍රියායෙන්; සම්බජ්ඣියති' යුක්තාහෙ ත්‍ද;තව' හෙද; වාකාරෙන'වාශබ්දග්‍රහණයෙන්; අකථිතඤ්ච'අකථි තයද; කම්මං නාම හොති' කර්මය නම්වේ.

''කම්මත්ථෙ දුතියා'' යන සූත්‍රයෙන් කර්මාර්ථයෙහි විතීයාවිභක්ති වේ. තත්‍ර; එහි, ඉච්ඡිතං, ඉච්ඡිතකර්මය තෙම; තාව, පළමුකොට කියනුලැබේ—බුද්ධං, සර්වඥයා, වන්දෙ, වදිමි—ආතපත්තං, අඩුපා ත්‍රයක්; භුජති, වළඳ—එත්‍ර, මෙතැන්හි, පත්තනති, පාත්‍රයයි; ත ගතං, ඒ පාත්‍රගතවූ; භොජනං, ආහාරයයි; (කවරහෙයින්ද යත්)අභෙදොපචාරා, භෙදයක් නැතිකොට සිතාගැන්මෙන; ය ථා, යම්සේ; ගාමො, ග්‍රාමය තෙම; ආගච්ඡතීති, එයි යනුද එමෙ නි—අනිච්ඡිතං, අනිච්ඡිතකර්මය මෙසේයි—කණ්ටකං, කටුව; ම ද්දති, මිරිකා—විසං, විෂය; ගිලති, ගලනේයි. ඉච්ඡිතානිච්ඡිතං, අභිමතානභිමතකර්මය කියනුලැබේ—ගාමං, ගමට; ගච්ඡං, යන් නේ; රුක්ඛමූලං, ගසමුලට; උපසප්පති, පැමිණේ—අත්‍ර, මෙහි; ගා මගමනං, ගමටයාම; ඉච්ඡිතං, මුඛ්‍යව කැමතිවනලද; රුක්ඛමූලො පසප්පනං, වෘක්ෂමූලයට පැමිණීම; පාසඞ්ගිකං ඉට., ප්‍රසඞ්ගිකානුයි, අනිච්ඡිතං නාම; අනීප්සිත නාම් වේ.

දුතියාචෙව— "කාලද්ධානමච්චන්තසංයොගෙ" —කාලද්ධානං දබ්බගුණක්‍රියාහි නිරන්තරසංයොගෙ සති දුතියා සියා. මාසං මංසොදනං—සරදං රමණීයා නදී—මාසංසජ්ඣායති—අද්ධානං—යොජනං වනරාජි—යොජනං දීඝො පබ්බතො—කොසං සජ්ඣායති. "කම්මප්පවචනීයයුත්තෙ"—කම්මප්පවචනීයෙහි යුත්තෙ ඨානෙ දුතියා සියා—ලක්ඛණෙ විච්ඡායං ඉත්ථම්භූතෙ භාගෙ සහත්ථෙ හීනෙ ච පඤ්චමානස්ස අනුස්ස, සහත්ථහීනවජ්ජිතෙසු ලක්ඛණාදීසු පතිපරීනඤ්ච භාගසහත්ථහීනවජ්ජිතෙසු තෙසුයෙව අභිස්ස ච කම්මප්පවචනීයසඤ්ඤා.

---

අකථිතං, අකථිතකර්මය කියනුලැබේ—භගවා, සර්වඥ තෙම; භික්ඛු, භික්ෂූන්ට; ධනං, ධන, අවොච, කී—එපා. මෙහි; භික්ඛූ ඉති භික්ඛු යනු; අකථිතං, අකථිතකර්මය; තච, මෙහෙද; කෙන, කවරක්හු විසින්; අකථිතං, අකථිතය යත්; ඡකාරකසඤ්ඤාහි, ෂට් කාරකසංඥාවන් විසින් අකථිත යි—නසමා; එහෙයින්; කෙනාපි සූත්‍රෙන, කිසිසූත්‍රයකිනුදු; කාරකසඤ්ඤා, කාරකසංඥා නොකෙරේ; හු විහිතාහි, නොකරනලදනුයි; වාකරෙන, ("යං කරොති තං කම්මං" යන සූත්‍රයට අනුව්‍යාඛ්‍යානකරනලද) ව්‍යාකරණයෙන්; භික්ඛු ඉති, භික්ඛු යනා: අත්‍ර, මෙහි; කම්මසඤ්ඤා, කර්මසංඥා වේ—එවං, මෙසේ; හිරණ, බෙරුතණින්; කාවං කරොති ඉසි, කලාලයක් කෙරෙයි යනා; ආදි, මේ ආදිය වේ. අකථිතව කම්මං, අකථිතකර්මයද; විකම්මකධාතුයොගෙ, විකර්මකධාතූන්හා සම්බන්ධයක් ඇතිකල්හි; දට්ඨබ්බං, දක්කයුතුයි.

කම්මං, කර්මය තෙම; නිබ්බත්ති, නිර්වෘත්තිකර්මය; විකති, විකෘතිකර්මය; පත්ති, ප්‍රාප්තිකර්මයයි යනා; භෙද, භෙදයෙන්; තිධා, තුන් පරිද්දෙකින් වන්නේය; යථා, ඊට උදාහරණ මෙසේයි; කටං, කලාල; කරොති, කරන්නේය; කට්ඨං, කාෂ්ඨය; ඣාපෙති, දවන්නේය; රූපං, රූපය; පස්සති, දක්නේයි.

දුතියා ඉති, දුතියා යනු; ච, මතු සූත්‍රයෙහි වැටේ—"කාලද්ධානමච්චන්තසංයොගෙ" යනු විභක්ත්‍යාවිභක්තිවිධාන සූත්‍රයි—කාලද්ධානං යනුපදය අච්චන්තසංයොගෙ යනු පදයි—කාලද්ධානං, කාලය මාර්ගය යන දෙදෙනාගේ; දබ්බගුණක්‍රියාහි, ද්‍රව්‍යය ගුණය ක්‍රියාය යන මොවුන්හා; නිරන්තරසංයොගෙ සති, නිරතුරු සම්බන්ධයක් ඇතිකල්හි; දුතියා සියා, ද්විතීයාවිභක්ති වන්නීයි.

ලක්ඛණං බ්‍යඤ්ජකං— රුක්ඛමනුවිජ්ජොතතෙ චන්දො—රුක්ඛ තොයෙතො—එත්ථ රුක්ඛො ලක්ඛණං විජ්ජොතමානො චන්දො ලක්ඛණියො—තත්‍ථාපි හි රුක්ඛස්ස ලක්ඛණවුත්තිතා පකාසියතීති රුක්ඛො අභූතා යුත්තො නාම—රුක්ඛං රුක්ඛමනුවිජ්ජොතතෙ චන්දො,—රුක්ඛ රුක්ඛතායෙතො—යදිදං විච්ඡායං රුක්ඛවිච්චස්ස සම්භත්තිස්ස ඒතං. එවං සබ්බත්ථ විච්ඡායං ඤෙයං.

භින්නානි යානි වත්ථූනි ක්‍රියාය තු ගුණෙන වා,
දස්සෙතු වාපි බ්‍යාපිතුං ශුච්ඡා විච්ඡාති වුච්චතෙ.

බ්‍යාපිතුං ති සම්බන්ධිතුං—අත්‍රොදාහරණානි—ගාමෙ ගාමෙ ගම්‍යතෙ—ගාමෙ ගාමෙ රමණීයො—ගාමෙ ගාමෙ ජලං.

---

මාසං, මසක්; මංසොදනං, මාංශෞදනයයි—සරදං, සරත් සමයෙහි; නදී, ගඟ; රමණීයා, සිත්කලුයි—

මාසං, මසක්; සජ්ඣායති, හදාරා—අඩෙනා, මාශීවාව්‍යශබ්දයා යෝරෙන් විහීයා කියනුලැබේ—යොජනං, යොදුනක්; වනරාජී, වනපෙරබාවය—යොජනං, යොදුනක්; දීඝො, දිගිවූ; පබ්බතො, පර්වතයයි—කොසං, හබසනක්; සජ්ඣායති, හදාරා.

"කම්මප්පවචනීයයුත්තෙ" යනු විතීයාවිභත්තිවිධාන සූත්‍රයි—කම්මප්පවචනීයයුත්තෙ යනු එකපදයි—කම්මප්පවචනීයෙහි යුක්තෙ, කර්මප්‍රවචනීයසංඥා යුක්තවූ; ඨානෙ, තැන්හි; දුතියා සියා, විතියාවිභක්ති වේ—ලක්ඛණෙ, ලක්ෂණාර්ථයෙහිද, විච්ඡායං, වීප්සාර්ථයෙහිද; ඉත්ථම්භූතෙ, ඉත්ථම්භූතාර්ථයෙහිද; භාගෙ, භාගාර්ථයෙහිද; සහෙතු, සහාර්ථයෙහිද; හීනෙ ච, හීනාර්ථයෙහිද; වත්තමානස්ස, වැටෙන්නාවූ: අනුස්ස, අනු ශබ්දයහටද; සහත්ථහීනවජ්ජිතෙසු, සහාර්ථ හීනාර්ථ වර්ජිතවූ; ලක්ඛණාදීසු, ලක්ෂණය වීප්සාය ඉත්ථම්භූතය භාගය යන සතර අර්ථයෙහි වැටෙන්නාවූ, පතිපරි නම්, පති පරි යන ශබ්දයන් දෙදෙනාටද; භාගසහත්ථහීනවජ්ජිතෙසු, භාගාර්ථ සහාර්ථ හීනාර්ථ යන මොවුන් වර්ජිතකොටඇති; තෙසෙව ච, ඒ ලක්ෂණය වීප්සාය ඉත්ථම්භූතය යන මේ අර්ථත්‍රයෙහි වැටෙන්නාවූ; අභිස්ස ච, අභි ශබ්දයහටද; කම්මප්පවචනීයසඤ්ඤා, (පරසඤ්ඤාදීන්) කර්මප්‍රවචනීයසංඥා වේ.

ලක්ඛණං, ලක්ෂණ නම්; බ්‍යඤ්ජකං, ප්‍රකාශකයි—චන්දො, චන්ද්‍රතෙම; රුක්ඛමනු, වෘක්ෂයෙහි; විජ්ජොතතෙ, බබලා—රුක්ඛො ඉති, වෘක්ෂයෙහි යනු; ලක්ෂ්‍යො, අර්ථයි—එත්ථ, මෙහි; රුක්ඛො, වෘ

ඉත්ථම්භූතො ඛ්‍යාති පකාරං. පතිනා—සාධු දෙවදත්තො මාතරමනු-මාතරි සාධුත්තා පතිනාත්‍යෙත්ථ—භාගෙ—යදෙත්ථ මං අනුසියා තං දීයතු—එසා මමභාගො යො දීයතුත්‍යත්ථො—නදි මන්වවසිතා බරාණසී—නදියා සහ අවබද්ධාත්‍යත්ථො—අනුසාරිපුත්තං පඤ්ඤවා භික්ඛු—සාරිපුත්තතො පඤ්ඤාය හීනොත්‍යත්ථො—එවං පතිච්චාදිසු යථායොගං යොජෙතබ්බං. "කච්චි දුජ්ජියා ජඩීනම ජෙ"—ජඩීතෙන කච්චි දුජ්ජියා සියා—තං ඛො පන භගවන්තං—ත ස්ස භගවතොත්‍යත්ථො. එවං අන්තරා අතෙනා තිරො අභිතො පරිතො පටිභා ඉච්චාදීනං අනන්තරා ච නාලඤ්ජං, අනෙනා රජ්ජං, තිරො රජ්ජං, අභිතො ගාමං, පරිතො ගාමං, උපමා මං පටිභාති.

---

ක්ඛාන; ලක්ඛණෙ, ලක්ෂණය, විජ්ජොතමානො, බබලන්නාවූ; චන්දො, චන්ද්‍ර තෙම; ලක්ඛිතබ්බො, ලක්ෂිතව්‍යයි—තත්‍ර, එහි; අනුනා, අනු ශබ්දයා විසින්; රුක්ඛස්ස, රුක්ඛ ශබ්දයාගේ; ලක්ඛණවුත්තිතා, ලක්ෂණාර්ථයෙහි වැටෙන බව; පකාසීයතීති, ප්‍රකාශකරනුලැබේනුයි; රුක්ඛො, රුක්ඛශබ්දය තෙම; අනුනා, අනු ශබ්දයාගෙන; යුත්තො නාම, යුක්ත නම් වේ—
රුක්ඛං රුක්ඛමනු, වෘක්ෂයෙක්හි වෘක්ෂයෙක්හි; චන්දො, චන්ද්‍ර තෙම; විජ්ජොතතෙ, බබලා—රුක්ඛරුක්ඛො ඉති, වෘක්ෂයෙහි වෘක්ෂයෙහි යනු; අත්ථො, අර්ථයි—යදාදිනා, යදාදිසූත්‍රයෙන්; විච්ඡායං, විප්සාර්ථයක් කිවමනාකල්හි; රුක්ඛං ඉති, රුක්ඛංයනු; සම්භන්තස්ස, ව්‍යාප්තිය ගිතවූ; අස්ස, මෝහට; ඒත්තං, ඒත්ව වේ. එවං, මෙසේ; සබ්බාසු, හැමතන්හි; විච්ඡායං, විප්සාවක් කිවමනාකල්හි; ඒත්තං, ඒත්ව වේ.

කිත්තානි, වෙන්වූ; යානි, යම්; වත්ථූනි, වස්තූකෙනෙකුන්; ක්‍රියාය වා, එක ක්‍රියාවකින් වේවයි; ගුණෙන වා, එක ගුණයකින් වේවයි; දබ්බෙන වා, එක ද්‍රව්‍යයකින් වේවයි; ව්‍යාපිතුං, සම්බන්ධ කරන්නට; ඉච්ඡා, ප්‍රශ්ණච්ඡාව; විච්ඡාති, විප්සායයි; වුච්චතෙ, කියනුලැබේ.

ව්‍යාපිතුන්ති, බ්‍යාපිතුන් යන්නෙහි, සම්බන්ධිතුං, සම්බන්ධකරන්නට යන අර්ථයි—අත්‍ර, මේ විප්සාර්ථයෙහි; උදාහරණානි, උදාහරණයෝ කියනුලැබෙත්—ගාමො ගාමො, ගම ගම; ගම්‍යතෙ, යනුලැබේ—ගාමෙ ගාමෙ ගම ගම; රමණීයකා, රම්‍යයි—ගාමෙ ගාමෙ ගම්හි ගම්හි; ජලං, දියයි. ඉත්ථම්භූතො, ඉත්ථම්භූත නම්; කම්පකාරං, කිසි ප්‍රභෙදයකාට; පතිනා, පැමිණියේයි—දෙවදත්තො, දෙව්දත් තෙම; මාතරමනු, මව කෙරෙහි; සාධු, ගුණයෙන් යුක්තයි—

ඡට්ඨීත්‍යධිකාරෙ—“තතියාසත්තමීනඤ්ච”—තතියාසත්තමීනඤ්චෙතෙ ච සාපරනසම්පදානෙ ච ඡට්ඨී දුතියා සියා—මං නාල පියසති, මයා සංගත්‍යස්සා—සහනම්‍යස්සා—පබ්බජාහසම්පං නිවාසෙතබ්බා, සම යෙතබ්බා. උපඅනුඅධිආපුබ්බස්ස වස නිවාසෙ ඉච්චස්ස අධිආ පුබ්බානං සි සයෙ ඨා ආස ඉච්චෙසං අභිනිපුබ්බස්ස විස පවෙසෙ ති ඉච්චස්ස ච යොගෙ—ගාමං උපවසති, අනුවසති, අධිවසති, ආවසති, අධිසෙතෙ අධිතිට්ඨති, අජ්ඣාසයති' අභිනිවිසති වා.

---

මාතරි, මව කෙරෙහි; සාධුතාය, 'ගුණයට; පනොතානාස්සො, ප්‍රාජාය යන අර්ථයි. භාගො, භාග නම්; කොට්ඨාසො, කොට්ඨාසයයි—එක්, මෙහිලා; යං, යමක්; මං අනුසියා, මාගේ කොටස වන්නේද; තං, හෙ තෙම; දීයතු, දෙනුලැබේවා—යො, යමක්; මම භාගො, මාගේ කොටසද; සො, හෙ තෙම; දීයතු ඉති, දෙනුලැබේවා යන; අත්ථො, අර්ථයි—

භාරානසි, බරන ස; නදිං, නදියනා; අනුවසිතා, අවබඩයි—නදියා යුත, නදියනා එක්ව; අවබඩා ඉති, අවබඩය යන; අත්ථා, අර්ථයි—භික්ඛු, භික්ෂු තෙම; අනුසාරිපුත්තං, ශාරිපුත්‍රයාට හීනයි; පඤ්ඤාය, ප්‍රඥාවී ඇත්තේයි—සාරිපුත්තතො, සැරියුත්නුකෙරෙන් පඤ්ඤාය, ප්‍රඥාවෙන්; හීනොතාස්සො, හීනය යන අර්ථයි—එවං, මෙසේ, පටිචාදීසි, පති පරි අභි යන මොවුන්හා; යථායොගං, සම්බන්ධපරිද්දෙන්; යොජෙතබ්බං, යෙදියයුතුයි.

“ඡට්ඨී දුතියා ඉධන්තමපෙ” යනු විතියාවිභක්තිවිධාන සූත්‍රයි—ඡට්ඨී අනුපදය දුතියාඅනුපදය ඉධන්තං යනුපදය අපෙක්ඛයනුපදයි—ඉධෙ, මෙහි ...යෙහි; ඡට්ඨී, සිසිතැනෙක්හි; දුතියා සියා, විභියාවිභක්ති වේ—තං ඛො පන භගවන්තං, ඒ භගවත්නුගේ; තංහභගවතො තයස්ථා, ඒ භගවත්නුගේ යන අර්ථයි—අන්තරා, අන්තරා ශබ්දය; අන්තො, අන්තො ශබ්දය; තිරො, තිරො ශබ්දය; අභිතො, අභිතො ශබ්දය; පරිතො, පරිතො ශබ්දය; පටිභා, පටිපූර්වවූ භා දීප්තියෙහි යන ධාතුය යන; ඉච්චාදීනං, මේආදිශබ්දයන්හා; යොගෙ, සම්බන්ධයක් ඇත්කල්හි; එවං, මෙසේමැයි—නාලන්දං, එනම් විහාරයාගේ; අන්තරා ච, අතුරෙහි; රජ්ජං, දෙශයාගේ, අන්තො, ඇතුලත; රජ්ජං, දෙශයාගේ; තිරො, පිටත; ගාමං, ග්‍රාමයාගේ; අභිතො, භාග්පස්හි; ගාමං, ග්‍රාමයාගේ; පරිතො, භාත්පස්හි; උපමා, උපමා තොම; මං, මට; පටිභාති, වැටහේ.

භාසාචාරසෙසු—නදිං පිවති, ගාමං චරති—සම්පදානෙ—පුච්ඡා රොචෙච්ඡිතං—තෙනාහ—පඨමාදෙ—පුබ්බනගාමං—ගාමස්මා පුබ්බ සම්භන්තාදො.

සුඛං සෙතිච්චාදිසු ක්‍රියා විසෙසනත්තා කම්මත්තෙව යෙව දුතියා සියා—කථං? භූකරා සබ්බධාතූනමෙවෙත්ථ සකාති, තෙනො සෙතීති සයනං කරොතීත්‍යත්ථො—කිං විසිට්ඨං සයනාකාරාපෙක්ඛායං සුඛාකාරාපෙක්ඛියමානත්තා සයනක්‍රියාය සුඛතානං විසෙසනත්තා සුඛස්ස සයනෙන තුල්‍යාධිකරණත්තා තගතං දුතියෙකවචනං නපුංසකත්තඤ්ච සුඛසද්දො ලභතෙ.

ක්‍රියාවිසෙසනං යාව තං සබ්බං හි නපුංසකො,
සියා ච එකවචනං යථා භික්ඛු සුඛං සිතා.

---

කච්චි ඉති, කච්චි යනු; අධිකාරො, සම්බන්ධකරනුලැබේ—"නාතිසාසනාතිභාව" යනු විභක්ත්‍යාවිභක්ති විධාන සූත්‍රයි—"තාතියාසත්තමීනං" යනු පදය ච යනු පදයි—තතියාසත්තමීනං ච, තෘතීයා සප්තමී දෙදෙනාගේ අර්ථයෙහිද; චකාරෙන, චග්‍රහණයෙන්; සම්පද, නාපාදනෙච, සම්ප්‍රදානාපාදන දෙක්හිද; කච්චි, කිසිතැනෙක්හි; දුතියා සියා, විභක්ත්‍යාවිභක්තිවූ—මං නාලපිස්සති, මා මා නාලපිස්සති—මයා සහ ඉති, මා නා එක්ව යනු; අයෝ අපෙසි—සත්තමියත්ථෙ, සප්තම්‍යර්ථයෙහි උදාහරණ කියනුලැබේ—පුබ්බණ්හසමයං, පෙරවරුවේලෙහි; නිවාසෙත්වා, හැඳපෙරව; සමයෙතාදෙඨා, කල්හි යනු අර්ථයි.

උප අනු අධි ආ පුබ්බස්ස, උපය අනුය අධිය ආය යනු මොවුන් පූර්වකොට ඇති; වස නිවාසෙ ඉති, වස නිවාසෙ යනු; ඇසස, මේ ධාතුනුගේ යොගයෙහිද; අධි ආ පුබ්බස්සීනං, අධ්‍ය ආය යනු මොවුන් පූර්වකොට ඇති; සී සයෙ, සී සයෙ යන ධාතුනුගේ යොගයෙහිද; ඨා ආස ඉති. ඨා ගතිනිවුත්තිම්හි ආස උපවෙසනෙ යනු; එසං, මේ ධාතූන් දෙදෙනාගේ යොගයෙහිද; අභි නි පුබ්බස්ස, අභි ශබ්ද නි ශබ්ද දෙදෙනා පූර්වකොට ඇති; විස පවෙසනෙ ඉති, විස පවෙසනෙ යනු; අස්ස යොගෙ ච, මේ ධාතුනුගේ යොගයෙහිද විභක්ත්‍යාවිභක්ති වේ—ගාමං, ගම; උපවසති, වෙසෙයි; අනුවසති, වෙසෙසි; අධිවසති, වෙසෙසි; ආවසති, වෙසෙයි; අධිසෙතෙ, හොවී; අධිතිට්ඨති, පිහිටයි; අජ්ඣාවසති, හිඳී; අභිනිවිසති වැ, වදනේනේවෝ වේ.

(2) "යොකරොති සකත්තා"—යො සුද්ධකාරකානං පධානතො ස
කිමබලෙනාපි වා ක්‍රියං කරොති සොකත්තා නාම—"කථාකරී වෙ"
ති කථිතා—සුදෙන පාලියං කෙළෙහි උදෙනා පච්චතෙ—රජ්ජු, පා
සාදෙ පාදෙහි සීඝෙන—එත්ථ පාලකාදිකාරකසමූහෙහි සූදෙන ගො
ජීහො සා ගං ධාරණාදිනා ඛ්‍යාපාරෙන පාකක්‍රියම්හි නිබ්බත්තයන්
ති සූදෙනෙව උස්සාහනිපුණතතා පධානො, න පන පාලකාදි—ක
ස්ස පාකක්‍රියා කම්මකා, සිතික්‍රියා තු කත්තුකා.

යො යොජයං සකසකෙ බලු කාරකානි
අඤ්ඤෙසු ක්‍රියෙ යතනසුත්තතනයා පධානො,
කාමිනිතං ක්‍රියමථාත්තසිතං කරොති
කත්තාති සො නිගදිතො තමි නෙකභෙදෙ.

---

පානාචාරනෙසු, පානය ආචාරය යන මේ අර්ථයෙහි පිහිටාවේ. කාද්‍ය. භොජනෙහි, පිවති, ජලය පානය කෙරේ—ගාමං, ගච්ඡති; චරති, හැසිරේ—සම්පදානෙ, සම්ප්‍රදානයෙහි පිහිටා කියනුලැබේ—පණ්ඩං, පසුව; තං, තට; ආරෝචෙමි, කියමි; නෙත්තභෙදා, තටයු යන අර්ථයි—පච්චත්තෙන, පච්චත්තයෙහි පිහිටා කියනුලැබේ—ගාමං, ගමින්; පුබ්බෙන, පූර්වභාගයෙහි; ගාමස්සා, ගමින්; පුබ්බසම්භානතො, පූර්වයෙහිය යන අර්ථයි—සුඛං සෙති භූති, සුඛං සෙතී යන; ආදිසු, මේ ආදියෙහි; ක්‍රියාවිසෙසනත්තා, ක්‍රියාවිශෙෂණහෙයින්; කම්මත්ත නෙව, කර්මාර්ථයෙහිම; දුතියා සියා, විභක්ති වේ—කථං, ක්‍රියාවිශෙෂණභාවය කෙසේද යත්?—

භූ තරා, භූ සත්තායංය කර කරණෙහි යන දෙදෙනා; සබ්බධාතු නෙපසු එව, සකල ධාතූන්ගේ අර්ථයෙහිම; සන්ති, ඇත; තතො, ඒ ධාතූන් දෙදෙනා සියලු ධාත්වර්ථයෙහිම ඇතිහෙයින්, සෙතීති, සෙති යන්නෙහි; සයනං කරොතීත්‍යත්ථො, සයනය කෙරෙයි යන අර්ථයි—කිං විසිටං සයනන්ති, කෙසේවූ සයනයද්‍යසි; අපෙක්ඛායං, අපෙක්ෂාවක් ඇතිකල්හි; සුඛන්ති, සුඛවූ සයනය කරන්නේයයි: අපෙක්ඛියමානත්තා, අපේක්ෂා කරනලබනහෙයින්; සයනක්‍රියාය; සයනක්‍රියාවට; සුඛන්ති, සුවය යන; එතං, මේ; විසෙසනන්ති. විශෙෂණහෙයින්; සුඛස්ස, සුඛ ශබ්දයා නාමා; සයනෙන, සයන ශබ්දයාහා; තුල්‍යාධිකරණත්තා; සමානාධිකරණහෙයින්; තගතං ඒ සයන ශබ්දයවූ; දුතියෙකවචනං, විභක්තිකවචනයද; නපුංසකත්තංච, නපුංසකලිඞ්ගබවද; සුඛසද්දො, සුඛ ශබ්දය තෙම, ලබ්භන්තෙ, ලබී.

ක්‍රියාවිසෙසනං, ක්‍රියාවිශෙෂණය; යාව සම්භාක්ද; තං සබ්බං හි, ඒ සියල්ලම; නපුංසකෙ, නපුංසකලිඟයෙහි වත්තතේය; එකවචනම සියා, එකවචනද වන්නේයි; යථා, ඊට උදාහරණ මෙසේයි; භික්ඛු, භික්ෂුහු; සුඛං, සුවසේ; සීතා, පිහිටියාහුයි.

"යො කරොති සකත්තා" යනු කර්තෘසංඥාවිධාන සූත්‍රයි—යො යනු පදය කරොති යනු පදය සකත්තා යනු පදයි—යො; යමෙක් තෙම; අඤ්ඤකාරකානං පධානො, අන්‍යකාරකයන්ට ප්‍රධානවූයේ කම්මකං වා, කර්මසථවූහෝ; ක්‍රියං ක්‍රියාව; කරොති, කෙරේද; සො හෙ තෙම; කත්තා නාම, කර්තෘ නම්—

"කත්තරි චෙ"ති, "කත්තරි ච"යි; තතියා, තෘතීයා වේ. සූදෙන, අරක්කැමියා; ථාලියං, සැළෙහිලා; කට්ඨෙහිදරින්; ඔදනො, ආහාරය; පච්චතෙ, පිසනුලැබේ—රඤ්ඤා, රජහු; පාසාදෙ, ප්‍රාසාදයෙහි; පාදෙහි, පයින්; සීයතෙ, සිටිමයි—එහි, තම් දෙතැන්හිලා; ථාලාදී, ථාලිකාය ඔදනාය යන; කාරකසම්භො; කාරකසමූහය තෙමේ; සූදෙන, සූදයා විසින්; යොජිතො, යොදනලද්දේ; සං සං, තම තමා පිළිබඳවූ; ධාරණාදිනා, ධාරණාදිවූ; ව්‍යාපාරෙන, ක්‍රියාවෙන්; පාකක්‍රියා, පචනක්‍රියාව; අභිනිබ්බත්තයතීති, නිපදවාහුයි සූදයෙව, සූදයාම; උස්සාහයුත්තත්තා, උත්සාහ යුක්තබැවින්; පධානො, ප්‍රධානය; න පන ථාලාදී, ථාලිආදිය ප්‍රධාන නොවේ. තෙසු, ඔවුන් අතුරෙහි; පාකක්‍රියා, පචනක්‍රියා තොමෝ; කත්තුනා, කර්තෘසථය; සිද්ධික්‍රියා තු, යම්ක්‍රියාව වනාහි; කත්තුනා, කර්තෘසථයි

යො, යමෙක් තෙම; අඤ්ඤකාරකානි, සෙසු කාරකයන්; සකසකෙ බලු, ස්වකීය ස්වකීයවූ ව්‍යාපාරයෙහි; යොජයං, යොදන්නේ; යත්නයුත්තතා, උත්සාහවත්හෙයින්; පධානො, ප්‍රධාන වූයේ; කම්මකිතං ක්‍රියං, කර්මසථවූ ක්‍රියාවක්හෝ; අථ, නොහොත් අත්තකිතං, ආත්මසථවූ ක්‍රියාවක් වේවයි; කරොති, කෙරේද; සො, හෙ තෙම; කත්තාති, කර්තෘයයි; නිගදිතො, කියනලද; සො ච, හෙද; අනෙකභෙදො, අනෙකභෙද ඇත්තේයි.

(3) "යෙන වා කයිරතෙ තං කරණං."—කත්තා යෙන කරොති පස්සති වා තං කත්තු * ක්‍රියාසිද්ධියමතිසයෙනොපකාරභූතං ගම්‍යතෙති කරණං නාම. "කරණෙ තතියා".

> බාහිරං තථජ්ඣත්තං කරණං දුවිධං යථා,
> වීහිං ලුනාති දාත්තෙන නෙත්තෙන චන්දමික්ඛතෙ.

තතියාතාධිකාරෙ—"සහාදියොගෙ ච"—සහඅලංකිංආදීනං යොගෙ සහත්ථෙ ච තතියා සියා—සහත්ථෙ ච යොගො ක්‍රියාගුණදබ්බසමවායෙ සම්භවති—පුත්තෙන සහ වුත්ති, ථූලො, ධනවා—පුත්තෙනෙති වා—අලං තෙ වාදෙන†—කිං තෙ ජටාහි.

---

(3) "යෙන වා කයිරතෙ තං කරණං" යනු කාරණසංඥාවිධාන සූත්‍රයි යෙන යනු පදය වා යනු පදය කයිරතෙ යනු පදය තං යනු පදය කරණං යනු පදයි—කත්තා, කර්තෘ තෙමේ; යෙන, යමක් කරණකොටගෙන; කරොති වා, කෙරේ නම් හෝ පස්සති වා, තං, ඒ වස්තුව; කත්තු, කර්තෘහුගේ; ක්‍රියාසිද්ධියං; ක්‍රියාසිද්ධියෙහිලා; අතිසයෙන, අතිශයින්; උපකාරභූතං, වහල්වූයේ; ගම්‍යතෙති, හැඟේනුයි; කරණං නාම, කරණ නමි. "කරණෙ තතියා" යනු තෘතීයාවිභක්තිවිධාන සූත්‍රයි කරණෙ යනු පදය තතියා යනු පදයි.

කරණං, කරණකාරකය තෙමේ; බාහිරං, බාහ්‍යකරණය; තථා, එසේම; අජ්ඣත්තං, අධ්‍යාත්මිකකරණයයි කියා; දුවිධං, ද්විවිධ වේ; යථා, ඊට උදාහරණ මෙසේයි; දාත්තෙන, දෑත්‍රය කරණකොටගෙන; වීහිං, ගොයම්; ලුනාති, ලයි; නෙත්තෙන, නේත්‍රය කරණකොටගෙන; චන්දං, චන්ද්‍රයා, ඉක්ඛතෙ, බලන්නේයි.

තතියා ඉති, තතියා යනු; අධිකාරෙ, මතුමත්තු සූත්‍රයන් සම්බන්ධකරනුලැබී—"සහාදියොගෙ ච" යනු තෘතීයාවිභක්තිවිධාන සූත්‍රයි සහාදියොගෙ යනු පදය ච යනු පදයි—සහඅලංකිං ආදීනං යොගෙ, සහය අලංය කිංය යන මේ ආදි ශබ්දයන්ගේ සම්බන්ධයක් ඇති කල්හිද; සහත්ථෙ ච, සහ ශබ්දයාගේ අර්ථයෙහිද; තතියා සියා, තෘතීයාවිභක්ති වේ.

---

* කත්තුස්ස යි මුද්‍රිතපොත්. † ඉධ වාසෙන යි මුද්‍රිතපොත්.

"හෙත්වත්ථෙ ච"—හෙත්වත්ථෙ හෙතුයොගෙ ච තතියා සියා—අන්නෙන වසති—කෙන හෙතුනා වා. "සත්තම්‍යත්ථෙ ච"ති තතියා සියා—පුබ්බෙන ගාමං. "යෙනඞ්ගවිකාරො"—යෙන බ්‍යාධිමතා අවයවෙන සරීරස්ස විකාරො විඤ්ඤායති තත්ථ තතියා සියා—විකාරො අඤ්ඤථා භාවො—අක්ඛිනා කාණො. "විසෙසනෙ ච"ති විසෙසනත්ථෙ තතියා සියා—ගොත්තෙන ගොතමො. වුත්තතො අඤ්ඤත්‍ර යා තතියා දිස්සති සා සබ්බා "කත්තරි ච"ච්චෙහ චකාරෙන සිජ්ඣති—තං යථා—කායෙන—තිලෙහි වපති පමිතියං—සුමුත්තාමයං තෙන භිංසමිච්ඡෙන පඨමං යං—අත්තනාව අත්තානං සම්මන්නති ඉත්ථම්භූතෙ—පරිබ්බාජකං භින්දණ්ඩනාද්දක්ඛි—

---

සහසද්දෙන ච; සහ ශබ්දයාගේද; යොගෙ, යෙදීම්; ක්‍රියාගුණ ද්‍රව්‍යසමවායෙ, ක්‍රියාවය ගුණය ද්‍රව්‍යය යන මොවුන්ගේ සම්බන්ධයක් ඇති කල්හි; සම්භවති, සම්භව වේ—පුත්තෙන සහ, පුත්‍රයා හා සමග; වුත්ති, පැවැත්මය; ථූලො, පුත්‍රයාගේ එක්ව ස්ථූලය; ධනං වා, පුත්‍රයාගේ එක්ව ධනයහෝ වේ—පුත්තෙන වා, පුත්‍රයා සි කියාහෝ වේ—තෙ වාසෙන, තාගේ වසීමෙන්; අලං, පමණි—තෙ ජටාහි, තාගේ ජටාවෙන්; කිං, කිම.

"හෙත්වත්ථෙ ච" යනු තෘතීයාවිභක්තිවිධාන සූත්‍රයි හෙත්වත්ථෙ යනු පදය ච යනු පදයි—හෙත්වත්ථෙ, හෙත්වර්ථයක් වාච්‍ය කල්හිද; හෙතුයොගෙ ච, හෙතු ශබ්දයාගේ සම්බන්ධයක් ඇති කල්හිද; තතියා සියා, තෘතීයා වේ—අන්නෙන, ආහාරය හෙතුකොටගෙන; වසති, වෙසේ—කෙන හෙතුනා වා, කවර හෙතුවකින්දැයි කියාහෝ වේ. "සත්තම්‍යත්ථෙ ච"ඉති—පෙ—යන සූත්‍රයෙන්; තතියා සියා, තෘතීයා වේ—ගාමං, ගමින්; පුබ්බෙන, පූර්වභාගයෙහියි. "යෙනඞ්ගවිකාරො" යනු තෘතීයාවිභක්තිවිධාන සූත්‍රයි යෙන යනු පදය අඞ්ගවිකාරො යනු පදයි—බ්‍යාධිමතා, ව්‍යාධිමත්වූ; යෙන අවයවෙන, යම් අවයවයකින්; සරීරස්ස, ශරීරයාගේ, විකාරො, අන්‍යථාභාවය, විඤ්ඤායති, දන්නාලැබේද; තත්ථ, එහි; තතියා සියා, තෘතීයා වේ—විකාරො, විකාර නම්; අඤ්ඤථා භාවො, අන්‍යථාත්වය යි—අක්ඛිනා, ඇසින්; කාණො, කණ්. "විසෙසනෙ ච"ඉති—පෙ—යන සූත්‍රයෙන්; විසෙසනත්ථෙ, විශෙෂණාර්ථයෙහි; තතියා සියා, තෘතීයා වේ—ගොත්තෙන, ගෝත්‍රයෙන්; ගොතමො, ගෞතමයි.

ක්‍රියාපවග්ගෙ—එකාහෙනෙව බාරාණසිං පායාසි—ක්‍රියාපවග්ගොති* ක්‍රියාය ආශු නිඨාපනං. තුල්‍යෙ—මාතරාසමො. කාලෙ—කාලෙන ධම්මස්සවණං. පුබ්බාදියොගෙ—මාසෙන පුබ්බො—යොගයොග උපසඞ්කමිතතාදි.

---

(4) “යස්ස දාතුකාමො රොචතෙ ධාරයතෙ වා තං සම්පදානං.”—කාතබ්බා පූජාබුද්ධියා වා අනුග්ගහබුද්ධියා වා යස්ස දාතුමිච්ඡති වා† පීතිං කරොති වා ධාරයතෙ වා තං කත්තු‡ දාතිච්ඡාදිනිමිත්තං සම්පදානං නාම—“සම්පදානෙ චතුත්ථී”—සමණස්ස චීවරං දදාති—සමණස්ස රොචතෙ සච්චං—යඤ්ඤදත්තස්ස ඡත්තං ධාරයතෙ. —

අනිරාකතතානුමන්තාරාධකා සම්පදානියං,
තිධා යථා ජලං දෙති රුක්ඛස්ස භික්ඛුනො සිනො.

---

වුත්තතො, කියනලදදෙසින්; අඤ්ඤත්‍ර, පිටත්තන්හි; සා තියා, යම් තෘතීයාවක්; දිස්සති, පෙණේද, සා සබ්බා, ඒ සියලු තෘතීයා නොමෙ!; “කත්තරිචෙ”ති, “කත්තරි ච”යන; ඉති, මේ සූත්‍රයෙන්; චකාරෙන, ච ග්‍රහණයෙන්; සිජ්ඣති, සිඬ වේ—තං යථා, හේ මෙසේයි—කාණෙන, කාණියෙහි තෘතීයා වේ—තිළෙන්, තල; වපති, වපුරේ—පචමියා, පඤ්චම්‍යර්ථයෙහි තෘතීයා වේ—මයං, අපි, ඉතෙන මහාසමණෙන ඒ මහාශ්‍රමණයා කෙරෙන්; සුමුත්තා, මිදුනමු. පඨමායං, ප්‍රථමාර්ථයෙහි තෘතීයා වේ—අනන්තනාව, තෙතෙම්ම්; අත්තනං, තමා; සම්භූනාති, දනී. ඉත්ථම්භූතෙ, ඉත්ථම්භූතාර්ථයෙහි තෘතීයා වේ—පරිබ්බාජකං, පරිබ්‍රාජකයා; තිදණ්ඩෙන, ත්‍රිදණ්ඩයෙන් උපලක්ෂිතවූවනු; අද්දක්ඛි, දිටි. ක්‍රියාපවග්ගෙ, ක්‍රියාපවර්ගයක් හැඟෙන කල්හි තෘතීයා වේ—එකාහෙනෙව, එකදවසින්ම: බාරාණසිං, බරනැසට; පායාසි, ගියේ—ක්‍රියාපවග්ගොති, ක්‍රියාපවර්ග නම්; ක්‍රියාය, ක්‍රියාවගේ; ආශු, වහා; නිඨාපනං, නිමවීමයි.

තුල්‍යෙ, තුල්‍යාර්ථයෙහි තෘතීයා වේ—මාතරා, මවහා; සමො, සදෘශයි. කාලෙ, කාලාර්ථයෙහි තෘතීයා වේ—කාලෙන, සුදුසු කාලයෙහි; ධම්මස්සවණං, දහම් ඇසීයයි—පුබ්බාදියොගෙ, පුබ්බ ශබ්දාදීන් හා යොගයක් ඇති කල්හි තෘතීයා වේ—මාසෙන, මසකින්; පු

---

* ක්‍රියාපවග්ගො. මුද්‍රිත පොත්. † දාතුමිච්ඡති, මුද්‍රිතපොත්. ‡ කත්තුස්ස, මුද්‍රිත පොත්.

"සිලාඝනහුඨානසපධාරපිහකුධදුහිස්සා*සූයරාධීක්ඛපච්චාසුණාඅනුපතිගිණාපුබ්බකත්තාරෝචනත්ථ දප්පතුම්පාල මඤ්ඤානාදර†පාණිනි ගත්‍යත්ථකම්මණි සාසක්සම්මුති‡ භියාසනතාමානසසු ච"—සිලාඝාදීසු යං තං සම්පදානං නාම. සිලාඝ කත්ථනෙ—බුද්ධස්ස සිලාඝතෙ—සිලාඝනං ථොමනං. හනු අපනයනෙ—හනුතෙ තුය්හං. ඨා, උපගීතෙඨියො සකාපුනනානං—උපඨානමුපගමනං. සප අක්කොසෙ—තුය්හං සපතෙ—සපතනාති තොයනාපං සච්චකාරණං. ධර ධාරණෙ—සුවණ්ණං තෙ ධාරයතෙ—ඉධ ධාරණිං ණෙදනතා. පිහ ඉච්ඡායං—සම්භිනා පිහයන්ති දළිද්දා. කුධ දහ සානං කොපෙ—කුධ කොපෙ—නසසකුජ්ඣති. දුහ ජිඝංසායං—දුහපදුරණෙණ වා—දුහයති දිසානං මෙඝො.

---

බෙබා, පුවීසි—වයඟුණමින්න, බොහෝසේ; උපයඩිකම්ති, ඵලඹීය යන; ආදි, මේ ආදිය වේ. •

« "යස්ස—පෙ—සම්පදානං"යනු සම්ප්‍රදානවිභක්තිවිධාන සූත්‍රයි—යස්සයනු පදය දාතුකාමෝ යනු පදය රෝචතෙ යනුපදය ධාරයතෙ යනු පදය වා යනු පදය තං යනු පදය සම්පදානං යනු පදයි—කතා, කත්‍රු තෙමේ; පූජාබුඪීසා වා, පූජාබුඪීන් වේවයි; අනුගාහබුඪීසා වා, අනුග්‍රහබුඪීන් වේවයි; යස්ස, යමක්හට; දාතුමිච්ඡති වා දෙනුකැමැත්තේ නම් හෝ; රුචිං කරොති වා, ප්‍රිය් කෙරේ නම්හෝ; ධාරයතෙ වා, දරා නම්හෝ; තං ඒ තෙමේ; කාතබ්, කත්‍රුයේ; දානිච්ඡාදි, දානවඡාදියට; නිමිත්තං, කාරණාවූයේ; සම්පදානං නාම; සම්ප්‍රදාන නම්—"සඞාදෙන චතුජි"යි චතුර්ජි වේ—සමණස්ස, ශ්‍රමණයානට; චීවරං, සිවුරු; දදාති, දේ—සමණස්ස, ශ්‍රමණයාහට; සච්චං, සබවස තෙමේ; රොචතෙ, රුස්වේසි—යඤ්ඤදත්තස්ස, යඥදත්තයාහට; ඡත්තං ධාරයතෙ, සත දරා.

අනරාකතතු, අනිරාකතීය; අභිමතතු, අභිමතානය; ආරාධකො, ප්‍රෙෂකයසි කියා; සම්පදානියං, සම්ප්‍රදානය තෙමේ; තිධා, ත්‍රිවිධ වේ; යථා, කෙසේද යි; රුක්ඛස්ස, වෘක්ෂයහට; ජලං, ජලය; දදාති, දෙයි; භික්ඛුනො, භික්ෂූවහට; ජලං දෙති, දිය දේ; අත්ථිනො, යාචකයාහට; ජලං දදති, දිය දේ.

---

* දුභික්ෂසයාසූය, මුද්‍රිතපොත්. † මඤ්ඤනානාදර, ඇතම් මුද්‍රිතපොත්—මිඤ්ඤනාදර,සම්භර මුද්‍රිතපොත්. ‡ සම්මති, ඇතම් මුද්‍රිතපොත්.

ඉස්ස ඉස්සායං—තිත්ථියා ඉස්සන්ති සමණානං—ඉස්සා අක්ඛමා. උසූය දොසාවිකරණෙ—දුජ්ජනා ගුණවන්තානං උසූයන්ති. රාධ ඉක්ඛානං රාධෙසු, ඉක්ඛ දස්සනඞ්කෙසු ඉච්චෙසං යොගෙ සති යස්ස විපුච්ඡනං සො සම්පදානං—ආපුච්ඡනන්ති විවිධෙන පඤ්ඤා—තං කස්ස පටිබද්ධං? යස්ස අම්බස්ස සුභාසුභං; පුච්ඡනස්ස—ආරාධො මෙ රඤ්ඤො, රාජිනං වා—පුච්ඡා ආරාධා ඛ්‍යාපයිතාදෙසො—ආයස්මතො උපසම්පදාපෙක්ඛො උපතිස්සස්ස, ආයස්මතො වා—පුච්ඡා උපසම්පදං අපෙක්ඛිතබ්බෙසො—එතෙසු පක්ඛෙ එකෙව විකාරෙන දුතියා. පතිආපුබ්බස්ස සුණොතිස්ස, අනුපතිපුබ්බස්ස ගිණ සද්දෙ ඉච්චස්ස ච යොගෙ පුබ්බස්ස කිරියාය යො කත්තා සො සම්පදානං—භගවා භික්ඛූ එතදවොච—භික්ඛූ භගවතො පච්චස්සොසුං, ආසුණන්ති වා—

---

“සිලාඝ—පෙ—සපථමානසෙසු ච” යනු චතුර්ථීවිභක්තිවිධාන සූත්‍රයි සිලාඝ—පෙ—නාදරප්පාණිනි යනු පදය ගත්‍යර්ථකම්මනි යනු පදය ආසිස—පෙ—සප්තම්‍යර්ථෙසු යනු පදය ච යනු පදයි—සිලාඝාදීසු. සිලාඝාදීන්ගේ ප්‍රයෝගයක් ඇතිකල්හි; යං, යමෙක් ඇද්ද; තං, ඒ; සම්පදානං නාම, සම්ප්‍රදාන නම්.

සිලාඝ, සිලාඝ යන ධාතු; කත්ථනෙ, ස්තුතිකිරීමෙහි වැටේ—බුද්ධස්ස, බුදුන්ට; සිලාඝතෙ, ස්තුති කෙරේ—සිලාඝනං, සිලාඝන නම්; ශ්ලාඝනං, ස්තුති කිරීමයි. හනු, හනු යන ධාතු; අපනයනෙ, වැලැක්වීමෙහි වැටේ—තුය්හං, තට; හනුතෙ, වළකා. ඨා, ඨා යන ධාතු වේ—සාකප්පුත්තානං, ශාක්‍යපුත්‍රයන්ට; උපතිට්ඨෙය්‍ය, උපස්ථාන කෙරේ—උපට්ඨානං, උපස්ථාන නම්; උපගමනං, එළඹ සිටීමයි. සප, සප යන ධාතු, අක්කොසෙ, අක්‍රොශයෙහි වැටේ—තුය්හං, තට; සපතෙ, සපතෙ දිවුරේ—සපනානි, සපන නම්; තොසනත්ථං, සතුටු පිණිස; සච්චකරණං, සබවස් කිරීමයි. ධර, ධර යන ධාතු; ධාරණෙ, දැරීමෙහි වැටේ—තෙ, තට; සුවණ්ණං, රත්රන්; ධාරයතෙ, දරා—ඉධ, මෙහි; ධාරණං, ධාරණ නම්; ඉණධාරණතා, ණය දියයුත්තබවය. පිහ, පිහ යන ධාතු, ඉච්ඡායං, කැමතිවීමෙහි වැටේ—දලිද්දා, දිළිඳුහු; සම්බාධනං, සුවපතුන්ට; පිහයන්ති, කැමති වෙත්. කුධාදයත්ථානං, කුධාදි අර්ථ ධාතූන්ගේ; යොගෙ, යොගයෙහි සම්ප්‍රදානසංඥ වේ—කුධ, කුධ යන ධාතු; කොපෙ, කොපයෙහි වැටේ—තස්ස, ඔහට; කුජ්ඣති, කිපේ. දුහ, යනු; ජිඝංසායං, නැසීමෙහි වැටේ—දුහ, යනු; පපූරණෙ වා, පිරීමෙහි හෝ වැටේ—මෙඝො, මෙඝය තෙම; දිසානං, දිගුන්; දුහ

පතිපුච්ඡා ආපුච්ඡා ච සුණොති පවිසෙ,තුණ්හී,සු වත්තතෙ—එත් දුඃඛක්‍රියාතිවචනක්‍රියා, භාසාකතතා භගවා—භික්ඛුජනං ධම්මං සාවෙති, භික්ඛුනො ජනො අනුගිනාති පතිගිනාති වා—අනුපතිපුච්ඡා ගිණාති අනුසාසනෙ. ආරෝචනපෙ—ආමන්තයාමි වො. තදපේක්ඛාසාසනාගමො—තං අපෙක්ඛා පයොජනං යස්ස තං තදපෙක්ඛං—එතස්ස සාසනාගමනස්ස පයොජනභූතාංගුඩං. තුමත්ථෙ—ලොකානුකම්පාය—තුංපච්චයෙන සමානත්ථො තුමත්ථො—තස්ස ලොකමනුකම්පිතුං තාදත්ථෙ. අලමත්ථෙ—අලං මල්ලො මල්ලස්ස අරහති වා—අලං මෙසුවණ්ණෙන—ඉහ අලංසද්දො අරහත්ථෙ ක පපද. මනුස්සයොගෙ අනාදරෙ. ගම්භීරෙන යො අප්පාණි තං සම්පදනං—

---

යති, තසා; නොහොත්, වැසපුරා. ඉස්ස, යනු; ඉස්සායං, ඊර්ෂ්‍යා වෙහි වැටේ—තිත්ථියා, තීර්ථකයෝ, සමණානං, ශ්‍රමණයන්ට; ඉස්සයන්ති, ක්ෂමා නොකෙරෙත් නොසෙහෙත්—ඉස්සා, ඊර්ෂ්‍යා නම්; අක්ඛමා, ක්ෂමා නොකිරිමයි.

උසුය, යනු; දොසාවිකරණෙ, වෙෂපහලකිරීමෙහි වැටේ—දුජ්ජනා, දුර්ජනයෝ; ගුණවන්තානං,ගුණවතුන්ට; උසූයන්ති,වෙෂකෙරෙත්. රාධ හිංසාසංරාධෙසු, ඉමස්ස දස්සනධෙතුසු ඉති, රාධ—ඊප—ඍෂ්ද යන; එසං යොගෙ සති, මොවුන් දෙදෙනාගේ යොගයක් ඇතිකල්හි; යස්ස, යමක්හුගේ; විප්පුච්ඡනං, විවිධවූ ප්‍රශ්නයද; සො, හෙ තෙම; සම්පදනං, සම්ප්‍රදාන නම්—විප්පුච්ඡනං'ති, විපුච්ඡනා නම්; විවිධො, නානාප්‍රකාරවූ; පඤ්හො, ප්‍රශ්නයයි; තං, ඒ විපුච්ඡනය; කස්ස පටිබද්ධං, කවරක්හු පිළිබඳද යත්; යස්ස සම්බන්ධ, යමක්හු සම්බන්ධවූ; සුභාසුභං, ශුභාශුභ දෙක, ප්‍රශ්නකස්ස, ප්‍රශ්නවුත්හනු පිළිබඳයි—මම,මාගේ; ආරාධො, ආරාධනාව; රඤ්ඤො, රජහටයි; රාජනං වා, රාජාතං කියා හෝ වේ—පුඤො, පුළුවුත්තාලද්දේද; ආරාධං, ආරාධනාව; ඛයාපයන්ති, ගහවයි යන; අපෙසා, අපීසී—ආයසමතො, ඇවැත්හට; උපතිසෙසා, උපතිස්ස නම් ස්ථවිර තෙම; උපසම්පදාපෙක්ඛො, උපසම්පතති කැමිති; ආයසමතං වා, ආයසමතං කියා හෝ වේ—පුඤො, පුළුවුත්තාලද්දේ; උපසම්පදං; උපසම්පතතිය; අපෙක්ඛායිතාපෙසා, කැමැත්තෝය යන අපීසී—එතෙසු, මේ උදාහරණයන් අතුරෙහි, පඤ්ඤො, ඵස්පසමයෙක්හි; එමෙව, මේ සිලාභාදිසූත්‍රයෙහිම; චතාගරනා, චතුනක්ෂත්‍රන්; දූතියා. චිතියා වේ. පතිඅද්ධබ්බස්ස, පත් සඬ්යාගා අ.ෂ

කඨස්ස ත්වං මඤ්ඤසි—අනාදරෙති කිං? සුවණ්ණං ත්වං මඤ්ඤසි—අප්පාණීති කිං? ගද්‍රභං ත්වං මඤ්ඤසි. ගත්‍යත්ථධාතූනං යං කම්මං තං සම්පදානං දුතියා ච—ගාමස්ස ගතො, ගාමං ගතො වා. සංසත්ථෙ—භද්දං භවතො හොතු—සංසත්ථං ආසිංසනං. සම්මුත්‍යත්ථෙ—සාධුසම්මුති මෙ. භිය්‍යො යොගෙ—භිය්‍යොසොමත්තාය. සත්‍යත්ථෙ—තුය්හං ආවිකරොමි. අප්පග්ගහණෙන—උපමං තෙ කරිස්සාමීච්චාදි.

‘‘නමොයොගාදිස්වපි ච’’ති චතුත්ථී—නමො තෙ—සොත්ථි පජනං—ස්වාගතං තෙ—කිං විප්පටිසාරාය.

.......................................

---

බඳය පූර්වකොටඇති; සුණොතිස්ස, සු සවණෙ යන ධාතුහුගේද; අනුපතිපුබ්බස්ස, අනු පති යන මොවුන් පූර්වකොටඇති; ගි සද්දෙ ඉච්චස්ස ච, ගි සද්දෙ යන මොවුන්ගේද; යොගෙ, සම්බන්ධයක් ඇතිකල්හි; පුබ්බස්සා, පූර්වවූ; ක්‍රියාය, ක්‍රියාවගේ; යො, යමෙක්; කත්තා කර්තෘද; සො, ඒ තෙම; සම්පදානං, සම්ප්‍රදාන නම්—භගවා භාග්‍යවත් තෙම; භික්ඛූ, භික්‍ෂූන්ට; එතං, මේ; අවොච, කීය—

භික්ඛූ, භික්‍ෂූහු; භගවතො, භගවත්හට; පච්චස්සොසුං, පිළිවිත්තාහ—ආසුණන්ති වා, ආසුණන්ති කියාහෝ වේ—පතිපුබ්බො, පතිපූර්වවූද; ආපුබ්බො ච, ආපූර්වවූද; සුණොති, සුණොති යනු; පටිඤ්ඤානුඤ්ඤාසු, ප්‍රතිඥානුඥ දෙක්හි; වත්තතෙ, වැටේ—එත්ථ, මෙහි; පුබ්බක්‍රියාති, පූර්වක්‍රියා නම්; වචනක්‍රියා, වචනක්‍රියාවය; තස්සා, ඒ වචනක්‍රියාවට; කත්තා, කර්තෘ නම්; භගවා, භගවති—භික්ඛු, භික්‍ෂු තෙම; ජනං, ජනයාහට; ධම්මං, දහම්; සාවෙති, අස්වයි; ජනො, ජන තෙම; භික්ඛුනො, භික්‍ෂුහට; අනුගිනාති, අනුදනි; පතිගිනාති වා, පතිගිනාති කියාහෝ වේ—අනුපතිපුබ්බො අනුපූර්වවූද පති පූර්වවූද; ගිනොති, ගි සද්දෙ යන ධාතු තෙම; අනුඤ්ඤෙන, අනුදනීමෙහිවැටේ. ආරොචනත්ථෙ, ආරෝචනාර්ථධාතුහුගේ යොගයෙහි සම්පදාන වේ—වො, තොපට; ආමන්තයාමි, කියමි. තදත්ථෙ, තදර්ථයක් කිවමනාකල්හි වේ—යුද්ධාය, යුද්ධයට; සන්නාහො, සැරහිනි—තං, ඒ යුද්ධාදිය; අත්ථො, යයි සේසි; පයොජනං, ප්‍රයෝජනවූයේ; යස්ස, යමක්හටද; තං, ඒ තෙම; තදත්ථං තදර්ථ නම—එත්ථ, මෙහි; සන්නාහනස්ස, සැරහීමට, පයොජනභූතං, ප්‍රයෝජනවූයේ; යුද්ධං, යුද්ධයයි. තුමත්ථෙ, තුමර්ථයක් හැඟෙන

කාල්හි වේ—ලෝකානුකම්පාය, ලොවට අනුකම්පා පිණිසයි—තුංප්පච්චයෙන, තුං ප්‍රත්‍යයාගා; සජ්ජිතබ්බො, සජ්ජිතවූ අර්ථ ඇත්තේ; තුමත්ථෝ, තුමර්ථ නම්—තස්මා, එහෙයින්; ලොකං, ලොවට; අනුකම්පිතුං ත්‍යජෙපා, අනුග්‍රහ කරන්නට යන අර්ථයි. අලමත්ථෙසු, අලමර්ථයන්ගේ ප්‍රයොගයක් ඇතිකල්හි වේ—මල්ලො; මල්ලව තෙම; මල්ලස්ස, මල්ලවයාහට; අලං, සුදුසුයි; අරහති වා, මල්ලො මල්ලස්ස අරහති කියාහෝ වේ—දෙම, මට; සුවණ්ණෙන, සුවර්ණයෙන් අලං, පමණි—ඉති, මෙහි, අලංසද්දො, අලං ශබ්ද තෙම; අරහපටික්ඛෙපෙසු, සුදුසුය ඒ නොකමැත්තේය යන අර්ථයෙහි වැටේ. මඤ්ඤති යොගෙ, මන ඤාණෙ යන ධාතුහුගේ යොගයෙහි; අනාදරෙ. අනාදරයක්; ගම්‍යමානෙ, හැඟෙනකල්; වා, යෙමෙන්; අප්පාණී, ප්‍රාණී නොවේද; තං, ඔහු තෙම; සම්පදානං, සම්ප්‍රදානනම්—

ත්වං කඨස්ස මඤ්ඤෙ, තා කෂ්ඨයක් කොට සිතමි—අනාදරෙ ඉති, අනාදරෙ යනු; කිං, කුමටය? තං, තා; සුවණ්ණං මඤ්ඤෙ, රන් කොට සිතමි—අප්පාණීයි කිං, අප්පාණී යනු කුමටය? ත්වං, තා; ගද්‍රභං මඤ්ඤෙ, ඔටුවකු කොට සිතමි. ගත්‍යත්ථධාතූනං, ගත්‍යර්ථධාතූන්ගේ; යං කම්මං, යම් කර්මයක් ඇද්ද; තං, එය; සම්පදානං, සම්ප්‍රදාන නම් වේ; දුතියා ච, ද්විතීයාවිභක්තිද වේ—ගාමස්ස, ගමට; ගතො, ගියේයි, ගාමං ගතො වා, ගාමං ගතො කියාහෝ වේ. ආසිංසනත්ථෙ, ආශිංසනාර්ථයෙහි වේ—භවතො පින්වත්හට; භද්දං හොතු, වැඩ වේවා—සාසසං, සංශුෂට නම්; ආශිංසනං, ප්‍රාර්ථනාවයි—සම්මුත්‍යත්ථෙ, සම්මුත්‍යර්ථයක් හැඟෙනකල්හි වේ—මෙ, මට; සම්මුති, සම්මුතිය; සාධු, මැනවි. භිය්‍යොයොගෙ, භිය්‍යො ශබ්දයාගේ යොගයෙහි වේ—භිය්‍යොසොමත්තාය, බොහෝසේ. සත්තම්‍යත්ථෙ, සප්තම්‍යර්ථයෙහි වේ—තුය්හං, තා, ආවිකරොමි; පහළ කෙරෙමි: අධිගහණෙන, අභිග්‍රහණයෙන්; තෙ, තට; උපමං කරිස්සාමීති, උපමා කෙරෙමි යන; ආදී, මේ ආදිය වේ.

"නමොයොගාදිස්වපි ච" ඉති—එප—සව්පි ච,යි; චතුත්ථි වේචතුර්ථි තෙ, තට; නමො, නමස්කාරයි—පජ්ජං, සත්ථයන්ට; සොත්ථි, ශ්‍රීඬියි—තෙ, තට; ස්වාගතං, ආරෝග්‍යද—විප්පටිසාරාය, පශ්චාත්තාපයට; කිං, කිමෙක්ද.

(5) "යස්මාදපෙති භයමාදත්තෙ වා තදපාදානං"—යතො අපසරති භායති ගණ්හාති වා තං කත්තුස්සාපගමනාදිසීමාභූතනං අපාදානං නාම. "අපාදානෙ පඤ්චමී". ගාමා අපෙන්ති—චොරා භායන්ති—උපජ්ඣායා සික්ඛං ගණ්හාති. නියමපුබ්බකෙ විජ්ජාග්ගහණෙ සාධෙ ආදාතත්තෙනෙව සිජ්ඣති—යථා *—උපජ්ඣායම්හා අධීයතෙ.

සමෙප්‍යපගමෙ විඤ්ඤානං පුබ්බරූපා යදච්චුතං,
වුච්චතෙ තදපාදානං තං චලාචලතො ද්විධා,
යථාස්සා ධාවතා පොසො පතෙ රුක්ඛා ඵලානි ච.

"ධාතුනාමානමුපසග්ගයොගාදිස්වපි ච"—ධාත්වාදිවිසෙසානං යොගෙ යං තං අපාදානං නාම.

---

(5) "යස්මා—පෙ—තදපාදානං" යනු අපාදානසංඥාවිධාන සූත්‍රයි යස්මා යනු පදය අපෙති යනු පදය භයං යනු පදය ආදත්තෙ යනු පදය වා යනු පදය තං යනු පදය අපාදානං යනු පදයි—යතො, යමක්හු කෙරෙන්; අපසරති වා, පහවන්නේහෝ වේද; භායති වා, භය වන්නේ හෝ වේද; ගණ්හාති වා, ගන්නේ හෝ වේද; තං, හෙ තෙම; කත්තුස්ස, කතෘහුගේ; අපගමනාදිසීමාභූතනත්, පහවීම්ආදියට සීමාවීනුයි; අපාදානං නාම, අපාදාන නම්වේ. "අපාදානෙ පඤ්චමී"යි පඤ්චමී වේ.
ගාමා, ගමින්; අපෙන්ති පහවෙත්—චොරා. සොරු කෙරෙන්; භායන්ති, බිය වෙත්—උපජ්ඣායා, උපාධ්‍යායා කෙරෙන්; සික්ඛං, ශික්ෂාව; ගණ්හාති, ගනී. නියමපුබ්බකෙ, නියම පෙරදැරිකොට ඇති; විජ්ජාග්ගහණෙ සාධෙ, විද්‍යාග්‍රහණය සාධ්‍යකල්හි; ආදාතත්තෙනෙව, ආදානාර්ථයෙන්ම; සිජ්ඣති, සිඹ වේ—යථා, මෙසේයි—උපජ්ඣායම්හා, උපාධ්‍යායා කෙරෙන්; අධීයතෙ, හදරා.
අපගමෙ, පහවීමක්; සමෙපි, සමවූකල්හිද; විඤ්ඤානං, වස්තූන් දෙදෙනෙක්හු අතුරෙහි; යං, යම් වස්තුවෙක් තෙම; පුබ්බරූපා, පූර්වස්වරූපයෙන්; අච්චුතං, නොපිරිහීනිද; තං, ඒ වස්තු තෙමේ; අපාදානං වුච්චතෙ, අපාදානයයි කියනුලැබේ; තං, ඒ අපාදානය තෙමේ; චලාචලතො, ජඞ්ගමාජඞ්ගමයයිකියා; ද්විධා, ද්විවිධ වේ; යථා, මෙසේයි; ධාවතො, දිවන්නාවූ; අස්සා, අශ්වයා කෙරෙන්; පොසො, පුරුෂ තෙමේ; පතෙ, හෙයි; රුක්ඛා, වෘක්ෂය කෙරෙන්; ඵලානි, ඵලය තෙමේ; පතන්ති ච, හෙයි ක්‍රියාද වේ.

---

* යථා, යනු මුද්‍රිතපොත්හි නොපෙණේ.

පරාපුබ්බජියොගෙ යො අනභිභවනීයො තං අපාදානං නාම—බුද්ධස්මා පරාජෙන්ති අඤ්ඤතිත්ථියා—බුද්ධමභිභවිතුමසමත්ථතාත්‍යත්ථො—අනභිභවනීයොති කිං? රිපුං පරාජයති වීරො. පපුබ්බභූයොගෙ යතො අවිච්ඡින්නප්පභවො තං අපාදානං නාම—අනවතත්තම්හා මහාසරා පභවන්ති—පඨමං තතො එව උපලබ්භන්තීත්‍යත්ථො—පෙමතො ජායතෙ භයං. ජිගුච්ඡාපමාදත්ථානං යොගෙ—අධම්මා ජිගුච්ඡති, පමජ්ජති වා. නාමයොගෙ—තතොපභුති—යතො සරාමි—යතොපභුතීත්‍යත්ථො—එසො පභුතිසද්දො තප්පයුත්තො ගම්‍යමානස්ස සද්දස්ස පයොගම්පෙති කාමචාරා * ති ඤායා. අඤ්ඤත්ථානං යොගෙ—නාඤ්ඤං දුක්ඛා—භින්නො දෙවදත්තාවචාදි.

---

“ධාතුනාමානමුපසග්ගයොගාදිස්වපි ච” යන්නු පචම්විභක්තිවිධාන සූත්‍රයි. ධාතුනාමානං යන්නු පදය උපසග්ගයොගාදිසු යන්නු පදය අපි යන්නු පදය ච යන්නු පදයි—ධාත්වාදිවිසෙසනං, ධාතුනාමඋපසර්ගවිශෙෂයන මොවුන්හා; යොගෙ, සම්බන්ධයක් ඇතිකල්හි; "යං, යම් වස්තුවෙක් ඇද්ද, තං, හේ වස්තුව; අපාදානං නාම, අපාදාන නම්.

පරාපුබ්බ, පරා යන ශබ්ද පූර්වකොට ඇති; ජියොගෙ, ජි ජයෙ යන ධාතුනුගේ සම්බන්ධයක් ඇතිකල්හි; යො, යමෙක්; අනභිභවනීයො, මැඩපිය නොහැකිද; තං, හෙ තෙම; අපාදානං නාම, අපාදාන නම්—අඤ්ඤතිත්ථියා, අන්‍යතීර්ථකයෝ; බුද්ධස්මා, බුදුන්; පරාජෙන්ති; මඩනට නොපොහොසත්හුයි—බුද්ධං, සර්වඥයා; අභිභවිතුං, මඩනට; අසමත්ථතාත්‍යත්ථො, නොපොහොසත්හුය යන අර්ථයි—අනභිභවනීයොති, අනභිභවනීයො යන්නු; කිං, කුමටය? වීරො වීර තෙම; රිපුං, සතුරා; පරාජයති, මඩී. පපුබ්බ, ප පූර්වවූ; භූයොගෙ, භූ සත්තායං යන්නහුගේ යොගයෙහි; යතො, යමක්හු කෙරෙන්; අවිච්ඡින්නප්පභවො, ආද්‍යුත්පත්තියද; තං, හෙ තෙම; අපාදානං නාම, අපාදාන නම්—අනවතත්තම්හා, අනවතප්තනම් විලින්; මහාසරා, මහානදීහු; පභවන්ති, උපදිත්—පඨමං, පළමු කොට; තතො එව; එයින්ම; උපලබ්භන්තීත්‍යත්ථො, පැමිණෙති යන අර්ථයි—පෙමතො, ප්‍රේමයෙන්; භයං, භය; ජායතෙ, උපදී.. ජිගුච්ඡාපමාදත්ථානං යොගෙ, නින්දාප්‍රමාදාර්ථධාතූන්ගේ යොගයෙහි අපාදාන වේ—අධම්මා ජිගුච්ඡති, අධර්මයට නින්දා කෙරේ; පමජ්ජති, මැලි වේ. නාමයොගෙ, නාමයන්ගේ යොගයෙහි වේ—තතොපභුති,

---

* කාමාචාරා, මුද්‍රිතපාඨ.

උපසග්ගයොගෙ—අපසාලාය ආයන්ති වාණිජා—සාලං වජ්ජෙත්වාත්‍යත්ථො—ආබ්‍රහ්මලොකා අබ්භුග්ගච්ඡති මුඛ්‍යසදිසෙ පතිදානෙ ච වත්තමානස්ස පතිස්ස යොගෙ—බුද්ධස්මාපති සාරිපුත්තො—බුද්ධසදිසොත්‍යත්ථො—ඝතමස්ස තෙලස්මාපති දදාති—විනිමයෙ උපාදානස්ස පතිනිය්‍යාතනං පතිදානං—තත්‍ර තෙලං ඝතත්ථං පඨමං දින්නං, තෙලස්සත්ථාය ඝතං පුන දීයතෙ—තෙලං ගහෙත්වා ඝතං දදාතීත්‍යත්ථො. ආදිග්ගහණෙන කාරකමජ්ඣෙපි—ලුද්දකො ඉතො පක්ඛස්මා මිගං විජ්ඣති—ලුද්දකො ඉතො කොසා කුඤ්ජරං විජ්ඣති—එත්ථ ඉතොතාපාදානස්ස මිගනාම කම්මස්ස ච මජ්ඣභූතො පක්ඛො, තස්සාපාදානසඤ්ඤා—

---

එතැන්පටන්කොට—යතො, යම් කලෙක පටන්කොට; සරාමි, සිහිකෙරෙම්ද—යතොපපභුතීත්‍යත්ථො, යම් කලෙකපටන්කොට යන අර්ථයි—එත්ථ, මෙහි; පභුතිසද්දො, පභුති ශබ්දය තෙම; නප්පයුත්තො නොකියනලදි; (කවර හෙයින යත්?) ගම්‍යමානත්ථස්ස, හැඟෙන්නාවූ අර්ථැති; සද්දස්ස, ශබ්දයාගේ; පයොගම්පති, ප්‍රයොගයෙහිලා; කාමචාරාති, කැමතිපරිද්දෙන් පැවැත්මය යන; ඤායා, යුක්ති හෙයිනි. අඤ්ඤත්ථා යොගෙ, අනිකෙක යන අර්ථැති නාමයන්ගේ යොගයෙහි වේ—දුක්ඛා; දුකින්; අඤ්ඤං න, අනිකෙක් නැති—දෙවදත්තා, දෙවදත්තයා කෙරෙන්; භින්නොති, වෙනය යන, ආදි, මේ ආදිය වේ.

උපසග්ගයොගෙ, උපසර්ගයන්ගේ යොගයෙහිවේ—වාණිජ, වෙළෙන්දෝ; අපසාලාය, ශාලාව හැර; ආයන්ති, එත්. සාලංවජ්ජෙත්වාත්‍යත්ථො. ශාලාව හැර යනඅර්ථයි—ආබ්‍රහ්මලොකා, බ්‍රහ්මලොකය දක්වා; අබ්භුග්ගච්ඡති, නැගේ. මුඛ්‍යසදිසෙ, මුඛ්‍යයානා සදෘශය යන අර්ථයෙහිද; පතිදානෙ ච, ප්‍රතිදානයෙහිද; වත්තමානස්ස, වැටෙන්නාවූ; පතිස්ස, පතියන උපසර්ගයාගේ; යොගෙ, යොගයෙන් වේ—සාරිපුත්තො, ශාරිපුත්‍ර තෙම; බුද්ධස්මාපති, බුදුන් හා සම සි—බුද්ධසදිසොත්‍යත්ථො, බුදුන් හා සදෘශ යන අර්ථයි—අස්ස, මේහට; තෙලස්මාපති, තෙලට වඩා; ඝතං දදාති, ගිතෙල් දේ—විනිමයෙ, ගනු දෙනු පිණිස; උපාදානස්ස, ගන්නාලද්දනුගේ; පතිනිය්‍යාතනං, පසුව දීම්; පතිදානං, ප්‍රතිදාන නම්—තත්‍ර, එහි; තෙලං, තලතෙල් තෙම; ඝතත්ථං, ගිතෙල් පිණිස; පඨමං දින්නං, පළමුකොට දෙනලද; තෙලස්සත්ථාය, තලතෙල් පිණිස; ඝතං, ගිතෙල්; පුන, නැවත; දීයතෙ, දෙනුලැබේ—තෙලං ගහෙත්වා,

අථවා, කරණං කාරො, කාරො එව කාරකො, ක්‍රියා—යදාදිනා සකත්ථෙ කප්පච්චයො—තතො ක්‍රියානම්පි මජ්ඣො කාරකමජ්ඣො නාම—යථා—අජ්ජ විජ්ඣිත්වා පක්ඛස්මා විජ්ඣති—එත්ථ විජ්ඣිත්වා විජ්ඣතීති ක්‍රියාවයං. අපිසද්දෙන නිපාතයොගෙපි පඤ්චමී දුතියා තතියා ච—රහිතා මාතුජා මාතුජං මාතුජෙන වා—රිතෙ සද්ධම්මා සද්ධම්මං සද්ධම්මෙන වා. එවං විනායොගෙපි—නානාකුලා පබ්බජිතා—අරියෙහි පුථගෙවායං. චකාරෙන අඤ්ඤත්‍රාපි යොජෙතබ්බං.

---

